වාර්ෂික වාර්තාව
2022



Digital technologies for older persons and healthy ageing

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව



ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

වාර්ෂික වාර්තාව

2022

වැඩිහිටි පරපුර හා නිරෝගිමත් වයස්ගතවීම උදෙසා ඩිජිටල් සහාය


මිනිසුන්ගේ ජීවිතයේ සෑම අංශයකම පාහේ අවස්ථා නිර්මාණය කිරීමේ දී ඩිජිටල් තාක්ෂණයන් උත්ප්‍රේරක කාර්යභාරයක් ඉටු කරයි. එදිනෙදා සේවාවන් අන්තර්ජාලය තුළින් සිදු කිරීම සහ තොරතුරු තාක්ෂණය මඟින් සමාජයන් ජාලගත වීම නිසා, ඩිජිටල් තාක්ෂණයේ වේගයෙන් වර්ධනය වන නවෝත්පාදනයන් භාවිතයට නැඹුරුවීමෙන් ඩිජිටල් යුගයේ වයස්ගත ජනගහනයේ අවදානම තුරන් වී ඇත.

ලොව පුරා උපත් අනුපාතය අඩුවෙමින් පවතින අතර 2050 වසර වන විට වයස්ගත ජනගහනය බිලියන 2 දක්වා ළඟා වනු ඇතැයි පුරෝකථනය කර ඇත. ආසියානු සංවර්ධන බැංකු වාර්තාවලට අනුව, ශ්‍රී ලංකාව ද පෙර නොවූ විරූ ජනගහන සංක්‍රාන්තියක් ඔස්සේ සෙසු පරිනත ආර්ථිකයන්ට වඩා අඩු ජීවන මට්ටමක් සහිත වයස්ගත ජනගහනයක් කරා ගමන් කරනු ඇත.

“වැඩිහිටි පරපුර හා නිරෝගිමත් වයස්ගතවීම උදෙසා ඩිජිටල් සහාය”මැයෙන් වූ 2022 වසරේ ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනයේ (WTISD) තේමාව මඟින් වයස්ගත ජනගහනය අඩු නොවන බව සහතික කිරීම සඳහා තාක්ෂණයෙන් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළ හැකි ආකාරය අවධානයට යොමු කරයි.

වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ආදායම හෝ වෙනත් ඕනෑම සාධකයක් නොසලකා සෑම කෙනෙකුටම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයෙන් සහ සේවාවන්ගෙන් ප්‍රතිලාභ ලැබිය හැකිය. තවද, සෞඛ්‍ය සම්පන්න වයෝවෘද්ධභාවය සාක්ෂාත් කර ගැනීම, රැකවරණ සපයන්නන්ට සහාය වීම, වයස් හිතකාමී සුහුරු නගර ගොඩනැගීම, සේවා ස්ථානයේ වයස් පදනම් වූ වෙනස්කම් ඉවත් කිරීම මෙන්ම වැඩිහිටි පුද්ගලයින්ගේ තිරසාර මූල්‍ය අන්තර්ගතයන් සහතික කිරීම උදෙසා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කළ හැකිය.

එබැවින්, තාක්ෂණික නිර්මාපකයන්ට සහ ප්‍රතිපත්ති සම්පාදකයින්ට මෙම ගෝලීය ජනගහන ප්‍රවණතාවය පිළිබඳව කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට හැකි වන පරිදි වයස්ගත ජනගහනය ආශ්‍රිත ගැටළු පිළිබඳව දැනුවත් කිරීම කාලීනව වැදගත් වේ. විදුලි සංදේශ ක්ෂේත්‍රයේ ජාතික නියාමන ආයතනය වශයෙන්, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වැඩිහිටි ජනගහනයේ යහපැවැත්ම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ වැලඳ ගැනීමෙන් වයස්ගත පුද්ගලයින් අතර තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යාප්ති විෂමතාවය සීමා කර වයසට හිතකාමී පරිසරයක් නිර්මාණය කිරීමේ වැදගත්කම අරභයා ජාතික මුලපිරීම් සිදු කරන ලෙස වගකිව යුතු පාර්ශවයන්ට ආරාධනා කරයි.



මෙම වාර්තාව මාර්ගගත්ව බැලීමට QR කේතය පරිලෝකනය කරන්න.
නැතිනම් පිවිසෙන්න https://www.trc.gov.lk

අන්තර්ගතය

01 වසරේ විශේෂ ක්‍රියාකාරකම්

02 සභාපතිතුමාගේ පණිවුඩය

03 අප ගැන

09 කොමිෂන් සභාව සහ විධායක කළමනාකාරිත්වය

21 අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය

31 විදුලි සංදේශ සංඛ්‍යාලේඛන සහ තොරතුරු

34 අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

- **34** බලපත්‍ර කළමනාකරණ
- **35** ජාල
- **36** සංඛ්‍යාත කළමනාකරණය
- **37** තරහකාරිත්ව
- **42** අනුකූලතා සහ විමර්ශන
- **46** ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා
- **50** නීති කටයුතු
- **51** විශේෂ ව්‍යාපෘති
- **56** පාලන සහ ආයතනික කටයුතු
- **61** තොරතුරු තාක්ෂණ
- **61** මූල්‍ය
- **63** අභ්‍යන්තර විගණනය

64 විගණන කමිටු තොරතුරු

65 කොමිෂන් සභා ලේකම් කාර්යාලය

66 නියාමන කමිටුව / ප්‍රගති සමාලෝචනය යාවත්කාලීන කිරීම්

68 අවදානම් සාධක කළමනාකරණය

70 මූල්‍ය ප්‍රකාශනය

97 වසර 10ක මූල්‍ය ප්‍රගතිය

98 විගණකාධිපතිගේ වාර්තාව

කෙටි යෙදුම් ලැයිස්තුව

AG	Attorney General's Department නීතිපති දෙපාර්තුමේන්තුව
AI	Artificial Intelligence කෘතිම බුද්ධිය
APT	Asia Pacific Telecommunity ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය
ARPU	Average Revenue Per User පරිහරණය කරන්නෙකුගෙන් ලැබෙන ආදායමේ සාමාන්‍යය
ASMS	Antenna Structure Management System ඇන්ටනා ව්‍යුහ කළමනාකරණ පද්ධතිය
ATC	Advance Training Committee උසස් පුහුණු කමිටුව
BOI	Board of Investment ආයෝජන මණ්ඩලය
CANC	Cabinet Appointed Negotiating Committee අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර සාකච්ඡා සම්මුති කමිටුව
CDMA	Code Division Multiple Access කේත බෙදුම් බහු ප්‍රවේශය
CEIEC	China National Electronics Import & Export Corporation චීනයේ ජාතික ඉලෙක්ට්‍රොනික ආනයන හා අපනයන සංස්ථාව
CEO	Chief Executive Officer ප්‍රධාන විධායක නිලධාරී
CERT	Computer Emergency Readiness Team පරිගණක ආපදාවලට සූදානම්වීමේ සංසදය
CID	Crime Investigation Department අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව
CIM	Chartered Institute of Marketing වරලත් අලෙවිකරණ ආයතනය
CLT	Colombo Lotus Tower කොළඹ නෙලුම් කුලුන
CLTMC	Colombo Lotus Tower Management Company කොළඹ නෙළුම් කුලුන කළමනාකරණ පෞද්ගලික සමාගම
COPE	Committee on Public Enterprises පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව
CSR	Corporate Social Responsibility ආයතනික සමාජ වගකීම්
CTL	Cellular Tower Levy සෙලියුලර් කුලුනු බද්ද
DS	Divisional Secretariat ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
DTH	Direct to Home සෘජු ගෘහස්ථ
DVB	Digital Video Broadcasting ඩිජිටල් වීඩියෝ විකාශනය
EBC	Extra Budgetary Contribution අතිරේක අයවැය දායකත්වය

EGO	External Gateway Operator බාහිර ද්වාර ක්‍රියාකරු
EPF	Employees' Provident Fund සේවක අර්ථසාධක අරමුදල
ESCAP	Economic and Social Commission for Asia and the Pacific ආසියා හා පැසිෆික් කලාපය සඳහා වූ ආර්ථික හා සමාජ කොමිසම
ETF	Employees' Trust Fund සේවා නියුක්තයන්ගේ භාර අරමුදල
FM	Frequency Modulation සංඛ්‍යාත මොඩියුලේෂන්
FR	Financial Regulation මුදල් රෙගුලාසි
GPRS	General Packet Radio Services පොදු දත්ත මලු ගුවන් විදුලි සේවය
GS	Gamata Sannivedanaya ගමට සන්නිවේදනය
GSM	Global System for Mobiles ජංගම දුරකථන සන්නිවේදන සඳහා ගෝලීය පද්ධතිය
HLMC	High Level Management Committee ඉහළ මට්ටමේ කළමනාකරණ කමිටුව
HRM	Human Resources Management මානව සම්පත් කළමනාකරණය
ICSA	Institute of Chartered Secretaries and Administrators වරලත් ලේකම්වරුන්ගේ සහ පරිපාලකයින්ගේ ආයතනය
ICT	Information and Communications Technology තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය
ICTA	Information and Communication Technology Agency තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය
IESL	Institution of Engineers Sri Lanka ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය
IET	Institution of Engineering and Technology ඉංජිනේරු හා තාක්ෂණ ආයතනය
IMEI	International Mobile Equipment Identity ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතාවය
IP	Internet Protocol අන්තර්ජාල ප්‍රෝටොකෝලය
IPMSL	Institute of Project Managers of Sri Lanka ශ්‍රී ලංකා ව්‍යාපෘති කළමනාකරුවන්ගේ ආයතනය
ISP	Internet Service Provider අන්තර්ජාල සේවා සැපයුම්කරුවන්
IT	Information Technology තොරතුරු තාක්ෂණය
ITN	Independent Television Network ස්වාධීන රූපවාහිනී ජාලය
ITU	International Telecommunication Union ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය
IVR	Interactive Voice Response අන්තර් ක්‍රියාකාරී හඬ ප්‍රතිචාරය අන්තර් ක්‍රියාකාරී හඬ ප්‍රතිචාරය

JICA	Japan International Cooperation Agency ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය
KIV	Korea International Volunteer කොරියානු ජාත්‍යන්තර ස්වේච්ඡා සේවකයා
KPI	Key Performance Indicator කාර්ය සාධන දර්ශකය
LTE	Long Term Evolution දිගුකාලීන පරිණාමය
MOD	Ministry of Defence ආරක්ෂක අමාත්‍යාංශය
MOU	Memorandum of Understanding අවබෝධතා ගිවිසුම
NAITA	National Apprentice and Industrial Training Authority ජාතික අධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය
NAO	National Audit Office ජාතික විගණන කාර්යාලය
NCS	National Competency Standard ජාතික නිපුණතා ප්‍රමිතිය
NIA	National Information Agency ජාතික තොරතුරු නියෝජිතායතනය
NVQ	National Vocational Qualification ජාතික වෘත්තීය සුදුසුකම්
OLP	Optical Line Protection ඔප්ටිකල් කේබල් ආරක්ෂණය
PABX	Private Automatic Branch Exchange පෞද්ගලික ස්වයංක්‍රීය ශාඛා හුවමාරුව
PCU	Project Consultancy Unit ව්‍යාපෘති උපදේශන ඒකකය
PED	Department of Public Enterprises රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තුමේන්තුව
PLC	Public Limited Company පොදු සීමා සහිත සමාගම
PSTN	Public Switched Telephone Network පොදු ස්විචිකරණ දුරකථන ජාල
QOS	Quality of Service සේවා තත්ත්ව
RF	Radio Frequency ගුවන්විදුලි සංඛ්‍යාත
RFSL	Radio Frequency Spectrum Licence ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලිය බලපත්‍රය
RMC	Regional Monitoring Center ප්‍රාදේශීය පිරික්සුම් මධ්‍යස්ථාන
RTI	Right to Information තොරතුරු දැනගැනීමේ අයිතිය
SAFIR	South Asia Forum for Infrastructure Regulation යටිතල පහසුකම් නියාමනය පිළිබඳ දකුණු ආසියානු සමුළුව
SATRC	South Asian Telecommunication Regulators Council දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමය


SDG	Sustainable Development Goals තිරසාර සංවර්ධන ඉලක්ක
SIM	Subscriber Identity Module ග්‍රාහක අනන්‍යතා මොඩියුල්පත්
SLASSCOM	Sri Lanka Association for Software Services Companies ශ්‍රී ලංකා මෘදුකාංග හා සේවා සමාගම් සඳහා වන සංගමය
SLIATE	Sri Lanka Institute of Advanced Technological Education ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය
SLINTEC	Sri Lanka Institute of Nanotechnology ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය
SMS	Short Message Service කෙටි පණිවිඩ සේවා
SOR	Scheme of Recruitment බඳවා ගැනීමේ පටිපාටිය
TDC	Telecommunications Development Fund විදුලි සංදේශ සංවර්ධන ගාස්තුව
TL	Telecommunications Levy විදුලි සංදේශ බදු
TRCSL	Telecommunications Regulatory Commission of Sri Lanka ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
TVEC	Tertiary and Vocational Education Commission තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
UMTS	Universal Mobile Telecommunication System විශ්ව ජංගම විදුලි සංදේශ පද්ධතිය
UN	United Nations එක්සත් ජාතීන්
VAS	Value Added Services අගය එකතු කළ සේවාවන්
VLR	Visitor Location Register ග්‍රාහකයින්ගේ ස්ථාන ලේඛනය
WTISD	World Telecommunication and Information Society Day ජාත්‍යාන්තර විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනය

වසරේ විශේෂ ක්‍රියාකාරකම්



“ගමට සන්නිවේදනය”ජාතික ව්‍යාපෘතිය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සහ පාසල් තන්තු/අධිවේගී අන්තර්ජාල සේවා සංවර්ධනය ආරම්භ කිරීම

අන්තර්ජාල සම්මුති යෙදුම් 6 (IPv6) මාරුවීම පිණිස මාර්ග සිතියම සකස් කිරීම සඳහා විශේෂඥ සහාය ලබා ගැනීම සම්පූර්ණ කිරීම



දුරකථන අංකය වෙනස් නොවී ජාල අතර මාරුවීමේ හැකියාව ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම

5G ව්‍යාපෘතිය කටයුතු ක්‍රියාත්මක කිරීම



අනුකූලතාවය සහ සේවා තත්ත්වය

ගුවන් කුලුනු ප්‍රතිසන්ධානය කිරීම සහ අනවසර කුලුනු හඳුනා ගැනීම



ජාත්‍යන්තර සංවිධානවල දායකත්ව මුදල් ගෙවීම් සම්බන්ධයෙන් සුදුසු පියවර හඳුන්වා දීම.

විදුලි සංදේශ කුලුනු කාර්මික ශිල්පීන් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතිකයක් ස්ථාපිත කිරීම



“APT-NIA World Friends Korea ICT”ස්වේච්ඡා වැඩසටහන සහ APT-EBC-K ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය කටයුතු ඉටු කිරීම

කොළඹ නෙළුම් කුලුනේ බාහිර කටයුතු අවසන් කර කළමනාකරණ සමාගමට පැවරීම



රජයේ ආදායම ශක්තිමත් කිරීම සඳහා ඒකාබද්ධ අරමුදලට දායක වීම

සභාපතිතුමාගේ පණිවුඩය



ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ 2022 වාර්ෂික වාර්තාව සඳහා පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම පිළිබඳව මම සතුටු වෙමි. රටෙහි තීරණාත්මක ආර්ථික තත්ත්වය හේතුවෙන් මෙම සමාලෝචිත වර්ෂය වඩාත්ම අභියෝගාත්මක වසරක් විය. මෙම දුෂ්කර තත්ත්වයන් මධ්‍යයේ වුව ද විදුලි සංදේශ ක්ෂේත්‍රය ධනාත්මක ප්‍රතිඵල පෙන්නුම් කර ඇති බව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන් මා සඳහන් කරන්නේ සතුටිනි.

විදුලි සංදේශ කර්මාන්තයේ අපගේ පාර්ශවකරුවන්ගේ නම්‍යශීලී බව සහ කැපවීම පිළිබඳ ව අපගේ අවංක කෘතඥතාව පුද කිරීමට අපි කැමැත්තෙමු. අනෙකුත් බොහෝ අංශවල දියුණුව මෙන්ම ආර්ථික තත්ත්වය යථා තත්ත්වයට පත් කිරීම සඳහා හිතකර විදුලි සංදේශ සහ තොරතුරු තාක්ෂණ පරිසරයක් අත්‍යවශ්‍ය වේ. ශක්තිමත් විදුලි සංදේශ ක්ෂේත්‍රයක් පවත්වාගෙන යාම සඳහා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

ජංගම ග්‍රාහකයින් මිලියන 29.8 ක්, ස්ථාවර ග්‍රාහකයින් මිලියන 3.7 ක් සහ අධිවේගී අන්තර්ජාල සේවා ග්‍රාහකයින් මිලියන 21.5 ක් පමණ වූ ඉතා ශක්තිමත් විදුලි සංදේශ ක්ෂේත්‍රයක් අප රට සතු වේ. 2022 අවසන් වන විට ජංගම සහ ස්ථාවර දුරකථන ඝනත්වය පිළිවෙළින් 130% සහ 12% ක් විය. විදුලි සංදේශ කර්මාන්තය ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ ශීඝ්‍රයෙන් වර්ධනය වන අංශයක් වන අතර එය ජංගම දුරකථන ක්ෂේත්‍රයේ ප්‍රමුඛ වේ. විදුලි සංදේශ අංශයේ වර්ධනයත් සමඟ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) අංශය පසුගිය වසර තුළ සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත.

2022 වර්ෂය තුළ දී, විදුලි සංදේශ කර්මාන්තයේ වර්ධනය උදෙසා පද්ධති බලපත්‍ර හතරක් අලුත් කිරීම, ජංගම දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් 5G අත්හදා බැලීම් පැවැත්වීම, ගාස්තු රහිත අංක පද්ධතිය ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීම, විදුලි සංදේශ කුලුනු කාර්මික ශිල්පීන්ගේ වෘත්තීය සුදුසුකම් සහතික කිරීම සඳහා විෂයමාලා සංවර්ධනය සහ අවශ්‍ය ජාතික නිපුණතා ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම, කොළඹ නෙළුම් කුලුන කළමනාකරණ සමාගම යටතේ ආරම්භ කරන ලද කොළඹ නෙළුම් කුලුන වාණිජකරණ කටයුතු යනාදී ප්‍රධාන කාර්යයන් රැසක් සම්පූර්ණ කිරීමට ආයතනය පියවර ගෙන ඇත.

ආයතනය සමාලෝචිත වසර තුළ සිය කාර්යයන්හි බොහෝ අංශවලින් සාර්ථක වී ඇති අතර "ගමට සන්නිවේදනය"යටතේ ග්‍රාමීය සහ දුරස්ථ යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීම පිණිස ජාතික මූලපිරීම් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ප්‍රමුඛ අවධානය යොමු කර ඇත. මෙම මූලපිරීම එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සන්දර්භයට අනුකූල වේ. අදාළ වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය අනුව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ආදායම රු. මිලියන 38,414 ක් වන අතර, ඒ සමඟම, කොමිෂන් සභාව විසින් ඒකාබද්ධ අරමුදල සඳහා ප්‍රේෂණය කරන ලද මුදල රු. මිලියන 29,308 කි.

රජයේ රෙගුලාසිවලට අනුකූලව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මහජන සේවා සැපයීම බාධාවකින් තොරව සිදු කරන ලදී. මෙම කාලසීමාව තුළ, සංකීර්ණ තත්ත්වයකදී රටට සේවය කිරීම උදෙසා වගකිව යුතු රාජ්‍ය ආයතනයක් ලෙස ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස එක්ව කටයුතු කිරීමෙහි ලා කාර්ය මණ්ඩලයේ ශක්තීන් සහ අවස්ථාවන් හඳුනා ගැනීමට අපට හැකි විය.

සමාලෝචිත වසර තුළ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ලබා දුන් දායකත්වය අගය කරන අතරම, ඉදිරියට යන ගමනේ දී, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට රටෙහි නියාමන ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම සහ ඩිජිටල්කරණය සහතික කිරීමේ උපායමාර්ගික කාර්යය ඇත. විදුලි සංදේශ ක්ෂේත්‍රයට වටිනා සේවාවක් ලබා දීම උදෙසා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කොමිෂන් සභා සාමාජිකයින් සහ සමස්ථ කාර්ය මණ්ඩලයේ අඛණ්ඩ පක්ෂපාතීත්වය, කාර්යක්ෂමතාවය, වෘත්තීයභාවය සහ කැපවීම වෙනුවෙන් මම ස්තුතිවන්ත වෙමි.

තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම්
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සභාපති

අප ගැන

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL), 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත, හා පසුව සංශෝධනය කරන ලද, 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත යටතේ ස්ථාපනය කරන ලද රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතනයක් වේ. මෙම වාර්තාවේ පනත යන්නෙන් 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත හැඳින්වෙන අතර කොමිෂන් සභාව යන්නෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හැඳින්වේ.

1996 අංක 27 දරන පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත අනුව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) යනු රටේ විදුලි සංදේශ නියාමන කටයුතු මෙහෙයවීමේ රාජ්‍ය බලධරයා වේ. ඒ අනුව පාරිභෝගිකයින්ගේ සහ දුරකථන ක්‍රියාකරු සමාගම්වල යහපත නිසැක කරමින් මෙරටේ විදුලි සංදේශ සේවා නංවාලීමට පනත මඟින් කොමිෂන් සභාවට බලය පවරා ඇත.

දර්ශනය

"විද්‍යාත්මක හා නියාමන විශිෂ්ටතාව මඟින් දියුණුවෙමින් ඉදිරියට යන විදුලි සංදේශ කර්මාන්තයේ විශ්වීය නියාමකයකු වශයෙන් පිළිගැනීමට ලක්වීම."

මෙහෙවර

"කුසලතාවයෙන් පිරිපුන් සදාචාර සම්පන්න ශ්‍රම බලකායක් මඟින් තරඟකාරී වෙළඳපලෙහි සාධාරණත්වය හා යුක්තිය ප්‍රවර්ධනය කිරීමෙන් පිළිගත හැකි ගුණාත්මක බවකින් හා දැරිය හැකි මිලකින් යුක්ත සේවාවක් දීප ව්‍යාප්තව කලට වේලාවට ලබාදීමට වග බලා ගැනීම"

අපගේ වටිනාකම්

වගවීම: අපගේ ප්‍රතිපත්ති උපදෙස් සහ කාර්යයන් සම්බන්ධයෙන් වගකීම භාර ගැනීම.

විනිවිදභාවය: අපගේ කාර්යයන් පසුපස පවත්නා තාර්කිකත්වය පැහැදිලි කිරීමට සූදානම් ව සිටීම.

වෘත්තීයභාවය: කොමිෂන් සභාවේ විදුලි සංදේශ නියාමනය පිළිබඳ අපගේ එදිනෙදා කටයුතුවල දී ප්‍රශස්ත වෘත්තීමයභාවයක් ප්‍රදර්ශනය කිරීම සහ අඛණ්ඩ ස්වයං-වැඩිදියුණුව සාක්ෂාත් කර ගැනීම.

අඛණ්ඩතාව: අපගේ පාරිභෝගිකයින්ගේ සහ පාර්ශ්වකරුවන්ගේ යහපත උදෙසා සදාචාරාත්මකව, කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස කාර්යයන් ඉටු කිරීම මඟින් ක්‍රියාවන් සමඟ වචන ගැලපීම.

මෙහෙවර ප්‍රකාශනය අර්ථ නිරූපනය කිරීම

ශ්‍රී ලංකාවේ දිගු කාලීන සන්නිවේදන අවශ්‍යතාවයන් සපුරාලීම සහතික කරනු වස් සාධාරණත්වය, තරඟකාරීත්වය සහ ආයෝජන දිරිගන්වන නියාමන පරිසරයන් නිර්මාණය කිරීම උදෙසා සියළුම පාර්ශවකරුවන් සමඟ ස්වාධීන, විවෘත සහ පාරදෘශ්‍ය ආකාරයෙන් ක්‍රියා කිරීම තුලින් සියළුම පරිභරණය කරන්නන්ට සාධාරණ, යුක්තිසහගත සහ දැරිය හැකි මිල ගනන් යටතේ වැඩිදියුණු සහ ගුණාත්මක බවෙන් ඉහළ සන්නිවේදන තාක්ෂණ සේවා සැපයිය හැකි බව සහතික කිරීම.

කොමිෂන් සභාව

කොමිෂන් සභාව සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත වන අතර කොමිෂන් සභාව අයත් වන තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම්වරයා නිල බලයෙන්ම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සභාපතිවරයා වේ.

එමෙන්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා, ප්‍රධාන විධායක නිලධාරියා වන අතර කොමිෂන් සභා සාමාජිකයෙකු ද වේ. සෙසු සාමාජිකයින් තිදෙනා පිළිවෙලින් නීති, කළමණාකරන, මූල්‍ය ක්ෂේත්‍රවල විශිෂ්ඨතාවක් ලබා ඇත්තාවූ තැනැත්තන් වේ.

අරමුණු

විදුලි සංදේශ පනත ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සාක්ෂාත් කළ යුතු අරමුණු පහත දැක්වේ.

- ජාතික අභිවෘද්ධියට හේතු වන හදිසි සේවා, පොදු දුරකථන කුටි සේවා, දුරකථන නාමාවලි තොරතුරු සේවා, සමුදීය සේවා සහ ග්‍රාමීය සේවා වැනි සේවාවන්වල අවශ්‍යතාවය සපුරාලමින් ශ්‍රී ලංකාව තුළ දේශීය සහ ජාත්‍යන්තර විදුලි සංදේශ සේවා සාධාරණව හා කාර්යක්ෂමව සැපයීමට වගබලා ගැනීම (එහි ප්‍රතිපාදන සාධ්‍ය නොවන තාක් ආරක්ෂා කිරීම).
- සෑම ක්‍රියාකරුවෙකුගේම බලපත්‍රයේ සඳහන් කර ඇති සේවාවන් සපයනු ලැබීම නිසැක කිරීම සඳහා එකී සෑම ක්‍රියාකරුවෙකුටම අවශ්‍ය තාක්ෂණික, මූල්‍ය සහ කළමණාකරන සම්පත් ඇති බවට සහ ඔවුන් විසින් ඒවා යොදා ගනු ලබන බවට වග බලා ගැනීම.
- අය කරනු ලබන ගාස්තු සහ සපයනු ලබන විදුලි සංදේශ සේවාවන් මෙන්ම විදුලි සංදේශ උපකරණවල තත්ත්වය හා විවිධත්වය සම්බන්ධයෙන් පාරිභෝගිකයින්ගේ, ගැනුම්කරුවන්ගේ සහ වෙනත් පාර්විවිකරන්නන්ගේ සම්බන්ධතාවන් හා පොදුවේ මහජන යහපත ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

- විදුලි සංදේශ සේවා හා සම්බන්ධ වාණිජ කටයුතු වල නිරත තැනැත්තන් අතර ඵලදායී තරහකාරිත්වයක් පවත්වාගෙනයාම සහ ප්‍රවර්ධනය කිරීම මෙන්ම ඒ තැනැත්තන්ගේ කාර්යක්ෂමතාව සහ පිරිමැසුම්දායක බව ප්‍රවර්ධනය කිරීම.
- අභ්‍යන්තර සහ ජාත්‍යන්තර විදුලි සංදේශ පහසුකම් පිළිබඳව සීඝ්‍ර සහ අඛණ්ඩ සංවර්ධනයක් ප්‍රවර්ධනය කිරීම.
- අනවශ්‍ය ප්‍රමාදයන් හෝ බාධාවන් හෝ අවහිරතාවයන්ගෙන් තොරව විශ්වාසදායක සහ කාර්යක්ෂම සේවාවක් සැපයීමේ තම වගකීම ඉටු කිරීමට ක්‍රියාකරුවන්ට හැකිකම ඇති බවට නිසැක කිරීම.
- විදුලි සංදේශ සහ ඒ හා සම්බන්ධ ක්ෂේත්‍ර ගැන නව තාක්ෂණික ක්‍රම වැඩි දියුණු කිරීම සහ ඒ ක්‍රම භාවිත කිරීම.
- ශ්‍රී ලංකාවෙන් පිටත සිය ව්‍යාපාරික ස්ථාන ඇති විදුලි සංදේශ සේවා බහුල වශයෙන් පාවිච්චිකරන්නන් ශ්‍රී ලංකාව ඇතුළත ව්‍යාපාරික ස්ථාන පිහිටුවීම සහ ජාත්‍යන්තර සංක්‍රාන්ති සේවා සඳහා ශ්‍රී ලංකාව යොදා ගැනීම ප්‍රවර්ධනය කිරීම පිණිස දිරි ගැන්වීම.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වගකීම්

රජයේ ප්‍රධාන ආයතනයක් වන ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ක්ෂේත්‍රය පිළිබඳ ජාතික නියාමන නියෝජිතායතනය වන අතර කොමිෂන් සභාවේ ප්‍රධාන අරමුණ වන්නේ වර්ධනය වන තරහකාරී වෙළඳපලේ උද්ගත වන අභියෝග වලට ප්‍රතිචාරවිව මහජන යහපත ආරක්ෂා කර, නියාමන ක්‍රියාවලිය ස්ථායී ලෙස ශක්තිමත් කරමින් විදුලි සංදේශ කර්මාන්තයේ නිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සහ මහජන යහපත ආරක්ෂා කිරීමයි.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් විදුලි සංදේශ සේවා නොසපයන නමුත් කාර්යක්ෂමව හා ක්‍රමවත්ව විදුලි සංදේශ සේවා සැපයීමෙහිලා විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් දිරිගන්වයි. එමෙන්ම ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ජාල පහසුකම් විශ්වීය මට්ටමට වැඩිදියුණු කිරීම පිණිස සියළුම විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් වලට සහාය වේ.

ප්‍රධාන වගකීම් පහත දැක්වේ:

- පනතේ විධිවිධාන බලාත්මක කිරීම සහ බලපත්‍රලාභී ක්‍රියාකරුවන්ගේ බලපත්‍රයේ කොන්දේසි තරයේ පිළිපැදීම.
- බලපත්‍රලාභී ක්‍රියාකරුවන් අතර නිදහස් සහ සාධාරණ තරහකාරිත්වයක් පවත්වා ගැනීමට දිරි ගැන්වීම.
    - දුරකථන ක්‍රියාකරු සමාගම් මහජන යහපත සලසන්නේද යන්න නිශ්චය කිරීම සහ අපක්ෂපාතී ලෙස හිතකර ක්‍රියාවන්හි නිරතවීම සඳහා තරහකාරිත්වය පිරික්සීම.
    - ජාල හා සේවා අතර අන්තර් සම්බන්ධතාවය ඇති කිරීමට වග බලා ගැනීම.
    - විවෘත ප්‍රවේශය, අවහිරතා නැති කිරීම සහ විනිවිද පෙනෙන බලපත්‍ර ක්‍රියාවලියක් ඇති කිරීමට හැකි වන පරිදි පොදු නීති රාමුවක් සකස් කිරීම.
- මිල
  පොදු මහජනතාවට දුරකථන ක්‍රියාකාර සමාගම්වල මිල දරාගත හැකිද යන්න බව සැලකිල්ලට ගෙන සාධාරණ මිල සහතික කිරීම.
- පාරිභෝගික ආරක්ෂාව
  මහජනතාව සහ පාරිභෝගිකයන් විසින් ඉදිරිපත් කරන පැමිණිලි පිළිබඳව විමර්ශන පැවැත්වීමේදී සවන් දීමට ඇති කැමැත්ත, සන්නිවේදනය සහ මහජන සහභාගීත්වය දිරිගැන්වීම සහ මහජන සුරක්ෂිතතාවය ඇති කිරීම.
- සමාජ නියාමනය
    - විශ්වීය ප්‍රවේශය/සේවා
    - ග්‍රාමීය ප්‍රජාව, වැඩිහිටි ජනතාව සහ විවිධ අවශ්‍යතා සහිත පුද්ගලයන්ට විශ්වීය ප්‍රවේශ/සේවා සැපයීමට වග බලා ගැනීම.
    - හදිසි අවස්ථාවකදී ක්‍රියා කිරීම සඳහා පූර්ව සූදානමින් සිටීම.
    - විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට විදුලි සංදේශ සේවා සැපයීම.
- අඩු පහසුකම් සහ සීමිත සම්පත් නියාමනය කිරීම
    - සංඛ්‍යාත වර්ණාවලි කළමණාකරනය (Spectrum Management)
    - අංකනය (Numbering)
    - නීත්‍යානුකූල අවසරය ලබාදීම (Right of Way)
    - අවකාශ පරාස (Space Segment)
    - අන්තර් සම්බන්ධතාවය (Interconnection)
    - ජාත්‍යන්තර සම්බන්ධතා මධ්‍යස්ථාන වලට ප්‍රවේශවීම(Access to International Landing Stations)
    - ප්‍රධාන ජාතික ජාල වලට ප්‍රවේශවීම (Access to Backbone)
- ගුණාත්මක විදුලි සංදේශ සේවා
  පාරිභෝගිකයා සෑහීමකට පත්වන ආකාරයෙන් අවශ්‍යතාවයන් සපුරාලන ලෙස සාධාරණ හා දරාගත හැකි පරිදි ඉහළ ගුණාත්මක භාවයකින් යුතුව විදුලි සංදේශ සේවා සැපයීමට වගබලා ගැනීම.
- යහපාලනය ප්‍රවර්ධනය කිරීම
  ස්වාභාවික යුක්තියේ මූලධර්ම පිලිපදිමින් කාලෝචිත තීරණ ලබාදීම, මහජන සහභාගීත්වය දිරිගැන්වීම හා විනිවිද පෙනෙන තීරණ ක්‍රියාවලියක් ඇති කිරීමට වග බලා ගැනීම.
- සාධාරණ සහ ඒකපාර්ශවීය නොවූ තීරණ ලබාදීමට වග බලා ගැනීම.
- සිවිල් සමාජය නවීන තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයෙන් හෙබි දැනුවත් සමාජයක් බවට ගොඩනැංවීමට සහායවීම.
- ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) සහ අදාල ජාත්‍යන්තර සංවිධාන විසින් විදුලි සංදේශ උපකරණ සහ තාක්ෂණික ප්‍රමිතීන් සම්බන්ධයෙන් පනවන නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට සියළුම විදුලි සංදේශ ක්‍රියාකරුවන් හා එක්ව කටයුතු කිරීමට වග බලා ගැනීම.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්යයන්

ඉහත අරමුණු සාක්ෂාත් කිරීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව පහත සඳහන් නියාමන කාර්යයන් ඉටු කිරීමෙහිලා නිරත වේ.

- බලපත්‍ර සඳහා අයදුම් කිරීමේ පටිපාටිය සහ බලපත්‍ර ප්‍රදානය කිරීම
    - පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකාව තුළ විදුලි සංදේශ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා බලපත්‍රය. පනතේ 17 වන වගන්තියට අනුකූලව කොමිෂන් සභාවේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් දෙන ලද බලපත්‍රයක් යටතේ හැර කිසිම තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ විදුලි සංදේශ ක්‍රමයක් ක්‍රියාත්මක නොකළ යුතුය. කෙසේවුවද පනතේ 20 වන වගන්තියේ බලපත්‍ර ආදියෙන් නිදහස් කිරීම සඳහන් කර ඇත.
    - පනතේ 22 වන වගන්තිය යටතේ ගුවන් විදුලි සංඛ්‍යාත හා ගුවන් විදුලි සංඛ්‍යාත විමෝචන උපකරණ පාවිච්චි කිරීම සඳහා බලපත්‍රය. විදුලි සංදේශ පනතේ 22 (1) වගන්තිය ප්‍රකාරව කිසියම් තැනැත්තකු විසින් තත් කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් යටතේ හැර යම් ගුවන් විදුලි සංඛ්‍යාතයක් හෝ යම් ගුවන් විදුලි සංඛ්‍යාත විමෝචන උපකරණයක් ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරයේ යම් කොටසක හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද යම් නැවක හෝ ගුවන් යානයක පාවිච්චි නොකළ යුතුය.
    - පනතේ 21 වන වගන්තිය යටතේ වෙළඳ බලපත්‍ර. පනතේ 21 (1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත්කළ බලපත්‍රයක් යටතේ හැර කිසිම තැනැත්තකු විසින් යම් විදුලි සංදේශ උපකරණයක් වෙළඳාමක් වශයෙන් නිශ්පාදනය කිරීම,

ආනයනය කිරීම, විකිණීම, විකිණීම පිණිස ඉදිරිපත් කිරීම, ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම, පැවරීම, කුලියට දීම, බදුදීම, ක්‍රියාකර පෙන්වීම, නඩත්තු කිරීම හෝ අළුත්වැඩියා කිරීම සිදු නොකළ යුතුය.

- ❖ අයක්‍රම නියාමනය කිරීම
  - පනතේ 5 (ඔ) වගන්තියේ නියමයන් ප්‍රකාරව කොමිෂන් සභාවට ඇති බලතල අනුව අමාත්‍යවරයා විමසා ආණ්ඩුවේ ප්‍රතිපත්තිය සහ ක්‍රියාකරුවන් විසින් සපයනු ලබන විදුලි සංදේශ සේවාවන් සම්බන්ධයෙන් ක්‍රියාකරුවන්ගේ අවශ්‍යතා සැළකිල්ලට ගනිමින් අයක්‍රම හෝ අයක්‍රම තීරණය කිරීමේ ක්‍රම නිශ්චය කිරීම.
  - පනතේ 5 (1) ප්‍රකාරව අන්තර්ජාල ගාස්තු අනුමත කිරීම/නිශ්චය කිරීම.

- ❖ විදුලි සංදේශ පනත (ඒ යටතේ වූ නීති සහ රීති ඇතුලත්ව) සහ බලපත්‍රලාභී ක්‍රියාකරුවන්ගේ බලපත්‍රවල අනුකූලතාවය පිරික්සීම සහ සහතික කිරීම.

- ❖ ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය නිසි ලෙස පාවිච්චි කිරීමට වගබලා ගැනීම මෙන්ම පිරික්සීම සහ ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය කළමණාකරනය කිරීම.

- ❖ පාරිභෝගික පැමිණිලි සහ විමර්ශන/පරීක්ෂණ පැවැත්වීමට ප්‍රතිචාර දැක්වීම.
  පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව ක්‍රියාකරුවකු විසින් සපයනු ලබන විදුලි සංදේශ සේවා පිළිබඳව විදුලි සංදේශ සේවා දායකයකු හෝ මහජනයා අතුරින් කෙනෙකු හෝ විසින් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් කරනු ලැබූ විට අවශ්‍යයයි කොමිෂන් සභාව සලකන විමර්ශනයක් කොමිෂන් සභාවට පැවැත්විය හැකි අතර කාරණයට අදාල අවස්ථානුගත කරුණු අනුව ගත යුතු ප්‍රතිකර්ම යෙදීමටද සැලැස්විය යුතුය.
  පනතේ 9(2) වගන්තිය අනුව යම් විමර්ශනයක් පැවැත්වීමේදී, පනතේ 9(1) ප්‍රකාරව කොමිෂන් සභාව විසින් ඒ පැමිණිල්ලට හේතු වූ නිමිත්ත හෝ කාරණය නිරවද්‍ය කිරීම සඳහා අවශ්‍යයයි පෙනී යන පරිදි එවැනි ක්‍රියාමාර්ග ගන්නා ලෙස එකී දුරකථන ක්‍රියාකාර සමාගම් වලට නියම කළ හැකි අතර අවශ්‍යයැයි හැඟෙන පරිදි මූල්‍යය වන්දි ගෙවන ලෙසද නියම කළ හැකිය.

- ❖ විදුලි සංදේශ සේවාවල ගුණාත්මකභාවය සහ විවිධත්වය සම්බන්ධයෙන් මහජනතාවට තොරතුරු සැපයීම සහ මහජන ක්‍රියාවලීන් සහ ප්‍රසිද්ධ විභාග පැවැත්වීමේදී ඔවුන්ගේ සහභාගීත්වය දිරි ගැන්වීම.

- ❖ විදුලි සංදේශ ක්ෂේත්‍රයට සම්බන්ධ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ/ ජාත්‍යන්තර හා විදේශීය ආයතනවල කටයුතු වලදී ශ්‍රී ලංකා රජය නියෝජනය කිරීම.

- ❖ කොමිෂන් සභාව විසින් නියෝග, උපදෙස් හා තීරණ නිකුත් කිරීම
  කොමිෂන් සභාව නියෝග, උපදෙස් සහ තීරණ නිකුත් කිරීම සම්බන්ධයෙන් විනිවිද පෙනෙන ප්‍රතිපත්තියක් අනුගමනය කර ඇත. ප්‍රසිද්ධ විභාග සහ සෙසු සමුළු වලට සහභාගීවන සහ ඒවා නියෝජනය කරන විදුලි සංදේශ ක්ෂේත්‍රයේ ක්‍රියාකරුවන්ට, පාරිභෝගිකයින්ට සහ වෙනත් ඒ සම්බන්ධ උනන්දුවක් දක්වන පාර්ශවයන්ට වැඩි අවස්ථාවක් ලබා දෙනු ලැබේ.

- ❖ විදුලි සංදේශ උපකරණ සහ මාදිලි අනුමැතිය සඳහා තාක්ෂණික ප්‍රමිතීන් සඳහන් කිරීම.

අන්තර් කොටියාස සහයෝගීතාව

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්යයන් ඉටු කිරීම සඳහා අංශ/ඒකක කිහිපයක් තිබේ. 2022 වර්ෂයේ අංශ/ඒකකවල ප්‍රධාන කාර්යයන් සහ කාර්ය සාධනය මෙම වාර්තාවේ අදාළ අංශවල විස්තර කර ඇත. නිශ්චිත අංශයක්/ඒකකයක් යටතේ යම් යම් ක්‍රියාකාරකම් ලැයිස්තුගත කර ඇතත්, එම ක්‍රියාකාරකම් වෙනත් අංශ/ඒකකවල සහය ඇතිව එම නිශ්චිත අංශය/ඒකකය විසින් සිදු කර ඇති බව විශේෂයෙන් සඳහන් කළ යුතුය.

අංශ වලින් සිදු කෙරෙන කාර්යයන් සහ සමාලෝචනය

බලපත්‍ර කළමනාකරණ අංශය

ජාතික යහපැවැත්ම සඳහා අත්‍යවශ්‍ය යැයි සැලකෙන විදුලි සංදේශ සේවාවන් සඳහා වන සියලුම සාධාරණ ඉල්ලීම් සපුරාලීම පිණිස ශ්‍රී ලංකාව තුළ විශ්වාසනීය සහ කාර්යක්ෂම ලෙස ජාතික සහ ජාත්‍යන්තර විදුලි සංදේශ සේවා සැපයීම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සහතික කළ යුතුය.

බලපත්‍රලාභී ක්‍රියාකරු සමාගම් වසින් 1996 අංක 27 පනත මඟින් සංශෝධිත 1991 අංක 25 දරන විදුලි සංදේශ පනතේ 17 වැනි වගන්තියේ විධිවිධාන වලට අනුකූලව සේවා සැපයීම සහතික කරයි. පනතේ ඉහත සඳහන් කර ඇති වගන්තිය ප්‍රකාරව, පද්ධති බලපත්‍රයක අධිකාරිය යටතේ මිස, ශ්‍රී ලංකාව තුළ කිසිදු පුද්ගලයෙකු පොදු විදුලි සංදේශ පද්ධතියක් ක්‍රියාත්මක නොකළ යුතුය. මහජන අදහස් හා කොමිෂන් සභාවේ නිර්දේශයට යටත්ව අමාත්‍යවරයා විසින් පද්ධති බලපත්‍ර විධිමත් ලෙස ප්‍රදානය කරන ලදී.

ජාල අංශය

විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ජාල අංශය විසින් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන රාජ්‍ය සහ පෞද්ගලික විදුලි සංදේශ ජාල ආශ්‍රිත කටයුතු නියාමනය කරයි. පොදු විදුලි සංදේශ ජාල සඳහා ජාතික අංකන සැලැස්ම කළමනාකරණය කිරීම, සංඥා කේත පැවරීම, ජංගම ජාල සංකේත අංක පැවරීම, object identifiers පැවරීම (OID - යනු වස්තුවක් අනන්‍ය ලෙස හඳුනා ගන්නා දශම සංඛ්‍යාවලින් යුත් තන්තුවකි), විදුලි සංදේශ යටිතල පහසුකම් යෙදවීමට පහසුකම් සැලසීම, විදුලි සංදේශ උපකරණ අලෙවිකරුවන්ට බලපත්‍ර ලබා දීම, මාදිලි අනුමත සහතික නිකුත් කිරීම සහ ජාල උපකරණ සඳහා රේගු නිෂ්කාශන, ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ජාල වෙත නව තාක්ෂණයන් හඳුන්වා දීමට කටයුතු කිරීම ජාල අංශයේ විෂය පථය යටතේ ඇති ක්ෂේත්‍ර වේ.

සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ අංශය

ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය යනු ස්වභාවික හා සීමිත සම්පතක් වන අතර එය සමාජයීය ජීවන තත්ත්වය සහ ආර්ථික වර්ධනය නැංවීමෙහි ලා යොදාගනිමින් අත්පත් කරගත් ප්‍රතිලාභ උපරිම කිරීමට සුදුසු ලෙස කළමනාකරණය කළ යුතුය. ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත මඟින් නියම කර ඇති සියළුම සංඛ්‍යාත වර්ණාවලිය ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් සිය වගකීම් ඉටු කිරීමට සහ සීමිත ජාතික සම්පතක් ලෙස ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලිය කාර්යක්ෂමව කළමනාකරණය කිරීමට කොමිෂන් සභාව සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ අංශයට බලය පවරා ඇත. ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 10(අ) වගන්තිය යටතේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) ශ්‍රී ලංකාවේ ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලියේ භාවිතය සහ ස්ථාවර වන්දිකා කක්ෂයට අදාළ කරුණු කළමනාකරණය සහ පාලනය සිදු කරන අතර ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලි භාවිතය අවලංගු කිරීමට හෝ අත්හිටුවීමට හෝ එවැනි සංඛ්‍යාත භාවිතය තහනම් කිරීමට අවශ්‍ය යැයි හැඟෙන විට බලය ක්‍රියාත්මක කරන ශ්‍රී ලංකාවේ එකම නීත්‍යානුකූල අධිකාරිය වේ. ගුවන් විදුලි සන්නිවේදන සේවා භාවිතා කරන්නන් සඳහා බලපත්‍ර නිකුත් කිරීම, ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලිය සංරක්ෂණය කිරීම සහ ගුවන්විදුලි සන්නිවේදන ස්ථාපනයන් මඟින් ඇතිවන විද්‍යුත් චුම්බක බාධා අවම කිරීම පිණිස නීතිරීතිවලට අනුකූලව ක්‍රියාත්මක කිරීම සඳහා පනතේ 22 වැනි වගන්තිය යටතේ කොමිෂන් සභාවට බලය පවරා ඇත.

තරඟකාරීත්ව අංශය

පාරිභෝගිකයින්ගේ සහ දුරකථන ක්‍රියාකරු සමාගම්වල අවශ්‍යතා සපුරාලන කාර්යක්ෂම, පරිපූර්ණ විදුලි සංදේශ සේවාවක් සැපයීම සඳහා තරඟකාරීත්ව අංශය නියාමන ක්‍රියාකාරකම් සිදු කරයි. මෙම අංශය විසින් විදුලි සංදේශ කර්මාන්තයේ සාධාරණ ගාස්තු සහ ගුණාත්මක සේවාවක් පවත්වාගෙන යන අතරම, අයක්‍රම කරුණු සහ අන්තර් සම්බන්ධතා සේවා නියාමනය කිරීම, කර්මාන්ත තොරතුරු ප්‍රකාශයට පත් කිරීම, ක්‍රියාකරු කාර්ය සාධනය විශ්ලේෂණය කිරීම, සහ අදාළ පාර්ශ්වයන්ට අවශ්‍ය උපදෙස් ලබා දීම සිදු කරයි. සේවා නොලබන සහ අඩු පහසුකම් සහිත ප්‍රදේශවලට විදුලි සංදේශ පහසුකම් සැපයීම සඳහා දුරකථන ක්‍රියාකරු සමාගම් ප්‍රවර්ධනය කිරීම මෙන්ම විදුලි සංදේශ බද්ද, ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරුවන්ගේ බද්ද, සෙලියුලර් කුලුනු බද්ද, ජංගම කෙටි පණිවිඩ සේවා බද්ද සහ සෙස් බද්ද එකතු කිරීම ද ඊට ඇතුළත් ය. නව සේවා සපයන විදුලි සංදේශ ක්ෂේත්‍රය ආශ්‍රිත විදේශීය විශේෂඥයින් දුරකථන ක්‍රියාකරුවන්ගේ ව්‍යාපෘති සඳහා අත්‍යවශ්‍ය වන අතර එවැනි වෘත්තිකයන්ගේ වීසා බලපත්‍ර සැකසීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කෙරේ.

අනුකූලතා සහ විමර්ශන අංශය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ එක් ප්‍රධාන අරමුණක් වන්නේ ශ්‍රී ලංකාව තුළ විශ්වසනීය හා කාර්යක්ෂම ජාතික සහ ජාත්‍යන්තර විදුලි සංදේශ සේවා සැපයීම සහතික කිරීමයි. මෙම කාර්යය සඳහා, විශ්වාසනීය, කාර්යක්ෂම සහ ගුණාත්මක විදුලි සංදේශ සේවාවක් සැපයීම සඳහා විදුලි සංදේශ සේවා සපයන්නන් ඔවුන්ගේ නියාමන වගකීම්වලට අනුකූල වන බව සහතික කිරීම සඳහා නියාමන ක්‍රියාමාර්ග ගත යුතුය. මේ සඳහා කර්මාන්තය පිළිබඳ අඛණ්ඩ නිරීක්ෂණ, විමර්ශන සහ බුද්ධි තොරතුරු සහ සුදුසු නියාමන ක්‍රියාමාර්ග බලාත්මක කිරීම අවශ්‍ය වේ. පාරිභෝගික පැමිණිලි සැකසීම සහ ඔවුන්ගේ ගැටලුවලට සාධාරණ විසඳුම් සෙවීම පාරිභෝගික තෘප්තියට සහ පැහැකඩ වැඩිදියුණු කිරීමට හේතු වේ. මෙම වගකීම් මෙහෙයවනු ලැබුවේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අනුකූලතා සහ විමර්ශන අංශය විසිනි.

ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා අංශය

ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත ප්‍රකාරව, මහජන විදුලි සංදේශ සේවා සැපයීමට අදාළ ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් රජයට උපදෙස් දීමේ බලය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සතු වන අතර ප්‍රතිපත්ති හා ජාත්‍යන්තර සම්බන්ධතා අංශය විදුලි සංදේශ රෙගුලාසි ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) හෝ ඊට අනුබද්ධ ආයතන සම්බන්ධීකරණය කිරීමේ වගකීම දරයි. පනතේ දක්වා ඇති එක් අරමුණක් වන්නේ විදුලි සංදේශ සහ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රවල නව තාක්ෂණික ක්‍රම දියුණු කිරීම සහ භාවිතය පිළිබඳ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීමයි. ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා අංශයට පර්යේෂණ අධ්‍යයනයන් සිදු කිරීම සඳහා දේශීය විශ්වවිද්‍යාල/පර්යේෂණ ආයතනවලට සහය වීමට කොමිෂන් සභාව විසින් බලය ලබා දී ඇත. විදුලි සංදේශ අංශයේ සංවර්ධනය සඳහා ජාත්‍යන්තර ප්‍රශස්ත භාවිතයන් ප්‍රවර්ධනය කිරීම සම්බන්ධ ජාත්‍යන්තර සහ දේශීය වැඩසටහන්/ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සම්බන්ධ වීමට ද මෙම අංශයට පැවරී ඇත.

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU), ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT) සහ දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමය (SATRC) වැනි විදුලි සංදේශ නියාමන ක්‍රියාකාරකම් සඳහා වගකිව යුතු ජාත්‍යන්තර ආයතනවල කේන්ද්‍රස්ථානය වශයෙන් ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා අංශය ක්‍රියා කරයි. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU), ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT) සහ දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමය (SATRC) හි සභාය ඇතිව මෙම අංශය නියාමනය, සම්බන්ධීකරණය සහ ආංශික සංවර්ධනය වැනි පුළුල් පරාසයක කටයුතු සිදු කරයි.

නීති අංශය

සියලුම නීතිමය සහ නියාමන ගැටළු සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත උපදෙස් ලබා දීමේදී නීති අංශය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මෙම අංශය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව පාර්ශවකරුවෙකු වන සියලුම නඩු කටයුතු කළමනාකරණය කරයි.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නියාමන කාර්යයන් සඳහා නීති අංශයේ කාර්යභාරය අවශ්‍ය වේ. 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ සංශෝධිත පනත සහ වෙනත් සෘජුව සම්බන්ධ නීතිරීති ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මඟින් සිදුකරන නියාමන ක්‍රියාකාරකම් වලදී නීතිමය අදහස් ලබාදීමේ වගකීම නීති අංශය සතු වේ.

විශේෂ ව්‍යාපෘති අංශය

විශේෂ ව්‍යාපෘති අංශය ජාතික අවශ්‍යතා සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ වගකීම දරයි.

අවශ්‍ය යටිතල පහසුකම් සපයා විදුලි සංදේශ ක්ෂේත්‍රය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මෙම අංශය ප්‍රධාන වශයෙන් සිදු කරයි. තවද, විදුලි සංදේශ ක්ෂේත්‍රයේ නව තාක්ෂණයන් හඳුන්වා දීමට හැකි වන පරිදි පර්යේෂණ ව්‍යාපෘති සිදු කිරීම ද මෙම අංශයට ඇතුළත් වේ.

පාලන සහ ආයතනික කටයුතු අංශය

සමස්ත සංවිධානයේ සුමට ක්‍රියාකාරිත්වය සඳහා අංශයේ කාර්යභාරය ඉතා වැදගත් වන අතර එහි විෂය පථය කාර්යයන් සහ වගකීම් රැසකින් සමන්විත වේ. මෙම අංශය මානව සම්පත් පරිපාලනය, කළමනාකරණය සහ සංවර්ධනය සහ ආයතනික කටයුතු සඳහා වගකිව යුතුය.

මෙම අංශයේ විෂය පථය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සහ අධීක්ෂණය කිරීම, සේවකයින්ට සිය සේවා ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම සඳහා හිතකර භෞතික පරිසරයක් පවත්වාගෙන යාම සහ නිර්මාණය කිරීමට සහ ආයතනය තුළ මෙන්ම සෙසු ආයතන සම්බන්ධීකරණය කිරීම දක්වා විහිදේ. තවද, මෙම අංශය විසින් කාර්ය මණ්ඩලය සඳහා කාර්යාල අවශ්‍යතා සහ උපකාරක පහසුකම් සැපයීම, කාර්ය මණ්ඩලයේ සුභසාධනය සහතික කිරීම, පුස්තකාල පහසුකම් සැපයීම සහ ආයතනයේ වැදගත් සිදුවීම් මාධ්‍ය ආවරණය කිරීම කළමනාකරණය කරයි.

මූල්‍ය අංශය

කොමිෂන් සභාවේ සියලුම අධීක්ෂණ කටයුතු ඇතුළත් මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් මූල්‍ය අංශය විසින් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ආදායම් එකතු කිරීම, ආදායම් සහ වියදම් වාර්තා කිරීම, අරමුදල් කළමනාකරණය සහ ආදායම් සහ වියදම් නිසි ලෙස වාර්තා කිරීම ප්‍රධාන කාර්යයන් වේ. එපමණක් නොව, මුදල් පාලනය සහ වියදම් කිරීමට අමතරව, විශේෂයෙන්ම මූල්‍ය රෙගුලාසිවලට අදාළ නීති රීති, චක්‍රලේඛ සහ කොමිෂන් සභා තීරණ වැනි ව්‍යවස්ථාපිත අවශ්‍යතා ද කාර්යයන් අතර වේ.

එසේම, රජය සහ අනෙකුත් පාර්ශ්වකරුවන් විසින් වැදගත් තීරණ ගැනීමට මහ පෙන්වන බැවින් නිවැරදි මූල්‍ය වාර්තා තබා ගැනීම සහ නඩත්තු කිරීම මූල්‍ය අංශයේ ප්‍රධාන වගකීම වේ. සියලුම රාජ්‍ය ආයතන මෙන්ම, ගනුදෙනුවල නිරවද්‍යතාවය සහ පරිපූර්ණ බව සම්බන්ධයෙන් මතයක් ප්‍රකාශ කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට මෙන්ම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් ප්‍රකාශයට පත් කරන ලද පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම, ගිණුම්කරණ ප්‍රමිති සහ සංකල්ප සමඟ අනුකූල සියලුම මූල්‍ය ප්‍රතිපත්ති සහ රජයේ මූල්‍ය රෙගුලාසිවලට අනුකූල මූල්‍ය පටිපාටි වන බව සහතික කිරීමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ද නීතියෙන් බැඳී සිටී. මූල්‍ය අංශය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය පරිපාලනය, පිරිවැය පාලනය සහ ඵලදායී හා කාර්යක්ෂම උපායමාර්ගික තීරණ ගැනීමේ කටයුතුවල ද නිරත වේ.

තොරතුරු තාක්ෂණ අංශය

තොරතුරු තාක්ෂණ (IT) අංශය අත්‍යවශ්‍ය පාර්ශවකරුවන් අතර හිතකර සේවා පරිසරයක් සැපයීම සඳහා අවශ්‍ය මෘදුකාංග, විසඳුම් සහ හාවිතාවන් ඒකාබද්ධ කරමින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව තුළ ඩිජිටල් පරිවර්තනය ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත. මෙමඟින් ආයතනයේ අභ්‍යන්තර හා බාහිර ක්‍රියා පටිපාටි ක්‍රමවත් කරන අතර කාර්ය මණ්ඩලයට සහ පාරිභෝගිකයින්ට තාක්ෂණයෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට හැකි වේ.

තොරතුරු තාක්ෂණ අංශය විසින් තොරතුරු තාක්ෂණය උපායශීලී ලෙස හාවිතා කිරීම ඩිජිටල් ලෙස ක්‍රියාත්මක වන ව්‍යාපාරවලට ඉඩ සැලසීමට උපකාරී වන අතරම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම්වල සඵලතාවය සහ කාර්යක්ෂමතාව සහ මෙහෙයුම් වැඩිදියුණු කිරීම සහතික කරයි. කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ හැකියාවන් ශක්තිමත් කිරීම සහ වත්මන් තාක්ෂණය සහ එය හාවිතා කරන ආකාරය පිළිබඳ ඔවුන්ගේ දැනුම වැඩිදියුණු කිරීම සඳහා අදාළ වැඩසටහන් ඉදිරිපත් කෙරේ.

අභ්‍යන්තර විගණන අංශය

අභ්‍යන්තර විගණනය යනු උපාය මාර්ග, අරමුණු සහ අවදානම් සලකා බලන; පාලනය, අවදානම් කළමනාකරණය සහ පාලන ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමේ ක්‍රම ඉදිරිපත් කිරීම දිරිගන්වන; සහ වෛෂයිකව අදාළ සහතිකය සපයන; ආයතනයට සහ එහි පාර්ශවකරුවන්ට වටිනාකමක් එකතු කිරීම අරමුණු කරගත් ස්වාධීන ක්‍රියාකාරකමකි.

එය දත්ත සහ ව්‍යාපාරික ක්‍රියාවලීන් පිළිබඳ ක්‍රමානුකූල විශ්ලේෂණ සහ තක්සේරු කිරීම් මත පදනම්ව අවබෝධය සහ නිර්දේශ ලබා දීමෙන් ආයතනයක පාලනය, කාර්යක්ෂමතාව, අවදානම් කළමනාකරණය සහ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා උත්ප්‍රේරකයකි.

අඛණ්ඩතාව සහ වගවීම සඳහා කැපවීමත් සමඟ, සංවිධානයක් තුළ අභ්‍යන්තර විගණනයේ විෂය පථය පුළුල් වේ. මෙහෙයුම්වල කාර්යක්ෂමතාවය, මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය, වංචා වැළැක්වීම සහ විමර්ශනය කිරීම, වත්කම් ආරක්ෂා කිරීම සහ නීති රීතිවලට අනුකූල වීම වැනි ක්ෂේත්‍ර ඊට ඇතුළත් විය හැකිය.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අනාගත දිශානතිය

- 17 වගන්තියේ බලපත්‍ර මාර්ගෝපදේශ සංශෝධනය කර අවසන් කිරීම, දුරකථන ක්‍රියාකරු සමාගම් සඳහා ජාල අනුමැතිය නිකුත් කිරීම, ඒකාබද්ධ බලපත්‍රය සඳහා බලපත්‍ර සැකිල්ල සකස් කිරීම.
- වර්තමාන විෂමතා පිළිබඳව ආමන්ත්‍රණය කරන පුළුල් කුළුණු ප්‍රතිසන්ධාන ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම, පවතින අංකන සැලැස්ම සමාලෝචනය කිරීම සහ ගාස්තු රහිත අංක සේවා හඳුන්වාදීම, ජංගම දුරකථන අංකය වෙනස් නොවී ජාල අතර මාරුවීමේ හැකියාව ක්‍රියාත්මක කිරීම සහ ජාල කටයුතු යටතේ කුලුනු භූමියේ විකිරණ මට්ටම මැනීම.
- 5G සඳහා වර්ණාවලි මාර්ග සිතියම සහ වර්ණාවලිය පැවරීම සම්පූර්ණ කිරීම, ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලි බලපත්‍ර රීති රාමුව හඳුන්වාදීම සහ වර්ණාවලි ගාස්තු සංශෝධනය කිරීම සහ කලාපීය වශයෙන් එකහ වූ සංඛ්‍යාත වෙන්කිරීමේ ජාතික වගුව සැකසීම වර්ණාවලිය කළමනාකරණය යටතේ ප්‍රධාන මුල පිරීම් ලෙස සැලකේ.
- ග්‍රාමීය ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම උදෙසා "ගමට සන්නිවේදනය" ව්‍යාපෘතිය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සහ ඩිජිටල් බෙදීම අවම කිරීම සඳහා ෆයිබර් තාක්ෂණය සහිතව ශ්‍රී ලංකාවේ සියලුම පාසල්වලට අධිවේගී අන්තර්ජාල සම්බන්ධතාව සැපයීම, කර්මාන්ත සංඛ්‍යාලේඛන එකතු කිරීම, කර්මාන්තයේ කාර්යසාධනය විශ්ලේෂණය කිරීම, නව ගාස්තු යෝජනා සැකසීම, අයක්‍රම ආශ්‍රිත තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දර්ශක ආශ්‍රිත අයක්‍රම සහ ජාත්‍යන්තර විදුලි සංදේශ ගාස්තු මිණුම් සලකුණු ගණනය කිරීම පිළිබඳව තරහකාරීත්ව අංශය යටතේ අවධානය යොමු කෙරේ.

- අනුකූලතා කාර්යයන්ට අනුව, සයිබර් හිරිහැර කිරීම කළමනාකරණය කිරීම, පාරිභෝගික පැමිණිලි මෙහෙයවීම, අනුමත නොකළ අයක්‍රම සහ අනුමත නොකළ උපකරණ කළමනාකරණය කිරීම සහ අවශ්‍ය නියාමන ක්‍රියාමාර්ග ගැනීම, ජාල විගණන පැවැත්වීම, බලපත්‍රවල අවශ්‍යතා පිළිපැදීම සහ නියම කර ඇති සේවා තත්ත්ව පරාමිතීන්වල ගුණාත්මකභාවය, සහ සාමාන්‍ය ජනතාව සඳහා දැනුවත් කිරීමේ ව්‍යාපාර පැවැත්වීම අවධානය යොමු කළ යුතු ප්‍රධාන කරුණු වලට ඇතුලත් වේ.

- දේශීය විශ්ව විද්‍යාලවල සහාය ඇතිව විදුලි සංදේශ පර්යේෂණ අධ්‍යයන පැවැත්වීම, දේශීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන සහ ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දින දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම, ජාත්‍යන්තර සංවිධාන සහ නියාමන ආයතන සමඟ සහයෝගිතා කටයුතු සංවිධානය කිරීම, අදාළ පාර්ශ්වයන්ගෙන් රැස් කරගත් දත්ත සම්පාදනය කිරීම සහ ලැබුණු සමීක්ෂණ/ප්‍රශ්නාවලියට ප්‍රතිචාර දැක්වීම. ජාත්‍යන්තර සංවිධාන වලින්, විශේෂඥ සහාය සහ පුහුණු අවස්ථා ලබා ගැනීම සඳහා ජාත්‍යන්තර සංවිධාන සම්බන්ධීකරණය කිරීම.

- කර්මාන්තයේ ශීඝ්‍ර දියුණුව සපුරාලීම සඳහා පනතට/නව පනතට සංශෝධන එක් කිරීම නීතිමය කටයුතු යටතේ සිදු කෙරෙන අතර නියාමන කොමිෂන් සභාව මෙහෙයවීමේ දී මූලික නිපුණතාව ලබා ගැනීම සහතික කිරීමෙහි ලා පාලන කටයුතු යටතේ බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය විධිමත් කිරීම.

- විශේෂ ව්‍යාපෘති යටතේ, කොළඹ නෙළුම් කුලුන විදුලි සෝපාන සහ විදුලි පඩිපෙළ විමර්ශනය කිරීම, කදිරාන ප්‍රතිසංස්කරණ සහ පුනරුත්ථාපන කටයුතු, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නව ප්‍රධාන කාර්යාල ගොඩනැගිලි වැඩ සහ සූර්ය ව්‍යාපෘතිය නිම කිරීමට සැලසුම් කර ඇත. තවද, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා වෙබ් අඩවිය ප්‍රතිනිර්මාණය කිරීම, නව පෞද්ගලික ස්වයංක්‍රීය ශාඛා හුවමාරු (PABX) පද්ධති ඒකාබද්ධ කිරීම සහ තොරතුරු සහ සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම තොරතුරු තාක්ෂණය යටතේ සිදු කෙරේ.

කොමිෂන් සභාව සහ විධායක කළමනාකාරිත්වය



මහාචාර්ය නිරංජන් ගුණවර්ධන
සභාපති

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නිරංජන් ගුණවර්ධන මහතා මොරටුව විශ්වවිද්‍යාලයට අනුයුක්තව සේවය කරන මහාචාර්යවරයෙකු වන අතර දැනට එහි උපකුලපති, ශ්‍රී ලංකා රජයේ තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම් සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සභාපති ලෙස කටයුතු කරයි. ඔහු වරලත් ඉංජිනේරුවෙක් වන අතර, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආයතනික සාමාජිකයෙක් සහ ශ්‍රී ලංකා ව්‍යාපෘති කළමනාකරුවන්ගේ ආයතනයේ (IPMSL) සාමාජිකයෙක් ද වේ.

ඔහු මොරටුව විශ්වවිද්‍යාලයෙන් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය ලබා ගත් අතර එක්සත් රාජධානියේ “Loughborough Technology”විශ්වවිද්‍යාලයෙන් විද්‍යාපති උපාධියක් සහ ආචාර්ය උපාධියක් ලබා ගත්තේය. මහාචාර්ය ගුණවර්ධන මහතා මොරටුව විශ්වවිද්‍යාලයේ නියෝජ්‍ය උපකුලපති, පීඨාධිපති (ව්‍යාපාර පීඨය) සහ අන්තර් විෂය අධ්‍යයන අංශයේ ප්‍රධානියා ලෙස ද කටයුතු කර ඇත. ඔහු එක්සත් රාජධානියේ බ්‍රිස්ටල් හි බටහිර එංගලන්ත විශ්වවිද්‍යාලයට අනුබද්ධ කොළඹ උසස් අධ්‍යාපන ආයතනයක් වන “Northshore College of Business and Technology”හි නිර්මාතෘ සහ අධ්‍යක්ෂවරයෙකි.



හෙළසිරි රණතුංග මහතා
අධ්‍යක්ෂ ජනරාල් (වැඩබලන)
අධ්‍යක්ෂ - ජාල

හෙළසිරි රණතුංග මහතා 1998 වසරේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සේවයට එක් විය. ඔහු මොරටුව විශ්වවිද්‍යාලයෙන් ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ ඉංජිනේරු ගෞරව උපාධිය සහ තොරතුරු තාක්ෂණ පශ්චාත් උපාධිය ලබාගෙන ඇති අතර ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) වරලත් ඉංජිනේරුවරයෙකි. 1986 වසරේ දී උපාධිය ලබාගැනීමෙන් අනතුරුව ඔහු ස්වාධීන රූපවාහිනී ජාලයට සම්බන්ධ වූ අතර ප්‍රධාන ඉංජිනේරු තනතුර දරා ඇත. ස්වාධීන රූපවාහිනී ජාලයේ වසර 12ක සිය වෘත්තීය ජීවිතය තුළ ඔහු එම විකාශන ආයතනයේ සම්ප්‍රේෂණ පුළුල් කිරීම, චිත්‍රාගාර සහ පාලන මැදිරි වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති කිහිපයකට නායකත්වය ලබාදෙන ලදී. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වසර 24ක ඔහුගේ සේවා කාලයේදී ජ්‍යෙෂ්ඨ තනතුරු කිහිපයක් දරා ඇත. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ගුවන් විදුලි සංඛ්‍යාත කළමනාකරණ සහ පිරික්සුම් පද්ධති ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘති කළමනාකරු ලෙස ඉතා ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කළේය. ඔහු වසර කිහිපයක් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ අංශයට නායකත්වය ලබාදෙන ලදී. ඔහුගේ වර්තමාන තනතුර වන අධ්‍යක්ෂ ජාල ලෙස වැඩ භාර ගැනීමට පෙර වසර කිහිපයක් බලපත්‍ර කළමනාකරණ අධ්‍යක්ෂ ලෙස සේවය කරන ලදී. මීට අමතරව, වර්තමානයේ ඔහු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වැඩබලන අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස ද කටයුතු කරයි.

ඔහුගේ වෘත්තීය ජීවිතය තුළ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන්, වැඩමුළු සහ සම්මන්ත්‍රණ වලට සහභාගී වීමෙන් විදුලි සංදේශ නියාමන ක්ෂේත්‍රය පිළිබඳව පුළුල් දැනුමක් ලබා ඇත. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය සහ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය විසින් සංවිධානය කරන ලද ලෝක ගුවන්විදුලි සන්නිවේදන සම්මන්ත්‍රණ සහ අනෙකුත් ගෝලීය විදුලි සංදේශ නියාමන රැස්වීම් කිහිපයකදී ඔහු ආයතනය නියෝජනය කළේය.



අනිල් මීගහගේ මහතා
කොමිෂන් සභා සාමාජික

අනිල් මීගහගේ මහතා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි අධ්‍යක්ෂවරයා වන අතර, ඔහු 2019 දෙසැම්බර් මාසයේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සඳහා කොමිෂන් සභා සාමාජිකයෙකු ලෙස පත් කර ඇත.

ඔහු EAP Holdings හි ජ්‍යෙෂ්ඨ විධායක, උප සභාපති/ප්‍රධාන විධායක නිලධාරී සහ එදිරිසිංහ විකාශන රූපවාහිනී/ගුවන් විදුලි/ EAP චිත්‍රපට යන අංශවල අධ්‍යක්ෂකවරයකු වශයෙන් කටයුතු කර ඇත. එමෙන්ම, 2012 සහ 2013 වසර වලදී ශ්‍රී ලංකාවේ Samsung Mobile හි ප්‍රධානියා ද විය.

මීට පෙර, ඔහු ශ්‍රී ලංකා සහ ජාත්‍යන්තර ව්‍යාපාරයක් වන හේමාස් පාරිභෝගික භාණ්ඩවල විකුණුම් සහ ජාත්‍යන්තර ව්‍යාපාර අධ්‍යක්ෂවරයා විය. රූපියල් බිලියන 10 පිරිවැටුම ලබා ගැනීම ඔහුගේ ජයග්‍රහණයක් වන අතර අලෙවි, මෙහෙයුම්, බෙදාහැරීම, පාරිභෝගික අලෙවිකරණය, ජාත්‍යන්තර ව්‍යාපාර සහ අලෙවි කළමනාකරණ කණ්ඩායම් යන ක්ෂේත්‍ර පිළිබඳව සෘජුවම ක්‍රියාකර ඇත. අලෙවි කණ්ඩායම් 235ක් සහ බෙදාහරින්නන් 108ක් විකුණුම් කළමනාකරණය යටතේ ඇතුලත් විය.

මීට පෙර දිවයිනේ විශාලතම අලෙවිකරණ සේවා සමූහයක් වන ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි සාමාන්‍යාධිකාරී ලෙස ශාඛා ජාලය, අලෙවි සහ විකුණුම් මෙන්ම සමස්ථ විකුණුම් කණ්ඩායම් 5000 සහ 1200ක් පමණ වූ කාර්ය මණ්ඩලයක් සම්බන්ධයෙන් ප්‍රධානත්වය ගෙන කටයුතු කළේය.

1988 දී යුනිලීවර් හා සම්බන්ධවී, අලෙවි විධායක, අලෙවි පරිපාලන කළමනාකරු, ප්‍රාදේශීය අලෙවි කළමණාකරු සහ නිවාස හා පුද්ගලික ආරක්ෂණය සම්බන්ධයෙන් සමූහ වෙළඳ කළමණාකරු වශයෙන් ප්‍රධාන තනතුරු රාශියක් දරන ලද අතර ක්‍රියාකාරී කළමනාකරු ලෙස නව වෙළඳ අංශයේ සේවයට එක් විය. වියට්නාම යුනිලීවර් ආයතනයේහි සේවය කිරීමෙන් පසුව එම ආයතනයේම නිවාස සහ පුද්ගලික ආරක්ෂණ අංශයේ වැනල් සංවර්ධන සහ වෙළඳ අලෙවි කළමනාකරු හා ෆාමසි සහ රූපලාවන්‍ය නාලිකාවේ ප්‍රධානියාද විය.

වෘත්තීමය වශයෙන් ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය ලබාගෙන සිටින අතර කොළඹ විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාධිය සඳහා

පෙනී සිටියි. එමෙන්ම අලෙවිකරණය පිළිබඳ වෘත්තීමය පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (DipM MCIM) හදාරා ඇති අතර එක්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනයේ CIM සහ ICSA සිසුන් සඳහා වසර 12 කට අධික කාලයක් දේශකයකු ලෙස කටයුතු කිරීමේ පළපුරුද්ද ඇත. වෘත්තීමය වශයෙන් ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය ලබාගෙන සිටින අතර කොළඹ විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාධිය සඳහා පෙනී සිටියි. එමෙන්ම අලෙවිකරණය පිළිබඳ වෘත්තීමය පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (DipM MCIM) හදාරා ඇති අතර එක්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනයේ CIM සහ ICSA සිසුන් සඳහා වසර 12 කට අධික කාලයක් දේශකයකු ලෙස කටයුතු කිරීමේ පළපුරුද්ද ඇත.



රුවන්ත කුරේ මහතා
කොමිෂන් සභා සාමාජික

රුවන්ත කුරේ මහතා වෘත්තීයෙන් නීතීඥවරයකු වන අතර ඔහු Leicester විශ්ව විද්‍යාලයෙන් නීතිවේදී ගෞරව උපාධිය (LL. B. (Hons)) සහ නීතිවේදියකු වශයෙන් Lincoln's Inn හි කටයුතු කර ඇත.

ඔහු වෙළඳ නීතිය, ගිවිසුම් නීතිය, බුද්ධිමය දේපළ නීතිය යනාදී විවිධ අංශ සම්බන්ධයෙන් පුළුල් පළපුරුද්දක් ඇති අතර නීති වෘත්තිකයකු ලෙස කීර්තිමත් වෘත්තීය පළපුරුද්දක් සහිත ජ්‍යෙෂ්ඨ නීති උපදේශකයකු වශයෙන් ක්‍රියාකාරීව සේවයේ යෙදී සිටී. එමෙන්ම ඔහු අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ඩිජිටල්කරණය සහ උසාවි ස්වයංක්‍රියකරනය පිළිබඳ නීති ප්‍රතිසංස්කරණ කමිටුවේ නීති උපදේශක සහ කැඳවුම්කරු ලෙස ද කටයුතු කරයි.

නීති ක්ෂේත්‍රයේ කැපී පෙනෙන ප්‍රවීන නීතීඥයකු වන කුරේ මහතා 2019 දෙසැම්බර් මාසයේදී කොමිෂන් සභා සාමාජිකයකු ලෙස පත් කරන ලදී. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ විගණන කමිටුවේ සාමාජිකයෙකි. රුවන්ත කුරේ මහතා කොමිෂන් සභාවේ නීතිමය සහ නියාමන කටයුතු කිහිපයකටම දායක වී ඇත.



වාමින්ද කුමාරසිරි මහතා
කොමිෂන් සභා සාමාජික

(2019.12.18 දින පත් කර 2022.06.07 දක්වා සේවය කරන ලදී.)

FCA, FCCA, ACMA, FMAAT, MBA, B. Sc. ගණකාධිකරණ (විශේෂ) පළමු පන්තියේ ගෞරව.

ජ්‍යෙෂ්ඨ වරලත් ගණකාධිකාරිවරයෙක්, ආයතනික පුහුණුකරුවෙක්, නායකත්ව පුහුණුකරුවෙක්, කළමනාකරණ උපදේශකයෙක් සහ මූල්‍ය උපදේශකයෙක් මෙන්ම ආයතනික අංශයේ දශක දෙකකට අධික පළපුරුද්ද ඇති වාමින්ද කුමාරසිරි මහතා ප්‍රමුඛපෙළේ දේශීය ව්‍යාපාරික ආයතන මෙන්ම බහුජාතික සමාගම්වල ජ්‍යෙෂ්ඨ නායකත්ව තනතුරු දරයි.

වෘත්තීය සහ අධ්‍යාපනික සුදුසුකම් රැසක් ලබා ඇති වාමින්ද මහතා සම්මාන සහ පදක්කම් ලාභියෙකි. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය, එක්සත් රාජධානියේ වරලත් සහතිකලත් ගණකාධිකාරිවරුන්ගේ සංගමය සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීය සංගමයේ සාමාජිකයෙකි. එමෙන්ම ශ්‍රී ලංකා සහතික ලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකි. වාමින්ද කුමාරසිරි මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී ගණකාධිකරන (විශේෂ) උපාධිය ප්‍රථම පන්තියේ සාමාර්ථයක් සහිතව සමත් වී ඇති අතර මූල්‍ය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී පශ්චාත් උපාධිය කොළඹ විශ්ව විද්‍යාලයෙන් සම්පූර්ණ කරන ලදී.

ඔහු දැනට ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සහ ජාතික ගණකාධිකාරී ආයතනයේ පාලක සභාවේ සාමාජිකයෙකු ලෙස සහ උපදේශකයකු/අධ්‍යක්ෂවරයෙකු ලෙස සමාගම් සහ ජාතික ආයතන කිහිපයකට ද සේවය කරයි. එමෙන්ම ජාත්‍යන්තර ගණකාධිකාරිවරුන්ගේ සම්මේලනයේ, ගිණුම්කරන අධ්‍යාපන ජාත්‍යන්තර මණ්ඩලයේද සාමාජිකයෙකු ලෙස පත් වී ඇති අතර සමස්ථ දකුණු ආසියාවේ එකම නියෝජිතයා ලෙස ඔහු එය නියෝජනය කරයි.



එච්. පී. කරුණාරත්න මහතා
අධ්‍යක්ෂ - සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණය

එච්. පී. කරුණාරත්න මහතා, 1992 වසරේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ස්ථාපිත කිරීමට පෙර හැඳින්වූ විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලයට ඉංජිනේරුවකු ලෙස සේවයට එක් විය. එමෙන්ම විදුලි සංදේශ නියාමන ආයතනයට සම්බන්ධවීමට පෙර ඔහු ශ්‍රී ලංකා විදුලි සංදේශ දෙපාර්තුමේන්තුවේ වසර 7කට වැඩි කාලයක් සේවය කර ඇත.

ඔහු එක්සත් රාජධානියේ ඉලෙක්ට්‍රොනික හා ගුවන් විදුලි ඉංජිනේරු ආයතනයේ උපාධි සාමාජිකත්වය ලබා 1995 වසරේදී එක්සත් රාජධානියේ ඉංජිනේරු කවුන්සිලයේ වරලත් ඉංජිනේරුවරයෙකු ලෙස ලියාපදිංචි විය. ඔහු බටහිර ඉන්දීය කොදෙව් විශ්ව විද්‍යාලයෙන් විදුලි සංදේශ ප්‍රතිපත්ති හා නියාමනය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබාගෙන ඇත.

විදුලි සංදේශ ක්ෂේත්‍රයේ වසර 30කට අධික කාලයක් පුරා විහිදුණු සිය වෘත්තීය ජීවිතය තුළ කරුණාරත්න මහතා ඉංජිනේරු, කළමනාකරණ, ජාත්‍යන්තර සබඳතා, විදුලි සංදේශ නියාමනය, බලපත්‍ර සහ ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණය යන විවිධ ක්ෂේත්‍ර වල කටයුතු කර ඇත.

එමෙන්ම ඔහු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ/බලපත්‍ර පරිපාලන, අධ්‍යක්ෂ/සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ, අධ්‍යක්ෂ/ජාල ඇතුළු ජ්‍යෙෂ්ඨ තනතුරු රැසක් හොබවා ඇත. දැනට කරුණාරත්න මහතා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ/සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ තනතුර දරයි. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ අංශයට ශ්‍රී ලංකාවේ සියලුම ගුවන් විදුලි සන්නිවේදන සේවා කළමනාකරණය කිරීමේ ප්‍රධාන වගකීම ඇත. සිවිල් සහ හමුදා සංඛ්‍යාත භාවිතය පිළිබඳ දත්ත සමුදාය සැලසුම් කිරීම, පැවරීම, අධීක්ෂණය කිරීම, පවත්වාගෙන යාම මෙයට ඇතුළත් වේ. සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ අංශයේ ප්‍රධානියා වන කරුණාරත්න මහතා, ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලියේ නව්‍යතාවය සහ කාර්යක්ෂමතාවය සහතික කරමින් ගුවන් විදුලි සංඛ්‍යාන වෙන් කිරීම සහ පැවරීම පිළිබඳ සාධාරණ, සමානාත්මතාවයෙන් යුතු පාරදෘශ්‍ය ක්‍රියාපටිපාටි සහ කොන්දේසි සඳහා වගකියනු ලැබේ.

ඔහු එක්සත් රාජධානියේ ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ (IET) සාමාජිකයෙකු වන අතර, එම ආයතනය සඳහා ජාත්‍යන්තර වෘත්තීය ලියාපදිංචි උපදේශකයෙකු ලෙස ද සේවය කරයි.



ඒ. උදයරාජන් මහතා
අධ්‍යක්ෂ - මූල්‍ය

උදයරාජන් මහතා 2022 නොවැම්බර් මාසයේ දී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සේවයට එක් වී ඇත. ඔහු ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකි. ඔහු ශ්‍රී ලංකා උසස් අධ්‍යාපන ආයතනයේ (SLIATE) උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව (HNDA) සම්පූර්ණ කර ඇති අතර ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද ලබා ඇත.

ඔහු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සේවයට එක් වීමට පෙර, ත්‍රිකුණාමලය සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී, නැගෙනහිර පළාත් සභාවේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී, ලෝක බැංකුවේ ව්‍යාපෘති දෙකක (EPC හි පුරනැගුම - NELSIP සහ LDSP) ව්‍යාපෘති ගණකාධිකාරී සහ තාක්ෂණ අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක යනාදී සම තනතුරුවල වසර 15ක් සේවය කර ඇත.



තරලිකා ලිවේරා මහත්මිය
අධ්‍යක්ෂ - අනුකූලතා සහ විමර්ශන (වැඩබලන)
අධ්‍යක්ෂ - තොරතුරු තාක්ෂණ (වැඩ ආවරණ)

තරලිකා ලිවේරා මහත්මිය 1994 වසරේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය ලෙස පැවති අවධියේ ඉංජිනේරුවරියක ලෙස සේවයට සම්බන්ධ වූ අතර විදුලි සංදේශ නියාමන ක්ෂේත්‍රය පිළිබඳව වසර 28කට අධික පුළුල් පළපුරුද්ද හෙබි නිලධාරිනියකි. වර්තමානයේ දී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ - අනුකූලතා සහ විමර්ශන (වැඩබලන) තනතුර හොබවයි.

ඇය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික විද්‍යා ගෞරව උපාධිය සහ එක්සත් රාජධානියේ Sheffield Hallam විශ්වවිද්‍යාලයෙන් ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ පශ්චාත් උපාධිය ලබාගෙන ඇත.

ලිවේරා මහත්මිය වෘත්තියෙන් වරලත් ඉංජිනේරුවරියක් (CEng) වන අතර එක්සත් රාජධානියේ ඉංජිනේරු කවුන්සිලයේ ලියාපදිංචි වී ඇත. ඇය එක්සත් රාජධානියේ ඉංජිනේරු සහ තාක්ෂණ ආයතනයේ සාමාජිකාවක් වන අතර ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ද ආශ්‍රිත සාමාජිකයෙකි. ඇය දකුණු ආසියාවේ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංසදයේ උප සභාපතිත්වය දරන අතර ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ “අධ්‍යයන කණ්ඩායම - 1”හි බ්‍රෝඩ්බෑන්ඩ් අධ්‍යයනය පිළිබඳ උප වාර්තාකරු ලෙස ද කටයුතු කර ඇත. ඇයගේ වෘත්තීය ජීවිතය තුළ, විදුලි සංදේශ ප්‍රතිපත්ති සහ නියාමනය පිළිබඳ පුළුල් ජාතික හා ජාත්‍යන්තර අත්දැකීම් ලබා ඇති අතර, උපායමාර්ගික තීරණ ක්‍රියාත්මක කිරීමට ඇයගේ එම අත්දැකීම් කොමිෂන් සභාවට බෙහෙවින් ප්‍රයෝජනවත් වී ඇත.



ඊ. එන්. පී. කේ රත්නපාල මහතා
අධ්‍යක්ෂ - බලපත්‍ර කළමනාකරණ (වැඩබලන)

ශ්‍රී ලාංකීය විදුලි සංදේශ නියාමන ක්ෂේත්‍රයේ වෘත්තීය ඉංජිනේරුවකු ලෙස වසර 28කට අධික වෘත්තීය ජීවිතය තුලින්, නිහාල් රත්නපාල මහතා ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණය පිළිබඳ පුළුල් පළපුරුද්දක් අත්කරගෙන ශ්‍රව්‍ය සහ දෘශ්‍ය විකාශන සේවා ඇතුළු ගුවන් විදුලි සන්නිවේදන ක්ෂේත්‍රයේ ප්‍රධාන ප්‍රවර්ධනයන් සඳහා දායක වී ඇත.

ඔහු පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ඉංජිනේරු ගෞරව උපාධිය සහ මොරටුව විශ්වවිද්‍යාලයේ ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ පශ්චාත් උපාධිය ලබාගෙන ඇත. ඔහු ඉංජිනේරු කවුන්සලයේ (එක්සත් රාජධානිය) ලියාපදිංචි වරලත් ඉංජිනේරුවකු වන අතර ඉංජිනේරු හා තාක්ෂණ ආයතනයේ (එක්සත් රාජධානිය) සාමාජිකයෙකි. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ද සාමාජිකයකු වේ.

වර්තමානයේ දී වැඩබලන අධ්‍යක්ෂ (සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ) වශයෙන් ක්‍රියා කරන ඔහුගේ සේවය රටේ සමස්ථ ගුවන්විදුලි සන්නිවේදන සේවා සැපයීම මෙහෙයවීමේ සිට සමාජයීය ශුභසාධනය ඉහළ නැංවීම සහ කාර්යක්ෂම භාවිතය ප්‍රවර්ධනය කිරීම පිණිස ශ්‍රී ලංකාවේ හෝ මුහුදු සීමාවේ ඕනෑම ප්‍රදේශයක හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වී ඇති ඕනෑම නෞකාවක හෝ ගුවන් යානයක ගුවන්විදුලි සංඛ්‍යාත භාවිතය නියාමනය කිරීම දක්වා විහිදෙන අතර ඔහු හිටපු බලපත්‍ර කළමනාකරණ අධ්‍යක්ෂවරයා ද (වැඩ බලන) වේ. ඔහු 1994 වසරේ සිට බොහෝ ජාත්‍යන්තර සංවිධාන ආශ්‍රයෙන් විදුලි සංදේශ ක්ෂේත්‍රය පිළිබඳ පුළුල් දැනුම මෙන්ම පළපුරුද්ද ලබාගෙන ඇති අතර ස්විස්ටර්ලන්තයේ ජිනීවාහි ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය විසින් පවත්වන ලද ලෝක ගුවන් විදුලි සන්නිවේදන සමුළුවේ ශ්‍රී ලංකා නියෝජිත පිරිසේ සාමාජිකයෙකු වශයෙන් ශ්‍රී ලංකාව නියෝජනය කරන වෙනත් කලාපීය නියාමන ක්‍රියාකාරකම් වලදී ද ශ්‍රී ලංකාව නියෝජනය කර ඇත.



කේ. එස්. එම්. විශාඛා මෙනවිය
අධ්‍යක්ෂ - ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සම්බන්ධතා (වැඩබලන)

කේ. එස්. එම්. විශාඛා මෙනවිය 1994 වසරේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය වශයෙන් පැවතුන අවධියේ එහි සේවයට සම්බන්ධ වී ඇත. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ විදුලි සංදේශ සහ නියාමන ක්ෂේත්‍රයේ වසර 28කට අධික පළපුරුද්දක් ඇය සතු වේ. ඇය දැනට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිපත්ති හා ජාත්‍යන්තර සබඳතා අංශයේ අධ්‍යක්ෂ (වැඩබලන) තනතුර දරයි. එමෙන්ම ඇය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වර්ණාවලි කළමනාකරණ සහ ජාල අංශවල නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ සහකාර අධ්‍යක්ෂ තනතුරු වල සේවය කර ඇත. ඇය සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ අංශයේ සහකාර අධ්‍යක්ෂ සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු වල වසර 17ක් සේවය කර ඇත. ඇය 2013 වසරේ සිට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ජාල අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරියක් ලෙස කටයුතු කරයි. ඇය සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ අංශයේ සේවයේ නිරත ව ගුවන්විදුලි සන්නිවේදනය පිළිබඳ අත්දැකීම් සම්භාරයක් ලබා ඇති අතර මෙම කාලය තුළ අංශය විසින් මෙහෙයවන ලද ප්‍රධාන ව්‍යාපෘති රැසකට දායක වී ඇත. එමෙන්ම ඇය ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ (ITU) ලෝක ගුවන්විදුලි සම්මන්ත්‍රණ (WRC) රැසක් වෙනුවෙන් ශ්‍රී ලංකාව නියෝජනය කළාය.

ඇය ජාල අංශයේ සේවය කරමින් අංකන සහ ජාලකරණ ක්ෂේත්‍රය පිළිබඳ පුළුල් දැනුමක් ලබා ඇත. ඇය දැනට නියෝජ්‍ය අධ්‍යක්ෂ/අංකන තනතුර හොබවන අතර දුරකථන අංකය වෙනස් නොවී ජාල අතර මාරුවීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතියේ අභ්‍යන්තර කමිටු සාමාජිකාවක් ලෙස එම ව්‍යාපෘතියට දායක වේ. එමෙන්ම ඇය ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU), ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT) මෙන්ම වෙනත් ජාත්‍යන්තර සංවිධාන රැස්වීම් රැසක් වෙනුවෙන් ශ්‍රී ලංකාව නියෝජනය කළාය.

ඇය 1993 වසරේ දී පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යා ගෞරව උපාධිය ලබා ගත්තාය. මොරටුව විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පශ්චාත් උපාධිධාරිනියක වන අතර එක්සත් රාජධානියේ ඉංජිනේරු සහ තාක්ෂණ ආයතනයේ (IET) වරලත් ඉංජිනේරුවරියක් සහ එක්සත් රාජධානියේ ඉංජිනේරු කවුන්සලයේ වරලත් සමාජිකාවක් ද වේ.



ඉංජිනේරු ජේ. ඒ. එස්. ගුණානන්දන
අධ්‍යක්ෂ - විශේෂ ව්‍යාපෘති (වැඩබලන)

ඉංජිනේරු ජේ. ඒ. එස්. ගුණානන්දන 1994 වසරේදී මොරටුව විශ්වවිද්‍යාලයෙන් සිය උපාධිය ලබා ගත් අතර, පෞද්ගලික අංශයේ කෙටි කාලයක් සේවය කිරීමෙන් අනතුරුව 1998 වසරේදී සහකාර අධ්‍යක්ෂ/අන්තර් ක්‍රියාකාරීත්ව ලෙස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සේවයට එක් විය. ඔහු සිය පශ්චාත් උපාධි අධ්‍යාපනය හදාරන ලද අතර ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයෙන් තොරතුරු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සහ පශ්චාත් උපාධිය ලබාගෙන ඇත.

වරලත් ඉංජිනේරුවරයකු වන ගුණානන්දන මහතා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සහ ශ්‍රී ලංකා ඉංජිනේරු කවුන්සලයේ ආයතනික සාමාජිකයකු වන අතර එක්සත් රාජධානියේ විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු ආයතනයේ සාමාජිකයෙකි.

ඔහු පසුගිය වසර 27 පුරා ශ්‍රී ලංකා මාතාව වෙනුවෙන් සිය සේවය කැප කර ඇති අතර, කොළඹ මහා රෝහල උසස් ඉලෙක්ට්‍රොනික වෛද්‍ය උපකරණ වලින් සවිබල ගැන්වූ අළෙවි සමාගමක ඉංජිනේරුවරයකු වශයෙන් සහ ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමට අනුබද්ධ සමාගමක් වූ සීමා සහිත ටෙලිකම්යුනිකේෂන් සර්විස් සමාගමේ සැපයුම් ණය වැඩසටහන යටතේ ක්‍රියාත්මක වූ දීප ව්‍යාප්ත විදුලි සංදේශ සේවා සංවර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති ඉංජිනේරුවරයකු ලෙස සේවය කර ඇත. සහකාර අධ්‍යක්ෂ/අන්තර් ක්‍රියාකාරීත්ව ලෙස ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා සුවිශේෂී සේවාවන් රැසක් ඉටු කර ඇති අතර විදුලි සංදේශ ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා රෙගුලාසි, මාර්ගෝපදේශ සහ පටිපාටි සකස් කිරීම සහ පාරිසරික, නියාමන සහ සමාජයීය සම්මතයන් සහ නීති ආරක්ෂා කරමින් ජාලගත කිරීම, මෙන්ම කාලගුණ විද්‍යා දෙපාර්තුමේන්තුව, කැලණි විශ්වවිද්‍යාල වැනි වෙනත් අදාළ ආයතන වල සහයෝගය ලබා ගනිමින් විදුලි සංදේශ ජාල සංවර්ධනය පිළිබඳව සමස්ථ ජනතාව දැනුවත් කිරීම ඔහු විසින් ඉටු කරන ලද සේවාවන් අතර වේ. ඉංජිනේරු ගුණානන්ද මහතා විසින් විදුලි සංදේශ ක්ෂේත්‍රය ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් සරල බසින් පොත් සහ මුද්‍රිත ලියවිලි කිහිපයක් රචනා කර ඇත.

ඉංජිනේරු ගුණානන්දන මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂ සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ වශයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සඳහා ගුවන්විදුලි වර්ණාවලි පිරික්සුම් පද්ධතිය වැඩිදියුණු කිරීම, ගුවන්විදුලි අවහිරතා පිළිබඳ ගැටළු නිරාකරණය කිරීම, අනවසර ගුවන්විදුලි සංඛ්‍යාත භාවිතය අවම කිරීම, විදුලි සංදේශ ක්ෂේත්‍රය මෙන්ම ආරක්ෂක සේවා සඳහා සංඛ්‍යාත වෙන් කිරීම සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දෙන ලදී. ව්‍යාපෘති කළමනාකරණය, කොන්ත්‍රාත් පරිපාලනය, සංඛ්‍යාත වර්ණාවලි පරිපාලනය විදුලි සංදේශ ජාල සංවර්ධනය පිළිබඳව පුළුල් පළපුරුද්ද සැලකිල්ලට ගනිමින් කොළඹ නෙළුම් කුලුනු, කදිරාන පිරික්සුම් සංකීර්ණය, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල සහ හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යානය ඇතුළු දැනට පවතින සියලුම යටිතල පහසුකම් සංවර්ධනය ව්‍යාපෘති කළමනාකරණය කිරීම සඳහා 2017 වසරේ දී විශේෂ ව්‍යාපෘති වැඩබලන අධ්‍යක්ෂවරයා ලෙස ගුණානන්දන මහතා පත් කරන ලදී.

එමෙන්ම ඔහු 2011 වසරේ සිට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ගුවන්විදුලි සංඛ්‍යාත පැවරුම් කමිටුවේ සාමාජිකයෙකි. ඉංජිනේරු ගුණානන්දන මහතා සමාජ සේවා සහ ස්වේච්ඡා සේවයේ ඉතා ක්‍රියාශීලීව කටයුතු කරන අතර සමාජයට ඔහු කළ විශිෂ්ට මෙහෙවර අගයමින් අධිකරණ අමාත්‍යාංශය විසින් ඔහුව මුළු දිවයිනේම සාම විනිසුරුවරයෙකු ලෙස පත් කර ඇත.



ඉන්ද්‍රජීත් හඳපාන්ගොඩ මහතා
අධ්‍යක්ෂ - තරහකාරීත්ව (වැඩබලන)

ඉන්ද්‍රජීත් හඳපාන්ගොඩ මහතා 1994 වසරේදී ශ්‍රී ලංකා Blue-Chip සමාගම් සමූහයේ විධායක නිලධාරිවරයෙකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කරන ලද අතර 1998 වසරේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මධ්‍යම කළමනාකාරීතවය සඳහා සේවයට එක් විය. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ආර්ථික කටයුතු අංශයේ සහ තරහකරීත්ව අංශයේ වසර 23ක සේවා කාලය තුළ ඔහු අන්තර් සම්බන්ධතාවය, අයක්‍රම, බලපත්‍ර, ආවේක්ෂණ යනාදී ප්‍රධාන නියාමන කාර්යයන් මෙහෙයවා ඇත. 2002 වසරේදී ඔහු ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර විදුලි සංදේශ සේවා ප්‍රතිපත්ති ලිහිල් කිරීමේ උපායමාර්ග සකස් කිරීමේ උපදේශන ක්‍රියාවලිය සම්බන්ධීකරණය කරන ලද අතර

එම උපායමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා දායක විය. 2000, 2001 සහ 2002 වසර වලදී ශ්‍රී ලංකා ටෙලිකොම්හි අයකුම තුලනය කිරීමේ ක්‍රියාවලිය මෙහෙයවන ලදී. ඔහු 2003 වසරේදී විදුලි සංදේශ ක්ෂේත්‍රයට අන්තර්සම්බන්ධතා රීති හඳුන්වාදීම සහ 1999 සහ 2010 වසර වලදී අන්තර්සම්බන්ධීය තීරණ නිකුත් කිරීමේ දී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් පවත්වන ලද එවැනි ප්‍රසිද්ධ විභාග දෙකකදී ඔහු මහජන විමර්ශන කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කළේය. දැනට ඔහු පාරිභෝගික පැමිණිලි ආරාවුල් නිරාකරණය කිරීමේ අභ්‍යන්තර කමිටුවේ (ICRCC) මූලසුන උසුලයි.

ඉන්ද්‍රජිත් මහතා 2008 වසරේදී දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ අන්තර්ජාල සම්මුති (IP) පාදක සේවා වල බිල්පත් සහ අයකුම පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ කණ්ඩායම් නායකයෙකු ලෙස දායක විය. එමෙන්ම ඔහු 2010/2011 වසර වලදී දකුණු ආසියානු විදුලි සංදේශ නියාකමයන්ගේ සංගමයේ ජාල සහ සේවා පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ සභාපති විය. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව නියෝජනය කරමින් ඉන්ද්‍රජිත් මහතා ඉන්දියාව, පාකිස්තානය සහ ශ්‍රී ලංකාවේ පැවති දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ රැස්වීම් වලට සහභාගි වූ අතර විදුලි සංදේශ ක්ෂේත්‍රයට අදාළ විවිධ විෂය කරුණු සම්බන්ධයෙන් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ අධ්‍යයන කණ්ඩායම් රැස්වීම්වලට ක්‍රියාකාරීව සහභාගී විය. ඔහුගේ වෘත්තිය ජීවිතය තුළ එක්සත් රාජධානියේ Coventry හි Cable and Wireless College විසින් පවත්වන ලද විදුලි සංදේශ විදුලි සංදේශ කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් ඇතුළු දේශීය සහ ජාත්‍යන්තර ආයතන මඟින් විදුලි සංදේශ ක්ෂේත්‍රය ආශ්‍රිත පුළුල් දැනුමක් සහ පුහුණුවක් ලබා ගත්තේය.

ඔහු ශ්‍රී ලංකා වරලත් වෘත්තීය කළමනාකරුවන්ගේ (CPM) සාමාජිකයකු වන අතර ශ්‍රී ලංකා ආර්ථික සංගමයේ (SLEA) යාවජීව සාමාජිකයෙකි. ඉන්ද්‍රජිත් මහතා පිළිවෙලින් කොළඹ විශ්ව විද්‍යාලය (ශ්‍රී ලංකාව) සහ Flinders විශ්වවිද්‍යාලය (දකුණු ඕස්ට්‍රේලියාවෙන්) යන විශ්ව විද්‍යාලවලින් ව්‍යාපාර පරිපාලනය (MBA) සහ රාජ්‍ය පරිපාලනය (MPA) පශ්චාත් උපාධි දෙකක් ලබා ඇති අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යාව (ගෞරව) උපාධිධාරියෙකි.



රුවනි ගුණරත්න මහත්මිය
අධ්‍යක්ෂ – නීති කටයුතු (වැඩබලන)

වෘත්තියෙන් නීතිඥවරියක් වන රුවනි ගුණරත්න මහත්මිය කොළඹ විශ්ව විද්‍යාලයෙන් නීතිවේදී උපාධිය ලබා ඇත.

ඇය දැනට වැඩබලන අධ්‍යක්ෂ/නීති කටයුතු තනතුර දරයි. ඇය කොමිෂන් සභාවේ නීති අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරියක ලෙස විවිධ නීතිමය කරුණු මෙහෙයවයි. මීට අමතරව, ආයතනික නීතිමය ගැටළු විධිමත් කිරීම සඳහා ඇය ඉතා වැදගත් සේවාවක් සපයයි.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වසර 23ක පළපුරුද්ද සමඟින් නීති ක්ෂේත්‍රයේ වසර 27කට වැඩි අත්දැකීම් ඇය සතුවේ. ඇය 2011 වසරේ සිට කොමිෂන් සභාවේ වැඩ බලන ලේකම්වරිය ලෙස කටයුතු කළාය. එමෙන්ම ඇය කොමිෂන් සභාවේ පාරිභෝගික පැමිණිලි නිරාකරණය කිරීමේ උපදේශන කමිටුවේ ද සාමාජිකාවකි.



සාලිය ගුණරත්න මහතා
අධ්‍යක්ෂ - පාලන සහ ආයතනික කටයුතු (වැඩ ආවරණ)

සාලිය ගුණරත්න මහතා 2022 අගෝස්තු මාසයේ සිට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ / පාලන සහ ආයතනික කටයුතු තනතුරේ වැඩ ආවරණය කිරීම සඳහා පත් කරන ලදී. ඔහු 2020 දෙසැම්බර් සිට සහකාර අධ්‍යක්ෂ මානව සම්පත් ලෙස කටයුතු කරයි. ඔහු ආයතනයේ පාලන, ආයතනික කටයුතු සහ මානව සම්පත් සංවර්ධන කාර්යභාරය සඳහා වගකියනු ලැබේ. ඔහු අත්දැකීම් සම්භාරයක් ඇති ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ නිලධාරියෙකි. ඔහු e-HRM සහ IT ආශ්‍රිත මානව සම්පත් කළමනාකරණ පද්ධතිය කාර්ය මණ්ඩලයට හඳුන්වා දුන් කමිටු සාමාජිකයෙක් විය. ඔහු ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙන් නීතිවේදී උපාධිධාරියෙකි. ඔහු ශ්‍රී ලංකා ගණකාධිකරණ කාර්මික ශිල්පීය ආයතනයේ අවසන් විභාගය සමත් වූ නිලධාරියෙකු වේ.

ගුණරත්න මහතා රාජ්‍ය කළමනාකරණ සහකාරවරයකු වශයෙන් සිය වෘත්තීය ජීවිතය ආරම්භ කර ඇත. වෘත්තීය පරිපාලකයෙකු ලෙස ඔහු ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ පරිපාලන නිලධාරි තනතුර සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සහකාර ලේකම් ලෙස කටයුතු කර ඇත. ඔහු කොමිෂන් සභාවේ සේවයට එක්වීමට පෙර ආගමන විගමන දෙපාර්තුමේන්තුවේ සහකාර පාලකවරයා ලෙස කටයුතු කරමින් සිටියේය.



ජගත් රත්නායක මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ/ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා, වැඩබලන නියෝජ්‍ය අධ්‍යක්ෂ/ආයතනික කටයුතු

ජගත් රත්නායක මහතා 1998 මැයි 22 දින සහකාර අධ්‍යක්ෂක ප්‍රතිපත්ති වශයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සේවයට එක් විය. ඔහු පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය සහ සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත. ඔහු ජපානයේ ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයේ ප්‍රතිපත්ති සහ රෙගුලාසි, ස්වීඩනයේ බ්ලෙකින්ග් තාක්ෂණ ආයතනයේ විදුලි සංදේශ වෙළඳපොළ ප්‍රතිපත්ති සහ විවෘත විදුලි සංදේශ වෙළඳපල සහ කැනඩාවේ විදුලි සංදේශ කළමනාකරණ ආයතනයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සංවර්ධන හා කළමනාකරණ විෂයයන් හැදෑරිය.

1991 දී උපාධිය ලැබීමෙන් පසු ඔහු DANIDA ආයතනයේ කනිෂ්ඨ සමාජ විද්‍යාඥයෙකු ලෙස මෙන්ම 1993 දී නිවාස අමාත්‍යාංශයේ CWSSP වැඩසටහන් ඒකකයේ ජ්‍යෙෂ්ඨ ප්‍රජා සම්බන්ධතා නිලධාරී ලෙස ද සේවය කළේය. ඔහු ප්‍රජා සංවර්ධනය, බලමුලු ගැන්වීම, සහභාගීත්ව තක්සේරු කිරීම් සහ හවුල්කාර සංවිධාන සංවර්ධන වැඩසටහන් කිහිපයක නායකත්වය ලබා ගත් අතර පුහුණුකරු සම්පත් දායකයෙකු ලෙස සහභාගී විය. ඔහු IFS සහ Smithsonian ව්‍යාපෘතිවල පර්යේෂණ සහකරුවෙකු ලෙස ද සේවය කළේය.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වසර 24 කට වැඩි සේවා පළපුරුද්දක් ඔහු සතු වන අතර දැනට නියෝජ්‍ය අධ්‍යක්ෂ/ප්‍රතිපත්ති සහ වැඩබලන නියෝජ්‍ය අධ්‍යක්ෂ/ආයතනික කටයුතු යන තනතුරු දරයි. විශ්ව විද්‍යාල සහ පර්යේෂණ ආයතනවල සහාය ඇතිව ප්‍රතිපත්ති ක්‍රියාකාරකම්, ව්‍යාපෘති, පර්යේෂණ සහ සංවර්ධනය, ජාත්‍යන්තර ප්‍රශස්ත භාවිතයන් හඳුන්වාදීම, හදිසි ආපදා සන්නිවේදනය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන් වලට සහාය වූ අතර ආයතනික අධ්‍යයන කටයුතු වල ද ඔහු නිරත විය. තවද, ඔහුගේ කැපවීම මත ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තා සම්මාන තරඟාවලියේ ප්‍රමුඛ ස්ථානයක් ලබා ගැනීමට හැකි වූ අතර ව්‍යවස්ථාපිත සහ රාජ්‍ය යන දෙඅංශයේම ආයතන අතුරින් හොඳම වාර්ෂික වාර්තාව ලෙස සම්මාන දිනා ගත්තේය. ඔහු ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ පාසල හා ප්‍රජාව සම්බන්ධීකරණ ව්‍යාපෘතිය සඳහා දේශීය විශේෂඥයෙකු ලෙස ද තෝරා ගන්නා ලදී. ඔහු සම්මන්ත්‍රණ සම්බන්ධීකරණය කළ අතර පුහුණුවීම්, දැනුවත් කිරීම් සහ ප්‍රදර්ශන වැඩසටහන් සඳහා සම්පත් දායකයෙකු ලෙස සහභාගී විය. ඔහු ජාත්‍යන්තර මෙන්ම දේශීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන්, විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින් තොරතුරු සන්නිවේදන තාක්ෂණයෙන් සවිබල ගැන්වීම (e-NABLE ව්‍යාපෘතිය) සහ ජාත්‍යන්තර විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනයේ වැඩසටහන් සංවර්ධනය සඳහා සිය විශේෂඥ දැනුමෙන් දායක විය. එසේම, ජාත්‍යන්තර සංවිධාන විසින් සංවිධානය කරන ලද සම්මන්ත්‍රණ සහ සෙසු විදුලි සංදේශ නියාමන රැස්වීම් කිහිපයක් වෙනුවෙන් ඔහු ආයතනය නියෝජනය කළේය.

මූලික විදුලි සංදේශ පහසුකම් පිළිබඳ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ආරම්භ කරන ලද පර්යේෂණ අධ්‍යයනයන් සඳහා දායකත්වය ලබාදීම, සහ ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතේ සේවා පහසුකම් නොසපයන ලද සහ අඩු පහසුකම් සහිත ප්‍රදේශ හඳුනා ගැනීම, ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය සහ මානුෂීය කටයුතු සම්බන්ධීකරණය පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය සමඟ එක්ව ශ්‍රී ලංකාවේ ආපදා සහ හදිසි අවස්ථා වලදී විදුලි සංදේශ භාවිතය පිළිබඳ නියමු අධ්‍යයනය, හදිසි විදුලි සංදේශ සහ ICO ගෝලීය සන්නිවේදනය පිළිබඳ කාර්ය කණ්ඩායම සහ ශ්‍රී ලංකාව තුළ පොදු ප්‍රවේශ හදිසි පද්ධතියක් ස්ථාපිත කිරීමේ ශක්‍යතාව පිළිබඳ අධ්‍යයනය සඳහා ඔහු දායක විය.



එච්. පී. එච්. එම් පතිරණ මිය
නියෝජ්‍ය අධ්‍යක්ෂ/පාරිභෝගික කටයුතු

මෙනකා පතිරණ මහත්මිය ජෝන් කීල්ස් සමූහ ව්‍යාපාරයේ ගිණුම් විධායකවරියක් ලෙසත්, සිනමාස් සමූහ ව්‍යාපාරයේ සමූහ අභ්‍යන්තර විගණකවරියක ලෙසත් 1994 වසරේදී සිය වෘත්තීය ජීවිතය ආරම්භ කරන ලදී. ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ (ගෞරව) උපාධිය සහ ඉන්දියාවේ මදුරෙයි කාමරාජ් විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත. කොමිෂන් සභාවේ මහපෙන්වීම මත ඇය පාරිභෝගික සම්බන්ධතා අංශයේ ප්‍රධාන නියාමන කාර්යයන් මෙහෙයවීම සඳහා අනුකූලතා අංශයට පත් කරන ලදී.

ඇය දැනට අනුකූලතා අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර දරයි. විදුලි සංදේශ කර්මාන්තය ආශ්‍රිත පාරිභෝගික කටයුතු මෙහෙයවීම, පාරිභෝගික ගැටළු සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ සන්නිවේදනයේ සහ මාධ්‍යයේ සදාචාරාත්මක භාවිතය පිළිබඳව දැනුවත් කිරීම ඇයගේ ප්‍රධාන කාර්යභාරය අතර වේ. එසේම, ඇය සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල, රජයේ පාසල්වල, සියලුම පොලිස් ස්ථානවල සහ අනෙකුත් සමාජ කණ්ඩායම්වල පාරිභෝගිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා ආරාධිත දේශකයකු ලෙස ද කටයුතු කළාය. තවද, ඇය පාරිභෝගික පැමිණිලි නිරාකරණය කිරීමේ අභ්‍යන්තර කමිටුව (ICRCC) සම්බන්ධීකරණය කරයි. ඇය ශ්‍රී ලංකා වරලත් වෘත්තීය කළමනාකරුවන්ගේ (CPM) ආයතනයේ ආශ්‍රිත සාමාජිකාවක් වන අතර ශ්‍රී ලංකා ආර්ථික සංගමයේ (SLEA) යාවජීව සාමාජිකාවකි. ඇයට මූල්‍ය හා නියාමන කටයුතු පිළිබඳ වසර 29 කට වැඩි අත්දැකීම් තිබේ. පතිරණ මහත්මිය ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය සහ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ රැස්වීම්වලදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව නියෝජනය කළ අතර කර්මාන්තයට අදාළ විවිධ විෂය කරුණු පිළිබඳ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ අධ්‍යයන කණ්ඩායම් රැස්වීම්වලට සහභාගී වූවාය. ඇය සිය වෘත්තීය ජීවිතය තුළ, දේශීය හා ජාත්‍යන්තර ආයතනවලින් විදුලි සංදේශ ක්ෂේත්‍රය සම්බන්ධ පුළුල් දැනුමක් සහ පුහුණුවක් ලබා ගත්තාය.



එල්. ගනේෂමූර්ති මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ/සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණය

එල්. ගනේෂමූර්ති මහතා පුද්ගලික ආයතනවල විවිධ තනතුරු දරා ඇති අතර 1997 වසරේ දී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හා සම්බන්ධ විය. ඔහු ශ්‍රී ලංකා පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යාවේදී (ඉංජිනේරු) උපාධිය සහ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයෙන් තොරතුරු කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය ලබා ගන්නා ලදී. ඔහු ඉංජිනේරු හා තාක්ෂණ ආයතනයේ (IET) සාමාජිකයෙකි. ඔහුට පරිගණක හා විදුලි සංදේශ ක්ෂේත්‍රයේ වෘත්තිකයෙකු ලෙස වසර 30කට අධික පළපුරුද්දක් ඇත. ඔහු 1993 වසරේ දී ශ්‍රී ලාංකීය පුද්ගලික සමාගමක පරිගණක ඉංජිනේරුවරයෙකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කර ඉංජිනේරු කළමනාකරු තනතුර දක්වා උසස් විය. ඔහු 1997 දී කොන්ත්‍රාත් පදනම මත ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ජාල

අංශයේ ඉංජිනේරුවරයෙකු ලෙස සම්බන්ධ වූ අතර පසුව ඔහුට සහකාර අධ්‍යක්ෂවරයෙකු ලෙස ස්ථිර තනතුරක් ලැබුණි. විදුලි සංදේශ ක්‍රියාකරු බලපත්‍ර සැකසීම සහ නිකුත් කිරීම, සංඛ්‍යාත වර්ණාවලිය සැලසුම් කිරීම, කළමනාකරණය, සම්බන්ධීකරණය, බලපත්‍ර නිකුත් කිරීම සහ එහි කොන්දේසි බලාත්මක කිරීම, ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ සම්මුතීන් සහ ගුවන්විදුලි රෙගුලාසි ප්‍රතිපාදන මත පදනම්ව සංඛ්‍යාත ප්‍රතිපාදන වගුව යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම වැනි ක්ෂේත්‍රවල ඔහුට පුළුල් පළපුරුද්දක් ඇත. ගෝලීය සමුද්‍රීය හදිසි ආරක්ෂණ පද්ධතිය පිළිබඳ විභාගය පැවැත්වීම සහ සාර්ථක අපේක්ෂකයින් සඳහා සහතික නිකුත් කිරීම ඔහුගේ රාජකාරිය යටතේ පවතී. ඔහු ශ්‍රී ලංකාව වෙනුවෙන් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය සහ ආසියා ශාන්තිකර විදුලි ප්‍රජාව විසින් විශේෂයෙන් සංවිධානය කරන ලද ජාත්‍යන්තර සහ කලාපීය සංසද කිහිපයක්ම නියෝජනය කළේය.



සී. එන්. පලිහවඩන මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ / අයකළම

නිශාන්ත පලිහවඩන මහතා 2003 වසරේ දී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සේවයට එක් වූ අතර කොළඹ විශ්වවිද්‍යාලයෙන් සංඛ්‍යානය පිළිබඳ විශේෂ උපාධිය ලබා ඇත. ඊට අමතරව, ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ (ශ්‍රාස්ත්‍රපති) උපාධිය සහ ව්‍යාපාර පරිපාලනය (ව්‍යාපාර පරිපාලනවේදී) උපාධිය යන ශාස්ත්‍රපති උපාධි දෙක ද ලබා ඇත. ඔහු ශ්‍රී ලංකාවේ වරලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු වන අතර සහතිකලත් ව්‍යාපාර ගණකාධිකාරීවරයෙකු ලෙස ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ සාමාජිකත්වය දරයි.

ඔහු දැනට තරහකාරිත්ව අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර දරයි. විදුලි සංදේශ කර්මාන්තයේ අයකළම අනුමැතීන් සැකසීම සහ අයකළම ආශ්‍රිත ගැටළු සම්බන්ධයෙන් කටයුතු කිරීම ඔහුගේ ප්‍රධාන කාර්යභාරය වේ. තවද, ඔහු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙහෙයවනු ලබන ජාතික මූල්‍ය අන්තර්ගත උපාය මාර්ග සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) විසින් මෙහෙයවනු ලබන කෘෂිකර්ම ඩිජිටල් පරිවර්තනය ව්‍යාපෘතියේ ක්‍රියාකාරී කමිටු සාමාජිකයෙකු ලෙසද කටයුතු කරයි. ඔහු ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ වැඩසටහන්වල ක්‍රියාකාරීව නිරත වන අතර ඔහු ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ අධ්‍යයන කණ්ඩායම් 3 ආසියානු කලාපයේ හිටපු උප සභාපතිවරයා විය.



එස්. ඒ. ආර්. කමලනයනා මිය
නියෝජ්‍ය අධ්‍යක්ෂ/ජාල

රමණි කමලනයනා මහත්මිය 2001 වසරේ දී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හා සම්බන්ධ වූ අතර ශ්‍රී ලංකා මොරටුව විශ්වවිද්‍යාලයෙන් ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ පිළිබඳ විද්‍යාවේදී ඉංජිනේරු උපාධියක් ලබා ඇත. ඇය ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ වරලත් ඉංජිනේරුවරියක වන අතර එහි ආශ්‍රිත සාමාජිකාවකි. ඇය සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ අංශයේ සහකාර අධ්‍යක්ෂ සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරුවල සේවය කර ඇති අතර ඇය ගුවන්, සමුද්‍රීය, පෞද්ගලික ජංගම ගුවන්විදුලි (PMR) සහ ජංගම සේවා භාරව සිටියාය. දැනට ඇය ජාල අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ/යටිතල පහසුකම් සංවර්ධන තනතුර දරයි. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ විවිධ අංශවල විවිධ තනතුරුවල වසර 22 ක සේවා පළපුරුද්දක් ඇති ඇය විදුලි සංදේශ ජාලයන්හි යටිතල පහසුකම් සංවර්ධනය කිරීමෙහිලා නායකත්වය සැපයීම සඳහා ශක්තිමත් කළමනාකරණ සහ තාක්ෂණික කුසලතා ඇය සතුය.

නියාමක වෘත්තිකයෙකු ලෙස, ඇය ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය, ආසියා-ශාන්තිකර විදුලි සංදේශ සංගමය, එක්සත් රාජධානියේ විදුලි සංදේශ පුහුණු ආයතනය, ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය ඇතුළු ජාත්‍යන්තර ආයතන විසින් සංවිධානය කරන ලද විදේශීය රැස්වීම්, වැඩමුළු, සම්මන්ත්‍රණ සහ පුහුණු වැඩසටහන් රැසකට සහභාගී වී ඇත.



එස්. ඊ. වාකිස්ට මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ / සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණය

එස්. ඊ. වාකිස්ට මහතා 2001 වසරේදී ඉංජිනේරුවරයකු වශයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සේවයට එක් විය. ඔහු මොරටුව විශ්වවිද්‍යාලයෙන් ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ විද්‍යාවේදී ඉංජිනේරු උපාධිය සහ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයෙන් තොරතුරු කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය ලබා ගත්තේය. ඔහු 2001 වසරේ සිට වරලත් ඉංජිනේරුවරයෙකු වන අතර ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සාමාජිකයෙකි. විදුලි සංදේශ කර්මාන්තයේ වෘත්තිකයෙකු වශයෙන් වසර 27 කට වැඩි පළපුරුද්දක් ඔහු සතුය. ඔහු 1995 වසරේ දී ඉංජිනේරුවෙකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ අතර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) සේවයට එක්වීමට පෙර පෞද්ගලික සහ රාජ්‍ය ආයතනවල සේවය කළේය. ඔහු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ අංශයට සම්බන්ධ විය. 2011 වසරේ සිට ඔහු ජාල අංශයට මාරු වී නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස උසස්වීම් ලැබීය. ඔහු විදුලි සංදේශ ක්‍රියාකරු බලපත්‍ර සැකසීම සහ නිකුත් කිරීම, සංඛ්‍යාත වර්ණාවලි අධීක්ෂණය සහ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ (ITU) ගුවන්විදුලි රෙගුලාසිවල විධිවිධාන මත පදනම් වූ විමර්ශන කටයුතු වැනි ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පුළුල් පළපුරුද්දක් ඇත. ඔහු ශ්‍රී ලංකාව වෙනුවෙන් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය සහ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය විසින් විශේෂයෙන් සංවිධානය කරන ලද ජාත්‍යන්තර සහ කලාපීය සමූළු කිහිපයක් නියෝජනය කළේය.



එම්. පී. ගුණසිංහ මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ / සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණය

මුදිත ගුණසිංහ මහතා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) නියෝජ්‍ය අධ්‍යක්ෂ - විකාශන සහ වර්ණාවලි සැලසුම් වශයෙන් සංඛ්‍යාත වර්ණාවලිය කළමනාකරණ අංශයට අනුයුක්තව සේවය කරයි. ඔහුට විදුලි සංදේශ නියාමනය පිළිබඳ වසර 20කට අධික පළපුරුද්ද ඇතුළුව සමස්ථ විදුලි සංදේශ ක්ෂේත්‍රයේ වසර 25කට වැඩි පළපුරුද්දක් ඇත. ගුණසිංහ මහතා පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය සහ එම විශ්ව විද්‍යාලයෙන්ම විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය ලබා ඇත. ඔහු වරලත් ඉංජිනේරුවෙකු වන අතර ශ්‍රී ලංකා ඉංජිනේරු සංගමයේ (ECSL) සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) සාමාජිකයෙකි. ගුණසිංහ මහතා එක්සත් රාජධානියේ ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ (IET) සහ ඇමරිකා එක්සත්

ජනපදයේ විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු ආයතනයේ (IEEE) සාමාජිකයෙකි.



ජී. සී. පී. මොරගොඩ මිය
නියෝජ්‍ය අධ්‍යක්ෂ/නීති

ගෞරව මොරගොඩ මහත්මිය 1997 වසරේ දී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සේවයට එක් වුණි. ඇය නීතිඥවරියක් වන අතර, කොළඹ විශ්වවිද්‍යාලයෙන් නීතිවේදී උපාධිය සහ එක්සත් රාජධානියේ Strathclyde විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්ෂණ හා විදුලි සංදේශ නීතිය පිළිබඳ නීතිපති උපාධිය ලබා ඇත. ඇය එක්සත් රාජධානියේ සහ අයර්ලන්තයේ වරලත් පාලන ආයතනයේ ආශ්‍රිත සාමාජිකාවක් වන අතර ඕස්ට්‍රේලියාවේ අපරාධ සහ යුක්තිය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරයි. කොමිෂන් සභාවේ ඇයගේ අත්දැකීම් වසර 22 කට වඩා වැඩි වන අතර දැනට නියෝජ්‍ය අධ්‍යක්ෂ (නීති) තනතුර දරයි. ඇයගේ මූලික කාර්යය ලෙස ඇය විවිධ නීතිමය කටයුතුවලදී කොමිෂන් සභාවට උපදෙස් දෙන අතර කොමිෂන් සභාවේ තීරණ අභියෝගයට ලක් වූ ප්‍රධාන අවස්ථා රැසකට සම්බන්ධ වී ඇත. ඇය කොමිෂන් සභාවේ බොහෝ නීති, රීති රෙගුලාසි සහ මාර්ගෝපදේශ කෙටුම්පත් කර ඇති අතර විදුලි සංදේශ සහ විකාශන නීති කෙටුම්පත් කමිටු සඳහා සහභාගී වී ඇත. ඇය ජාත්‍යන්තර සහ දේශීය සම්මන්ත්‍රණ, රැස්වීම්, වැඩමුළු, සංසද සහ පුහුණුවීම් රැසකට සහභාගී වී සම්පත් දායකයෙකු ලෙසද කටයුතු කර ඇත. ඇය ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ලෝක විදුලි සංදේශ සංවර්ධන සමුළුව (WTDC), ජාත්‍යන්තර විදුලි සංදේශ පිළිබඳ ලෝක සම්මේලනය (WCIT) සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කර ඇත.

මොරගොඩ මහත්මියට නීති ක්ෂේත්‍රය පිළිබඳව වසර 30කට වැඩි පළපුරුද්දක් ඇත. කොමිෂන් සභාවේ සේවයට එක්වීමට පෙර ඇය පෞද්ගලික අංශයේ මෙන්ම පෞද්ගලික නීති ආයතනයන්හී සේවය කර ඇති අතර, එය කොමිෂන් සභාර්ථක කාර්ය සාධනය සඳහා ඇයට මූලික අඩිතාලම සපයා ඇත.

කොමිෂන් සභාවේ සුබසාධන කටයුතු රැසකට නිරතුරුව සක්‍රීයව සහභාගි වූ ඇය සුබසාධන කටයුතු සංවිධානය කිරීමට නායකත්වය ලබා දුන්නාය.



එල්. එස්. පී. රුදිගු මෙනවිය
නියෝජ්‍ය අධ්‍යක්ෂ/නීති

සුජීවා රුදිගු මහත්මියට විදුලි සංදේශ නියාමන කටයුතු පිළිබඳ වසර 17කට වැඩි පළපුරුද්දක් ඇති අතර නීති අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස කටයුතු කරයි. ඇය තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සඳහා පත් කරන ලද තොරතුරු නිලධාරිනිය ද වේ.

ඇය විදුලි සංදේශ ආශ්‍රිත ගැටළු සහ නීති ගැටළු කිහිපයක් සම්බන්ධයෙන් ඇයගේ නීතිමය ශක්‍යතාවය තුළ සේවය ලබා දී ඇත.

නීතිවේදී උපාධියක් ලබා ඇති සුජීවා රුදිගු මහත්මිය වෘත්තියෙන් නීතිඥවරියක්, නොතාරිස්වරියක් සහ ලියාපදිංචි සමාගම් ලේකම්වරියක් ලෙස කටයුතු කරයි. නීති ක්ෂේත්‍රයේ ඇයගේ අත්දැකීම් වසර 23කට අධිකය. ඇය විවිධ නීතිමය කරුණු සම්බන්ධයෙන් අධිකරණයේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව නියෝජනය කර ඇත.



ආර්. ආර්. සමන් කිත්සිරි මහතා
අභ්‍යන්තර විගණක

කිත්සිරි මහතා 2014 වසරේ දී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සේවයට එක් විය. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධිය සහ කැලණිය විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ සහ ශ්‍රී ලංකා සහතික ලත් කළමනාකාරිත්ව ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු වන අතර, එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ උසස් ඩිප්ලෝමාධාරියෙකි.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හා සම්බන්ධ වීමට පෙර, කිත්සිරි මහතා ශ්‍රී ලංකාවේ බොහෝ පිළිගත් නිෂ්පාදන, වෙළඳ සහ සේවා ආයතනවල සමූහ ගණකාධිකාරී, අභ්‍යන්තර විගණක සහ මූල්‍ය කළමනාකරු වැනි ජ්‍යෙෂ්ඨ තනතුරු දරමින් අභ්‍යන්තර විගණනය, මූල්‍ය සහ බදු සම්බන්ධයෙන් වසර 16 කට වැඩි පළපුරුද්දක් ලබා ඇත.



අයි. එම්. ජවුසි මහතා
සහකාර අධ්‍යක්ෂ/ජාල

අයි. එම්. ජවුසි මහතා 1991 මාර්තු මාසයේදී පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් සිය ප්‍රථම උපාධිය වන විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විශේෂ උපාධිය සම්පූර්ණ කළේය. ඔහු පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ විදුලි ඉංජිනේරු සහ ඉංජිනේරු ගණිත අංශයේ උපදේශකයෙකු ලෙස 1993 මාර්තු දක්වා සේවය කළේය. ඔහු ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) ආශ්‍රිත සාමාජිකයෙකි.

ජවුසි මහතා 1993 ජුනි මාසයේදී විදුලි සංදේශ ඉංජිනේරුවරයකු ලෙස විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලයට (නියාමන ආයතනය) සම්බන්ධ වූ අතර 1998 පෙබරවාරි දක්වා ඉංජිනේරු/තාක්ෂණික ප්‍රමිති ලෙස සේවය කළේය.

ඔහු 1998 පෙබරවාරි මාසයේදී ඉංජිනේරු/නඩත්තු වශයෙන් විදුලි සංදේශ අමාත්‍යාංශයට අනුයුක්ත කරන ලද අතර 2000 ජූනි මාසයේදී නැවත ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) සේවයේ පිහිටුවන ලදී. ඔහු 2013 මාර්තු දක්වා සහකාර අධ්‍යක්ෂ/ ජාත්‍යන්තර සබඳතා ලෙස සේවය කළේය. වර්තමානයේ දී සහකාර අධ්‍යක්ෂ/ වෙළඳ බලපත්‍ර සහ මාදිලි අනුමැතිය වශයෙන් කටයුතු කරයි.

ඔහු ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය සහ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය විසින් විශේෂයෙන් සංවිධානය කරන ලද ජාත්‍යන්තර සහ කලාපීය සමුළු කිහිපයක්ම ශ්‍රී ලංකාව වෙනුවෙන් නියෝජනය කළේය. ඔහු විදුලි සංදේශ නියාමනය ඇතුළුව විදුලි සංදේශ ක්ෂේත්‍රය පිළිබඳව වසර 30 ක පළපුරුද්දක් ලබා ඇත.



අයි. එන්. මැතිව් මහතා
සහකාර අධ්‍යක්ෂ/නීති

ඉන්දික නලින්ද මැතිව් මහතා නීතීඥවරයෙකු වන අතර වෘත්තියෙන් නොතාරිස්වරයෙකුද වේ. ඔහු 2002 වසරේ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ උසස් අධ්‍යාපනය ලබා ඇත. ඔහු 2002 සිට 2011 දක්වා බී. එන්. තුරෙයිරාජා සහ සම නීතීඥ සමාගමේ නීති සහකාරවරයෙකු ලෙස සේවය කළේය.

මැතිව් මහතා 2012 වසරේ දී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සේවයට එක්වූ අතර සහකාර අධ්‍යක්ෂක නීති තනතුර දරයි. ඔහු ආයතනයේ විදුලි සංදේශ නියාමනය සම්බන්ධයෙන් විවිධ නීතිමය කටයුතු සිදු කරයි.

ඔහු අංශයේ නීතිමය කටයුතු මෙහෙයවමින් අධිකරණමය කටයුතු වලදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව නියෝජනය කර ඇත. ඔහු විදුලි සංදේශ නියාමනය ආශ්‍රිත නීති කටයුතු පිළිබඳ වසර 10 ක පළපුරුද්දක් ලබා ඇත.



එල්. ඩී. ජයවික්‍රම මෙනවිය
සහකාර අධ්‍යක්ෂ/මුදල්

දීපිකා ජයවික්‍රම මෙනවිය 2019 වසරේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සේවයට එක් වී ඇත. ඇය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ ආශ්‍රිත සාමාජිකාවක් (ACA) වන අතර ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී කළමනාකරණ රාජ්‍ය පරිපාලන (විශේෂ) දෙවන ඉහළ පන්තියේ උපාධියක් ලබා ඇත.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සේවයට එක්වීමට පෙර, ජයවික්‍රම මෙනවිය ශ්‍රී ලංකාවේ කීර්තිමත් පෞද්ගලික සහ රාජ්‍ය ආයතනවල ජ්‍යෙෂ්ඨ කළමනාකාර තනතුරු දරමින් වසර 10කට වැඩි ගිණුම්කරණ, මූල්‍ය සහ විගණන පළපුරුද්ද ලබා ඇත.



ඩබ්ලිව්. ඒ. ඩී. ටී. මධුශංක
සහකාර අධ්‍යක්ෂ/ සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණය

ඩබ්. ඒ. ටී. ඩී. මධුෂංක මහතා 2018 වසරේ දී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට (TRCSL) සම්බන්ධ වූ අතර ශ්‍රී ලංකා මොරටුව විශ්වවිද්‍යාලයෙන් ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ පිළිබඳ විද්‍යාවේදී (ඉන්ජිනේරු) උපාධිය ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) ආශ්‍රිත සාමාජිකයෙකු, විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු ආයතනයේ (IEEE) සාමාජිකයෙකු සහ ඉංජිනේරු හා තාක්ෂණ ආයතනයේ (IET) සාමාජිකයෙකු වේ. විදුලි සංදේශ ඉංජිනේරු, විදුලි ඉංජිනේරු සහ ව්‍යාපෘති කළමනාකරණ අංශයේ වසර 11 ක සේවා පළපුරුද්දක් ඇති ඔහු ආයතනික අරමුණු ඵලදායී ලෙස ළඟා කර ගැනීමට අවශ්‍ය ශක්තිමත් කළමනාකරණ සහ තාක්ෂණික කුසලතා ලබා ඇත.

2011 වසරේ දී ඔහු ලංකා බෙල් සමාගමේ පුහුණු ඉංජිනේරු - ස්විචිකරණ ලෙස සේවයට එක් වූ අතර, පසුව ඔහු සීමාසහිත මොබිටෙල් (පෞද්ගලික) සමාගම හා සම්බන්ධ විය. ගුවන්විදුලි ජාල සැලසුම් සහ ප්‍රශස්තකරණ අධීක්ෂණ ඉංජිනේරුවරයෙකු ලෙස මොබිටෙල් සමාගමේ වසර 4 යි මාස 3 ක සේවා කාලයෙන් පසු, ඔහු මාලදිවයිනේ, මාලේ, සීමාසහිත Rishthaa (පුද්ගලික) සමාගමේ විදුලි ඉංජිනේරුවරයෙකු ලෙස සම්බන්ධව විදුලි සංදේශ සහ විදුලිය ආශ්‍රිත ව්‍යාපෘති මෙන්ම ඵලදායී පිරිවැය/තත්ත්ව විශ්ලේෂණය මත පදනම්ව බහු ව්‍යාපෘති කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් සේවා සැපයීමෙහිලා නිරත විය. එම Rishthaa සමාගමේ වසර 1 ක සේවා කාලයෙන් පසු, ඔහු ඉදිකිරීම් ව්‍යාපෘති කළමනාකරුවෙකු ලෙස සීමාසහිත Zhongtian ඉදිකිරීම් සමූහ සමාගමේ සේවයට එක් වූ අතර විදුලි / සිවිල් ඉදිකිරීම් ආශ්‍රිත වැඩ කළමනාකරණයට සම්බන්ධ විය. Zhongtian සමූහ ව්‍යාපාරය සමඟ වසර 1 යි මාස 6 ක සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් පසු, ඔහු සීමාසහිත හුවාවි ටෙක්නොලොජීස් ලංකා පුද්ගලික සමාගමේ Man Power සමාගම වන සීමාසහිත Quess Corp ලංකා (පුද්ගලික) සමාගමේ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු ගුවන් විදුලි සංඛ්‍යාත වශයෙන් සම්බන්ධ විය. දැනට, ඔහු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සහකාර අධ්‍යක්ෂ - සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ ලෙස කටයුතු කරන අතර ශ්‍රී ලංකාව, තායිලන්තය, මැලේසියාව සහ දකුණු කොරියාවේ ප්‍රධාන තාක්ෂණ සමූළු සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව නියෝජනය කර ඇත.



ජී. එච්. පී. ඉමාලි ප්‍රසන්තිකා මිය
සහකාර අධ්‍යක්ෂ/සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණය

ඉමාලි ප්‍රසන්තිකා මහත්මියට විදුලි සංදේශ ක්ෂේත්‍රයේ වසර 15කට වැඩි පළපුරුද්දක් ඇති අතර, දැනට සහකාර අධ්‍යක්ෂ සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ (සංඛ්‍යාත වර්ණාවලි මිලකරණය සහ වෙනත් සේවා) ලෙස සේවය කරයි. ඇය මීට පෙර විදුලි සංදේශ ක්‍රියාකරු සමාගමක සේවයේ නිරතව සිට ඇති අතර කළමනාකරු තාක්ෂණ සංවර්ධන, ජාල තත්ත්ව සහතික සහ විගණන ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු යන තනතුරුවල සේවය කර ඇත. ඉමාලි ප්‍රසන්තිකා මහත්මිය ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) වරලත් ඉංජිනේරුවරියක වන අතර පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ඉලෙක්ට්‍රොනික හා විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ඉංජිනේරු උපාධිය ලබා ඇත.



ඩී. එන්. විජේසිංහ මහතා
සහකාර අධ්‍යක්ෂ/අනුකූලතා

විජේසිංහ මහතා 2019 වසරේ දී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට (TRCSL) සම්බන්ධ වූ අතර ශ්‍රී ලංකා මොරටුව විශ්වවිද්‍යාලයෙන් ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ පිළිබඳ විද්‍යාවේදී (ඉංජිනේරු.) උපාධිය ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) ආශ්‍රිත සාමාජිකයෙකි. ඔහු සුදුසුකම් ලත් UMTS/LTE/4.5G ගුවන්විදුලි ජාල සැලසුම් සහ ප්‍රශස්තකරණ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරුවෙකු වන අතර, ආයතනික අවශ්‍යතා හඳුනාගනිමින් නව තාක්ෂණයන් ක්‍රියාවට නැංවීමට ප්‍රමුඛව කටයුතු කර ඇත. සීමාසහිත හුවාවි ටෙක්නොලොජීස් ලංකා සමාගමේ වසර 12 ක පුළුල් පළපුරුද්දක් ඇති ඔහු UMTS/LTE/4.5G ගුවන් විදුලි සංඛ්‍යාත ප්‍රශස්තකරණය, KPI/සේවා තත්ත්ව වැඩිදියුණු කිරීම, පරාමිති ප්‍රශස්තකරණය,

ජාල ගැටළු හඳුනාගැනීම සහ නව තාක්ෂණික විසඳුම් සැපයීමෙහිලා ඉතා සාර්ථක වී ඇත.

දැනට, ඔහු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සහකාර අධ්‍යක්ෂ - අනුකූලතා ලෙස කටයුතු කරන අතර ශ්‍රී ලංකාව, තායිලන්තය සහ ඉන්දියාවේ ප්‍රධාන තාක්ෂණික සමුළුවල දී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව නියෝජනය කර ඇත.




කේ. එස්. එන්. විජේරත්න මහතා
සහකාර අධ්‍යක්ෂ/ පාලන

කේ. එස්. එන්. විජේරත්න මහතා සහකාර අධ්‍යක්ෂ (පාලන) ලෙස 2022 ජනවාරි 19 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය සේවයෙන් ද්විතීයික පදනම මත ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට (TRCSL) පත් කරන ලදී.

විජේරත්න මහතා රාජ්‍ය අංශයේ වසර හයකට වැඩි සේවා පළපුරුද්දකින් හෙබි ශ්‍රී ලංකා පරිපාලන සේවා නිලධාරියෙකි. ඔහු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සේවයට එක් වීමට පෙර වරාය හා නාවික අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) තනතුර දැරීය. ඔහු කැලණිය විශ්ව විද්‍යාලයේ විද්‍යාවේදී ගෞරව (භෞතික විද්‍යාව) උපාධිධාරියෙකු වන අතර කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක පාසලෙන් තොරතුරු තාක්ෂණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවද ලබා ඇත.

විධායක නිලධාරීන්

බලපත්‍ර කළමනාකරණ ඊ.එන්.පී.කේ. රත්නපාල මහතා අධ්‍යක්ෂ (වැඩබලන) **අනුකූලතා සහ විමර්ශන** තරලිකා ලිවේරා මහත්මිය අධ්‍යක්ෂ (වැඩබලන) මේනකා පතිරණ මහත්මිය නියෝජ්‍ය අධ්‍යක්ෂ ඩී.එන්. විජේසිංහ මහතා සහකාර අධ්‍යක්ෂ	**සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ** එච්.පී. කරුණාරත්න මහතා අධ්‍යක්ෂ එල්. ගනේෂ්මූර්ති මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂ එම්.පී. ගුණසිංහ මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂ ශාන්ත ගුණානන්දන මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂ එස්.ඊ. වාකිෂ්ට මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂ ඩබ්ලිව්.ඒ.ඩී.ටී. මධුශංක මහතා සහකාර අධ්‍යක්ෂ ජී.එච්.පී. ඉමාලි ප්‍රශාන්තිකා මහත්මිය සහකාර අධ්‍යක්ෂ	**ජාල** ආර්.ජී.එච්.කේ. රණතුංග මහතා අධ්‍යක්ෂ කේ.එස්.එම්. විශාකා මහත්මිය නියෝජ්‍ය අධ්‍යක්ෂ එස්.ඒ.ආර්. කමලනයනා මහත්මිය නියෝජ්‍ය අධ්‍යක්ෂ අයි.එම්. ජවුසි මහතා සහකාර අධ්‍යක්ෂ එස්.ඩබ්ලිව්.එම්.ආර්.එල්.බී. සේනාධීර මහතා සහකාර අධ්‍යක්ෂ (2022.12.21 දක්වා)
ප්‍රතිපත්ති හා ජාත්‍යන්තර සම්බන්ධතා කේ.එස්.එම්.විශාකා මෙනවිය අධ්‍යක්ෂ (වැඩබලන) ජේ.කේ.බී.රත්නායක මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂ	**තරඟකාරිත්ව** එච්.ඩබ්ලිව්.කේ. ඉන්ද්‍රජිත් මහතා අධ්‍යක්ෂ (වැඩබලන) ශ්‍රියානි මාවැල්ලගේ මහත්මිය නියෝජ්‍ය අධ්‍යක්ෂ (2022.08.07 දක්වා) නිශාන්ත පලිහවඩන මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂ	**නීති** රුවනි ගුණරත්න මහත්මිය අධ්‍යක්ෂ (වැඩබලන) ජී. මොරගොඩ මහත්මිය නියෝජ්‍ය අධ්‍යක්ෂ එස්. රුද්‍රිගු මෙනවිය නියෝජ්‍ය අධ්‍යක්ෂ (වැඩබලන) අයි.එන්. මැනිවි මහතා සහකාර අධ්‍යක්ෂ
විශේෂ ව්‍යාපෘති ශාන්ත ගුණානන්දන මහතා අධ්‍යක්ෂ (වැඩබලන)	**අභ්‍යන්තර විගණන** සමන් කිත්සිරි මහතා අභ්‍යන්තර විගණක	**කොරතුරු තාක්ෂණ** තරලිකා ලිවේරා මහත්මිය අධ්‍යක්ෂ (වැඩ ආවරණ) එම්.සී.එම්. ෆාරුක් මහතා අධ්‍යක්ෂ (වැඩබලන) 2022.05.05 දක්වා
මූල්‍ය එම්.කේ. ජයන්ත මහතා අධ්‍යක්ෂ (2022.05.29 දක්වා) අරුමුගම් උතයරාජන් මහතා **අධ්‍යක්ෂ** එල්.ඩී. ජයවික්‍රම මෙනවිය සහකාර අධ්‍යක්ෂ අසංකා ලියනගේ මහත්මිය සහකාර අධ්‍යක්ෂ (2022.11.24 දක්වා)	**පාලන හා ආයතනික කටයුතු** වයි.එස්.පී. ගුණරත්න මහතා අධ්‍යක්ෂ (වැඩ ආවරණ) සහකාර අධ්‍යක්ෂ ජේ.කේ.බී. රත්නායක මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂ (වැඩබලන) වයි.එස්.පී. ගුණරත්න මහතා සහකාර අධ්‍යක්ෂ	



සටහන: සේවක සංඛ්‍යාව, ආයතනික ව්‍යුහය සහ බඳවා ගැනීමේ පටිපාටිය සමාලෝචනය කිරීම සඳහා කමිටුවක් පත් කර ඇත.

අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත (සංශෝධන) මඟින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත (පනත) යටතේ ස්ථාපනය කරන ලද රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතනයකි.

ප්‍රමුඛ පෙළේ රාජ්‍ය ආයතනයක් වන, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ සේවා පිළිබඳ ජාතික නියාමන ආයතනයයි. මෙම ආයතනය විසින් නියාමන ක්‍රියාවලිය මෙහෙයවමින්, මහජන යහපත ආරක්ෂා කරමින් සහ වඩාත් තරහකාරී වෙළෙඳපොළක අභියෝගවලට ප්‍රතිචාරවිව ක්‍රියා කරමින් විදුලි සංදේශ කර්මාන්තයේ දියුණුව ප්‍රවර්ධනය කරයි.

විදුලි සංදේශ සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණය වූ කලී රටේ අපේක්ෂිත සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා තීරණාත්මකව වැදගත් වන ශීඝ්‍රයෙන් සංවර්ධනය වන අංශය කි. රටේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පාදක කරගත් සංවර්ධනයේ බලපෑමේ වැදගත්කම බෙහෙවින්ම අවබෝධ කරගත් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විදුලි සංදේශ ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට සහාය වේ.

පවත්නා මූල්‍ය අර්බුදය විදුලි සංදේශ නියාමනය, අඛණ්ඩ සංවර්ධන ක්‍රියාවලිය, විදුලි සංදේශ වෙළඳපොළ, මෙන්ම දුරකථන ක්‍රියාකරු සමාගම් සහ පාරිභෝගිකයන් සම්බන්ධ අස්ථාවරත්වය සහ උද්ධමන පීඩනය වැනි ආර්ථික අභියෝග රැසකට බලපා ඇත. රටේ මෙවැනි වාතාවරණයක් තිබියදී ත් විදුලි සංදේශ නියාමන සේවාවන් නිසි පරිදි මෙහෙයවීම සඳහා අවශ්‍ය සැලසුම් කොමිෂන් සභාව ක්‍රියාත්මක කරන ලදී. මෙම සන්දර්භය තුළ, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය විසින් දුරකථන සේවා සැපයුම්කරුවන් සහ පාරිභෝගිකයන් සඳහා සේවා සැපයීම සඳහා අන්තර්ජාල භාවිතාවන් යොදා ගනිමින් නිවසේ සිට වැඩ කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. කොමිෂන් සභාව විසින් අවශ්‍ය නියාමන තීරණ ගැනීම සඳහා කොමිෂන් සභා රැස්වීම් එකොළහක්, විගණන කමිටු රැස්වීමක් සහ සමාලෝචන රැස්වීම් හතරක් පැවැත්විය.

නියාමන කටයුතු පිළිබඳ සමාලෝචනය

බලපත්‍ර කළමනාකරණය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) විසින් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) සමඟ එක්ව නව බලපත්‍ර රාමුවක් සකස් කිරීම සඳහා සේවා සහ තාක්ෂණ අභිසාරීත්වය ඉලක්ක කර ගනිමින් මහජන උපදේශනයක් ආරම්භ කළ අතර එම රාමුව ඒකාබද්ධ බලපත්‍ර ලබා දීම සඳහා යොමු කර ඇත. මෙම සංක්‍රමණය සඳහා මාර්ග සිතියමක් සකස් කරන ලදී. කෙසේ වෙතත්, උපදේශනය අතරතුර, නව රාමුව හඳුන්වාදීමට පෙර ක්‍රියාත්මක කළ යුතු පූර්ව අවශ්‍යතා හඳුනාගෙන ඒ සම්බන්ධ සාකච්ඡා දැනට සිදු කෙරෙමින් පවතී.

බලපත්‍රයේ 17 වන වගන්තිය ප්‍රකාරව ජාල අනුමැතිය ලබා ගැනීම අත්‍යවශ්‍ය අවශ්‍යතාවයකි. එබැවින්, මෙහෙයුම් පද්ධතිය/සේවාව පරීක්ෂා කිරීම මත පදනම්ව ජාල අනුමත කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට කටයුතු ඇත. මෙම මුලපිරීම යටතේ, ඔප්ටිකල් මාර්ග ආරක්ෂණ (OLP) ජාලය සඳහා දෛශික සිතියම මෙන්ම සියලුම කේබල් ක්‍රියාකරුවන්ගේ සම්පූර්ණ ජාලය සකස් කර ඇත. තවද, දිගුදුර (Trunking) ක්‍රියාකරුගේ ජාල රූප සටහන් ද සකස් කර ඇත.

වර්තමාන බලපත්‍ර මාර්ගෝපදේශයේ 17 වන වගන්තිය මඟින් බලපත්‍ර නිකුත් කිරීම, අලුත් කිරීම සහ වෙනස් කිරීම සඳහා වන ක්‍රියා පටිපාටි ආවරණය කරයි. දැනට පවතින බලපත්‍ර අලුත් කිරීමේ ක්‍රියා පටිපාටිය යටතේ බලපත්‍ර අලුත් කිරීමේ දී අනවශ්‍ය ප්‍රමාදයක් ඇති කරයි. එබැවින්, අයිතිය පැවරීම, අවලංගු කිරීම වැනි නව අංග ඇතුළත් කරමින් බලපත්‍ර පටිපාටිය වැඩිදියුණු කිරීම සඳහා නව මාර්ගෝපදේශයක් සකස් කරන ලදී.

17 වන වගන්තිය ප්‍රකාරව අළුත් කර අමාත්‍යාවරයාගේ අනුමැතිය සඳහා යොමු කරන ලද බලපත්‍ර මතු දැක්වේ: ශ්‍රී ලංකා ටෙලිකොම් පී. එල්. සී (ස්ථාවර සේවා පද්ධති බලපත්‍රය), සීමාසහිත හවිසන් ටෙලිකොම්යුනිකේෂන්ස් ලංකා (පෞද්ගලික) සමාගම (ජංගම පද්ධති බලපත්‍රය), ලංකා අධ්‍යාපන සහ පර්යේෂණ ජාලය (අන්තර්ජාල සේවා සැපයුම්කරුවන්ගේ පද්ධති බලපත්‍රය), සහ සීමාසහිත ඩයලොග් ටෙලිවිෂන් (පෞද්ගලික) සමාගම (සෘජු ගෘහස්ථ සේවා (DTH) පද්ධති බලපත්‍රය).

ජාල කටයුතු

ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන විදුලි සංදේශ ජාල ආශ්‍රිත ගැටළු නිරාකරණය කිරීමේ වගකීම මෙන්ම මීට අමතරව, ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ කර්මාන්තයේ ජාතික අංකකරණ සැලැස්ම කළමනාකරණය කිරීමේ වගකීම ද ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සතු වේ. පවතින අංකකරණ සැලැස්ම සමාලෝචනය කිරීම සහ අදාළ මාර්ගෝපදේශ සමඟ ගැස්තු රහිත අංක පරාසය හඳුන්වාදීමේ ක්‍රියාවලිය සිදු කෙරෙමින් පවතී. අන්තර්ජාල සම්මුති යෙදුම් (IPv6) ක්‍රියාත්මක කිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රශස්ත භාවිතයන් සැලකිල්ලට ගනිමින් IPv6 මාර්ග සිතියම සකස් කිරීමෙහි ලා ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ (APT) විශේෂඥ සහාය ලබා දී ඇත. ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය විසින් මෙම ක්‍රියාකාරකම අවසන් කර වාර්තාව ඉදිරිපත් කර ඇත.

ශ්‍රී ලංකාවේ ජංගම සහ ජංගම දුරකථන ජාල අතර මෙන්ම ස්ථාවර සහ ස්ථාවර දුරකථන ජාල අතර දුරකථන අංකය වෙනස් නොවී ජාල අතර මාරුවීමේ හැකියාව ක්‍රියාත්මක කිරීම පිණිස කොමිෂන් සභාව විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇත. පසුව ඒ සම්බන්ධයෙන් අභ්‍යන්තර කමිටුවක් ස්ථාපනය කර ඇති අතර, විදුලි සංදේශ ක්ෂේත්‍රයේ නිරතවූවන්ගේ සහ මෙහිලා උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගෙන් අදහස් ලබා ගැනීම සඳහා මහජන අදහස් විමසීමක් සිදු කරන ලදී. එයින් ලද ප්‍රතිචාර සහ කර්මාන්තයේ නියැලෙන්නන් සමඟ කරන ලද සාකච්ඡා මත පදනම්ව සුදුසු මෙහෙයුම් සහ තාක්ෂණික ආකෘතියක් තීරණය කරන ලදී. දුරකථන අංකය වෙනස් නොවී ජාල අතර මාරුවීමේ හැකියාව හඳුන්වාදීම පහසු කිරීම සඳහා දුරකථන අංකය වෙනස් නොවී ජාල අතර මාරුවීමේ ක්‍රමය ආශ්‍රිත ක්‍රියාකරු බලපත්‍රයක් කෙටුම්පත් කර ඇත. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ දුරකථන ක්‍රියාකරු සමාගම් දුරකථන අංකය වෙනස් නොවී ජාල අතර මාරුවීමේ පහසුකම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ඉදිරි පියවර ගනිමින් සිටී.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් බලපත්‍රලාභී කේබල් ටීවී ජාල මෙහෙයුමට අදාළ තොරතුරු කාර්තුමය පදනමින් රැස්කර ඔවුන්ගේ කේබල් ජාල සහ පාලන මැදිරි භෞතිකව පරීක්ෂා කරයි. මීට අමතරව, පර්යන්ත ජාල උපකරණ සඳහා මාදිලි අනුමැති ක්‍රියා පටිපාටියක් සිදු කරන ලද අතර සියලුම ජාල ආශ්‍රිත උපකරණ ආනයනය කිරීම සඳහා රේගුව, ආයෝජන මණ්ඩලය සහ ආනයන පාලක වෙත බලය පැවරීමේ ලිපි නිකුත් කරන ලදී.

අලුතින් ඉදිකරන ලද නව කුලුනු 412 සහ බහුකාර්ය පහන් කණු 198 ක් ඇතුළත් ව සමුච්චිත විදුලි සංදේශ කුලුනු සංඛ්‍යාව 8077 දක්වා වැඩි විය. ජංගම දුරකථන ක්‍රියාකරු සමාගම් හතරක කුලුනු ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය අවසන් කර ඇති අතර අනුමත නොකළ කුලුනු විධිමත් කිරීම සඳහා අලුතින් අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටියේය. අදාළ රාජ්‍ය ආයතනවල නිර්දේශ මත දැනටමත් ඉදිකර ඇති අනුමත නොකළ කුලුනු කිහිපයක් සඳහා අනුමැතිය ලබා දී ඇත. අනෙකුත් දුරකථන ක්‍රියාකරු සමාගම්වල දුරකථන කුලුනු ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය සිදු වෙමින් පවතී.

සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණය

2022.12.21 දින වන විට ජාතික සංඛ්‍යාත වෙන්කිරීමේ වගුව සකස් කර FM (සංඛ්‍යාත මුහුර්ජන) විකාශනයේ සංඛ්‍යාත පැවරුම් සහ සංඛ්‍යාත නැවත භාවිතය පිළිබඳව මහජනතාවගේ දැනගැනීම සඳහා වෙබ් අඩවියේ පළ කරන ලදී. ආධුනික ගුවන්විදුලි මෙහෙයුම් නිපුණතා සහතික නිකුත් කිරීම සහ විභාග දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව විභාග පැවැත්වීම කොමිෂන් සභාවේ වගකීම වේ. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ආධුනික ගුවන්විදුලි ක්‍රියාකරුවන් සඳහා වන විභාගය සඳහා අයදුම්පත් කැඳවන ලදී. 2022.09.02 දිනැති

අංක 2296 දරන ගැසට් නිවේදනයට අනුව විභාග දෙපාර්තමේන්තුව විසින් විභාගය පැවැත්වීම සඳහා 2023 පෙබරවාරි මස දිනයක් නියම කර ඇත.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අධිවේගී අන්තර්ජාල ධාරිතාවය සහ ජාල ආවරණය පුළුල් කිරීම සඳහා ලබන වසරේ දී 5G ජංගම තාක්ෂණය හඳුන්වා දීමට සැලසුම් කරයි. වසරේ ආර්ථික පසුබෑම සහ කෝවිඩ්-19 වසංගතය හේතුවෙන් මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. එහි පළමු පියවර ලෙස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව දුරකථන ක්‍රියාකරු සමාගම් සමඟ මූලික 5G පරීක්ෂා කිරීම, 5G තාක්ෂණය යෙදවීමට ගිගාහර්ට්ස් 3.5 පරාසය භාවිත කිරීමට අපේක්ෂා කරන අතර වර්ණාවලිය පැවරීම තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියාවලියක් හරහා සිදු කෙරේ. ගිගාහර්ට්ස් 3.5 වර්ණාවලි වෙන්දේසිය 2023 වර්ෂය සඳහා සැලසුම් කර ඇත. 2022 ජාතික අයවැයෙන් ශ්‍රී ලංකාව තුළ 5G තාක්ෂණය හඳුන්වා දීමට යෝජිතය.

තරඟකාරිත්වය

විදුලි සංදේශ ග්‍රාහකයින්ගේ වර්ධනය සැලකිල්ලට ගැනීමේ දී , ශ්‍රී ලංකාව සතුව ශීඝ්‍රයෙන් වර්ධනය වන විදුලි සංදේශ අංශයක් ඇත. ඒ අනුව ආසන්න වශයෙන් ජංගම දුරකථන ග්‍රාහකයන් මිලියන 29.8 (දත්ත ග්‍රාහකයන් මිලියන 0.9 පමණ ඇතුලත්ව), ස්ථාවර දුරකථන ග්‍රාහකයන් මිලියන 3.7 (දත්ත ග්‍රාහකයින් මිලියන 1.1 පමණ ඇතුලත්ව), සහ අධිවේගී අන්තර්ජාල සේවා ග්‍රාහකයන් මිලියන 21.6 කින් සමන්විත ය. 2022 වන විට පැවති මුළු පද්ධති බලපත්‍ර සංඛ්‍යාව 26ක් හා ජංගම දුරකථන සහ ස්ථාවර දුරකථන ඝනත්වය (ව්‍යාප්තිය) පිළිවෙලින් 130% සහ 12% ක් විය. විදුලි සංදේශ අධිවේගී අන්තර්ජාල සේවා කර්මාන්තයට රට පුරා භූගෝලීය ආවරණය වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් තවදුරටත් වේගවත් වර්ධනයක් අවශ්‍ය වන අතර එය ශ්‍රී ලංකාවේ ඩිජිටල් පරිවර්තන මාර්ග සිතියම සාර්ථක කර ගැනීමට සහ තාක්ෂණික ව්‍යාප්තිය සමඟ ආර්ථිකය ශක්තිමත් කිරීමට අත්‍යවශ්‍ය වේ. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් එකතු කරන ලද විදුලි සංදේශ බදු සහ සෙස් බදු ගාස්තුව රු. මිලියන 25,026 කි. [විදුලි සංදේශ බද්ද – රු. මිලියන 12,906, සෙස් බදු - රු. මිලියන 5,514, කුලුනු බද්ද - රු. මිලියන 1,565, කෙටි පණිවුඩ සේවා බදු - රු. මිලියන 231 සහ විදුලි සංදේශ සංවර්ධන ගාස්තුව - රු. මිලියන 4,810.]

කොමිෂන් සභාව දැනට පවතින අන්තර් සම්බන්ධතා ගාස්තු සමාලෝචනය කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කළ අතර අන්තර් සම්බන්ධතා ගාස්තු තීරණය කිරීමට අවශ්‍ය අදාළ පිරිවැය සහ අයකුම තොරතුරු ලබා ගන්නා ලදී. ඉදිරිපත් කරන ලද තොරතුරු විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව, 2010 මැයි මාසයේ දී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් තීරණය කරන ලද අන්තර් සම්බන්ධතා ගාස්තු සංශෝධනය කරන ලද අතර එය 2025 දක්වා අදියර හතරකින් ක්‍රියාත්මක වේ.

වසර තුළ, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව රටේ අවශ්‍යතා සහ ඩිජිටල්කරණ අවශ්‍යතාවලට සරිලන පරිදි අවශ්‍ය අයකුම තිරණ ගෙන ඇත. ඒ අනුව බලපත්‍රලාභී දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් අයකුම යෝජනා 99ක් ඉදිරිපත් කර ඇත. කාණ්ඩ තුනක් යටතේ, උත්සව 28, ප්‍රවර්ධන ගාස්තු 52 සහ ස්ථාවර අයකුම 19 ක් සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා දී ඇති අතර එමඟින් ක්‍රියාකරුවන්ට නිෂ්පාදන විවිධාංගීකරණයේ ප්‍රතිලාභ තම පාරිභෝගිකයින්ට ලබා දීමට ඉඩ සැලසේ. පාරිභෝගික අවශ්‍යතා වලට අනුකූලව, නිශ්චිත ක්‍රියාකරුවන්ට සීමා නොකර ඕනෑම ජාලයකට අසීමිතව හඬ අයකුම සැලසුම් ලබා දීමට තවත් පියවරක් ගන්නා ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පාරිභෝගිකයින්ට කරදරයකින් තොරව විදුලි සංදේශ සේවා වෙත ප්‍රවේශ විය හැකි අසීමිත හඬ සහ දත්ත අයකුම සැලසුම් තිබේ.

එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම සහ අනෙකුත් සියලුම භාණ්ඩ ඇතුළු ඉන්ධන සහ විදුලි මිල ඉහළ යාම විදුලි සංදේශ ක්ෂේත්‍රයට අහිතකර ලෙස බලපෑවේය. කර්මාන්තයේ තිරසාරභාවයට තර්ජනයක් වෙමින් හඬ මිනිත්තුවක් සහ දත්ත නිෂ්පාදනය කිරීමේ පිරිවැය ඉහළ ගියේය. ඒ අනුව, පැකේජ බදු සඳහා මිල වැඩි කිරීමට කොමිෂන් සභාව අනුමැතිය ලබා දී ඇත. හඬ සහ දත්ත බදු 20% කින් පමණ වැඩි වූ අතර ගෙවන රූපවාහිනී පැකේජ බදු මුදල ද 25% කින් වැඩි විය. කෙසේ වෙතත්, හඬ සහ දත්ත සඳහා පෙරනිමි ගාස්තු වැඩි කිරීමට කොමිෂන් සභාව අනුමැතිය ලබා දී නොමැත. ඒ අනුව, පසුගිය වසර විස්ස තුළ කිසිදු ගාස්තු වැඩිවීමක් වාර්තා වී නොමැත.

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) ඔවුන්ගේ සාමාජික රටවලින් වාර්ෂිකව අයකුම සම්බන්ධ දත්ත රැස් කරන අතර අයකුම සම්බන්ධ ස්ථිතික දර්ශක ගණනය කරයි. හඬ, දත්ත සහ කෙටි පණිවුඩ සේවාවල මිල ග්‍රහණය කර ගන්නා සහ ජංගම සහ ස්ථාවර ගාස්තු සැලසුම්වල මාසික භාවිතය විශ්ලේෂණය කිරීමෙන් සංසන්දනය කරන දර්ශක වර්ග පහක් ඇත. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මිල ප්‍රවණතා විශ්ලේෂණය 2021 ප්‍රකාරව, ශ්‍රී ලංකාව හඬ සහ දත්ත ගාස්තු සම්බන්ධයෙන් ප්‍රශංසනීය ස්ථානයක් දරයි. නවතම වාර්තාවට අනුව, ශ්‍රී ලංකාව ලාභදායි හඬ සහ දත්ත අඩු භාවිතය සඳහා 23 වැනි ස්ථානයටත්, හඬ සහ දත්ත ඉහළ භාවිතය සඳහා 48 වැනි ස්ථානයටත්, දත්ත පමණක් සහිත ජංගම අධිවේගී අන්තර්ජාල සේවා සඳහා 23 වැනි ස්ථානයටත්, ජංගම සෙලියුලර් සඳහා 12 වැනි ස්ථානයටත්, ස්ථාවර අධිවේගී අන්තර්ජාල සේවා සඳහා 18 වැනි ස්ථානයටත් පත්ව ඇත. මෙම ශ්‍රේණිගත කිරීම ඒක පුද්ගල ආදායමේ ප්‍රතිශතයක් ලෙස ලබාගෙන ඇති අතර එමඟින් දැරිය හැකි මට්ටම මනිනු ලබයි.

කෝවිඩ්-19 වසංගතය සහ රට තුළ පවතින ආර්ථික තත්ත්වය හේතුවෙන් බොහෝ ව්‍යාපාර මාර්ගගතව මෙහෙයුම් කටයුතු සිදු කරන ලද අතර ඒ අනුව පුද්ගලික/රාජ්‍ය අංශයේ කටයුතු මාර්ගගතව සිදු කිරීමට සිදු විය. එබැවින් මෙම ඉහළ දත්ත ඉල්ලුම සපුරාලීම සඳහා විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් වලට ඔවුන්ගේ ජාල ධාරිතාව වැඩි කිරීමට සිදු විය. මෙහිදී 2021 දෙසැම්බර් දත්ත භාවිතයට සාපේක්ෂව 2022 ජූලි දත්ත භාවිතය සලකා බලන විට, කර්මාන්තයේ දත්ත භාවිතය 16% කින් වර්ධනය වී ඇත.

ගමට සන්නිවේදනය සහ පාසල් ෆයිබර් ව්‍යාපෘතිය (ජාතික අයවැය 2021 සහ 2022): ඩිජිටල් පරිවර්තනය සහ තාක්ෂණය වැලඳ ගැනීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කර රට ඩිජිටල් ලෙස සක්‍රීය රාජ්‍යක් සහ ඩිජිටල් ආර්ථිකයක් කරා ගෙන යාමේදී, රට තුළ ඩිජිටල්කරණය සඳහා යටිතල පහසුකම් පැවතීම අනිවාර්ය අවශ්‍යතාවයකි. පුරවැසියන්ට විද්‍යුත් රාජ්‍ය සේවා, මාර්ගගත අධ්‍යාපනය සහ වෙනත් බොහෝ සේවාවන් සඳහා විශ්වීය ප්‍රවේශය ලබා දීම සහතික කිරීමෙහි ලා දැරිය හැකි මිල කෙරෙහි අවධානය යොමු කරමින් රට පුරා අධිවේගී අන්තර්ජාල සේවා ආවරණය සැපයීම ප්‍රධාන සාධකයක් වනු ඇත. ඒ අනුව, 2021 රජයේ ජාතික අයවැය යෝජනාවට අනුව, 4G තාක්ෂණය සහිතව දීප ව්‍යාප්ත ආවරණය සැපයීම පිණිස දුරකථන ක්‍රියාකරු සමාගම් වලට සිය ජාලයන් පුළුල් කිරීමට ගමට සන්නිවේදනය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. එම ව්‍යාපෘතියේ පළමු අදියර සඳහා කොමිෂන් සභාව දිස්ත්‍රික්ක දහයක් තෝරාගෙන ඇති අතර 4G ආවරණය සැපයීමට අවශ්‍ය කුලුනු භූමි හඳුනාගෙන ඇත. හඳුනාගත් කුලුනු භූමි දුරකථන ක්‍රියාකරු සමාගම් අතර වෙන් කර ඇති අතර අදාළ ප්‍රදේශ ආවරණය වන පරිදි උපකරණ ස්ථාපනය කිරීමට දුරකථන ක්‍රියාකරු සමාගම් වලට උපදෙස් ලබා දෙන ලදී. දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් 4G තාක්ෂණය ඔස්සේ සේවා සැපයීම සඳහා දැනටමත් රත්නපුර දිස්ත්‍රික්කයේ කුලුනු 28 ක් සහ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලුනු 10 ක් සම්පූර්ණ කර ඇත.

ශ්‍රී ලංකා රුපියල විශාල වශයෙන් අවප්‍රමාණය වීම සහ ශීඝ්‍රයෙන් ඉහළ යන උද්ධමනය හේතුවෙන් කුලුනු ඉදිකිරීමේ පිරිවැය සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. ඉන්ධන ලබාගැනීමේ අපහසුව සහ ද්‍රව්‍ය නොමැනිකම නිසා ඉදිකිරීම් ප්‍රමාද විය. එම නිසා ගමට සන්නිවේදනය ව්‍යාපෘතියේ ප්‍රගතිය සාක්ෂාත් කර ගැනීම ඉතා අභියෝගාත්මක විය. රටේ පවතින ආර්ථික තත්ත්වය සැලකිල්ලට ගනිමින්, විදුලි සංදේශ සංවර්ධන ගාස්තු (TDC) මාර්ගෝපදේශ සංශෝධනය කිරීම මෙන්ම කුලුනු ඉදිකිරීම කඩිනම් කිරීම සඳහා දුරකථන ක්‍රියාකරු සමාගම් දිරිමත් කිරීමේ අරමුණින්, එම සමාගම් විසින් දැනටමත් ආරම්භ කර ඇති කුලුනු සඳහා අරමුදල් සැපයීමට තීරණය කරන ලදී.

2022 රජයේ ජාතික අයවැය මඟින් ශ්‍රී ලංකාවේ සියලුම පාසල් සඳහා ෆයිබර් සම්බන්ධතාවය ඔස්සේ අධිවේගී අන්තර්ජාල සම්බන්ධතාවය ලබා දීමට අවධානය යොමු කර ඇත. මෙම ව්‍යාපෘතියේ පවතින ගැටලු සහ ඉදිරි සැලසුම් පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ දී ඉහළ පෙළේ රැස්වීමක් පවත්වා ඇත. මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සංශෝධිත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් කෙටුම්පත් කිරීමට තීරණය කළ අතර, එම ක්‍රියාවලිය ආරම්භ කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය එකඟ විය.

අනුකූලතාවය

බලපත්‍රලාභී දුරකථන ක්‍රියාකරු සමාගම් හතක සේවා තත්ත්ව (QoS) පරාමිතීන් පිළිපැදීම සම්බන්ධ මාසික වාර්තා 84 ක් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ලැබිණි. මෙම වාර්තාවලට අදාළ සේවා තත්ත්ව පරාමිතීන් පිළිබඳ අදාළ විශ්ලේෂණයක් සිදු කරන ලද අතර පරාමිතිවලට අනුකූල වීම වැඩිදියුණු කිරීම සඳහා දුරකථන ක්‍රියාකරු සමාගම් සමඟ සාකච්ඡා කරන ලදී. තොරතුරු වල නිරවද්‍යතාවය සහ කාර්ය සාධනය මැනීම සඳහා දුරකථන ක්‍රියාකරු සමාගම් හතක සංසන්දනාත්මක වාර්තා 24ක් සකස් කර ඔවුන් අතර බෙදාහරින ලදී.

පොදු ස්විච්කරණ දුරකථන ජාල ක්‍රියාකරු සමාගම් (PSTN) ජාල කවුළු මඟින් කාර්ය සාධන මිනුම් දත්ත ලබාගෙන, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ලබා දී ඇති සම්මතකරණයට අනුව ගණනය කර සේවා තත්ත්ව පරාමිතියක ආකාරයෙන් නැවත වාර්තා කරයි. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් දුරකථන ක්‍රියාකරු සමාගම වෙත ගොස් සේවා තත්ත්ව පරාමිති ගණනය කිරීම සඳහා ජාල කවුළුවලින් ලබාගත් පරිගණක ක්‍රමවේදය සහ අමු දත්ත නැවත ඇගයීමට ලක් කරන ලදී. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් පොදු ස්විච්කරණ දුරකථන ජාල ක්‍රියාකරුවන් (PSTN) හත් දෙනෙකුගේ (07) හඬ සහ අධිවේගී අන්තර්ජාල සේවා ආශ්‍රිත පාරිභෝගික සේවා සහ ජාල පරාමිතීන් පිළිබඳ ජාල විගණන විසිඑක් (21) සිදු කරන ලදී. තවද, පොදු ස්විච්කරණ දුරකථන ජාල ක්‍රියාකරුවන් (PSTN) විසින් අගය එකතු කළ විදුලි සංදේශ සේවා (VAS) මාර්ගෝපදේශ පිළිපැදීම පිළිබඳ විගණන විසි එකක් (21) සිදු කරන ලදී.

ආවේක්ෂණ ක්‍රියාකාරකම් යටතේ, මෙම අංශය විසින් බලපත්‍රලාභී වෙළෙන්දන් අනුමත නොකළ විදුලි සංදේශ උපකරණ විකිණීම සම්බන්ධයෙන් විමර්ශන 20 ක් සහ 17 වැනි වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයේ නියමයන් සහ කොන්දේසි පිළිපැදීම නිරීක්ෂණය කිරීම සඳහා විමර්ශන 43 ක් සිදු කරන ලදී. බලපත්‍රයේ සඳහන් නියමයන් සහ කොන්දේසි උල්ලංඝනය කිරීම් අනාවරණය වූ අවස්ථාවල ඒ සම්බන්ධයෙන් සුදුසු පියවර ගෙන ඇත.

තවද, විදුලි සංදේශ සේවා සැපයීම සඳහා බලපත්‍රයක අවශ්‍යතාවය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් 03ක් සංවිධානය කරන ලදී. සිම් ලියාපදිංචියට අදාළ ගැසට් නිවේදනයට අනුව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ග්‍රාහකයින් නැවත ලියාපදිංචි කිරීමට දුරකථන ක්‍රියාකරු සමාගම් පියවර ගෙන තිබේද යන්න තහවුරු කිරීම සඳහා විගණන 24ක් සහ ග්‍රාහකයින් වෙත පිරිනමනු ලබන අයකුම පැකේජ අයකිරීමේ යාන්ත්‍රණයන් පිළිබඳ විගණන 16ක් සම්පූර්ණ කර ඇත.

අපරාධ සහ සිවිල් විමර්ශන සඳහා දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් ඉදිරිපත් කරන ලද ඇමතුම් වාර්තා සහ හිමිකාරිත්වය පිළිබඳ තොරතුරු විශ්ලේෂණය කිරීමට නීතිය ක්‍රියාත්මක කරන ආයතන සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අවශ්‍ය සහාය ලබා දෙන ලදී. මීට අමතරව, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පොලිසිය සමඟ එක්ව විමර්ශන සහ බුද්ධිමය විෂය පථය යටතේ නීතිවිරෝධී කේබල් රූපවාහිනී සේවා සහ නීති විරෝධී විදුලි සංදේශ සේවා පිළිබඳ තාක්ෂණික විමර්ශන පහක් පවත්වන ලදී. මෙම අංශය විසින් සිම් (SIM - ග්‍රාහක අනන්‍යතා මොඩියුල්පත්) උපාංග/වෙළෙන්දන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය සහ ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතා (IMEI) විසඳුම් විධිමත් කිරීම සිදු කරන ලදී. තවද, නීතිවිරෝධී සෘජු ගෘහස්ථ (Direct to Home)/ කේබල් රූපවාහිනී (Cable TV) සේවාව සම්බන්ධ ගැටළු අවම කර ඇති අතර, සයිබර් හිරිහැර කිරීම්/සමාජ මාධ්‍ය පැමිණිලි 1,232 ක් විසඳා ඇත. අනුමත වෙළෙන්දන් විසින් සපයනු ලබන ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විදුලි සංදේශ උපකරණ සහ සේවා මිලදී ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව විද්‍යුත් මාධ්‍ය සහ සමාජ ඔස්සේ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

තවද, වාර්තා වන සයිබර් අවහිරතා සහ බාධාවන් පිළිබඳ පැමිණිලි සම්බන්ධ කරුණු ගෙන හැර දක්වමින්, දුරකථන සහ සමාජ මාධ්‍යවල සදාචාරාත්මක සහ නීත්‍යානුකූල භාවිතය පිළිබඳව පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් ද පවත්වා ඇත. එසේම, දෙමාපියන් සහ සිසුන් වැනි ප්‍රධාන ඉලක්කගත ප්‍රේක්ෂකයින් සඳහා පැහැදිලිවම ගැලපෙන පාඨමාලා අන්තර්ගතයන් සහිතව ගුවන්විදුලිය, රූපවාහිනිය සහ සමාජ මාධ්‍ය ඔස්සේ මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව කටයුතු කර ඇත.

බිල්පත්, කරදර/හිරිහැර ඇමතුම්, සේවාවේ ගුණාත්මකභාවය, කේබල් ටීවී, අන්තර්ජාලය/දත්ත, සමාජ මාධ්‍ය, සයිබර් හිරිහැර, සහ වෙනත් විදුලි සංදේශ සේවා සම්බන්ධ පාරිභෝගික පැමිණිලි සහ ආරවුල් විසඳීම සඳහා විදුලි සංදේශ ක්‍රියාකරුවන් සහ අනෙකුත් අදාළ පාර්ශ්ව සමඟ අඛණ්ඩ රැස්වීම් සහ සාකච්ඡා පවත්වන ලදී.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් පාරිභෝගික පැමිණිලි 1500 ක් මෙහෙයවා ඇත. අස්ථානගත වූ ජංගම දුරකථන සොයාදීමේ මැදිහත්කරුවෙකු ලෙස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ක්‍රියා කළේය. දිනපතා ලැබෙන පැමිණිලි ජංගම දුරකථන ක්‍රියාකරු සමාගම් වෙත යොමු කරන ලද අතර, එමඟින් ලැබෙන ප්‍රතිචාර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම පිණිස අදාළ පොලිස් ස්ථාන වෙත යොමු කරන ලදී. තවද, අන්තර්ජාලය ඔස්සේ ලැබුණු අස්ථානගත වූ ජංගම දුරකථන පිළිබඳ පැමිණිලි 21,471 ක් සම්බන්ධයෙන් කටයුතු කිරීමට කටයුතු යොදා ඇත. අඛණ්ඩ අන්‍යෝන්‍ය පරීක්ෂාව සිදු කිරීමට වගබලා ගනිමින් එවැනි ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතා (IMEI) දත්ත පරීක්ෂා කිරීමේ ක්‍රියාවලිය තවදුරටත් විධිමත් කරන ලදී. දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් මීට පෙර අස්ථානගත වූ ජංගම දුරකථනවල IMEI අංකය එක් වරක් පමණක් පරීක්ෂා කළ අතර, එය අකාර්යක්ෂම විය. නමුත් දැන් දිගුකාලීන අක්‍රියතාවයෙන් පසුව පවා සොරකම් කළ දුරකථනයක් සොයා ගැනීමට අවස්ථාව සලසා දෙයි.

දුරකථන ක්‍රියාකරු සමාගම් සහ අනෙකුත් අදාළ පාර්ශ්වයන්ගේ සහභාගීත්වය ඇතිව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් දුරකථන බිල්පත් 172, දුරකථන දෝෂ 182, දුරකථන සම්බන්ධතා ගැටළු 170, සහ අගය එකතු කළ විදුලි සංදේශ සේවා (VAS) ගැටළු 40, සංඥා සහ ආවරණ දෝෂ 195, අන්තර්ජාල දත්ත පිළිබඳ ගැටළු 195 ක් සහ ජංගම විද්‍යුත් තැපෑල/නිවේදන සම්බන්ධ පාරිභෝගික ආරාවුල් 408 ක් නිරාකරණය කරන ලදී. පාරිභෝගික සම්බන්ධතා විෂය පථය යටතේ, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හිංසාකාරී සහ කරදරකාරී ඇමතුම්, සමාජ මාධ්‍ය සහ සයිබර් හිරිහැර කිරීම් සම්බන්ධයෙන් මහජන පැමිණිලි කළමනාකරණය කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සයිබර් අපරාධ ඒකකය සම්බන්ධ කර ගත්තේය.

බලපත්‍රලාභී ජංගම දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් අලෙවි කරනු ලබන අගය එකතු කළ සේවාවන්හි අක්‍රමිකතා මැඩලීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මාර්ගෝපදේශ නිකුත් කළේය. මෙම රාමුවේ අනෙකුත් දේවල් අතර, අගය එකතු කළ සේවාවන් සඳහා දායක නොවී සිටීම සඳහා ප්‍රායෝගික යාන්ත්‍රණයක් අපේක්ෂා කරයි. එමඟින් පාරිභෝගික පැමිණිලි ආශ්‍රිත බිල්පත් සහ ආරවුල් කළමනාකරණ ක්‍රියාවලියක් ද හඳුන්වා දෙයි. එමෙන්ම දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් පාරිභෝගික පැමිණිලි විසඳීම සම්බන්ධයෙන් මාසිකව වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

තොරතුරු තාක්ෂණය

ආයතනයේ ඩිජිටල්කරණ වැඩසටහන වෙනුවෙන්, තොරතුරු තාක්ෂණ අංශය විසින් පද්ධති සහ ක්‍රියාවලි වැඩිදියුණු කිරීමේ වැඩසටහන් කිහිපයක් ආරම්භ කර ඇත. එම ව්‍යාපෘති මත, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා වෙබ් අඩවිය ප්‍රතිනිර්මාණය කිරීම මෙම වසරේ ආරම්භ කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකමකි. මානව සම්පත් කළමනාකරණ පද්ධතිය ආරම්භ කරන ලද අතර, ආයතනයේ කාර්යය ක්‍රියාවලිය පරිවර්තනය කර පරිපාලන කාර්යයන් විධිමත් කිරීම සඳහා මොඩියුල කිහිපයක් ක්‍රියාත්මක කරන ලද අතර ඩිජිටල් වාර්තාවල අඛණ්ඩතාව වැඩිදියුණු කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට ඩිජිටල් අත්සන හඳුන්වා දෙන ලදී.

තොරතුරු තාක්ෂණ අංශය විසින් ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (CERT) හඳුන්වා දෙන ලද "තොරතුරු තාක්ෂණ ආරක්ෂණ පාලන රාමුව" ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශය කෙටුම්පත් කරමින් සිටී. තවද, තොරතුරු තාක්ෂණ ආශ්‍රිත නවතම තාක්ෂණයන් සහ සයිබර් ආරක්ෂණයේ ප්‍රශස්ත භාවිතයන් පිළිබඳව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිලධාරීන් දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

නීති කටයුතු

විදුලි සංදේශ නියාමනය ආශ්‍රිත ගැටළු සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලද අතර සියලුම ආයතනික නඩු කළමනාකරණය සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත නීති උපදෙස් ලබා දෙන ලදී. මීට අමතරව, 17 වන වගන්තිය පද්ධති බලපත්‍ර, වෙළඳ බලපත්‍ර ලබා දීම, ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලිය, ජාල සහ විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් වලට අදාළ කරුණු සම්බන්ධයෙන් නීති උපදෙස් ලබා දෙන ලදී. මීට අමතරව, නීති අංශය මඟින් සිම් ලියාපදිංචිය, වෙබ් අඩවිය ආශ්‍රිත ගැටළු සහ අනෙකුත් අනුකූලතා සම්බන්ධ මූලපිරීම් මෙන්ම පාරිභෝගික පැමිණිලි සම්බන්ධ අනුකූලතා ගැටළු සඳහා සහාය විය. තවද, ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතා අංකය (IMEI) ලියාපදිංචි කිරීමේ පද්ධතිය, පාරිභෝගික පැමිණිලි විසඳීම සඳහා වන අභ්‍යන්තර කමිටුව, දුරකථන අංකය වෙනස් නොවී ජාල අතර මාරුවීමේ හැකියාව සහ පරිපාලනමය ගැටළු සඳහා නීතිමය නිර්දේශ ද ලබා දෙන ලදී. අපරාධ විමර්ශනය කිරීමේදී නීතිය බලාත්මක කිරීමේ බලධාරීන්ට සහාය වීම සඳහා අපරාධ විමර්ශනය කිරීමේ අධිකරණ නියෝග 456 ක් මෙහෙයවන ලදී.

කොළඹ නෙළුම් කුලුන ආශ්‍රිත ප්‍රධාන නීතිමය ගැටලු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් මෙහෙයවන ලද අතර කොළඹ නෙළුම් කුලුන සඳහා ඉඩම් අත්පත් කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලදී. තවද, කොළඹ නෙළුම් කුලුන ඉදිකිරීම, කුලුන පවරා ගැනීම, ණය ගිවිසුම, වාණිජකරණය, කළමනාකරණ සමාගම ස්ථාපනය කිරීම, කළමනාකරණ ගිවිසුම අත්සන් කිරීම සහ බදු ගිවිසුම සකස් කිරීම සම්බන්ධ ගැටළු සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය උපදෙස් ලබා දෙන ලදී. එසේම බෙරුම්කරණ විනිශ්චය සභාව හමුවේ බෙරුම්කරණ කටයුතු අවසන් කර තීරණයට අනුකූලව කටයුතු කිරීමට පියවර ගන්නා ලදී.

1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත සංශෝධනය කිරීමේ ක්‍රියාවලියට පියවර ගන්නා ලදී. නීතිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු ඇතුළු ප්‍රවීනයන් සහ විද්වතුන්ගෙන් සමන්විත කමිටුවක් පත් කිරීමට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත. කොමිෂන් සභාව විසින් පත් කරන ලද කමිටුවේ සාමාජිකයින් සම්බන්ධයෙන් නැවත සලකා බැලීමට සහ කමිටුව ප්‍රතිස්ථාපනය කිරීමට නියමිතය.

ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා

විදුලි සංදේශ කුලුනු කාර්මික ශිල්පීන් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකයක් සංවර්ධනය කිරීම: විදුලි සංදේශ කුලුනු කාර්මික ශිල්පීන් සඳහා NVQ (ජාතික වෘත්තීය සුදුසුකම්) සහතිකයක් සංවර්ධනය කිරීම ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ කර්මාන්තය සඳහා උසස් තත්ත්වයේ දේශීය තාක්ෂණික ශ්‍රමිකයන් බිහි කිරීම සඳහා කාලෝචිත හා වැදගත් වැඩසටහනක් ලෙස සැලකේ.

පසුව, I64S003 නිපුණතා ප්‍රමිති සංග්‍රහය යටතේ සංවර්ධනය කරන ලද ජාතික නිපුණතා ප්‍රමිතිය සහ විෂය මාලාව තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් අනුමත කරන ලදී. තවද, අනුමත පුහුණු මධ්‍යස්ථාන වෙත වැඩසටහන හඳුන්වාදීම සහ පුහුණු මධ්‍යස්ථානවල ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) පාඨමාලාව ආරම්භ කිරීම ඇතුළුව මෙම වැඩසටහනේ ඉදිරි ගමන පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා 2022.11.25 දින තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් මාර්ගගත දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතනවල සහාය ඇතිව පසුගිය වසරේ ආරම්භ කරන ලද විදුලි සංදේශ ආශ්‍රිත පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. රුහුණ විශ්වවිද්‍යාලයේ විදුලි හා තොරතුරු ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ පර්යේෂණ කණ්ඩායමක් විසින් "Blockchain and AI-empowered Cryptographic Dynamic Spectrum Access for 6G and Beyond" පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතියේ ප්‍රගතිය ඉදිරිපත් කිරීමෙන් පසු දෙවන සහ තෙවන ප්‍රගති වාර්තා ඉදිරිපත් කරන ලදී. මෙම පර්යේෂණ ව්‍යාපෘතිය මේ වන විට අවසන් අදියරේ ක්‍රියාත්මක වෙමින් පවතින අතර අදාළ ප්‍රගති වාර්තා සහ ඉදිරිපත් කිරීම් ඉදිරිපත් කිරීම් වලින් පසු වාරික පදනම මත මූල්‍ය ප්‍රදාන ලබා දෙන ලදී. 2022 පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහනට අදාළ මූලික කටයුතු අවසන් වෙමින් පවතී. මේ සම්බන්ධයෙන් රාජ්‍ය විශ්වවිද්‍යාලවලින් පර්යේෂණ යෝජනා පහක් ලැබිණි.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම්/අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් අදාළ දත්ත ලබා ගැනීමට අවශ්‍ය විධිවිධාන සලසා ඇති අතර එකතු කරන ලද තොරතුරු සම්පාදනය කිරීමෙන් පසු ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU)/ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ (APT) පහත සමීක්ෂණ සහ ප්‍රශ්නාවලිය සම්පූර්ණ කරන ලදී; ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ලෝක විදුලි සංදේශ/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දර්ශක කෙටි ප්‍රශ්නාවලිය 2022, ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ විදුලි සංදේශ/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියාමන සමීක්ෂණය 2022, ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මිල ආශ්‍රිත ප්‍රශ්නාවලිය 2022, ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ලෝක විදුලි සංදේශ/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දර්ශක දිගු ප්‍රශ්නාවලිය 2022.

තාක්ෂණික සහ විශේෂඥ සහාය, සහයෝගිතා ව්‍යාපෘති/වැඩසටහන්, සහ විදුලි සංදේශ/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ ධාරිතාවය ගොඩනැගීම සඳහා සහයෝගිතා අවස්ථා ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විදුලි සංදේශ රෙගුලාසි සම්බන්ධයෙන් ක්‍රියා කරන ජාත්‍යන්තර සංවිධාන (ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය - ITU, ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය - APT, දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමය - SATRC, යටිතල පහසුකම් නියාමනය පිළිබඳ දකුණු ආසියානු සමුළුව - SAFIR) සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කර ඇත. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ රාජතාන්ත්‍රීය සමුළුවේදී (Plenipotentiary Conference - 22) ශ්‍රී ලංකාව නියෝජනය කිරීම සඳහා නියෝජිත පිරිස සහ අක්තපත්‍ර සකස් කරන ලදී. මහජන චීන සමූහාණ්ඩුවේ සහ කොරියානු ජනරජයේ රජයේ අතිරේක අයවැය දායකත්වයෙන් අරමුදල් සපයන EBC-C සහ EBC-K ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ ලේකම් කාර්යාලය සමඟ අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී. EBC-K ව්‍යාපෘතිය යටතේ අරමුදල් සැපයීම සඳහා ශ්‍රී ලංකා සබරගමුව විශ්ව විද්‍යාලය විසින් ඉදිරිපත් කරන ලද පර්යේෂණ යෝජනාව ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ ලේකම් කාර්යාලය විසින් තෝරාගෙන ඇත. විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන් අතර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සාක්ෂරතාවය නංවාලීමේ අරමුණින් ජාත්‍යන්තර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන දකුණු කොරියාවේ ජාතික තොරතුරු සමාජ නියෝජිතායතනය (NIA) සමඟ එක්ව

වත්තේගම, සිදුව සහ කැටවල වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල මාර්ගගත පුහුණු වැඩසටහනක් ලෙස සංවිධානය කරන ලදී.

"ගැහැණු දරුවා තොරතුරු තාක්ෂණ විෂයය සමගාමී අධ්‍යාපනය හා වෘත්තීය වෙත යොමු වීම"යනු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ ගැහැණු ළමයින් සහ කාන්තා නියෝජනය වැඩි කිරීම අරමුණු කරගත් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ (ITU) ගෝලීය ප්‍රයත්නයකි. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ සාමාජික රාජ්‍යයක් ලෙස, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් අධ්‍යාපන අමාත්‍යාංශය, ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය සහ පාර්ශවකරුවන්ගේ ඒකාබද්ධ සහයෝගිතාවයෙන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ අධ්‍යාපනය සහ වෘත්තීන් හැදෑරීමට ගැහැණු ළමයින්/තරුණියන් සවිබල ගැන්වීම සහ දිරිමත් කිරීම පිළිබඳව දැනුවත් කරමින් මෙම දිනය සමරනු ලැබීය. කුරුණෑගල, කෑගල්ල, මාතර, හම්බන්තොට සහ මොණරාගල දිස්ත්‍රික්කවල පාසල්වල මෙවර "ප්‍රවේශය සහ ආරක්ෂාව"යන තේමාවට අනුකූලව ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහ ගුරුවරුන් සඳහා මාර්ගගත දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදී. තවද, මෙම දැනුවත් කිරීමේ වැඩසටහන අනෙකුත් පාසල් සහ සාමාන්‍ය ජනතාව අතර සමාජ මාධ්‍ය සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා වෙබ් අඩවිය ඔස්සේ බෙදා හරින ලදී.

විදුලි සංදේශ ක්ෂේත්‍රය හා බැඳි ජාත්‍යන්තර නියාමන සංවිධාන විසින් මෙහෙයවනු ලබන පුහුණු වැඩසටහන්/වැඩමුළු/මාර්ගගත රැස්වීම් තිස් දෙකක් සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා නිලධාරීන්ට සහභාගී වීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී. ජාත්‍යන්තර සංවිධාන විසින් පිරිනමනු ලබන ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් මඟින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට රටේ මානව සහ ආයතනික ධාරිතාව ශක්තිමත් කිරීමට, ප්‍රශස්ත භාවිතයන් අනුගමනය කිරීමට සහ විකාශනය වන විදුලි සංදේශ අංශයකට අනුගත වීමට හැකි විය. තවද, විදේශීය පුහුණු වැඩසටහන්වලට සහභාගිවන්නන් පුහුණුවෙන් ලබාගත් දැනුම කාර්ය මණ්ඩල සාමාජිකයින් අතර බෙදාහදා ගැනීම සහතික කිරීමෙහිලා පශ්චාත් පුහුණු සැසි පැවැත්වීමෙන් දැනුම බෙදාගැනීමේ වැඩසටහන් සංවිධානය කරන ලදී.

GSMA සමාගම සහ තොරතුරු ආරක්ෂණ මෙහෙයුම් මධ්‍යස්ථානය (ISOC) සමඟ සම්බන්ධීකරණයෙන් ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ දේශීය පුහුණු වැඩසටහන් සංවිධානය කරන ලදී. ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය විසින් වැඩසටහන් 03ක් ඉදිරිපත් කර එයින් GSMA වැඩසටහන් 02 (GSMA - 02, ISOC - 01) ක් සම්පූර්ණ කර ඇති අතර, දැනට තොරතුරු ආරක්ෂණ මෙහෙයුම් මධ්‍යස්ථානයේ (ISOC) පුහුණුව සිදු කෙරේ. "පුළුල් දත්ත සහ කෘතිම බුද්ධියේ බලපෑම"පිළිබඳ GSMA සමාගමේ පුහුණුව සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා නිලධාරීන් 12 ක් ද "රේඩියෝ සංඥා සහ සෞඛ්‍යය". සඳහා නිලධාරීන් 17 ක් ද සහභාගී වූහ. තවද, අන්තර්ජාල ජාලකරණ ක්‍රමය පිළිබඳ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ - APT/ තොරතුරු ආරක්ෂණ මෙහෙයුම් මධ්‍යස්ථානයේ - ISOC පුහුණු පාඨමාලාවට නිලධාරීන් 9 දෙනෙක් සහභාගී වූහ. ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනය (WTISD) සැමරීම සඳහා ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ මහලේකම්, සභාපති සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ විශේෂ පණිවුඩ නිකුත් කිරීමට සහ කොමිෂන් සභා වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කිරීමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අවශ්‍ය කටයුතු සම්පාදනය කළේය. වැඩසටහනේ තේමාව ඉස්මතු කරමින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ සහභාගීත්වයෙන් උත්සවයක් සාර්ථකව පවත්වන ලදී. මෙම වසරේ ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනයේ - WTISD තේමාව වන "නිරෝගීමත් වයස්ගතවීම හා වැඩිහිටි පරපුර උදෙසා ඩිජිටල් සහාය"කෙරෙහි අවධානය යොමු කරමින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා වෙබ් අඩවිය, සමාජ මාධ්‍ය සහ විද්‍යුත් මාධ්‍ය ඔස්සේ මහජනතාව දැනුවත් කිරීමට ද අවශ්‍ය පියවර ගෙන ඇත.

විශේෂ ව්‍යාපෘති

කොළඹ නෙළුම් කුලුන: මෙම වසරේ කොළඹ නෙළුම් කුලුන (CLT) ව්‍යාපෘතියේ දෝෂ නිවැරදි කිරීම, ව්‍යාපෘතිය භාර ගැනීම සහ වාණිජ මෙහෙයුම් ආරම්භ කිරීම කෙරෙහි ප්‍රධාන අවධානය යොමු විය. කෙසේ වෙතත්, කෝවිඩ්-19 වසංගතය මෙන්ම රටේ ආර්ථික අර්බුදය හේතුවෙන් ව්‍යාපෘතියේ ප්‍රගතියට බලපෑම් එල්ල විය. කොන්ත්‍රාත්කරු වන China National Electronics Import & Export Corporation (CEIEC) විසින් ක්‍රියාත්මක කළ යුතු කොන්දේසි සහිතව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව 2022 පෙබරවාරි 28 වැනි දින කොළඹ නෙළුම් කුලුන භාර ගන්නා ලදී. පසුව, 2022 මාර්තු 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මුදල් අමාත්‍යාංශයට (භාණ්ඩාගාරයට) සම්පූර්ණයෙන්ම අයත් සමාගමක් වන සීමාසහිත කොළඹ නෙළුම් කුලුන කළමනාකරණ (පෞද්ගලික) සමාගම (Colombo Lotus Tower Management Company (Private) Ltd - CLTMC) වෙත කොළඹ නෙළුම් කුලුන භාර දෙන ලදී. එක්සිම් බැංකු ණය වාරික පියවීමට කටයුතු කරන ලද අතර නීතිපති දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව බදු ගිවිසුම් කෙටුම්පත සහ කල්බදු කුලිය නිර්දේශ කිරීම සඳහා ඉහළ මට්ටමේ කමිටුවක් පත් කරන ලදී. මීට අමතරව, විකාශන පහසුකම් සඳහා ජනමාධ්‍ය අමාත්‍යාංශය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමටත්, නෙළුම් කුලුන ඉඩම අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන කළමනාකරණ ගිවිසුමක් ඇති කර ගැනීමටත් කටයුතු යොදා ඇත. කොළඹ නෙළුම් කුලුනේ වත්කම් භෞතික සත්‍යාපනය කර සීමාසහිත කොළඹ නෙළුම් කුලුන කළමනාකරණ (පෞද්ගලික) සමාගම - CLTMC වෙත පැවරීම ආරම්භ කර ඇත.

නව ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල: ගොඩනැගිල්ල පරීක්ෂා කිරීම සහ ඉදි කිරීමේ කටයුතු හැර ගොඩනැගිල්ලේ භෞතික වැඩ නිම කරන ලදී. අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති දැනට පවතින ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීම වෙනුවට නව ගොඩනැඟිල්ලක් ඉදිකිරීම පිළිබඳව අමාත්‍ය මණ්ඩලය දැනුවත් කිරීම පිණිස මෙම ව්‍යාපෘතිය පිළිබඳ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව රේඛීය අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කර ඇත.

වෙනත් ව්‍යාපෘති: හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යානය සම්බන්ධයෙන් බෙරුම්කරණ විනිශ්චය සභාවෙන් තීන්දුවක් ලැබී ඇති අතර එම තීරණයට අනුව අවශ්‍ය පියවර ගෙන ඇත.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල සඳහා සූර්ය බලශක්ති ව්‍යාපෘතිය ස්ථාපිත කිරීම පිණිස ව්‍යාපෘති සංකල්පය සහ තාක්ෂණික පිරිවිතර කෙටුම්පත් කර ඇත. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියෙන් ශක්‍යතා වාර්තාවක් ඉල්ලා ඇත.

මූල්‍ය කටයුතු

2022 වාර්ෂික අයවැය සහ 2022 මූල්‍ය බලතල පැවරීමේ ප්‍රකාශන සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන ඇත. 2021 සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සකස් කර කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව අදාළ ආයතන වෙත ඉදිරිපත් කරන ලදී. අවසාන ආදායම් බදු ගණනය කිරීම සහ 2021/2022 වරිපනම් වර්ෂය සඳහා වාර්ෂික ආදායම් බදු වාර්තා සකස් කෙරෙමින් පවතී. අර්ධ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන කෙටුම්පතක් සකස් කරන ලද අතර, දෙවන කාර්තුවේ ආදායම් බදු ගෙවීම 2022 අගෝස්තු මාසයේදී සිදු කරන ලදී. 2022 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනය සකස් කරමින් පවතී. මුදල් පනත සහ විදුලි සංදේශ බදු පනත යටතේ සියලුම බදු නියමිත වේලාවට එකතු කර නියමිත කාලය තුළ ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරන ලදී. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් දේශීය ආදායම් පනත යටතේ අදාළ බදු (එකතු කළ අගය මත බද්ද, අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද, මුද්දර බදු, රඳවා ගැනීමේ බද්ද) එකතු කරන ලද අතර සේවක ප්‍රතිලාභ සඳහා දායක මුදල් (සේවක අර්ථසාධක අරමුදල - EPF සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල - ETF) ගෙවීම නිසි කලට සිදු කරන ලදී.

අභ්‍යන්තර විගණනය

මෙම වසරේ දී, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ආයතනයේ අරමුණු, පාලනය, අවදානම් කළමනාකරණය, පාලන ක්‍රියාවලීන්,

මෙහෙයුම් පරිවයන් සහ නීති රීති පිළිපැදීම වැඩිදියුණු කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කරමින් අඛණ්ඩ අභ්‍යන්තර විගණනයක නිරත විය. තවද, අභ්‍යන්තර විගණන විමර්ශන සිදු කරන ලද අතර, අලාභ හා වංචාවෙන් ආරක්ෂා වීම සඳහා අදාළ විගණන සමාලෝචන සිදු කර ඇගයීම් ලබා දෙන ලදී. කොමිෂන් සභාවේ ඉල්ලීම පරිදි විශේෂ අභ්‍යන්තර විගණන වාර්තා ද සකස් කරන ලදී.

පාලන සහ ආයතනික කටයුතු

කොමිෂන් සභාව විසින් 2022 වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම අනුමත කරන ලදී. මෙම කාලය තුළ ජ්‍යෙෂ්ඨ ප්‍රසම්පාදන කමිටු රැස්වීම් 11 ක් සහ සුළු ප්‍රසම්පාදන කමිටු රැස්වීමක් 01 ක් පවත්වන ලදී. 2022 ප්‍රසම්පාදන සැලැස්මේ 91% ප්‍රගතියක් ලබා ඇත. 2021 වාර්ෂික සමීක්ෂණ මණ්ඩලය පුද්ගලයන් පස් දෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක් සහිතව පැවැත්විණි. ක්‍රියාකාරී සැලැස්ම 2023 සහ ආයතනික සැලැස්ම 2023 - 2025 සියලුම අංශ ප්‍රධානීන් සමඟ සහයෝගයෙන් සකස් කරන ලදී. මාර්ගෝපදේශයන්ට අනුව මෙම වාර්තා අදාළ අමාත්‍යාංශ සහ ආයතන වෙත ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම 2022 අරමුණු නිසි පරිදි ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා කාර්තුමය ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වන ලදී. නියමිත කාල සීමාව තුළ මාසික හා කාර්තුමය ප්‍රගති වාර්තා ඉදිරිපත් කරන ලදී. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිත ප්‍රගති වාර්තාව, 2023 ජාතික අයවැය යෝජනාව සහ 2022 වසර සඳහා තිරසාර සංවර්ධන ඉලක්ක ප්‍රගති වාර්තාව රේඛීය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී. 2020 මූල්‍ය ප්‍රකාශය සහිත වාර්ෂික වාර්තාව ආරක්ෂක අමාත්‍යාංශය මඟින් අමාත්‍ය මණ්ඩලයේ සහ ජනාධිපතිවරයාගේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. 2021 වාර්ෂික වාර්තා කෙටුම්පත 2022 පෙබරවාරි 28 වන දින අදාළ ආයතන වෙත ඉදිරිපත් කරන ලදී. විගණකාධිපතිවරයාගේ වාර්තාව ලැබීමෙන් පසු අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා 2021 අවසන් වාර්ෂික වාර්තාව 2022.09.15 දින ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. ඊට අමතරව රේඛීය අමාත්‍යාංශය මඟින් කෝප් වාර්තා අදාළ ආයතන වෙත නියමිත කාලයට ලබා දෙන ලදී.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සඳහා අනුමත සේවක සංඛ්‍යාව 298කි. මෙම වර්ෂය තුළ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව යෝජිත බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයේ (SOR) කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී. මෙම කාර්යයට සම්බන්ධ උපදේශකවරයා අවසන් වාර්තාව ඉදිරිපත් කර එය සමාලෝචනය කිරීම සඳහා කොමිෂන් සභාව වෙත යොමු කළේය. අදාළ අංශ අනුව යෝජිත සංවිධාන ව්‍යුහය සහතික කිරීම සඳහා අංශ ප්‍රධානීන් සමඟ පැවැත්වූ සාකච්ඡාවක ප්‍රතිඵලයක් ලෙස මෙම වාර්තාව සකස් කර ඇත. 2022 දෙසැම්බර් 31 වන දිනට මුළු කාර්ය මණ්ඩලය 215ක් විය. සමස්ථ කාර්ය මණ්ඩලයෙන් 03ක් ජ්‍යෙෂ්ඨ කළමනාකාර, 29ක් මධ්‍ය කළමනාකාර තනතුරුවල, 145ක් යටත් නිලතලවල සහ 38 සුළු ශ්‍රේණිවල සේවය කරයි. අනුමත බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය ප්‍රකාරව විධායක කාර්ය මණ්ඩලයේ තනතුරු පුරප්පාඩු පිරවීමට නියමිතව ඇත. මෙම බඳවා ගැනීම් පටිපාටියේ ප්‍රමාදය ආයතනයේ පරිපාලනයට මෙන්ම කාර්යක්ෂමතාවයට අහිතකර ලෙස බලපෑවේය. මෙම බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය උපදෙස් සහ අනුමැතිය ලබා ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අවශ්‍ය සාධාරණීකරනයන් සහිතව මුදල් අමාත්‍යාංශයට දැනුම් දී ඇත.

මෙම වසර තුළ සේවක කාර්ය සාධන ඇගයීම් සහ වැටුප් වර්ධක සකස් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී. වසර 3 ක පරිවාස කාලය අවසන් වූ පසු සේවකයින් 30 දෙනෙකු ඔවුන්ගේ තනතුරුවල ස්ථිර කරන ලදී. කාර්ය සාධනයේ සාර්ථකත්වය සහ ප්‍රවේශ අවශ්‍යතා සපුරාලීම සලකා බලා කොන්ත්‍රාත් සේවකයින් 07 දෙනෙකු සේවයේ ස්ථිර කරන ලදී. අභ්‍යන්තර උසස්වීම් යෝජනා ක්‍රමය යටතේ කළමනාකරණ සහකාර 01, සංවර්ධන නිලධාරී 01 සහ සහකාර අධ්‍යක්ෂ 01 II ශ්‍රේණියේ සිට I ශ්‍රේණිය දක්වා උසස් කරන ලදී. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නිලධාරීන් 16 දෙනෙකු සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග සාර්ථකව පවත්වන ලදී.

විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ දැනුම, කුසලතා සහ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා දේශීය සහ විදේශීය පුහුණු වැඩසටහන් 17කට සහභාගී වීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී. රජයේ විශ්වවිද්‍යාල සහ ව්‍යාත්තීය පුහුණු ආයතනවල සිසුන් 07 දෙනෙකු මාස 06 ක පුහුණු කාලයක් සඳහා පුහුණුකරුවන් ලෙස බඳවා ගන්නා ලද අතර ඔවුන්ට විදුලි සංදේශ ක්ෂේත්‍රයේ අත්දැකීම් ලබා ගැනීමට හැකි විය.

කාර්ය මණ්ඩලය සඳහා වෙබ් පාදක මානව සම්පත් නිවාඩු-අයදුම් කිරීමේ ක්‍රමයක් හඳුන්වා දෙන ලද අතර එම පද්ධතිය කාර්ය මණ්ඩලය විසින් සාර්ථකව භාවිතා කරනු ලැබේ. මේ සඳහා ජංගම යෙදුමක් ද හඳුන්වා දී ඇති අතර එහි වැඩිදියුණු කිරීම් කටයුතු සිදු කෙරෙමින් පවතී. MS Teams මඟින් රාජකාරී වාහන අයදුම් කිරීමේ ක්‍රමය කාර්ය මණ්ඩලය විසින් රාජකාරි සඳහා වෙන් කරවා ගැනීම සඳහා භාවිතා කරන ලදී. ඉන්ධන හිඟය හේතුවෙන් අත්‍යාවශ්‍ය කාර්යාල රාජකාරී වෙනුවෙන් නිරීක්ෂණ වාරිකා සහ ප්‍රවාහනය සඳහා සීමිත ක්‍රමවේදයකට අනුව මෙම වාහන වෙන්කරන ලදී.

මෙම වසරේ දී සකස් කරන ලද ආපදා ණය සහ මෝටර් වාහන ණය සංඛ්‍යාව පිළිවෙලින් 62 සහ 02 ක් විය. මීට අමතරව, නිවාස ණය ලබා ගැනීම් වෙනුවෙන් ණය පොළී මුදලින් 2/3ක් ප්‍රතිපූරණය කරන ලද වාර ගණන 248 කි. එමෙන්ම විශ්‍රාමික සේවකයින් දෙදෙනෙකු සඳහා පාරිතෝෂික ප්‍රදානය කිරීම ද සිදු කෙරිණි. බොහෝ මාධ්‍ය ක්‍රියාකාරකම් සමාජ මාධ්‍ය සහ වෙබ් අඩවිය ඔස්සේ ආවරණය කෙරිණි. සියලුම කාර්ය මණ්ඩලය සඳහා පුස්තකාල පහසුකම් සපයා ඇත. ආයතනය සහ විදුලි සංදේශ කර්මාන්තය ආශ්‍රිත පුවත්පත් ලිපි කාර්ය මණ්ඩලයේ දැන ගැනීම සඳහා MS Teams හරහා බෙදා හැර යාවත්කාලීන කරන ලදී.

MOF - PED 04/2022 දරන චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව ආයතනයේ ඉහළ මට්ටමේ කළමනාකරණ කමිටුවක් ස්ථාපනය කිරීමට පියවර ගන්නා ලදී. 2022 ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම (ප්‍රාග්ධනය) සහ ක්‍රියාකාරී සැලැස්මෙහි (නියාමන) මූල්‍ය වියදම් පාලනය කිරීම සඳහා රැස්වීම් දෙකක් පවත්වා ඉහළ සහ අඩු ප්‍රමුඛතා ක්ෂේත්‍ර හඳුනා ගන්නා ලදී. චක්‍රලේඛ මාර්ගෝපදේශයට අනුකූලව 2022 වසරේ දී ක්‍රියාකාරකම්/ව්‍යාපෘති කිහිපයක් නතර කිරීමට තීරණය කරන ලදී. ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම් සහ ව්‍යාපෘති පිළිබඳ අවසන් ලැයිස්තුව සකස් කරන ලදී. "ගමට සන්නිවේදනය" ජාතික ව්‍යාපෘතියේ නියාමන සහ ව්‍යාපෘති ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර, පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන, ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතා (IMEI) සත්‍යාපන පද්ධතිය/මාදිලි අනුමැති පද්ධතිය වැඩිදියුණු කිරීම, කොමිෂන් සභා වෙබ් අඩවිය ප්‍රති නිර්මාණය කිරීම සහ 2022 වර්ෂයේදී සිදුකිරීමට අවශ්‍ය අනෙකුත් අත්‍යාවශ්‍ය ප්‍රසම්පාදන විස්තර රේඛීය අමාත්‍යාංශය මඟින් මුදල් අමාත්‍යාංශය/රාජ්‍ය ව්‍යාවසාය දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම පිණිස යොමු කර ඇත.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ක්‍රියාකාරී සැලැස්ම 2022 ට අනුකූලව, ආයතනයේ ක්‍රියාකාරකම් වලින් 78% ක් පමණ අපේක්ෂා කළ පරිදි සිදු කරන ලද අතර, දැනට රට තුළ පවතින දැඩි ආර්ථික බාධාවන්ගේ බලපෑම යටතේ වුවද, ක්‍රියාකාරකම්වලින් 55% ක් පමණ වූ ඉලක්කගත ප්‍රගතියක් සාක්ෂාත් කර ගෙන ඇත.

තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරලීමේ වැඩසටහන 2022

සංවර්ධනය පිළිබඳ ගෝලීය අවබෝධය දැන් සමෘද්ධිය, ආර්ථික අවස්ථා, පරිසරය ආරක්ෂා කිරීම සහ වැඩි සමාජ යහපැවැත්ම ප්‍රවර්ධනය කරන තිරසාර සංවර්ධනයක් කරා ගමන් කරයි. මෙම සන්දර්භය තුළ, විදුලි සංදේශ/තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය (ICTs) තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සාක්ෂාත් කර ගැනීමේ ප්‍රධාන සවිබලගන්වන්නන් ලෙස සැලකේ.

ගෝලීය අන්තර් සම්බන්ධතාවය ආශ්‍රිත තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ව්‍යාප්ත කිරීමෙහි ලා එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් සම්මත කරන ලද තිරසාර සංවර්ධන ඉලක්ක මඟින් මානව දියුණුව වේගවත් කිරීමට සහ තොරතුරු හා සන්නිවේදන සේවා ව්‍යාප්ති විෂමතාවය අවම කිරීමට විශාල හැකියාවයක් පවතී.

විදුලි සංදේශ/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම වේගවත් කිරීම සඳහා අපි 2022 වසරේ අපගේ ක්‍රියාකාරී සැලසුම්වල තිරසාර සංවර්ධන ඉලක්ක මුලපිරීම් ඇතුළත් කළෙමු.

තිරසාර සංවර්ධන ඉලක්ක 4 - ගුණාත්මක අධ්‍යාපනය:
සැමට අංගසම්පූර්ණ සහ ගුණාත්මක අධ්‍යාපනය සහතික කිරීම සහ ජීවිත කාලය පුරාම ඉගෙනීම ප්‍රවර්ධනය කිරීම.

4.4 2030 වන විට, සේවා නියුක්තිය, ප්‍රමාණවත් රැකියා අවස්ථා සහ ව්‍යවසායකත්වය සඳහා තාක්ෂණික සහ වෘත්තීය කුසලතා ඇතුළු අදාළ කුසලතා ඇති තරුණ හා වැඩිහිටි ප්‍රජාව සැලකිය යුතු ලෙස වැඩි කිරීම.

ක්‍රියාකාරී අයිතමය	ඉලක්ක	ප්‍රගතිය
දේශීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන	අධ්‍යාපන අමාත්‍යාංශය, ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය, අනෙකුත් රාජ්‍ය ආයතන සහ විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් සමඟ සහයෝගයෙන් ග්‍රාමීය ප්‍රදේශවල සිසුන් අතර තොරතුරු සන්නිවේදන තාක්ෂණ සාක්ෂරතාවය ඉහළ නැංවීම. වෘත්තීය සිසුන්ට වඩා හොඳ රැකියා අවස්ථා සොයා ගැනීමට සහ ව්‍යවසායකයින් වීමට සවිබල ගැන්වීම.	• ස්වේච්ඡා සේවකයන් මාසයක කාලයක් මාර්ගගතව පුහුණු කරන ලදී. රාජ්‍ය ආයතන, විශ්වවිද්‍යාල සහ දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් පවත්වනු ලබන පුහුණු සැසි 15 ක් මෙයට ඇතුළත් වේ. • මොණරාගල, හම්බන්තොට, මාතර, කුරුණෑගල සහ කෑගල්ල දිස්ත්‍රික්කවල පාසල් 17ක් සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ සම්බන්ධීකරණයෙන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා සේවකයන් මාස දෙකක කාලයක් සඳහා පිටත් කර යවන ලදී. • ලියාපදිංචි තැපෑලෙන් ස්වේච්ඡා සේවකයන්ට සහතිකපත්‍ර ලබාදීමට කටයුතු කිරීමෙන් අනතුරුව වැඩසටහන අවසන් කරන ලදී. • සමාප්ති උත්සවය 2022.05.30 දින මාර්ගගතව පවත්වන ලදී.
ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරියේ සහාය ඇතිව විදුලි සංදේශ කුළුණු කාර්මික ශිල්පීන් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය සංවර්ධනය කිරීම	ජාතික නිපුණතා ප්‍රමිතිය (NCS) සහ විදුලි සංදේශ කුලුනු කාර්මික ශිල්පීන් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටමේ 3/4 විෂය මාලාව සංවර්ධනය කිරීම.	• ජාතික වෘත්තීය සුදුසුකම් 4 වන මට්ටම සඳහා විදුලි සංදේශ කුළුණු කාර්මික ශිල්පීන් සඳහා ජාතික නිපුණතා ප්‍රමිතිය සහ විෂය මාලාව තෘතීය සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී. • දෙවන කාර්තුව තුළ ඇගයුම් සංවර්ධනය සහ වලංගු කිරීම සම්බන්ධ සබැඳි රැස්වීම් කිහිපයක් පවත්වන ලදී. • ඇගයුම් සම්පත් සංවර්ධනය සහ තක්සේරු සම්පත් වලංගු කිරීම සම්පූර්ණ කරන ලදී. • අනුමත පුහුණු මධ්‍යස්ථානවල ජාතික වෘත්තීය සුදුසුකම් පාඨමාලාව ආරම්භ කිරීම ඇතුළුව මෙම මූලපිරීමේ ඉදිරි මාවත සාකච්ඡා කිරීම සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් මාර්ගගත දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී. විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය, විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් සහ පුහුණු ආයතනවල නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2022.11.25 වන දින තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් මාර්ගගත දැනුවත් කිරීමේ වැඩසටහන පවත්වන ලදී.

4.7 2030 වන විට, තිරසාර සංවර්ධනය සහ තිරසාර ජීවන රටාවන් සඳහා අධ්‍යාපනය, මානව හිමිකම්, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, සාමය සහ අවිහිංසාවාදී සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම ඇතුළුව, තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය දැනුම සහ කුසලතා සියලුම අධ්‍යාපනය හදාරන්නන්ට අත්පත් කරදීම, සාමය සහ අවිහිංසාවාදී සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, ගෝලීය පුරවැසිභාවය සහ සංස්කෘතික විවිධත්වය අගය කිරීම සහ තිරසාර සංවර්ධනය සඳහා සංස්කෘතියේ දායකත්වය අගය කිරීම සහතික කිරීම.

ක්‍රියාකාරී අයිතමය	ඉලක්ක	ප්‍රගතිය
2022 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දින වැඩසටහන - ගැහැණු දරුවා තොරතුරු තාක්ෂණ විෂයය සමගාමී අධ්‍යාපනය හා වෘත්තීය වෙත යොමුවීමේ වැදගත්කම	සමාජ මාධ්‍ය/වෙබ් අඩවිය/ ඉලෙක්ට්‍රොනික මාධ්‍ය/පුවත්පත් යනාදිය මඟින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන දැනුවත් කිරීමේ වැඩසටහන්.	• 2022 ජාත්‍යන්තර විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනයේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධානීන් සහ කාර්ය මණ්ඩලයේ සහභාගීත්වයෙන් එම දිනයේ තේමාවට යටත්ව දැනුවත් කිරීමේ වැඩසටහන 2022 මැයි 17 වන දින පවත්වන ලදී. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වෙබ් අඩවිය සහ විද්‍යුත් මාධ්‍ය ඔස්සේ ජාත්‍යන්තර විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනය 2022 පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමට කටයුතු සම්පාදනය කරන ලදී. ඒ සඳහා දැනුවත් කිරීමේ වීඩියෝ පටයක් මාධ්‍ය ඒකකය විසින් එම අංශය සමඟ සම්බන්ධීකරණයෙන් සකස් කරන ලදී. • අධ්‍යාපන අමාත්‍යාංශයේ සහය ඇතිව ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ “2022 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දිනයේදී ගැහැණු දරුවා තොරතුරු තාක්ෂණ විෂයය සමගාමී අධ්‍යාපනය හා වෘත්තීය වෙත යොමුවීමේ වැදගත්කම වැඩසටහන”සැමරීම සඳහා මාර්ගගත දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගන්නා ලදී. • මෙම වසරේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දිනයේ තේමාවට අනුකූලව අධ්‍යාපන අමාත්‍යාංශය, ශ්‍රී ලංකා පරිගණක හදිසි ආපදා වලට සූදානම්වීමේ සංසදය, ඩයලොග් සහ මොබිටෙල් සමාගම් විසින් 2022 දෙසැම්බර් 14 වැනි දින සම්පත් දායකයින්ගේ සහයෝගයෙන් ගැහැණු දරුවන් සඳහා පැය දෙකක මාර්ගගත දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී. • කුරුණෑගල, කෑගල්ල, මාතර, හම්බන්තොට සහ මොනරාගල දිස්ත්‍රික්කවලින් “තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන 2021”ට සම්බන්ධ පාසල් 10 ක් නියෝජනය කරමින් ශිෂ්‍යාවන් සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ ගුරුවරුන් මෙම මාර්ගගත වැඩසටහනට සහභාගී විය.

තිරසාර සංවර්ධන ඉලක්ක 9: කර්මාන්ත, නවෝත්පාදන සහ යටිතල පහසුකම්

කර්මාන්ත, නවෝත්පාදන සහ ශක්තිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, තිරසාර කාර්මිකකරණය ප්‍රවර්ධනය කිරීම සහ නවෝත්පාදනයන් පෝෂණය කිරීම.

9.1 සැමට දැරිය හැකි සහ සාධාරණ ප්‍රවේශයක් කෙරෙහි අවධානය යොමු කරමින් ආර්ථික සංවර්ධනයට සහ මානව යහපැවැත්මට සහාය වීම සඳහා කලාපීය සහ දේශසීමා යටිතල පහසුකම් ඇතුළුව ගුණාත්මක, විශ්වාසදායක, තිරසාර සහ ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

ක්‍රියාකාරී අයිතමය	ඉලක්ක	ප්‍රගතිය
දුරකථන අංකය වෙනස් නොකර ග්‍රාහකයන්ට ජාල අතර මාරුවීමේ හැකියාව ක්‍රියාත්මක කිරීම	• සේවා සපයන්නා වෙනස් කිරීමේදී ග්‍රාහකයින්ට අංකය රඳවා ගත හැක	• සියලුම බලපත්‍රලාභී ස්ථාවර සහ ජංගම ක්‍රියාකරු සමාගම්වල සාමාජිකයින්ගෙන් සමන්විත වන “Lanka Number Portability Services Ltd”නමින් ඇපකර සමාගමක් දුරකථන අංකය වෙනස් නොකර ග්‍රාහකයන්ට ජාල අතර මාරුවීමේ හැකියාව ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුම් සඳහා පිහිටුවා ඇත. • දුරකථන ක්‍රියාකරු සමාගම්වල අදහස් ප්‍රකාරව කෙටුම්පත් රීති සහ මාර්ගෝපදේශ සංශෝධනය කරමින් පවතී. • ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ දුරකථන ක්‍රියාකරු සමාගම් දුරකථන අංකය වෙනස් නොකර ග්‍රාහකයන්ට ජාල අතර මාරුවීමේ හැකියාව සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ඉදිරි පියවර ගනිමින් සිටී.

9.4 2030 වන විට සියළුම රටවල් ඔවුන්ගේ හැකියාවන්ට අනුකූලව කටයුතු කිරීමත් සමඟ යටිතල පහසුකම් සහ ප්‍රතිනිර්මාණය කිරීමේ කර්මාන්ත වැඩිදියුණු කිරීම, සම්පත් පරිහරණ කාර්යක්ෂමතාව වැඩි කිරීම සහ පිරිසිදු හා පරිසර හිතකාමී තාක්ෂණයන් සහ කාර්මික ක්‍රියාවලීන් වැඩි වශයෙන් භාවිතා කිරීම.

ක්‍රියාකාරී අයිතමය	ඉලක්ක	ප්‍රගතිය
කුලුනු ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය	• අනුමත නොකරන ලද කුලුනු ලැයිස්තුව සම්පූර්ණ කර නව අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස දුරකථන ක්‍රියාකරු සමාගම් වලට දැනුම් දීම.	• අනුමත නොකරන ලද වැඩබිම් සඳහා එයාර්ටෙල් සහ හච්සන් සමාගම් විසින් නව අයදුම්පත් ඉදිරිපත් කිරීම. • ලංකා බෙල් සහ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතන වලට ඔවුන්ගේ අනුමත නොකළ කුලුනු සඳහා නව අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස දන්වා ඇත.
හඬ සහ දත්ත/අධිවේගී අන්තර්ජාල සේවා සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සකසා ඇති සේවා තත්ත්ව (QoS) පරාමිති දුරකථන ක්‍රියාකරු සමාගම් පිළිපැදීම සහතික කිරීම.	• පිළිපැදිය යුතු සේවා තත්ත්ව පරාමිති: ○ ස්ථාවර දුරකථන ක්‍රියාකරු සමාගම් සඳහා පරාමිති 16 ○ ජංගම දුරකථන ක්‍රියාකරු සමාගම් සඳහා පරාමිති 14	• සියලුම දුරකථන ක්‍රියාකරු සමාගම් නියමිත වේලාවට අදාළ සේවා තත්ත්ව වාර්තා ඉදිරිපත් කර ඇත. • ලංකා බෙල් සහ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතන වලට ඔවුන්ගේ අනුමත නොකළ කුලුනු සඳහා නව අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස දන්වා ඇත.

9.5 2030 වන විට නවෝත්පාදන දිරිමත් කිරීම සහ රාජ්‍ය හා පෞද්ගලික පර්යේෂණ සහ සංවර්ධන වියදම් සඳහා වන පර්යේෂණ හා සංවර්ධන සේවකයින් සංඛ්‍යාව සැලකිය යුතු ලෙස වැඩි කිරීම ඇතුළුව, විශේෂයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල, විද්‍යාත්මක පර්යේෂණ වැඩිදියුණු කිරීම, කාර්මික අංශවල තාක්ෂණික හැකියාවන් වැඩිදියුණු කිරීම.

ක්‍රියාකාරී අයිතමය	ඉලක්ක	ප්‍රගතිය
ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතනවල සහාය ඇතිව විදුලි සංදේශ ආශ්‍රිත පර්යේෂණ අධ්‍යයන පැවැත්වීම	• විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතනවල සහාය ඇතිව පර්යේෂණ අධ්‍යයන සිදු කිරීම	• දෙසැම්බර් මාසයේදී “Blockchain and AI-empowered Cryptographic Dynamic Spectrum Access for 6G and Beyond”පිළිබඳ පර්යේෂණ අධ්‍යයනය සම්පූර්ණ කරන ලදී. • පහත සඳහන් ප්‍රගති සමාලෝචන ඉදිරිපත් කිරීම් සහ වාර්තා සම්පූර්ණ කිරීමෙන් පසු වාරික වශයෙන් ගෙවීම් සිදු කරන ලදී: ○ මූලික ඉදිරිපත් කිරීම ○ 1 වන ප්‍රගති සමාලෝචනය ඉදිරිපත් කිරීම සහ වාර්තාව ○ 2 වන ප්‍රගති සමාලෝචනය ඉදිරිපත් කිරීම සහ වාර්තාව ○ අවසාන ඉදිරිපත් කිරීම සහ වාර්තාව

තිරසාර සංවර්ධන ඉලක්ක 16: සාමය, යුක්තිය සහ ශක්තිමත් ආයතන
තිරසාර සංවර්ධනය සඳහා සාමකාමී සහ අංගසම්පූර්ණ සමාජයන් ප්‍රවර්ධනය කිරීම, සැමට යුක්තිය සඳහා ප්‍රවේශය සැපයීම සහ සෑම තරාතිරමකම ඵලදායී, වගවීම සහිත අංගසම්පූර්ණ ආයතන ගොඩනැගීම

16.6 සෑම මට්ටමකම ඵලදායී, වගවීම සහිත පාරදෘශ්‍ය ආයතන ලෙස සංවර්ධනය කිරීම.

ක්‍රියාකාරී අයිතමය	ඉලක්ක	ප්‍රගතිය
විදුලි සංදේශ කර්මාන්තයේ වෙගවත් වර්ධනයන් සපුරාලීම සඳහා සංශෝධිත/නව පනත සකස් කිරීමේ ක්‍රියාවලිය	• පනත සංශෝධනය කිරීමේ ක්‍රියාකාරකම් ආශ්‍රිත ක්‍රියාවලිය අවසන් කිරීමේ ප්‍රතිශතය	• සංකල්ප පත්‍රිකාවක් සකස් කිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයකු ඇතුළු බුද්ධිමතුන් සහ විශේෂඥයන්ගෙන් සැදුම්ලත් කමිටුවක් පත් කිරීමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට බලය පැවරීමට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත. • කොමිෂන් සභාව විසින් කමිටුවට පත්කිරීම් නැවත සලකා බැලීම සහ මෙම කමිටුවට සභාපතිවරයෙකු නම් කිරීම සහ සුදුසු නම් කරන්නන් සම්බන්ධයෙන් නැවත අදහස් විමසීමෙන් පසු කමිටුව ප්‍රතිසංවිධානය කිරීම.

16.7 සෑම මට්ටමකම ප්‍රතිචාරාත්මක, අංගසම්පූර්ණ, සහභාගිත්ව සහ නියෝජිත තීරණ ගැනීම සහතික කිරීම.

ක්‍රියාකාරී අයිතමය	ඉලක්ක	ප්‍රගතිය

දැනුවත් කිරීම තුළින් සාධාරණ නියාමන පරිසරයක් සහතික කිරීම	• අදාළ පාර්ශවකරුවන්ගේ සහයෝගිත්වය ඇතිව පවත්වනු ලබන දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව	• භෞතික දැනුවත් කිරීමේ වැඩසටහන්
		  ○ කන්දකාඩු - 01
		  ○ පිටිපන - 01
		  ○ පාසල - 01
		• මාර්ගගත දැනුවත් කිරීමේ වැඩසටහන්
		  ○ පාසල - 02
		  ○ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - 16
		  ○ යුධහමුදාව / පොලීසිය - 11
		• වෙනත් වැඩසටහන්
		  ○ රූපවාහිනී වැඩසටහන් - 10
		  ○ පුවත්පත් නිවේදන - 8

විදුලි සංදේශ පරිසරය සම්බන්ධයෙන් පාරිභෝගික ආරක්ෂාව සහතික කිරීම	• මෙහෙයවන පාරිභෝගික පැමිණිලි සංඛ්‍යාව. • සාකච්ඡා කරන ලද පාරිභෝගික ආරක්ෂණ ගැටළු සංඛ්‍යාව. • ඇගයුම් ක්‍රියාකරුගේ කාර්ය සාධනය සහ කාර්ය සාධන වාර්තාව ප්‍රකාශයට පත් කිරීම.	• පාරිභෝගික පැමිණිලි 1500ක් මෙහෙයවා ඇත. • පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාකරුවන් සමඟ සාකච්ඡා 752 ක් පවත්වන ලදී. • අස්ථානගත වූ ජංගම දුරකථන සම්බන්ධව නව පැමිණිලි 44,013ක් ලැබී ඇති අතර ප්‍රතිඵල ලද පැමිණිලි 21,471ක් සම්බන්ධයෙන් අදාළ පොලිස් ස්ථාන වෙත දැනුම් දෙන ලදී. • සමාජ මාධ්‍ය පැමිණිලි 1,232ක් ඉදිරිපත් කර ඇති අතර, 878ක් සඳහා අවශ්‍ය උපදෙස් ලබා දී ඇති අතර, සමාජ මාධ්‍යවල පැමිණිලි 354ක් වාර්තා විය. • ජංගම දුරකථන ක්‍රියාකරු සමාගම් හතර දෙනාගේම අගය එකතු කළ සේවා විගණනය සිදු කරන ලදී.

තිරසාර සංවර්ධන ඉලක්ක 17: ඉලක්ක සඳහා හවුල්කාරිත්වය
ක්‍රියාත්මක කිරීමේ මාර්ග ශක්තිමත් කිරීම සහ තිරසාර සංවර්ධනය සඳහා වූ ගෝලීය හවුල්කාරිත්වය යාවත්කාලීන කිරීම

17.6 විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදනය සඳහා උතුරු-දකුණු, දකුණු-දකුණු සහ ත්‍රිකෝණාකාර කලාපීය සහ ජාත්‍යන්තර සහයෝගිතාව වැඩිදියුණු කිරීම සහ පවතින යාන්ත්‍රණයන් අතර, විශේෂයෙන් එක්සත් ජාතීන්ගේ මට්ටමින් වැඩිදියුණු කරන ලද සම්බන්ධීකරණය ඇතුළුව, ගෝලීය තාක්ෂණික පහසුකම් යාන්ත්‍රණයක් මඟින් අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වූ කොන්දේසි මත දැනුම බෙදාගැනීම වැඩි දියුණු කිරීම.

ක්‍රියාකාරී අයිතමය	ඉලක්ක	ප්‍රගතිය
17 වගන්තියේ බලපත්‍ර මාර්ගෝපදේශ සංශෝධනය කිරීම.	සංශෝධිත බලපත්‍ර මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම (17 වගන්තිය)	• නව කෙටුම්පත් බලපත්‍ර මාර්ගෝපදේශ සකස් කර අභ්‍යන්තර කමිටුවක් විසින් සමාලෝචනය කරන ලදී. • ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ විශේෂඥ නිර්දේශය ලබා දී ඇත. • කෙටුම්පත් මාර්ගෝපදේශය නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර නීතිමය නිශ්කාශන නිකුත් කර ඇත. • ඉදිරි ක්‍රියාමාර්ග සඳහා කොමිෂන් සභාවේ තීරණය අපේක්ෂා කෙරේ.
උසස් පුහුණු ක්‍රියාකාරකම් සඳහා ජාත්‍යන්තර සංවිධාන සම්බන්ධීකරණය කිරීම	• ලැබුණු සහ සහභාගී වූ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව. • විදේශ පුහුණුව සඳහා නිපුණතා ඇගයීම් වැඩසටහන. • දැනුම බෙදාගැනීමේ පුහුණු සැසි ගණන. • ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය විසින් පවත්වන ලද දේශීය පුහුණු වැඩසටහන් සංඛ්‍යාව.	• සහභාගිවන්නන් තෝරා ගැනීම සඳහා උසස් පුහුණු කමිටු (ATC) රැස්වීම් 11 ක් පවත්වන ලදී. • 2022 දී ලැබුණු සහ සහභාගී වූ විදේශීය පුහුණුවීම් සංඛ්‍යාව: ○ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය - 10 ○ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය - 21 ○ වෙනත් - 02 • සහයෝගිතා වැඩසටහන් යටතේ සහභාගී වූ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිලධාරීන් සංඛ්‍යාව: ○ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය - 28 ○ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය - 14 • 2022 දී පවත්වන ලද පශ්චාත් පුහුණු ඉදිරිපත් කිරීම් සංඛ්‍යාව 07 කි. • ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ දේශීය පුහුණු වැඩසටහන් 03 ක් පමණ GSMA සහ ISOC සමග සම්බන්ධීකරණයෙන් සංවිධානය කරන ලදී. එම දේශීය පුහුණුව සඳහා නිලධාරීන් 21 දෙනෙකු සහභාගී විය.
IPv6 ක්‍රියාත්මක කිරීමේ ජාත්‍යන්තර ප්‍රශස්ත භාවිතයන් සලකා IPv6 මාර්ග සිතියම සකස් කිරීම	IPv6 වෙත මාරුවීම සඳහා මාර්ග සිතියම	• මාර්ග සිතියම සහ IPV6 වෙත නිසි පරිදි මාරුවීම සඳහා අවශ්‍ය උපායමාර්ගය ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ විශේෂඥයා විසින් සම්පූර්ණ කරන ලදී.

17.8 2017 වන විට අවම සංවර්ධිත රටවල් සඳහා තාක්ෂණ බැංකුව සහ විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන ධාරිතාව ගොඩනැගීමේ යාන්ත්‍රණය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීම සහ විශේෂයෙන් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය සක්‍රීය කිරීමේ තාක්ෂණ භාවිතය වැඩි දියුණු කිරීම.

ක්‍රියාකාරී අයිතමය	ඉලක්ක	ප්‍රගතිය
ඉදිරි වසර 5 සඳහා සංඛ්‍යාත වර්ණාවලි මාර්ග සිතියම සකස් කිරීම සහ 5G සඳහා සංඛ්‍යාත වර්ණාවලිය පැවරීම	ඉදිරි වසර 5 සඳහා ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ සභාය ඇතිව සංඛ්‍යාත වර්ණාවලි මාර්ග සිතියම සම්පූර්ණ කිරීම.	• ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලි බලපත්‍ර (RFSL) රීති ප්‍රකාශයට පත් කළ වහාම මාර්ග සිතියම ප්‍රකාශයට පත් කෙරේ.
“ගමට සන්නිවේදනය” ජාතික ව්‍යාපෘතිය	• ගමට සන්නිවේදනය ව්‍යාපෘතිය යටතේ සම්පූර්ණ කරන ලද වැඩබිම් සංඛ්‍යාව. • තෝරාගත් දිස්ත්‍රික්ක 10 ක ප්‍රධාන මධ්‍යස්ථාන ආරම්භ කිරීම. ගාල්ල, පුත්තලම, නුවරඑළිය, පොළොන්නරුව සහ මන්නාරම යන ප්‍රදේශවල ගමට සන්නිවේදනය ව්‍යාපෘතිය ආරම්භ කිරීම.	• ශ්‍රී ලංකා රුපියලේ ප්‍රධාන අවප්‍රමාණය වීම සහ ශීඝ්‍රයෙන් ඉහළ යන උද්ධමනය හේතුවෙන් විදුලි සංදේශ කර්මාන්තයට බලපෑම් එල්ල වී ඇත. ඒ අනුව කුලුනු ඉදිකිරීමේ වියදම විශාල ලෙස ඉහළ ගොස් ඇත. • ඉන්ධන ලබා ගැනීමේ අපහසුව සහ ද්‍රව්‍ය නොමැතිකම ඉදිකිරීම් ප්‍රමාද වීමට හේතු වේ. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතිය ප්‍රගතියට ඉතා අභියෝගාත්මක වී ඇත. නව ඉදිකිරීම් සඳහා මුදල් නොමැතිකම සම්බන්ධයෙන් ක්‍රියාකරුවන් දැනුවත් කර ඇත. • හේතු නිසා, ව්‍යාපෘතිය නැවත කාලසටහන්ගත කර ව්‍යාපෘති කාලය 2026 දක්වා දීර්ඝ කරන ලදී.
ගමට සන්නිවේදනය ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකාවේ සියලුම පාසල්වලට ෆයිබර් තාක්ෂණයෙන් අධිවේගී අන්තර්ජාල සම්බන්ධතාව ලබා දීම	• කමිටු පිහිටුවීම (මෙහෙයුම් කමිටුව සහ තාක්ෂණික කමිටුව) • අමාත්‍ය මණ්ඩල තීරණය සමාලෝචනය කිරීම • පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කිරීම • අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම • පාසල් වෙන් කිරීම • ක්‍රියාත්මක කිරීම සහ ප්‍රගතිය සමාලෝචනය කිරීම	• සකස් කරන ලද ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය තාක්ෂණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී. • 2023 අයවැය මඟින් දුෂ්කර ප්‍රදේශවල පිහිටි ජ්‍යෙෂ්ඨ සහ කනිෂ්ඨ ද්විතියික පාසල් 1000ක් ලබාදීමට හඳුනාගෙන ඇත.

විදුලි සංදේශ සංඛ්‍යාලේඛන සහ තොරතුරු

29.8 මිලියන
සෙලෙයුලර් ජංගම දුරකථන

3.8 මිලියන
ස්ථාවර ප්‍රවේශ දුරකථන

130%
ජනගහනයෙන් සෙලියුලර් ජංගම දුරකථන

12%
ජනගහනයෙන් ස්ථාවර ප්‍රවේශ දුරකථන



18.9 මිලියන
ජංගම අධිවේගී අන්තර්ජාල සේවා (3G/4G)

2.7 මිලියන
ස්ථාවර අධිවේගී අන්තර්ජාල සේවා


22.2 මිලියන
2022 වසර මැද භාගයේ ජනගහනය


26
පද්ධති බලපත්‍ර


පද්ධති බලපත්‍ර සංඛ්‍යාව	26
ස්ථාවර ප්‍රවේශ දුරකථන දායකත්වය (හඬ පමණි)	1,114,573
ස්ථාවර ප්‍රවේශ දුරකථන දායකත්වය (හඬ සහ දත්ත)	1,536,714
ස්ථාවර ප්‍රවේශ දුරකථන දායකත්වය (දත්ත පමණි)	1,101,723
මුළු ස්ථාවර ප්‍රවේශ දුරකථන දායකත්වය	3,753,010
ස්ථාවර ප්‍රවේශ දුරකථන ඝනත්වය (පදිංචිකරුවන් 100 දෙනෙකුට)	12
සෙලෙයුලර් ජංගම දුරකථන දායකත්වය (හඬ පමණි)	8,085,744
සෙලෙයුලර් ජංගම දුරකථන දායකත්වය (හඬ සහ දත්ත)	20,752,294
සෙලෙයුලර් ජංගම දුරකථන දායකත්වය (දත්ත පමණි)	986,895
මුළු සෙලෙයුලර් ජංගම දුරකථන දායකත්වය	29,824,933
සෙලෙයුලර් ජංගම දුරකථන ඝනත්වය (පදිංචිකරුවන් 100 දෙනෙකුට)	130
ස්ථාවර අධිවේගී අන්තර්ජාල සේවා දායකත්වය	2,686,955*
ජංගම අධිවේගී අන්තර්ජාල සේවා දායකත්වය (3G, 4G)	18,980,661


*තාවකාලික දත්ත

පද්ධති බලපත්‍ර සංඛ්‍යාව













*පහසු සංඥන්දනය සඳහා "ජංගම සහ ස්ථාවර දත්ත පමණක් දායකත්ව"ඇතුළත් කර නැත.




සෙස් බදු
6.0 බිලියන
5.50 බිලියන
5.0 බිලියන
4.50 බිලියන
4.0 බිලියන
3.50 බිලියන
3.0 බිලියන
2012
2013
2014
2015
2016
2017
2018
2019
2020
2021
2022


ජංගම හා ස්ථාවර ප්‍රවේශ ක්‍රියාකාර සමාගම්වල එක් පරිහරණය කරන්නෙකුගෙන් ලැබෙන සාමාන්‍ය ආදායම
40,000
35,000
30,000
25,000
20,000
15,000
10,000
5,000
0
2012
2013
2014
2015
2016
2017
2018
2019
2020
2021
2022
ජංගම
ස්ථාවර


ඒකාබද්ධ අරමුදල සඳහා ප්‍රේෂණ
70.0 බිලියන
60.0 බිලියන
50.0 බිලියන
40.0 බිලියන
30.0 බිලියන
20.0 බිලියන
10.0 බිලියන
.0 බිලියන
2012
2013
2014
2015
2016
2017
2018
2019
2020
2021
2022*
* තාවකාලික දත්ත

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

බලපත්‍ර කළමනාකරණ

නිකුත් කරන ලද බලපත්‍ර වර්ගය

ශ්‍රී ලංකාවේ වර්තමාන බලපත්‍ර පාලනය පහත පරිදි වේ;

අ) පහසුකම් පාදක කරගත් දුරකථන ක්‍රියාකරු සමාගම් - ජාල පහසුකම් නිර්මාණය කිරීමට සහ සේවා සැපයීමට දුරකථන ක්‍රියාකරු සමාගමට අවසර ලැබේ.

ආ) පහසුකම් පාදක කර නොගත් දුරකථන ක්‍රියාකරු සමාගම් - ජාල පහසුකම් නිර්මාණය කිරීමට ක්‍රියාකරුවන්ට අවසර ඇත, නමුත් සීමිත සම්පත් පවරනු නොලබන අතර එම සම්පත් පහසුකම් පාදක කරගත් දුරකථන ක්‍රියාකරු සමාගම් (FBOs) සමඟ බෙදාගත යුතුය.

ඇ) පහසුකම් සැපයුම්කරුවන් - දුරකථන ක්‍රියාකරු සමාගම් වලට ජාල පහසුකම් ලබා ගැනීමට හැකි නමුත් පාරිභෝගිකයන් සඳහා සේවා සැපයීමට අවසර නොලැබේ. සම්බන්ධතා පහසුකම් සැපයිය හැක්කේ දුරකථන ක්‍රියාකරු සමාගම් සහ විකාශන සමාගම් වලට පමණක් සම්බන්ධතා පහසුකම් සැපයිය හැකිය.

පනතේ 17 වැනි වගන්තිය ප්‍රකාරව සියලුම ක්‍රියාකරුවන් පද්ධති ක්‍රියාකරුවන් වන අතර, පනතේ 18 අ වගන්තියට අනුව සේවා සඳහා පමණක් බලපත්‍ර නිකුත් නොකෙරේ. බොහෝ බලපත්‍ර ඉහත සඳහන් (අ) කාණ්ඩයට අයත් වේ. (ආ) කාණ්ඩය යටතේ නිකුත් කරන ලද බලපත්‍ර තුනක් සහ (ඇ) කාණ්ඩය යටතේ නිකුත් කරන ලද බලපත්‍ර තුනක් ඇත.

වර්තමානයේ සේවා බලපත්‍ර ලබා දීමේ ක්‍රම

- තනි කාණ්ඩ අවසරය (උදා: DTH)
- බහුවිධ කාණ්ඩ අවසරය (බොහෝ බලපත්‍ර)

සියල්ල තනි පුද්ගල බලපත්‍ර වන අතර කාණ්ඩ බලපත්‍ර නිකුත් කර නොමැත.

බලපත්‍රකරණ රාමුව

වෙළඳපල වර්ධනය සහ සමාජයේ යහපැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා හිතකර පරිසරයක් සැපයීම සඳහා, කොමිෂන් සභාව තාක්ෂණය සහ සේවා කේන්ද්‍රගතවීම අපේක්ෂා කරයි. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ද මේ සම්බන්ධයෙන් පහත ලක්ෂණ සලකා බලයි.

- විවෘත ප්‍රවේශය
- තරහකාරීත්වය ප්‍රවර්ධනය කිරීම
- සේවා තත්ත්ව
- නව තාක්ෂණය ව්‍යාප්ත කිරීම
- කාර්යක්ෂමතාව සහ අභිසාරීත්වය
- යටිතල පහසුකම් සහ සීමිත සම්පත් බෙදා ගැනීම

බහු සේවා කාණ්ඩ වලට අවසර ලබාදීමේ ක්‍රමය අනුව විවිධ ජාල කාණ්ඩ යටතේ දැනට බලපත්‍ර 26 ක් බලාත්මක වේ.

- ස්ථාවර දුරකථන ක්‍රියාකරු සමාගම් - බලපත්‍ර 03
- ජංගම දුරකථන ක්‍රියාකරු සමාගම් - බලපත්‍ර 04
- බාහිර ප්‍රවේශ දුරකථන ක්‍රියාකරු සමාගම් - බලපත්‍ර 06
- කේබල් විබෙදුම් ජාල ක්‍රියාකරු සමාගම් - බලපත්‍ර 03
- දත්ත සන්නිවේදන ක්‍රියාකරු සමාගම් - බලපත්‍ර 01
- පහසුකම් පාදක කර නොගත් අන්තර්ජාල සේවා සැපයුම්කරුවන් - බලපත්‍ර 03
- සෘජු ගෘහස්ථ වන්දිකා විකාශන සේවා සැපයුම්කරුවන් - බලපත්‍ර 03
- දිගුදුර ජංගම සන්නිවේදන සේවා සැපයුම්කරුවන් - බලපත්‍ර 01
- යටිතල පහසුකම් සේවා සැපයුම්කරුවන් - බලපත්‍ර 01
- වන්දිකා සේවා සැපයුම්කරුවන් - බලපත්‍ර 01

සියලුම බලපත්‍ර පිළිබඳ සම්පූර්ණ විස්තර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය. (http://www.trc.gov.lk/2014-05-12-12-36-13/system-licence/licenced-operator-list.html)

පනතේ දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකාව පුරා සිටින ආයතනික ගනුදෙනුකරුවන්ගේ සහ පාරිභෝගිකයින්ගේ ශීඝ්‍රයෙන් වෙනස් වන අවශ්‍යතා සපුරාලීම සඳහා දුරකථන ක්‍රියාකරු සමාගම් වලට දැරිය හැකි සහ පුළුල් ලෙස ලබා ගත හැකි සේවාවන් සංවර්ධනය කිරීමට හැකි වන පරිදි ජාත්‍යන්තර ප්‍රශස්ත භාවිතයන් ක්‍රියාත්මක කරන ශක්තිමත් නියාමන රාමුවක් ස්ථාපිත කිරීම අත්‍යවශ්‍ය වේ.

රට කේන්ද්‍රීය ඩිජිටල් ආර්ථිකයක් කරා ඉදිරියට යාම සහ බලපත්‍ර රාමුව තුළ පිළිබිඹු වන සම්ප්‍රදායික සේවා කාණ්ඩ ක්‍රමක්‍රමයෙන් යල් පැන යාම දුරකථන ක්‍රියාකරු සමාගම් වලට පමණක් නොව පාරිභෝගිකයින්ට ද එකසේ බලපාන බැවින්, වඩාත් පරිපූර්ණ සහ තිරසාර බලපත්‍ර රාමුවකට අනුගත වීමේ අවශ්‍යතාවයක් පවතී. විදුලි සංදේශ කර්මාන්තයේ තිරසාර බව සැලකිල්ලට ගනිමින් රට තුළ සමාජ - ආර්ථික සංවර්ධනය සාක්ෂාත් කර ගැනීමෙහි ලා නව බලපත්‍ර රාමුවකට ක්‍රමිකව සංක්‍රමණයවීම කළමනාකරණය කළ යුතු වේ.

විශේෂයෙන් තාක්ෂණය සහ සේවා ඒකාබද්ධ කිරීම සහ මධ්‍යස්ථභාවය, බලපත්‍ර කාණ්ඩ සංඛ්‍යාව අඩු කිරීම , වර්තමාන සහ අනාගත ප්‍රතිපත්තිමය වරප්‍රසාද පිළිබිඹු කරන බලපත්‍ර කාණ්ඩ ඇති කිරීම , ඒකාබද්ධ බලපත්‍ර භාවිතය (බහු සේවා සඳහා තනි බලපත්‍රයක්) සහ සරල සහ වඩාත් කාර්යක්ෂම පාලනය සැලකිල්ලට ගෙන බලපත්‍ර රාමුව ක්‍රියාත්මක කරනු ඇත.

සේවා සහ ජාල කාණ්ඩ අනුව වර්තමාන තනි ක්‍රියාකරු බලපත්‍ර විධිමත්ව ඒකාබද්ධ කිරීම මෙම මූලධර්ම ක්‍රියාත්මක කිරීමේ පළමු පියවර වේ. දෙවන පියවර වන්නේ කේන්ද්‍රීය හෝ ඒකාබද්ධ බලපත්‍ර ක්‍රමවේදයක් හඳුන්වා දීමයි.

ඒකාබද්ධ බලපත්‍ර පාලන ක්‍රමය හඳුන්වා දීමට පෙර කුඩා පරිමාණයේ ක්‍රියාකරුවන් මහා පරිමාණ ක්‍රියාකරුවන්ගෙන් ආරක්ෂා කර ගැනීම සහ සමස්ත වෙළෙඳපොළ ඒකාධිකාරී හෝ ද්විතියික වෙළෙඳපොළ තත්ත්වයන් කරා තල්ලු වීම වැලැක්වීම පිණිස විශේෂ නියාමන ආරක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීමට සිදු විය. අත්‍යවශ්‍ය පූර්ව අවශ්‍යතා ලෙස සාධාරණව සංඛ්‍යාත වර්ණාවලිය පැවරීමේ ප්‍රතිපත්තිය සහ සාධාරණ යටිතල පහසුකම් බෙදාගැනීමේ මාර්ගෝපදේශ සකස් කිරීම අවශ්‍ය වේ. මේවා අදාළ අංශය මගින් ක්‍රියාත්මක කළ යුතු අතර, සංඛ්‍යාත වර්ණාවලිය පැවරීමේ නීති 2022 වසරේ දී සකස් කරන ලදී.

බලපත්‍ර නිකුත් කිරීම, බලපත්‍ර අලුත් කිරීම සහ බලපත්‍ර සංශෝධනය කිරීම වත්මන් බලපත්‍ර මාර්ගෝපදේශය යටතේ ආවරණය කරයි. කෙසේ වෙතත්, බලපත්‍ර අලුත් කිරීම සම්බන්ධයෙන් වෙන් වූ පරිච්ඡේදයක් නොමැත. නව බලපත්‍රයක් සඳහා දැනට පවතින අලුත් කිරීමේ ක්‍රියා පටිපාටිය අනුව බලපත්‍ර අලුත් කිරීමේදී සහ නියමිත වේලාවට බලපත්‍ර ගාස්තු එකතු කිරීමෙහි ලා අනවශ්‍ය ප්‍රමාදයක් ඇති කරයි. එබැවින්, නව මාර්ගෝපදේශයක් සකස් කර ඇති අතර එය අනුමැතිය ලබා ගැනීමේ අදියරේ පවතී.

ඒ හා සමානව, බලපත්‍රයේ 17 වන වගන්තිය ප්‍රකාරව ජාල අනුමැතිය ලබා ගැනීම අත්‍යවශ්‍යය අවශ්‍යතාවයක් වන අතර, එය මීට පෙර බලපත්‍රයේ නිසි පරිදි සඳහන් කර නොමැත. එබැවින්, මෙහෙයුම් පද්ධතියේ/සේවාවේ සමීක්ෂණ මත පදනම්ව මෙය ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත.

පනත ප්‍රකාරව, පහත සඳහන් බලපත්‍ර නිකුත් කිරීම (අලුත් කිරීම) සඳහා අතිගරු ජනාධිපතිවරයා විසින් නිර්දේශය ලබා දී ඇත.

- ශ්‍රී ලංකා ටෙලිකොම් බලපත්‍ර (රැහැන් සහිත + රැහැන් රහිත + බාහිර ප්‍රවේශ ක්‍රියාකරුවන්)
- සීමාසහිත හච්සන් ටෙලිකොම්යුනිකේෂන්ස් ලංකා (පුද්ගලික) සමාගම - ජංගම සේවා
- සීමාසහිත ඛයලොග් ටෙලිවිෂන් (පුද්ගලික) සමාගම - සෘජු ගෘහස්ථ වන්දිකා විකාශන
- ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලය
- සීමාසහිත ඩිෂ් ටීවී ලංකා (පුද්ගලික) සමාගම. ශ්‍රී ලංකා ටෙලිකොම් බලපත්‍රය (රැහැන් + රැහැන් රහිත + EGO)

ජාල

යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීම

ජාල අංශය විසින් සිදු කරනු ලබන ප්‍රධාන කාර්යයන් වන්නේ තඹ හෝ ඔප්ටිකල් ෆයිබර් ජාල, මුහුදු යට කේබල් මධ්‍යස්ථාන සහ විදුලි සංදේශ ඇන්ටෙනා කුලුනු වැනි විදුලි සංදේශ යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීමට පහසුකම් සැලසීමයි. විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් විසින් ඉහත සඳහන් කළ භෞතික යටිතල පහසුකම් භාවිතයෙන් පවතින ජාල පුළුල් කිරීමට හෝ නව සේවා හඳුන්වා දීමට අවසර ඉල්ලා සිටී. ජාල අංශය අනෙකුත් අදාළ රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් අදාළ අනුමැතිය ලබා දෙමින් ඔවුන්ට පහසුකම් සපයයි.

විදුලි සංදේශ ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධනයක් පවත්වා ගනිමින් පාරිසරික බලපෑම්, සෞඛ්‍ය සහ ආරක්ෂිත ගැටලු, ජාතික ආරක්ෂාව සහ මහජන අවශ්‍යතා සම්බන්ධ කරුණු පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වයි.

විදුලි සංදේශ කුලුනු ඉදිකිරීම

බහුකාර්ය පහන් කණු 198ක් සමඟින් 2022 වසරේ ඉදිකරන ලද නව කුලුනු 412 ඇතුළත්ව සමුච්චිත විදුලි සංදේශ කුලුනු සංඛ්‍යාව 8077 දක්වා වැඩි විය.

යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීමේ පැමිණිලි මෙහෙයවීම

කුලුනු ඉදිකිරීමට එරෙහිව සාමාන්‍ය ජනතාව විසින් කරන ලද පැමිණිලි සම්බන්ධයෙන් ජාල අංශය විසින් 2022 වසරේ විමර්ශන 12ක් සිදු කරන ලදී. 2022 දී කුලුනු ආශ්‍රිත මහජන පැමිණිලි එකසිය විසිපහක් ලැබී ඇති අතර, එම වසරේම ගැටලු 117ක් සඳහා අවධානය යොමු කර ඇත.

අනුමත නොකළ කුළුණු ප්‍රතිසන්ධානය

මෙම වසරේ දී ඇන්ටෙනා ව්‍යුහ කළමනාකරණ පද්ධතියේ දත්ත සමඟ දැනටමත් ක්‍රියාත්මක වන දූරකථන ක්‍රියාකරු සමාගම්වල කුලුනු ලැයිස්තුව අබණ්ඩව ප්‍රතිසන්ධානය කරන ලදී. ජංගම දූරකථන ක්‍රියාකරුවන් හතර දෙනෙකු සඳහා මෙම ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය අවසන් කර ඇති අතර, අනුමත නොකළ කුළුණු විධිමත් කිරීම සඳහා අලුතින් අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටින ලදී. ඒ අනුව, අදාළ රාජ්‍ය ආයතනවල නිර්දේශ මත දැනටමත් ඉදිකර ඇති අනුමත නොකළ කුළුණු කිහිපයක් සඳහා අනුමැතිය ලබා දී ඇත.

අනෙකුත් ක්‍රියාකරුවන්ගේ දත්ත ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය ක්‍රියාත්මක වෙමින් පවතී. ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය අවසන් වූ පසු, තහවුරු නොකළ කුලුනු විධිමත් කිරීම සඳහා නව අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස දූරකථන ක්‍රියාකරු සමාගම් වලින් ඉල්ලා සිටී.

අංකනය

විදුලි සංදේශ ජාලවල ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය අංකනය හිඟ සම්පතකි. ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ කර්මාන්තයේ ජාතික අංකකරණ සැලැස්ම ප්‍රකාරව මෙම සම්පත කළමනාකරණය කිරීමේ වගකීම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සතු වේ. රටෙහි විදුලි සංදේශ ජාල සඳහා පවතින අංකන සම්පත භාවිතා කිරීමේ රාමුව සහ මාර්ගෝපදේශ අංකනය කිරීමේ සැලැස්ම මගින් දක්වා ඇත. අංකනය හිඟ සම්පතකි; එබැවින් එය කාර්යක්ෂමව කළමනාකරණය කළ යුතුය. විදුලි සංදේශ අංශයේ නව වර්ධනයන් සහ වර්තමාන ප්‍රවණතා මත රඳා පවතින කර්මාන්තයේ ඉල්ලුමට අනුව අංකකරණ සැලැස්ම වරින් වර සංශෝධනය කෙරේ. මෙම කාර්යයට අදාළ ක්‍රියාකාරකම්වල සාරාංශයක් පහත දැක්වේ.

- ජාතික අංකකරණ සම්පත කළමනාකරණය කිරීම
- රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සඳහා කෙටි සංකේත අංක වෙන් කිරීම
- කෙටි සංකේත අංක ආශ්‍රිත කාරණා සම්බන්ධයෙන් විදුලි සංදේශ ක්‍රියාකරුවන සම්බන්ධීකරණය කිරීම
- විදුලි සංදේශ ක්‍රියාකරුවන්ට ජාත්‍යන්තර සහ ජාතික සංඥා සංකේත අංක සහ ජාල සංකේත අංක වෙන් කිරීම
- වස්තුවක් අනන්‍ය ලෙස හඳුනාගැනීමේ තන්තුවක් (Object Identifiers) වෙන් කිරීම
- දූරකථන අංකය වෙනස් නොවී ජාල අතර මාරුවීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම
- ගාස්තු රහිත අංකන පද්ධතිය ක්‍රියාත්මක කිරීම

කෙටි සංකේත අංක වෙන් කිරීම

මහජනතාවට සහ පාරිභෝගිකයින්ට ක්ෂණික දූරකථන ඇමතුම් ලබා ගැනීමේ අවශ්‍යතාවයක් පවතින විට කෙටි සංකේත අංක ආයතන වෙත පවරනු ලැබේ. ආයතනයේ ස්වභාවය අනුව එක් එක් රාජ්‍ය හා පෞද්ගලික අංශය සඳහා කෙටි සංකේත අංක දෙකක් හඳුන්වා දී ඇත. රාජ්‍ය ආයතන සඳහා ඉලක්කම් හතරකින් සමන්විත 19XX පරාසය ද ඒ හා සමානවම පෞද්ගලික අංශයේ ආයතන සඳහා ඉලක්කම් හතරකින් සමන්විත 13XX පරාසය ද වෙන් කර ඇත.

රාජ්‍ය ආයතන සඳහා වෙන් කරන ලද කෙටි සංකේත අංක

2022 වසරේ දී, 19xx පරාසයේ කෙටි සංකේත අංක හතරක් (4) රාජ්‍ය ආයතන වෙත පවරන ලදී. ආයතන සහ ඒවාට අදාළ කෙටි සංකේත අංක පහත වගුවේ දක්වා ඇත.

රාජ්‍ය ආයතනය	කෙටි සංකේත අංකය
සේවක අර්ථ සාධක අරමුදල - කම්කරු දෙපාර්තමේන්තුව	1958
ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය	1995
සුබසාධන ප්‍රතිලාභ මණ්ඩලය - මුදල් අමාත්‍යාංශය	1924
සෞඛ්‍ය අමාත්‍යාංශය - බෝ නොවන රෝග පිළිබඳ ජංගම සමීක්ෂණය	1993

පුද්ගලික අංශයේ ආයතන සඳහා වෙන් කරන ලද කෙටි සංකේත අංක

2022 වසරේ දී, 13xx පරාසයේ කෙටි සංකේත අංක හතරක් (04) පුද්ගලික අංශයේ ආයතන වෙත පවරන ලදී. ආයතන සහ ඒවාට අදාළ කෙටි සංකේත අංක පහත වගුවේ දක්වා ඇත.

පුද්ගලික ආයතනය	කෙටි සංකේත අංකය
සීමාසහිත හැන්ඩිස් ග්ලෝබල් හෝල්ඩිංග්ස් (පුද්ගලික) සමාගම	1315
HNB ඇෂුවරන්ස් පී. එල්. සී	1301
සීමාසහිත BIMA ලංකා ඇෂුවරන්ස් තැරැව්කාර (පුද්ගලික) සමාගම	1343
පීපල්ස් වර්ච් ඇස්ඵම්බිල් ගෝඩ්	1375

දූරකථන අංකය වෙනස් නොකර ජාල අතර මාරුවීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම

ජංගම දූරකතනයකින් තවත් ජංගම දූරකථනයකට සහ ස්ථාවර දූරකථනයකින් තවත් ස්ථාවර දූරකථනයකට දූරකථන අංකය වෙනස් නොවී ජාල අතර මාරුවීමේ හැකියාව ක්‍රියාත්මක කිරීමට සහ අවශ්‍ය රෙගුලාසි සහ මාර්ගෝපදේශ සකස් කිරීමට කොමිෂන් සභාව ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇත. ජාල අංශයේ නායකත්වය යටතේ අභ්‍යන්තර කමිටුව විසින්, දූරකථන අංකය වෙනස් නොකර ජාල අතර මාරුවීම සඳහා අවශ්‍ය රීති සහ මාර්ගෝපදේශ සකස් කරමින් සිටී. දූරකථන අංකය වෙනස් නොකර ජාල අතර මාරුවීමේ ක්‍රමය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ඊට අදාළ කටයුතු සාකච්ඡා කිරීම පිණිස පොදු ස්විචිකරණ දූරකථන ජාල ක්‍රියාකරු සමාගම්වල නියෝජිතයන්ගෙන් සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් ස්ථාපනය කරන ලදී. දූරකථන කර්මාන්තයේ නියැලවූවන් සමඟ කළ සාකච්ඡා මත පදනම්ව සුදුසු මෙහෙයුම් සහ තාක්ෂණික ආකෘතියක් තීරණය කර ඇත. සියලුම බලපත්‍රලාභී ස්ථාවර සහ ජංගම දූරකථන ක්‍රියාකරු සමාගම්වල සාමාජිකයින්ගෙන් සමන්විත 'සීමාසහිත ලංකා දූරකථන අංකය වෙනස් නොවී ජාල අතර මාරුවීමේ සේවා සමාගම Lanka Number Portability Services Ltd.' නමින් ඇපකර සමාගමක් දූරකථන අංකය වෙනස් නොවී ජාල අතර මාරුවීමේ මෙහෙයුම් සඳහා ස්ථාපනය කරන ලදී. දූරකථන අංකය වෙනස් නොවී ජාල අතර මාරුවීමේ හැකියාව සාර්ථකව ක්‍රියාත්මක කිරීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ දූරකථන ක්‍රියාකරු සමාගම් වැඩිදුර පියවර ගනිමින් සිටී.

ගාස්තු රහිත අංකන පද්ධතිය

වාණිජමය ආයතනවල සිය ව්‍යවසායන් සඳහා ගාස්තු රහිත අංක යොදා ගැනීමේ ඉහළ ඉල්ලුමක් පවතී.එබැවින් මෙම සේවාව ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු ජාල අංශය විසින් ආරම්භ කරන ලදී. ජාත්‍යන්තර භාවිතයන්ට අනුකූලව, මෙම සේවාව සඳහා අංක 800 මට්ටමක් හඳුනාගෙන ඇත. ගාස්තු රහිත අංකයක් 800 XXX XXXX යනාදී වශයෙන් 800 මට්ටමේ ඉලක්කම් 10 අංකයක් වනු ඇත. පොදු ස්විචිකරණ ජාල ක්‍රියාකරුවන් සඳහා සංඛ්‍යා පරාස ඒවායේ පවතින ලක්ෂණ සැලකිල්ලට ගනිමින් හඳුන්වා ද ඇත. ගාස්තු රහිත අංක පරාස සඳහා සුදුසු ගාස්තු තීරණය කිරීම සඳහා අභ්‍යන්තර කමිටුවක් පත් කරන ලදී.

IPv6 මාර්ග සිතියම සකස් කිරීම

ජාත්‍යන්තර ප්‍රශස්ත භාවිතයන් සැලකිල්ලට ගනිමින්, IPv6 මාර්ග සිතියමක් සකස් කිරීමට තීරණය කරන ලදී. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකාව තුළ බලපත්‍රලාභී අන්තර්ජාල සේවා සපයන්නන්ගේ IPv6 සූදානම සහ IPv6 සඳහා මාරුවීමේ ප්‍රගතිය පිළිබඳ තත්ව පරීක්ෂණයක් සිදු කරන ලදී. ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ විශේෂඥ සේවා සහාය ලබාදීමේ වැඩසටහන යටතේ බඳවා ගන්නා ලද ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ විශේෂඥයකු විසින් IPV6 සඳහා සාර්ථකව මාරුවීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සහ උපාය මාර්ග ඇතුලත් කෙටුම්පත් සකස් කළේය. මෙම කෙටුම්පත් ලියවිල්ල අන්තර්ජාල සේවා සැපයුම්කරුවන් විසින් සිය ජාල වල IPV6 සූදානමේ තත්ත්වය පරීක්ෂා කිරීමේ ප්‍රශ්නාවලිය සඳහා ලබා දුන් ප්‍රතිචාර මත පදනම් විය.

වෙළඳ බලපත්‍ර ලබා දීම

විදුලි සංදේශ පනතේ 21 වන වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අවසරය යටතේ හැර කිසිම තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ කිසියම් විදුලි සංදේශ උපකරණයක් හෝ ගුවන් විදුලි සන්නිවේදන උපකරණයක් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම, විකිණීම පිණිස ඉදිරිපත් කිරීම, ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම, කුලියට දීම, බදු දීම, ක්‍රියාකර පෙන්වීම, නඩත්තු කිරීම හෝ අළුත්වැඩියා කිරීම සිදු නොකළ යුතුය.

2022 වර්ෂයේදී විවිධ වර්ගයේ විදුලි සංදේශ උපකරණ වෙළෙන්දන් සඳහා වෙළඳ බලපත්‍ර හත්සිය පනස් හයක් නිකුත් කරන ලදී.

කේබල් රූපවාහිනී සේවා සපයන්නන්ගේ මෙහෙයුම් අධීක්ෂණය කිරීම

1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද පද්ධති බලපත්‍රයේ 22 වන පරිච්ඡේදය ප්‍රකාරව, අවශ්‍ය වන්නේ නම් තාක්ෂණික, වාණිජ හා වෙනත් තොරතුරු කොමිෂන් සභාව වෙත ලබා දීමට දුරකථන ක්‍රියාකරු සමාගම් බැඳී සිටී.

ජාල අංශය විසින් විදුලි සංදේශ පනතේ 17 වැනි වගන්තිය ප්‍රකාරව බලපත්‍ර ලබා ඇති කේබල් ටීවී ජාල පිළිබඳ ඉහත තොරතුරු කාර්තුමය වශයෙන් රැස් කරයි. කොමිෂන් සභාව වෙත ලබා දී ඇති තොරතුරු අනුව ජාල ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා පාලක මැදිරිවල අභ්‍යූ භෞතික පරීක්ෂණ සිදු කරනු ලැබේ.

මාදිලි අනුමැතිය සහ උපකරණ නිෂ්කාශනය

විදුලි සංදේශ පනතේ 5(ට) වගන්තිය ප්‍රකාරව විදුලි සංදේශ පද්ධතියකට සම්බන්ධ කළ හැකි විදුලි සංදේශ උපකරණ මාදිලි අනුමත කිරීමේ වගකීම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත පවරා ඇත. ඒ අනුව, 5(ට) වගන්තියේ පවරා ඇති රාජකාරී ක්‍රියාත්මක කිරීමේදී, කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විදුලි සංදේශ උපකරණ සම්බන්ධ කරන ලෙස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් පනතේ 17 වැනි වගන්තිය ප්‍රකාරව නිකුත් කර ඇති පද්ධති බලපත්‍රයේ උපලේඛන 2 හි සියලුම දුරකථන ක්‍රියාකරු සමාගම් වලට නියම කර ඇත.

එබැවින්, දුරකථන උපකරණ, ෆැක්ස් යන්ත්‍ර, PABX (පුද්ගලික ස්වයංක්‍රීය ශාඛා හුවමාරුව), මොඩම සහ රැහැන් රහිත දුරකථන වැනි ඕනෑම පාරිභෝගික පරිශ්‍ර උපකරණයක් විදුලි සංදේශ ජාලයකට සම්බන්ධ කිරීම සඳහා මාදිලි අනුමැතිය අවශ්‍ය වේ. දුරකථන ක්‍රියාකරු සමාගම්, වෙළෙන්දන් හෝ පුද්ගලයන් විසින් ආනයනය කරන ලද පාරිභෝගික පරිශ්‍ර උපකරණ හෝ දේශීයව නිෂ්පාදිත උපකරණ සඳහා මාදිලි අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය වේ.

ජාල අංශය විසින් මාදිලි අනුමැති ක්‍රියා පටිපාටි සිදු කිරීම, රැහැන්ගත පර්යන්ත ජාල උපකරණ සඳහා මාදිලි අනුමැති නිකුත් කිරීම සහ සියලුම ජාල ආශ්‍රිත උපකරණ ආනයනය කිරීම සඳහා රේගුව /ආයෝජන මණ්ඩලය/ආනයන පාලක වෙත බලය පැවරීමේ ලිපි නිකුත් කිරීම සඳහා වගකීම දරයි.

මාදිලි අනුමැතිය සහ උපකරණ නිෂ්කාශනය	
විස්තරය	**නිකුත් කරන ලද නිෂ්කාශන සංඛ්‍යාව**
උපකරණ නිෂ්කාශන	2286
මාදිලි අනුමැතිය	-

සංඛ්‍යාත කළමනාකරණය

තත් කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් යටතේ හැර ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවේ මුහුදු සීමාවේ කිසියම් ප්‍රදේශයක හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වී ඇති ඕනෑම නෞකාවක හෝ ගුවන් යානයක ගුවන් විදුලි සංඛ්‍යාත හෝ ගුවන්විදුලි සංඛ්‍යාත විමෝචන උපකරණ භාවිතා නොකළ යුතුය.

පුරවැසියෙකුගේ හෝ සමාගමක ඉල්ලීම මත ආනයන නිෂ්කාශනයක් නිකුත් කිරීමට පෙර, ගුවන් විදුලි උපකරණ අවශ්‍ය ප්‍රමිතීන්ට අනුකූල වන බවත්, උපකරණ ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද සංඛ්‍යාතයක් ඇති බවත් සහතික කෙරේ. මෙමගින් බලපත්‍රලාභී වර්ණාවලිය භාවිතා කරන්නන්ට සිදුවන ගුවන් විදුලි බාධාවන් අවම කරයි.

කෙසේ වෙතත්, සිය සම්ප්‍රේෂණයට බලපාන බාධාවන් අත්විඳින සෑම විටම පරිශීලකයින්ගෙන් සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ අංශය වෙත පැමිණිලි ලැබේ. එවිට එම බාධාවන්වල මූලාශ්‍රය හඳුනාගෙන ගැටලු නිරාකරණය කිරීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු සම්පාදනය කෙරේ.

සංඛ්‍යාත වර්ණාවලි ගාස්තු සංශෝධනය කිරීම ඇතුළුව ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය බලපත්‍ර රෙගුලාසි හඳුන්වා දීම

මෑත ඉතිහාසයේ සංඛ්‍යාත වර්ණාවලි බලපත්‍ර ගාස්තු සාපේක්ෂව සමානව පවතින බැවින්, සියලුම බලපත්‍ර කාණ්ඩවල සංඛ්‍යාත වර්ණාවලි බලපත්‍ර ගාස්තු සංශෝධනය කිරීමට කටයුතු ආරම්භ කර ඇත. තවද, නව ගුවන්විදුලි සංඛ්‍යාත බලපත්‍ර නීති සකස් කර අමාත්‍යවරයාගේ අත්සන සඳහා යොමු කර ඇත. මේ සම්බන්ධයෙන් අතිවිශේෂ ගැසට් නිවේදනයක් ප්‍රකාශයට පත් කිරීමට අපේක්ෂා කෙරේ.

ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතා අංකය (IMEI) තහවුරු කිරීමේ පද්ධතිය වැඩිදියුණු කිරීම

ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතා අංකය (IMEI) තහවුරු කිරීමේ පද්ධතිය සාමාන්‍ය පුරවැසියෙකුට වෙළඳපොලේ ඇති ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතා අංකය (IMIE) සක්‍රීය උපාංගයක වලංගුභාවය තහවුරු කිරීමට හැකියාව ලබා දෙයි. වර්තමාන වෙළඳපල අවශ්‍යතා හා සසඳන විට ‘TRIVES’ ලෙස හඳුන්වන වත්මන් ක්‍රමය යල් පැන ගොස් ඇත. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් විසින් TRIVES පද්ධතිය (පවත්නා IMEI සත්‍යාපන පද්ධතිය) වෙනුවට, වෙළෙන්දාට සහ මහජනතාවට සම්පූර්ණයෙන්ම ස්වයංක්‍රීයව තම සේවා බෙදා හැරීම පුළුල් කිරීම සඳහා පුළුල් සහ සහයෝගී වෙබ්-පාදක IMEI සත්‍යාපන පද්ධතියක්/මාදිලි අනුමත කිරීමේ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට ටෙන්ඩර් ක්‍රියාවලියක් ආරම්භ කර ඇත. යෝජිත පද්ධතිය වලාකුළු වේදිකාවක් (cloud platform) තුළ නිර්මාණය කළ යුතු අතර විවෘත මූලාශ්‍ර තාක්ෂණයන් සහිතව වැඩිදියුණු කිරීමට අදහස් කෙරේ.

ඉදිරි වසර 5 සඳහා වර්ණාවලිය මාර්ග සිතියම සකස් කිරීම / 5G සඳහා වර්ණාවලිය පැවරීම

ජාතික 5G සංඛ්‍යාත වර්ණාවලි ප්‍රතිපත්තිය සහ ශ්‍රී ලංකාව තුළ වාණිජ 5G සේවා ක්‍රියාවට නැංවීමේ උපාය මාර්ග ඇතුළු උපාය මාර්ගික සංඛ්‍යාත වර්ණාවලි ප්‍රතිපත්ති, නිෂ්පාදන සහ සේවා නවෝත්පාදන සම්බන්ධයෙන් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ විශේෂඥ සහාය යටතේ කෙටුම්පත් වාර්තාවක් සකස් කර ඇත. ගෝලීය 5G වෙළඳපොළට ප්‍රවේශ වීමට සහ 5G හි ප්‍රතිලාභ ලබා ගැනීමට කර්මාන්ත සඳහා පහසුකම් සැලසීමට, නව 5G ආශ්‍රිත නිෂ්පාදන සහ සේවාවන් නව්‍යකරණය කිරීමට ශ්‍රී ලංකාවට අවශ්‍ය පසුබිම සකස් කිරීමෙහි ලා මෙම වාර්තාව අවසන් කළ යුතුය.

සංඛ්‍යාත පිරික්සීම සහ විමර්ශනය

ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලිය පිරික්සීම සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ ක්‍රියාකාරකම්වල අනිවාර්ය අංගයකි. 22 වගන්තිය බලපත්‍රය නිකුත් කිරීම බාධාවකින් තොර ගුවන්විදුලි සන්නිවේදන පද්ධතියක සහතික භාවිතය සහතික කෙරේ. ගුවන්විදුලි සංඛ්‍යාත සම්ප්‍රේෂකයන් ව්‍යාජ සහ අනවශ්‍ය පරාසයෙන් පිටත විමෝචන ජනනය කරන බැවින් බාධාවකින් තොරව ගුවන්විදුලි සන්නිවේදන සේවා භාවිතය අභියෝගාත්මක ය. එසේම, ඔවුන් අනපේක්ෂිත අවහිරතා ඇති කළ හැකි ධාරිතාවයකට සංවේදී ආදායකයන් මෙහෙයවයි. එබැවින් අවහිරතා හඳුනා ගැනීම සහ අවම කිරීම අභිශය තීරණාත්මක කාර්යයක් වන අතර ඒවා හඳුනා ගැනීම සඳහා නවීන උපකරණ අවශ්‍ය වේ. වර්ණාවලි කළමනාකරණ අංශය කොළඹ, කදිරාන සහ මහනුවර ප්‍රාදේශීය පිරික්සුම් මධ්‍යස්ථාන තුනක් (RMC) පවත්වාගෙන යයි. ශ්‍රී ලංකා විදුලි

සංදේශ නියාමන කොමිෂන් සභාව සතුව එම සංඛ්‍යාත වර්ණාවලි නිරීක්ෂණ සඳහා නවීන සංඛ්‍යාත වර්ණාවලි පිරික්සුම් වාහනයක් ඇත.

සංඛ්‍යාත වර්ණාවලිය භාවිතා කරන්නන් සඳහා නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව		
සේවා කාණ්ඩය	වර්ෂය	
	2021	2022
ස්ථාවර සේවාව	43	45
විකාශන සේවාව (රූපවාහිනී සහ ගුවන්විදුලිය)	36	44
දත්ත / ගුවන් විදුලි ටෙලිමෙට්‍රි සේවාව	23/19	24/33
සෙලියුලර් සේවාව (ජංගම ක්‍රියාකරුවන්)	05	05
ගුවන් හා නාවික සේවා		
(i) ගුවන් යානා මධ්‍යස්ථාන	67	71
(ii) නැව් මධ්‍යස්ථාන	106	71
(iii) සමුද්‍රීය ජංගම	450	834
(iv) ගුවන් ජංගම	06	08
පෞද්ගලික ජංගම ගුවන් විදුලි සේවාව	142	143
ආධුනික ගුවන් විදුලි	71	66
*ප්‍රධාන බලපත්‍ර සංඛ්‍යාව පමණි		

නිකුත් කරන ලද නිෂ්කාශන ලිපි සංඛ්‍යාව		
සේවා කාණ්ඩය	වර්ෂය	
	2021	2022
සංකේත විබෙදුම් බහුවිධ ප්‍රවේශ (CDMA) ඇතුළු ස්ථාවර සේවා	781+	650
විකාශන සේවා (රූපවාහිනී හා ගුවන්විදුලි)	60	50
සෙලියුලර් ජංගම සේවා		
(i) බෙදාහැරීමේ බලපත්‍ර	6756	5340
(ii) ජංගම දුරකථන ක්‍රියාකරු	2082	1695
(iii) පෞද්ගලික ජංගම ගුවන්විදුලි	144	69
දත්ත සේවාව / ගුවන්විදුලි ටෙලිමෙට්‍රි	15/4	12/1
වන්දිකා සේවා	278	86
ආධුනික ගුවන්විදුලි	30	15
අඩු බල උපකරණ	1902	1840
(i) වෙළඳ බලපත්‍රලාභීන්	1114	887
(ii) තනි පාරිභෝගිකයන්	788	953
සමුද්‍රීය සන්නිවේදනය	119	87
නැව් මධ්‍යස්ථාන	09	

ආධුනික ගුවන්විදුලි ක්‍රියාකරුගේ බලපත්‍ර විභාගය

ආධුනික ගුවන්විදුලි ක්‍රියාකරු නිපුණතා සහතික නිකුත් කිරීමේ වගකීම කොමිෂන් සභාව සතුය. විභාග දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව විභාග තුනක් පවත්වයි. ආධුනික ගුවන්විදුලි ක්‍රියාකරුගේ බලපත්‍රය කාණ්ඩ තුනකින් සමන්විත වේ. ආධුනික ගුවන්විදුලි ක්‍රියාකරුගේ බලපත්‍රය කාණ්ඩ තුනකින් සමන්විත වේ:

1. ආධුනික ගුවන්විදුලි ක්‍රියාකරු උසස් පන්ති බලපත්‍රය
2. ආධුනික ගුවන්විදුලි ක්‍රියාකරු සාමාන්‍ය පන්ති බලපත්‍රය
3. ආධුනික ගුවන්විදුලි ක්‍රියාකරු නවක පන්ති බලපත්‍රය

වයස අවුරුදු දාහතරට (14) වැඩි ඕනෑම තැනැත්තෙකු විභාගයට ඇතුළත් වීමට සුදුසුකම් ලබයි. විභාගය අනිවාර්ය ලිඛිත ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වන අතර, එක් ප්‍රශ්න උසස් විදුලි තාක්ෂණය සහ ගුවන්විදුලි සන්නිවේදනය සහ අනෙක බලපත්‍ර කොන්දේසි, මෙහෙයුම් පරිවයන් සහ ක්‍රියා පටිපාටි පිළිබඳව වේ. මෝර්ස් කේතය පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය පවත්වනු ලබන්නේ ලිඛිත ප්‍රශ්න පත්‍ර සමත් වූ උසස් පන්ති බලපත්‍ර අයදුම්කරුවන් සඳහා පමණි.

සාමාන්‍යයෙන් වසරකට වරක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් මෙම විභාගය පවත්වනු ලැබේ. ඒ සඳහා අවශ්‍ය අයදුම් පත්‍රය කොමිෂන් සභාවෙන් හෝ කොමිෂන් සභා වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය. අනෙකුත් විස්තර කොමිෂන් සභාව විසින් සහ විභාගය පැවැත්වෙන දිනට සති හතරකට පෙර නිකුත් කෙරෙන ගැසට් නිවේදනයෙන් ද ලබාගත හැකිය අතර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත මුදල් ගෙවීමෙන් ද මෙහි විෂය නිර්දේශය ලබාගත හැක.

විභාග ගාස්තු		
විභාග කාණ්ඩය	01 කොටස සඳහා ගාස්තුව (රු.)	02 කොටස සඳහා ගාස්තුව (රු.)
උසස් පන්තිය	250.00	125.00
සාමාන්‍ය පන්තිය	125.00	-
නවක පන්තිය	125.00	-
සටහන: රජයේ ගාස්තු සහ බදු හැර		

තරඟකාරිත්ව

- බලපත්‍රලාභී දුරකථන ක්‍රියාකාර සමාගම්වල මූල්‍ය හා මෙහෙයුම් කාර්යසාධනය විශ්ලේෂණය කිරීම තුළින් ප්‍රවණතාවන් අධීක්ෂණය කිරීම.
- විදුලි සංදේශ කර්මාන්තයේ සංඛ්‍යාලේඛන තොරතුරු රැස්කිරීම සහ විශ්ලේෂණය කිරීම.
- විදුලි සංදේශ කර්මාන්තයෙන් රාජ්‍ය බදු/අයබදු (විදුලි සංදේශ බද්ද, සෙස්, සෙලෙයුලර් කුලුනු බදු සහ ජංගම කෙටි පණිවුඩ සේවා බදු) එකතු කිරීම.
- ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ආශ්‍රිත ව්‍යාපෘතිවල නිරත විදේශීය විශේෂඥයින් සඳහා අදාල වීසා ලබාගැනීමට පහසුකම් සැපයීම.
- අයක්‍රම නියාමනය කිරීම.
- දුරකථන ක්‍රියාකරු සමාගම්වල සහාය ඇතිව නොදියුණු හා ඌන සංවර්ධිත ප්‍රදේශවල විදුලි සංදේශ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ව්‍යාපෘති ආරම්භ කිරීම.
- විදුලි සංදේශ හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.
- අන්තර්ජාතික විදුලි සංදේශ බදු නිවැරදිව හා කාලෝචිත ලෙස එකතු කිරීම සහතික කිරීම.
- බලපත්‍රලාභී ක්‍රියාකරු සමාගම්වල විගණනය කළ ගිණුම් එකතු කිරීම.
- පොදු ස්විචිකරණ දුරකථන ජාල ක්‍රියාකරු සමාගම්වල ආදායම, ලාභය සහ අලාභ සහ ආයෝජන විශ්ලේෂණය කිරීම.


ග්‍රාහක පදනම

2022 දෙසැම්බර් 31 වන දින වන විට ජංගම සහ ස්ථාවර ප්‍රවේශ ග්‍රාහක පදනම 33,685,905 කි. 2021 වර්ෂයට සාපේක්ෂව 2022 දී, සෙලෙයුලර් ජංගම දුරකථන ක්‍රියාකරු සමාගම්වල ග්‍රාහක පදනමේ 3.2% කින් අඩුවීමක් පෙන්නුම් කළ අතර, 2021 වසරට සාපේක්ෂව ස්ථාවර ප්‍රවේශ ක්‍රියාකරු සමාගම්වල ග්‍රාහක පදනමේ වැඩිවීම 0.6% කි.

ග්‍රාහක පදනම	2021 (මිලියන)	2022 (මිලියන)	% වෙනස
ජංගම	30.8	29.8	-3.2%
ස්ථාවර ප්‍රවේශ	3.8	3.8	0.6%
එකතුව	34.6	33.6	-2.8%

දුරකථන ක්‍රියාකරු සමාගම්වල ආදායම

ජංගම, ස්ථාවර සහ අනෙකුත් දුරකථන ක්‍රියාකරු සමාගම් වලින් ලැබුණු ආදායම පෙර වසරට සාපේක්ෂව 2022 දී සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරයි. සමස්ත පාරිභෝගික පදනම සුළු වශයෙන් අඩු වී ඇතත්, 2022 සැප්තැම්බර් 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි කර්මාන්ත තීරුබදු 20% කින් පමණ වැඩි කර ඇති බැවින් කර්මාන්තයේ ආදායම 15% කින් ඉහළ ගොස් ඇත.



දුරකථන ක්‍රියාකරු සමාගම්වල ලාභය

ස්ථාවර ක්‍රියාකරුවන්ගේ ලාභදායිතාවය වැඩි වී ඇති අතර, ජංගම ක්‍රියාකරුවන්ගේ ලාභදායිතාවයේ අඩුවීමක් වසර තුළ පවතින බව පහත වගුවේ දැක්වේ. එය අවධාරණය කරන්නේ; අනෙකුත් දුරකථන ක්‍රියාකරු සමාගම්වල ලාභදායිතාවය පෙර වසරට සාපේක්ෂව 2022 වසරේ දී සෘණ අගයක් පෙන්නුම් කෙරෙන බව එයින් අවධාරණය කෙරේ. එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය අවප්‍රමාණය වීම නිසා අහිමි වූ

විදේශ විනිමය ජංගම දුරකථන කර්මාන්තයේ දැවැන්ත පාඩුවට එක් ප්‍රධාන හේතුවක් විය.

ලාභය	2020 (මිලියන)	2021 (මිලියන)	2022* (මිලියන)
ජංගම	6,805	5,146	(54,803)
ස්ථාවර	1,910	3,146	11,492
වෙනත්	(546)	543	(3,700)
එකතුව	8,169	8,835	(47,011)
*විගණනය නොකරන ලද			


ජංගම සහ ස්ථාවර ප්‍රවේශ ක්‍රියාකරු සමාගම්වල එක් පරිහරණය කරන්නෙකුගෙන් ලැබෙන ආදායමේ සාමාන්‍යය (ARPU)

ජංගම දුරකථන ක්‍රියාකරු කාණ්ඩය සඳහා 2022 වර්ෂයේ එක් පරිහරණය කරන්නෙකුගෙන් ලැබෙන සාමාන්‍යය ආදායම (වර්ෂයකට) රුපියල් 5,717 ක් වූ අතර එය 2021 වර්ෂයේ එක් පරිහරණය කරන්නෙකුගෙන් ලැබෙන සාමාන්‍යය ආදායම (ARPU) හා සසඳන විට 9.4% ක වැඩිවීමක් පෙන්නුම් කරයි. එසේම ස්ථාවර ප්‍රවේශ ක්‍රියාකරු කාණ්ඩය ද පසුගිය වසරට සාපේක්ෂව 32.8% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

ARPU	2021	2022	% වෙනස්වීම
ජංගම	5,227	5,717	9.4%
ස්ථාවර	26,759	35,524	32.8%

විදුලි සංදේශ කර්මාන්තයේ ආයෝජන

2011 සිට 2021 දක්වා ජංගම සහ ස්ථාවර දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් කරන ලද නව ආයෝජන පහත ප්‍රස්ථාරයෙන් දැක්වේ [ආයෝජන වලට දේපල, පිරියක, උපකරණ, අස්පෘශ්‍ය වත්කම් සහ කෙරීගෙන යන වැඩවල එකතුව ඇතුලත් වේ]. 2020 වසර හා සන්සන්දනය කිරීමේදී, ජංගම සහ ස්ථාවර දුරකථන සේවා කර්මාන්තයේ ආයෝජන අඩු වී ඇත.



ජංගම දුරකථන / පාරිභෝගිකයන්ගේ පරිහරණය සඳහා සැලසුම් කරන ලද දෘඩාංග හා මෘදුකාංග උපකරණ


1980 දශකයේ සිට ශ්‍රී ලංකාව තුළ ජංගම විදුලි සංදේශ සේවා සපයා ඇත. එහි ආරම්භයේ දී ඇනලොග් තාක්ෂණය හරහා සේවාවන් සපයන ලදී. 1990 දශකයේ මැද භාගයේදී ජංගම තාක්ෂණය ඇනලොග් සිට ඩිජිටල් තාක්ෂණයට මාරු කරන ලද අතර එය GSM (ජංගම සන්නිවේදනය පිළිබඳ ගෝලීය පද්ධතිය) ලෙස හඳුනා ගන්නා ලදී. GSM 2nd Generation (2G) මගින් දුරකථන ක්‍රියාකරු සමාගම් වලට සිය ජංගම පාරිභෝගිකයින් වෙත කෙටි පණිවුඩ සේවා (SMS) සහ පොදු ස්විචිකරණ ගුවන් විදුලි සේවා (GPRS) වැනි හඬ සහ මූලික දත්ත සේවා සැපයීමට සහාය වේ. කෙසේ වෙතත්, GSM තාක්ෂණයේ දියුණුව සහ 3G සහ 4G ජාල හඳුන්වාදීමත් සමඟ ජංගම අධිවේගී අන්තර්ජාල සේවාවන් ජනප්‍රිය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පාරිභෝගිකයන් ස්මාර්ට් ෆෝන්, ටැබ්, ඩොංගල් වැනි වඩාත් සංකීර්ණ සහ අතේ ගෙන යා හැකි උපකරණ වෙත මාරු විය.

2022 දෙසැම්බර් 31 වැනි දිනට ජංගම දුරකථන ජාලවලට සම්බන්ධ වූ දෘඩාංග හා මෘදුකාංග උපකරණ පහත වගුවේ දැක්වේ. සමස්ථ පාරිභෝගික දෘඩාංග සහ මෘදුකාංග අවසන් උපකරණ සංඛ්‍යාවෙන් 62%ක් ස්මාර්ට් ෆෝන් සහ ටැබ් ආවරණය වන බව පෙන්නුම් කෙරේ.

වර්ගය	උපකරණ සංඛ්‍යාව	%
මූලික/විශේෂාංග දුරකථන	මිලියන 8.5	33.2
ස්මාර්ට් දුරකථන /ටැබ්	මිලියන 15.9	62.0
ඩොංගල්/රවුටර්	මිලියන 0.3	1.0
වෙනත්	මිලියන 0.9	3.8
එකතුව	**මිලියන 25.6**	**100**

ස්ථාවර ප්‍රවේශ දුරකථන

දැනට, ශ්‍රී ලාංකීය පුරවැසියන්ට ස්ථාවර ප්‍රවේශ දුරකථන සේවා සැපයීම සඳහා දුරකථන ක්‍රියාකරු සමාගම් තුනකට බලපත්‍ර ලබා දී ඇති අතර, ස්ථාවර දුරකථනවල මුළු පාරිභෝගික සංඛ්‍යාවෙන් 16.7%ක් තඹ රහැන් සහ සංකේත විබෙදුම් බහුවිධ ප්‍රවේශ (CDMA) හරහා සපයනු ලබන හඬ දුරකථන සේවාව දැක්වේ. පාරිභෝගිකයින්ගෙන් බහුතරයක් විවිධ ප්‍රවේශ තාක්ෂණයන් හරහා ලැබෙන හඬ සහ දත්ත සේවා දෙකම පරිභෝජනය කරයි. ෆයිබර් සහ දිගු කාලීන පරිණාම තාක්ෂණය (LTE) පාරිභෝගිකයින් අතර වඩාත් ජනප්‍රිය වෙමින් පවතින්නේ එවැනි තාක්ෂණයන් අධිවේගී අන්තර්ජාල සේවා ලබා ගැනීමට සහාය වන බැවිනි. ස්ථාවර ප්‍රවේශ දුරකථන සේවා වර්ග සහ සම්බන්ධතා සංඛ්‍යාව පහත වගුවේ විස්තර කෙරේ.




සමාජ මාධ්‍ය භාවිතා කරන්නන් (ජංගම)

ලෝකයේ බොහෝ රටවලට සමානව ශ්‍රී ලංකාවේ සන්නිවේදන ක්ෂේත්‍රය තුළ සමාජ මාධ්‍ය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. පහත වගුවට අනුව Facebook, YouTube සහ WhatsApp ශ්‍රී ලාංකිකයන් අතර වඩාත් ජනප්‍රිය සමාජ මාධ්‍ය යෙදුම් වේ. 2022 දෙසැම්බර් 31 වන විට මෙම සමාජ මාධ්‍ය තුන සඳහා මුළු දායකත්වය මිලියන 39 ක් පමණ විය. එය මුළු සමාජ මාධ්‍ය භාවිතා කරන්නන්ගෙන් 65% ක් නියෝජනය කරයි.

සෘජු රැකියා අවස්ථා

2022 වර්ෂයේ දී විදුලි සංදේශ ක්ෂේත්‍රය තුළ රු. බිලියන 323 ක් සහ සෘජු රැකියා අවස්ථා 11,812 ක් නිර්මාණය කර ඇත. කෙසේ වෙතත්, සෘජු රැකියා අවස්ථා වලට වඩා වක්‍ර රැකියා අවස්ථා ද නිර්මාණය වී ඇත. විදුලි සංදේශ ක්ෂේත්‍රයේ ජංගම සහ ස්ථාවර අංශ දෙක අතර සෘජු රැකියා අවස්ථා ව්‍යාප්තිය පහත වගුවේ දැක්වේ.



වර්ගය	සෘජු රැකියා සංඛ්‍යාව
ජංගම	4,235
ස්ථාවර	7,577
එකතුව	**11,812**

ජංගම ග්‍රාහකයින්ගේ පළාත් ව්‍යාප්තිය

ජංගම දුරකථන සම්බන්ධතා ජංගම තාක්ෂණයේ අන්තර්ගත අංගයක් වන බැවින් එමගින් පාරිභෝගිකයින්ට ලොව පුරා අදාළ පාර්ශ්ව සමඟ) සම්බන්ධතා (ජංගම සෙලියුලර් ජාලය තිබේ නම්) පවත්වා ගත හැකිය. මෙම දුරකථන සම්බන්ධතා හේතුවෙන්, දී ඇති භූගෝලීය ප්‍රදේශයක් සඳහා නිශ්චිත ග්‍රාහකයින් සංඛ්‍යාවක් ලබා ගැනීම පිණිස විශාල කාර්යයක් සිදු කළ යුතුය. ජංගම දුරකථන ක්‍රියාකරු සමාගම් සංඛ්‍යා ලේඛන ලැයිස්තුව (VLR) අනුව, 2022 දෙසැම්බර් මස අවසානය වන විට එක් එක් පළාතේ ජංගම දුරකථන ග්‍රාහකයින් සංඛ්‍යාව පහත වගුවේ දක්වා ඇත. ජංගම දුරකථන ග්‍රාහකයින්ගෙන් 34% ක් බස්නාහිර පළාතෙන් වාර්තා වුවද, උතුරු මැද පළාතේ ඉහළම ජංගම දුරකථන ඝනත්වය දක්නට ඇත.

පළාත	ග්‍රාහකයින් සංඛ්‍යාව		ජංගම දුරකථන ඝනත්වය %
	මිලියන	%	
බස්නාහිර	7.2	34	115.1
දකුණ	2.1	10	78.1
මධ්‍යම	2.4	11	85.0
ඌව	1.1	5	77.0
නැගෙනහිර	1.4	7	80.8
උතුරු මැද	1.6	8	115.9
වයඹ	2.3	11	89.8
උතුර	1.1	5	93.7
සබරගමුව	1.7	8	82.1
එකතුව	**20.9**	**100**	**94.3**

සටහන: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද 2022වසරේ මධ්‍ය කාලීන (ඇස්තමේන්තුගත) ජනගහන තොරතුරු ජංගම දුරකථන ව්‍යාප්තිය ගණනය කිරීම සඳහා සලකා බලා ඇත.

ස්ථාවර දුරකථන ග්‍රාහකයින්ගේ පළාත් ව්‍යාප්තිය

පහත වගුවට අනුව, ස්ථාවර ප්‍රවේශ දුරකථන සම්බන්ධතාවලින් 50%ක් බස්නාහිර පළාතේ පාරිභෝගිකයන් වෙත ලබා දී ඇත. බස්නාහිර පළාතේ ස්ථාවර ප්‍රවේශ දුරකථන සංඛ්‍යාව 29.6%. කි. ඌව, නැඟෙනහිර සහ උතුරු මැද පළාත්වල 8% ක අඩු දුරකථන ඝනත්වයක් පෙන්නුම් කරයි.

පළාත	ග්‍රාහකයින් සංඛ්‍යාව		ස්ථාවර දුරකථන ඝනත්වය %
	මිලියන	%	
බස්නාහිර	1.8	49.3	29.6
දකුණ	0.4	9.5	13.0
මධ්‍යම	0.4	10.2	13.4
ඌව	0.1	3.8	10.3
නැගෙනහිර	0.1	4.0	4.0
උතුරු මැද	0.1	3.4	3.4
වයඹ	0.4	9.7	9.7
උතුර	0.1	3.6	3.6
සබරගමුව	0.2	6.5	11.8
එකතුව	**3.7**	**100**	**16.8**


විදුලි සංදේශ බදු

විදුලි සංදේශ බදු ශ්‍රී ලංකා රජය විසින් 2011 වසරේදී විදුලි සංදේශ කර්මාන්තය සඳහා "තනි අනුපාත බද්දක්"ලෙස හඳුන්වා දෙන ලදී. එහි ආරම්භක සැපයුම් වටිනාකම මත බදු අනුපාතය 20% ක් විය. අධිවේගී අන්තර්ජාල සේවා ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 2013 ආරම්භයේ සිට අන්තර්ජාල සේවා සඳහා 10% ක සහනදායී විදුලි සංදේශ බදු අනුපාතයක් පැනවීය. අනෙකුත් විදුලි සංදේශ සේවා සඳහා වන විදුලි සංදේශ අනුපාතය නොවෙනස්ව පැවතුනි. 2014 ජනවාරි සිට බලපැවැත්වෙන පරිදි විදුලි සංදේශ බදු අනුපාතය 20% සිට 25% දක්වා වැඩිවූ අතර අන්තර්ජාල සේවා සඳහා විදුලි සංදේශ බදු අනුපාතය 10% ලෙස නොවෙනස්ව පැවතුනි. පසුව, 2017 සැප්තැම්බර් මස සිට බලපැවැත්වෙන පරිදි අන්තර්ජාල සේවා සඳහා වන බද්ද අහෝසි කරන ලද අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2016ට සාපේක්ෂව 2017 වර්ෂය සඳහා එකතු කරන ලද විදුලි සංදේශ බදු ප්‍රමාණයේ අඩුවීමක් සිදු විය. 2018 නොවැම්බර් මාසයේ සිට බලපැවැත්වෙන පරිදි විදුලි සංදේශ සේවා මත විදුලි සංදේශ බදු අනුපාතය 25% සිට 15% දක්වා වෙනස් කරන ලදී. නැවතත්, විදුලි සංදේශ බදු අනුපාතය 2019 දෙසැම්බර් මාසයේදී 11.25% දක්වා අඩු කරන ලදී. නැවතත්, 2022 ජූනි මාසයේදී විදුලි සංදේශ බදු අනුපාතය 15% දක්වා වැඩි කරන ලදී.

වර්ෂය	2021	2022
විදුලි සංදේශ බදු (රු.මිලියන)	11,046	12,905


දේශීය සහ ජාත්‍යන්තර අයකුම මිනිත්තු භාවිතය

පහත ප්‍රස්ථාරය මගින් පසුගිය වසර කිහිපය තුළ දේශීය සහ ජාත්‍යන්තර ඇමතුම් අයකුම මිනිත්තු භාවිතය පෙන්වයි.



සෙස් බදු

1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ සංශෝධිත පනතේ 22 ඌ වගන්තියේ විධිවිධාන ප්‍රකාරව දුරකථන ක්‍රියාකරු සමාගම් වලින් සෙස් බදු එකතු කරනු ලැබේ.



ජංගම දුරකථන කුලුනු බදු

2018 ජනවාරි මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි 2018 අංක 35 දරන මූදල් පනතේ XII වන කොටස යටතේ ජංගම දුරකථන කුලුනු බදු පනවන ලදී. ඉහත සඳහන් මූදල් පනත ප්‍රකාරව සෑම ජංගම දුරකථන ක්‍රියාකරු සමාගමක් විසින් එක් කුලුනක් සඳහා වාර්ෂිකව රු. 200,000 ක් ගෙවිය යුතුය. වැඩිදුරටත් ජංගම දුරකථන ක්‍රියාකරු සතු නොවන නමුත් ඔවුන් විසින් භාවිතා කරන කුලුනු සඳහා ජංගම දුරකථන කුලුනු බදු ගෙවිය යුතුය. කුලුන හවුලේ පරිහරණය කරන ලද දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් එම රු. 200,000 බදු මුදල සමානව බෙදා ගත යුතුය. බද්ද කාර්තුමය වශයෙන් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට ගෙවිය යුතුය. 2022 වසරේ ජංගම දුරකථන කුලුනු බදු එකතුව 2021 වසර ට සාපේක්ෂව 6.6% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

වර්ෂය	2021	2022	% වෙනස්වීම
එකතුව (මිලියන)	1,466	1,565	6.6%

ජංගම දුරකථන කෙටි පණිවුඩ සේවා බද්ද (SMS Levy)

ජංගම දුරකථන කෙටි පණිවුඩ සේවා මත අයබදු 2018 අංක 35 දරන මූදල් පනතේ XIII වගන්තිය ප්‍රකාරව පනවන ලද අතර එය ක්‍රියාත්මක කිරීමේ රෙගුලාසි සඳහා අංක 2014/16 ගැසට් නිවේදනය මගින් අවසර ලබා දී ඇත. ඒ අනුව ජංගම දුරකථන ක්‍රියාකරු සමාගමකට වාණිජ අරමුණු සඳහා ග්‍රාහකයන් වෙත ජංගම දුරකථන හරහා යවන කෙටි පණිවුඩයකට 0.25 මුදලක් ගෙවීම අවශ්‍ය වේ. මෙම බද්ද විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් 2019 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි මාසිකව එකතු කරනු ලැබේ. 2022 වසරේ ජංගම දුරකථන කෙටි පණිවුඩ බදු එකතුව 2021 වසරට සාපේක්ෂව 42.2% ක අඩුවීමක් පෙන්නුම් කරයි.

වර්ෂය	2021	2022	% වෙනස්වීම
එකතුව (මිලියන)	400	231.4	-42.2%

විදුලි සංදේශ සංවර්ධන ගාස්තුව (TDC)

විදුලි සංදේශ සංවර්ධන ගාස්තු (TDC) එකතුව මිලියන 3,991 (තාවකාලික) විය.

වර්ෂය	2020	2021	2022
එකතුව (මිලියන)	4,293	3,621	4,750

වීසා අයදුම්පත් නිර්දේශ කිරීම

විදුලි සංදේශ කර්මාන්තය ශීඝ්‍රයෙන් වෙනස් වන කර්මාන්තයක් බැවින්, ලෝකයේ නව තාක්ෂණයන් සමඟ සිය ජාල වැඩිදියුණු කිරීමට දුරකථන ක්‍රියාකාර සමාගම් අබණ්ඩව උත්සාහ කරති. දුරකථන ක්‍රියාකාර සමාගම් සිය විශේෂ ව්‍යාපෘතිවල වැඩ කිරීමේදී විශේෂඥ සේවය

ලබා ගැනීම සඳහා විදුලි සංදේශ කර්මාන්තයේ විදේශීය වෘත්තිකයන් මෙරටට ගෙන්වා ගනු ලබයි. දුරකථන ක්‍රියාකාර සමාගම් වෙනුවෙන් කොමිෂන් සභාව එවැනි වෘත්තිකයන්ගේ වීසා බලපත්‍ර රේඛීය අමාත්‍යාංශයට නිර්දේශ කරයි. 2022 වර්ෂය තුළ එවැනි වෘත්තිකයින්ගේ වීසා බලපත්‍ර අයදුම්පත් 55 ක් මෙම අංශය විසින් සකස් කරන ලදී.

විදුලි සංදේශ ක්ෂේත්‍රය ආශ්‍රිත තොරතුරු මෙහෙයවීම

ශ්‍රී ලංකා මහ බැංකුව සහ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වැනි රාජ්‍ය ආයතන සඳහා විදුලි සංදේශ ක්ෂේත්‍රය ආශ්‍රිත අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කරන ලදී. ජාත්‍යන්තර සංවිධාන (ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය - ITU, ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය - APT, ආදිය) විසින් ඔවුන්ගේ ප්‍රශ්නාවලිය හරහා ඉල්ලා සිටි සංඛ්‍යාලේඛන තොරතුරු අනෙකුත් අංශ සමඟ සම්බන්ධීකරණයෙන් ලබා දෙන ලදී. එකතු කරන ලද විදුලි සංදේශ ක්ෂේත්‍රය ආශ්‍රිත දත්ත ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ වරින් වර ප්‍රකාශයට පත් කෙරේ.

අන්තර් සම්බන්ධතාවය මෙහෙයවීම

විදුලි සංදේශ ක්ෂේත්‍රයේ නිරතවූවන් සමඟ සිදු කරන ලද සාකච්ඡා ද ඇතුළුව දීර්ඝ ක්‍රියාවලියකින් පසුව, තරඟකාරිත්ව අංශය විසින් සංශෝධිත අන්තර් සම්බන්ධතා ගාස්තු සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ තීරණය ලබා ගැනීම පිණිස කොමිෂන් සභාවට නිර්දේශ කරන ලදි.ඒ අනුව, කොමිෂන් සභාව නව අන්තර් සම්බන්ධතා ගාස්තු තීරණය කළ අතර, එය පියවර හතරකින් ක්‍රියාත්මක කෙරේ. පළමු පියවර 2022 අප්‍රේල් 15 වැනි දින ආරම්භ වූ අතර සෙසු පියවර 2023, 2024 සහ 2025 වසරවල අප්‍රියෙල් 15 දින සිට මගින් බලපැවැත්වෙනු ඇත.

අයක්‍රම නියාමනය

විදුලි සංදේශ කර්මාන්තය වඩ වඩාත් තරඟකාරී වෙමින් පවතී. වෙළඳපොලේ පවතින ඵලදායී තරඟකාරීත්වය හේතුවෙන් ඇමතුම් ගාස්තු සහ දත්ත ගාස්තු වැනි විදුලි සංදේශ සේවාවල මිල ගණන් පහත වැටෙමින් පවතී. ඕනෑම ශුද්ධ මිනිත්තුවක් සහිත සීමාරහිත අයක්‍රම සැලසුම් සඳහා අනුමැතිය ලබා දී ඇත. මෙය වෙනත් ජාල වල ගනුදෙනුකරුවන් සමඟ සන්නිවේදනය කිරීමේ බාධාවන් බිඳ දමයි. මෙය සම්ප්‍රදායික හඬ සන්නිවේදනයේ සන්ධිස්ථානයකි.

කොමිෂන් සභාව විසින් හඬ, සමාජ මාධ්‍ය, දත්ත සහ කෙටි පණිවුඩ සේවා සුසංයෝගී අයක්‍රම සැලසුම් අනුමත කර ඇත. සීමාරහිත හඬ මෙහි විශේෂත්වය වන අතර සමාජ මාධ්‍ය යෙදුම් මෙම සංයුක්ත පැකේජයට ඇතුළත් වේ. එවැනි පැකේජ මගින් පාරිභෝගිකයින්ට දැරිය හැකි මිලකට සහ කිසිදු බාධාවකින් තොරව ජංගම සන්නිවේදන සේවා භාවිත කිරීමට ඉඩ සැලසේ.

කෙසේ වෙතත්, පිරිවැය ව්‍යුහය තීව්‍ර වීමට බලපෑ ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් විදුලි සංදේශ කර්මාන්තය දුෂ්කරතාවන්ට මුහුණ දී ඇත. මෙහි බලපෑම තුලනය කිරීම පිණිස, හඬ සහ දත්ත පැකේජ සඳහා 20% කින් මිල වැඩි කිරීමට සහ ගෙවන රූපවාහිනී පැකේජ සඳහා 25% සිට 40% දක්වා මිල වැඩි කිරීමට කොමිෂන් සභාව අවසර දුන්නේය.


උත්සව අයක්‍රම අනුමැතීන් 28ක්, ප්‍රවර්ධන අයක්‍රම අනුමැතීන් 53ක් සහ ස්ථිර අයක්‍රම අනුමැතීන් 20ක් වශයෙන් අයක්‍රම කාණ්ඩ තුනක් යටතේ 2022 වර්ෂය තුළ අයක්‍රම පැකේජ 101ක් කොමිෂන් සභාව විසින් අනුමත කර ඇත.

"ගමට සන්නිවේදනය"(Connect Sri Lanka) ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් රට පුරා 100% 4G ෆයිබර් අධිවේගී අන්තර්ජාල සම්බන්ධතාවය සාක්ෂාත් කිරීම පිණිස රටේ ඌන සංවර්ධිත සහ විදුලි සංදේශ සේවා පහසුකම් නොමැති ප්‍රදේශ හඳුනාගැනීම සඳහා "ගමට සන්නිවේදනය"ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

මෙම ව්‍යාපෘතිය යටතේ, හඳුනාගත් ප්‍රදේශ සඳහා 4G/Fiber අධිවේගී අන්තර්ජාල සේවා ආවරණය සැපයීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සිය විදුලි සංදේශ සංවර්ධන ගාස්තු (TDC) අරමුදල මගින් දුරකථන ක්‍රියාකරු සමාගම් වලට මූල්‍ය ආධාර සපයයි. තවද, විදුලි සංදේශ ජාල බෙදාහැරීමේ අවසාන අදියර සහ ග්‍රාමීය ප්‍රජාවන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම කෙරෙහි අවධානය යොමු කරමින් අධිවේගී, දැරිය හැකි සහ තිරසාර 4G/Fiber අධිවේගී අන්තර්ජාල සේවා ජාලයක් සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම එහි අරමුණයි.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් රත්නපුර, කුරුණෑගල, මාතර, අනුරාධපුර, මහනුවර, බදුල්ල කළුතර, කෑගල්ල, යාපනය සහ ත්‍රිකුණාමලය ඇතුළු දිස්ත්‍රික්ක දහයක 4G/ ෆයිබර් අධිවේගී අන්තර්ජාල සේවා ව්‍යාපෘතියේ පළමු අදියර සාර්ථකව ක්‍රියාත්මක කර ඇත. "ගමට සන්නිවේදනය"ව්‍යාපෘතිය යටතේ මෙම දිස්ත්‍රික්ක දහය සඳහා 4G ආවරණය සම්පූර්ණ කිරීම සඳහා ආසන්න වශයෙන් නව විදුලි සංදේශ කුළුණු බිම් 276ක් අවශ්‍ය වනු ඇතැයි ගණන් බලා ඇත. ඒ අනුව, දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් රත්නපුර සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල කුළුණු බිම් 35ක් මේ වන විටත් ආරම්භ කර ඇත. තවදුරටත් දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් කුළුණු බිම් 35 ක ඉදිකිරීම් ආරම්භ කර ඇති අතර, ඉතිරි බිම් (කුලුනු බිම් 206) සඳහා ඉඩම් අත්පත් කර ගනිමින් අදාළ රජයේ බලධාරීන්ගෙන් අනුමැතිය ලබා ගනිමින් සිටී.



සංඛ්‍යාලේඛනවල දැක්වෙන පරිදි, බොහෝ ස්ථානවල කුළුණු ඉදිකිරීම් ආරම්භ කර නොමැත. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ රට අත්විඳින අභිතකර ආර්ථික තත්ත්වය සහ දැඩි ආර්ථික පසුබෑම "ගමට සන්නිවේදනය"ව්‍යාපෘතියට බලපෑමයි. 2022 පෙබරවාරි මාසයේ සිට ශ්‍රී ලංකා රුපියල ඇමරිකන් ඩොලරයට සාපේක්ෂව 50%කට වඩා අවප්‍රමාණය වීම හේතුවෙන් විදුලි සංදේශ උපකරණ සහ ඉදිකිරීම් පිරිවැය 70% හෝ ඊට වැඩි ප්‍රමාණයකින් වැඩි වී ඇත. එය සියලුම දුරකථන ක්‍රියාකරු සමාගම්වල ආයෝජනවලට බලපෑ අතර ඔවුන්ගේ ප්‍රාග්ධන වියදම් අඩු කිරීමට හේතු වූ බැවින් ගමට සන්නිවේදනය ව්‍යාපෘතියේ තවදුරටත් අබණ්ඩව ආයෝජනය කිරීම අභියෝගාත්මක විය. මුදල් අවප්‍රමාණය වීම හේතුවෙන් පිරිවැය ඉහළ යාම නිසා දුරකථන ක්‍රියාකරු සමාගම්වල ප්‍රාග්ධන වියදම් සඳහා මුදල් වැඩියෙන් යෙදවීමට සිදු වී ඇති අතර, එය දුරකථන ක්‍රියාකරු සමාගම්වල ආයෝජන ශක්‍යතාවයට සැලකිය යුතු අභියෝගයක් එල්ල කරයි.

● සම්පූර්ණ කුළුණු
■ ඉඩම් හඳුනාගැනීම
◆ ආයතන අනුමැතීන්
↗ ඉදිකරමින් පවතින
✓ නිම කරන ලද කුලුනු

ලංකා විදුලිබල මණ්ඩලයෙන් විදුලිය ලබා ගැනීමේ ප්‍රමාදයන් සහ කෝවිඩ්-19 වසංගතය සහ රටේ සෘණ ආර්ථික පරිසරය යන දුෂ්කරතා මත විවිධ සම්පත් සීමාවන්ට මුහුණ දෙන සීමිත දේශීය කුළුණු සැපයුම්කරුවන් පමණක් සිටීම හේතුවෙන් ගමට සන්නිවේදනය ව්‍යාපෘතිය යටතේ වැඩබිම් ආරම්භ කිරීම නියමිත වේලාවට අවසන් කිරීම සහතික කිරීම සඳහා දුරකථන ක්‍රියාකරු සමාගම් දුෂ්කරතාවන්ට මුහුණ දී සිටිති. මෙම බාධක නිසා ගමට සන්නිවේදනය ව්‍යාපෘතිය යටතේ හඳුනාගත් දිස්ත්‍රික්ක ආවරණය කිරීම සඳහා විදුලි සංදේශ කුළුණු සැපයීමේ සැලකිය යුතු ප්‍රමාදයක් ඇති විය. ඉහත කරුණු සලකා බලා, 2024 දී නිම කිරීමට නියමිතව තිබූ ගමට සන්නිවේදනය ව්‍යාපෘතිය 2026 වසර අවසානය දක්වා දීර්ඝ කිරීමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සැලසුම් කරයි.

පාසල් ෆයිබර්කරණ ව්‍යාපෘතිය

නවීන තාක්ෂණය සමඟින් අධ්‍යාපන ක්‍රමය ඉදිරියට ගෙන යාමට පාසල්වලට අන්තර්ජාල පහසුකම් ලබාදීම අත්‍යවශ්‍ය කරුණකි. එබැවින් පළමු පියවර ලෙස දුෂ්කර ප්‍රදේශවල පිහිටි ජ්‍යෙෂ්ඨ සහ කනිෂ්ඨ ද්විතීයික පාසල් 1000කට නොමිලේ අන්තර්ජාල පහසුකම් ලබාදීමට කටයුතු කරයි. 2023 වසරේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සහයෝගීතාවයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශය සකස් කරන ලදී.

අනුකූලතා සහ විමර්ශන

සේවා තත්ත්ව (QoS)


- පොදු ස්විචිකරණ දුරකථන ක්‍රියාකරු සමාගම් හතකින් (07) ලැබුණු මාසික සේවා තත්ත්ව වාර්තා අසූහතරක් (84) විශ්ලේෂණය කර අවශ්‍ය අවස්ථාවලදී සේවා තත්ත්ව පරාමිතිවල වැඩිදියුණු කිරීම් පිළිබඳව ඔවුන් සමඟ සාකච්ඡා කිරීම.
- පොදු ස්විචිකරණ දුරකථන ක්‍රියාකරු සමාගම් හතක (07) සංසන්දනාත්මක වාර්තා විසිහතර (24) සකස් කර ඔවුන් අතර තොරතුරු සහ කාර්ය සාධන මිනුම්වල නිරවද්‍යතාවය වැඩි දියුණු කිරීම සඳහා ඒවා බෙදා හැරීම.
- ජාල විගණනය: පොදු ස්විචිකරණ දුරකථන ක්‍රියාකරු සමාගම් ජාල කවුළු මගින් කාර්ය සාධන මිනුම් දත්ත ලබා ගැනීම, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ලබා දී ඇති සම්මතකරණයට අනුව ගණනය කිරීම, සහ සේවා තත්ත්ව පරාමිතියක ආකාරයෙන් වාර්තාව නැවත ලබා දීම. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් දුරකථන ක්‍රියාකාර සමාගම්වල ජාල නිරීක්ෂණය කිරීම සහ ගණනය කිරීමේ ක්‍රමවේදය නැවත ඇගයීම සහ සේවා තත්ත්ව පරාමිතීන් ගණනය කිරීම පිණිස ජාල කවුළු මගින් සකස් නොකරන ලද දත්ත ලබා ගැනීම.
- පාරිභෝගික සේවා පරාමිතීන් පිළිබඳ ජාල විගණන විසි එකක් (21) සහ පොදු ස්විචිකරණ දුරකථන ජාල ක්‍රියාකරු සමාගම් හතක හඬ සේවා ජාල පරාමිතීන් පිළිබඳ ජාල විගණන විසිඑකක් සිදු කිරීම.
- පොදු ස්විචිකරණ දුරකථන ක්‍රියාකරු සමාගම් හතක (07) අධිවේගී අන්තර්ජාල සේවාවල පාරිභෝගික සේවා පරාමිතීන් සහ ජාල පරාමිතීන් පිළිබඳ ජාල විගණන විසිඑකක් (21) සිදු කිරීම.
- පොදු ස්විචිකරණ දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් අගය එකතු කළ සේවා මාර්ගෝපදේශ පිළිපැදීම සම්බන්ධයෙන් විගණන විගණන විසිහතරක් පවත්වන ලදී.

ජංගම ක්‍රියාකරුවන්ගේ පාරිභෝගික සේවා ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල විශේෂතා

2021.01.18 දිනැති අංක 2211/2 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සේවා තත්ත්ව පිළිබඳ (අතිවිශේෂ) අංක ගැසට් පත්‍රය ප්‍රකාරව, දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් පහත පරාමිතීන් මනිනු ලැබ ඇති අතර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් විගණනය කර ඇත.


බිල්පත් නිරවද්‍යතා පැමිණිලි - පසුගෙවුම්

- අගය (%) (>) 0.5% ට වඩා වැඩි නම්, ඉලක්කය සපුරා නැත.
- අගය (%) (<) 0.5% ට වඩා අඩු නම්, ඉලක්කය සපුරා ඇත.




බිල්පත් නිරවද්‍යතා පැමිණිලි - පෙරගෙවුම්

- අගය (%) (>) ට වඩා වැඩි නම්, 0.1%, ඉලක්කය සපුරා නැත.
- අගය (%) (<), 0.1% ට වඩා අඩු නම්, ඉලක්කය සපුරා ඇත.




පසුගෙවුම් සඳහා බිල්පත් නිරවද්‍යතා පැමිණිලි නිරාකරණය කිරීමේ කාලය (මාස හයක් ඇතුළත නිරාකරණය කිරීම)

- අගය (%) 95% සිට 100% දක්වා පරාසය තුළ නොමැති නම්, ඉලක්කය සපුරා නොගනී.
- අගය (%) 95% සිට 100% දක්වා පරාසයක පවතී නම්, ඉලක්කය සපුරා ඇත.




පසුගෙවුම් සඳහා බිල්පත් නිරවද්‍යතා පැමිණිලි නිරාකරණය කිරීමේ කාලය (මාස තුනක් ඇතුළත නිරාකරණය කිරීම)

- අගය (%) 90% සිට 95% දක්වා පරාසය තුළ නොමැති නම්, ඉලක්කය සපුරා නොගනී.
- අගය (%) 90% සිට 95% දක්වා පරාසයක පවතී නම්, ඉලක්කය සපුරා ඇත.




පෙරගෙවුම් සඳහා බිල්පත් නිරවද්‍යතා පැමිණිලි නිරාකරණය කිරීමේ කාලය (වැඩකරන දින පහක් ඇතුළත නිරාකරණය කිරීම)

- අගය (%) 95% සිට 100% දක්වා පරාසය තුළ නොමැති නම්, ඉලක්කය සපුරා නොගනී.
- අගය (%) 95% සිට 100% දක්වා පරාසයක පවතී නම්, ඉලක්කය සපුරා ඇත.




පෙරගෙවුම් සඳහා බිල්පත් නිරවද්‍යතා පැමිණිලි නිරාකරණය කිරීමේ කාලය (වැඩකරන දින තුනක් ඇතුළත නිරාකරණය කිරීම)

- අගය (%) 85% හෝ ඊට අඩු නොවේ නම්, ඉලක්කය සපුරා නැත.
- අගය (%) 85% හෝ ඊට වැඩි නම්, ඉලක්කය සපුරා ඇත.




කාලය තත්පර 40 ක් ඇතුළත ක්‍රියාකරු ප්‍රතිචාර දැක්වීම

- අගය (%) (<) 60% ට වඩා අඩු නම්, ඉලක්කය සපුරා නැත.
- අගය (%) (>) 60% ට වඩා වැඩි නම්, ඉලක්කය සපුරා ඇත.




කාලය තත්පර 80ක් ඇතුළත ක්‍රියාකරු ප්‍රතිචාර දැක්වීම

- අගය (%) (<) 85% ට වඩා අඩු නම්, ඉලක්කය සපුරා නැත.
- අගය (%) (>) 85% ට වඩා වැඩි නම්, ඉලක්කය සපුරා ඇත.



අන්තර් ක්‍රියාකාරී හඬ ප්‍රතිචාර ආරම්භක ප්‍රතිචාර කාලය

- අගය (%) (<) 95% ට වඩා අඩු නම්, ඉලක්කය සපුරා නැත.
- අගය (%) (>) 95% ට වඩා වැඩි නම්, ඉලක්කය සපුරා ඇත.



ආවේක්ෂණ

- වෙළෙන්දන් විසින් අනුමත නොකළ විදුලි සංදේශ උපකරණ විකිණීමේ අවස්ථා දොළහක් විමර්ශනය කරන ලදී.
- දිස්ත්‍රික්ක 10 ක වෙළෙන්දන් 442 ක ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද වලංගු වෙළඳ බලපත්‍ර තිබෙදැයි පරීක්ෂා කිරීම.
- 17 වන වගන්තියේ බලපත්‍ර කොන්දේසි දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් පිළිපදින්නේ ද යන්න නිරීක්ෂණය කිරීම සඳහා පරීක්ෂණ අටක් සිදු කර ඇත.
- සිම් ගැසට් නිවේදනය ප්‍රකාරව ග්‍රාහකයින් නැවත ලියාපදිංචි කිරීමට දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් පියවර ගෙන තිබේද යන්න තහවුරු කර ගැනීම සඳහා විගණන විසිහතරක් (24) සිදු කර ඇත.
- ග්‍රාහකයින් වෙත පිරිනමන අයක්‍රම පැකේජවල අයකිරීම් යාන්ත්‍රණයන් පිළිබඳ විගණන 16ක් සම්පූර්ණ කරන ලදී.

විමර්ශන සහ බුද්ධිමය කටයුතු

- නීති විරෝධී කේබල් රූපවාහිනී සේවා සැපයීමේ අවස්ථා හයක් විමර්ශනය කිරීම.
- පොලිසියේ / රහස් පොලිසියේ ඉල්ලීම් මත ඔවුන්ගේ පරීක්ෂණ සඳහා අවශ්‍ය සහාය ලබා දීම.
- විදුලි සංදේශ සේවා නීති විරෝධී ලෙස පවත්වාගෙන යාම පිළිබඳ තාක්ෂණික විමර්ශන සිදු කිරීම.
- ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතාවය (IMEI) සත්‍යාපනය කිරීමේ විසඳුම් ඇතුලත් සිම් උපකරණ / විකුණුම් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලීන් විධිමත් කිරීම.
- නීති විරෝධී DTH/Cable TV සේවා සපයන්නන් අවම කිරීම.
- සයිබර් හිරිහැර පැමිණිලි කළමනාකරණය කිරීම.

- සමාජ මාධ්‍ය පැමිණිලි 1348ක් විසඳීමට සහාය වීම.

පාරිභෝගික පැමිණිලි සහ මහජනතාව දැනුවත් කිරීම

1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (1996 පනතින් සංශෝධිත) පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව, දුරකථන ක්‍රියාකරු සමාගමක් විසින් සපයනු ලබන විදුලි සංදේශ සේවා සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත පැහැදිලි හේතු සහිතව ලිඛිත පැමිණිලි ඉදිරිපත් කිරීමට ග්‍රාහකයෙකුට හෝ මහජනතාවට අවසර ලබා දේ. ඒ අනුව කොමිෂන් සභාවට අවශ්‍ය පරිදි විමර්ශනය කිරීමට සහ සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට බලය පවරා ඇත. පනතේ 9 (2) වගන්තිය අනුව එවැනි නිමිත්තක් හෝ කරුණක් නිවැරදි කිරීම සඳහා අවශය පියවර ගැනීමට සහ උචිත අවස්ථා වලදී මුදල් සහන සලසන ලෙස ක්‍රියාකරුට නියම කිරීමට කොමිෂන් සභාවට විධිවිධාන සලසා ඇත.

අස්ථානගත වූ ජංගම දුරකථනවල ඉල්ලීම් මෙහෙයවීම


ශ්‍රී ලංකා පොලිසිය සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් අස්ථානගත වූ වූ දුරකථන තොරතුරු වාර්තා කිරීමට මාර්ගගත විසඳුමක් හඳුන්වා දී ඇති අතර ඔබට ඒ සඳහා “www.ineed.police.lk”වෙබ් අඩවියේ සහය ලබා ගත හැකිය.. දැන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත පැමිණීමෙන් තොරව එම ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමේ ඩිජිටල් පහසුකම ලබා දෙයි.

සමාජ වගකීමේ කොටසක් ලෙස, අස්ථාන ගත වූ ජංගම දුරකථන සොයා ගැනීමේ ක්‍රියාවලියේ මැදිහත්කරුවෙකු ලෙස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ක්‍රියා කරයි. අපි අන්තර්ජාල විසඳුම (iNeed) හරහා ලැබෙන පැමිණිලි දිනපතා ජංගම දුරකථන ක්‍රියාකරු සමාගම් වෙත යොමු කරන අතර, ඒ සඳහා ලැබෙන ප්‍රතිචාර අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා අදාළ පොලිස් ස්ථාන වෙත යොමු කරනු ලැබේ.

පහත වගුවෙන් 2022 වසරේ දී අස්ථානගත වූ ජංගම දුරකථන සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි සංඛ්‍යාව සහ ඒ සඳහා ජංගම දුරකථන ක්‍රියාකරු සමාගම් වෙතින් ලැබුණු ප්‍රතිඵල පෙන්වයි. එම ප්‍රතිඵල ඉදිරි කටයුතු සඳහා පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කරන ලදී.

නව පැමිණිලි	පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කරන ලද ප්‍රතිඵල
44,013	21,471

ඔබගේ දුරකථනය අස්ථානගතව තිබේද?



මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්

විදුලි සංදේශ/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතය සහ අනෙකුත් පාරිභෝගික ගැටළු පිළිබඳව පොදු මහජනතාව දැනුවත් කිරීමේ වැදගත්කම නිරීක්ෂණය විය. දැනුවත් ආර්ථිකයේ අභියෝග වැලඳ ගැනීමට මහජනතාව අනාගතයේ දී සූදානම් බව සහතික කිරීම පිණිස විදුලි සංදේශ /තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ වැදගත්කම පිළිබඳව සාමාන්‍ය ජනතාව දැනුවත් කරන මෙම වැඩසටහන ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සමාජ වගකීම් මුලපිරීමක් ලෙස සැලකිය හැකිය.

තවද, විදුලි සංදේශ සේවාවල සදාචාරාත්මක භාවිතය පිළිබඳව සාමාන්‍ය ජනතාව දැනුවත් කළ යුතු බව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව තරයේ විශ්වාස කරයි.

භෞතික වැඩසටහන්	මාර්ගගත වැඩසටහන්	වෙනත් වැඩසටහන්
කන්දකාඩු - 01 පිටිපන - 01 පාසල් - 01	පාසල් - 02 ප්‍රාදේශීය ලේකම් කාර්යාල - 16 හමුදා / පොලිසිය - 11	රූපවාහිනී වැඩසටහන්- 10 පුවත්පත් නිවේදන- 8

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නීතිමය රාමුව තුළ මූලික තොරතුරු පිළිබඳව සාමාන්‍ය මහජනතාව දැනුවත් කිරීමේ රූපවාහිනී/ගුවන්විදුලි වැඩසටහන් සහ සමාජ මාධ්‍ය වැඩසටහන් පවත්වා ඇත.

පාරිභෝගික පැමිණිලි

එක් එක් සේවා වර්ගය යටතේ මෙහෙයවන ලද පාරිභෝගික පැමිණිලි සංඛ්‍යාව පහත වගුවේ දැක්වේ. සංඥා ආවරණය සහ බිල්පත් සම්බන්ධයෙන් බොහෝ පැමිණිලි ලැබී ඇත. පාරිභෝගික පැමිණිලි රැසක් විසඳා ඇති අතර විසඳාලිය නොහැකි ඉතිරි සංඥා සහ ආවරණ පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී.

සියලුම පාරිභෝගික පැමිණිලිවලින් 91% ක් විසඳා ඇත.

පාරිභෝගික පැමිණිල්ලේ වර්ගය	ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව	නිරාකරණය කරන ලද පැමිණිලි සංඛ්‍යාව	නිරාකරණය කරන ලද පැමිණිලි සංඛ්‍යාවේ ප්‍රතිශතය %
සංඥා / ආවරණය	254	195	77%
බිල්පත්	198	172	87%
දුරකථන දෝෂ	182	182	100%
දුරකථන සම්බන්ධතා	170	170	100%
අගය එකතු කළ සේවා	55	40	73%
දත්ත	165	152	92%
අන්තර්ජාල	68	43	63%
ජංගම දුරකථන අස්ථානගතවීම	408	408	100%
එකතුව	**1500**	**1362**	**91%**

සමාජ මාධ්‍ය පැමිණිලි	
වර්ගය	සංඛ්‍යාව
ෆේස්බුක්	1127
වට්ස්ඇප්	37
යූ ටියුබ්	23
වෙබ් අන්තර්ගතය	24
විද්‍යුත් තැපෑල	16
වෙනත්	5
එකතුව	**1,232**
සමාජ මාධ්‍ය නියැලෙන්නන් සම්බන්ධයෙන් වාර්තා කරන ලද පැමිණිලි සංඛ්‍යාව - 354	
උපදෙස් ලබාදුන් පැමිණිලි සංඛ්‍යාව - 878	

දුරකථන ක්‍රියාකරු සමාගම් සහ පැමිණිලිකරුවන් අතර රැස්වීම් සහ සාකච්ඡා සංවිධානය කිරීම

දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් ඉදිරිපත් කරන ලද විසඳුම් සම්බන්ධයෙන් පැමිණිල්ල සෑහීමකට පත් නොවූ විට එවැනි පාරිභෝගික ගැටළු විසඳීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සේවා සපයන්නන් සහ පැමිණිලිකරුවන් අතර රැස්වීම් සහ සාකච්ඡා සංවිධානය කළේය. දෙපාර්ශවය අතර සුහද විසඳුමක් ඇති කරලීම සඳහා මෙම වසරේදී පවත්වන ලද සාකච්ඡා සංඛ්‍යාව හත්සිය පනස් දෙකකි.









ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා

විදුලි සංදේශ ක්ෂේත්‍රයේ පර්යේෂණ සහ සංවර්ධනය

ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා අංශය විසින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්ව විද්‍යාල සහ පර්යේෂණ ආයතනවල සහාය ඇතිව පසුගිය වසරේ ආරම්භ කරන ලද විදුලි සංදේශ ආශ්‍රිත පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙන ගියේය.ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අදාළ සියලුම අංශවල නියෝජිතයින්ගෙන් සමන්විත පර්යේෂණ කමිටුව විසින් මූල්‍යාධාර ලබාදීම පිණිස “Blockchain and AI-empowered Cryptographic Dynamic Spectrum Access for 6G and Beyond”පර්යේෂණ ව්‍යාපෘතිය තෝරා ගන්නා ලදී. රුහුණු විශ්වවිද්‍යාලයේ විදුලි හා තොරතුරු ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ පර්යේෂණ කණ්ඩායම විසින් මෙම ව්‍යාපෘතිය ඉදිරිපත් කරනු ලැබීය. පර්යේෂක කණ්ඩායම මෙම වසරේ මාර්තු සහ ජූලි මාසවලදී 1 වන සහ 2 වන ප්‍රගති ඉදිරිපත් කිරීම් සිදු කර ව්‍යාපෘතියේ ප්‍රගතිය පිළිබඳ වාර්තා ඉදිරිපත් කරන ලදී.

ඔවුන් විසින් දෙසැම්බර් මාසයේ අවසන් ඉදිරිපත් කිරීම සම්පූර්ණ කිරීමෙන් පසු “Blockchain and AI-empowered Cryptographic Dynamic Spectrum Access for 6G and Beyond “පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතියේ අවසන් වාර්තාව ඉදිරිපත් කරන ලදී. පර්යේෂණ ව්‍යාපෘතියේ අවසාන ඉදිරිපත් කිරීම ඇතුළුව සියලුම ඉදිරිපත් කිරීම් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පර්යේෂණ කමිටුවේ සාමාජිකයින්, පර්යේෂණ කණ්ඩායමේ සාමාජිකයින් ඇතුළු ඔවුන්ගේ ජාත්‍යන්තර සහයෝගිතාකරුවන්, විදුලි සංදේශ ක්ෂේත්‍රයේ විශේෂඥයින් සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ සහභාගීත්වයෙන් මාර්ගගත වැඩසටහන් ලෙස සංවිධානය කරන ලදී. ඉදිරිපත් කිරීම් අවසන් කර අදාළ ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීමෙන් පසු වාරික පදනම මත ව්‍යාපෘතිය සඳහා මූල්‍ය ප්‍රදාන ලබා දෙන ලදී.

2022 වසර සඳහා සැලසුම් කර ඇති පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහනේ ප්‍රගතියට “සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වල විසඳම් කළමනාකරණය සහ ව්‍යාපාර තිරසාරභාවය”පිළිබඳ අංක 04/2022 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය බලපා ඇත. මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු මෙම වසර සඳහා පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහනේ ඉදිරි කටයුතු සිදු කරන ලදී. රාජ්‍ය විශ්වවිද්‍යාලවලින් පර්යේෂණ යෝජනා පහක් ලැබී ඇති අතර ලැබුණු යෝජනා පර්යේෂණ කමිටුවේ ඇගයීමට ලක්ව ඇත.

පර්යේෂකයන්ට අවශ්‍ය සම්පත් ලබා ගැනීමේදී සහ අපේක්ෂිත පර්යේෂණ ප්‍රතිඵල සමඟින් තම ව්‍යාපෘති නිම කිරීමේදී ඔවුන් මුහුණ දුන් මූල්‍ය බාධාවන් මහඟරවා ගැනීමට මෙලෙස පහසුකම් සැලසීම නිසා විශ්වවිද්‍යාල විසින් මෙම පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන බෙහෙවින් අගය කරන ලදී. දේශීය හා ජාත්‍යන්තර පර්යේෂකයන්ගේ අධීක්ෂණය යටතේ මෙම ව්‍යාපෘතියෙන් සාක්ෂාත් කරගත් ප්‍රායෝගික අත්දැකීම් උපාධි අපේක්ෂකයින්ට ඔවුන්ගේ අධ්‍යයන අරමුණු සහ වෘත්තීන් ඉදිරියට ගෙන යාමට ප්‍රයෝජනවත් වූ බව වාර්තා විය.

ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT) / කොරියානු ජාතික තොරතුරු සමාජ නියෝජිතායතනය තොරතුරු සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන 2022

සෑම වසරකම දකුණු කොරියානු රජය විසින් ජාත්‍යන්තර තොරතුරු සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන යටතේ තොරතුරු තාක්ෂණය (IT) පිළිබඳ දක්ෂ කොරියානු ස්වේච්ඡා සේවක කණ්ඩායම් සංවර්ධනය වෙමින් පවතින රටවලට යවයි. කොරියානු ජාතික තොරතුරු සමාජ නියෝජිතායතනය (NIA) විසින් 2001 වසරේ සිට මෙම ජාත්‍යන්තර තොරතුරු සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන සංවිධානය කර කළමනාකරණය කර ඇත.

කොරියානු ජාතික තොරතුරු සමාජ නියෝජිතායතනය (NIA), ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) සහ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT) සහයෝගිතාවයෙන් 2011 වසරේ සිට රට පුරා ඇති රාජ්‍ය/පෞද්ගලික ආයතන වෙත ජාත්‍යන්තර තොරතුරු සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා සේවකයන් 100කට අධික සංඛ්‍යාවක් යැවීමේ සම්බන්ධීකාරක/ පහසුකම් සපයන්නා වී ඇත්තේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවයි.

ශ්‍රී ලංකාවේ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන් අතර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සාක්ෂරතාවය ඉහළ නැංවීම සඳහා ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT) / කොරියානු ජාතික තොරතුරු සමාජ නියෝජිතායතනයේ ජාත්‍යන්තර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන 2022 සංවිධානය කරන ලදී.. ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය සහ කොරියානු ජාතික තොරතුරු සමාජ නියෝජිතායතනය විසින් සපයන ලද මාර්ගෝපදේශ ප්‍රකාරව, මෙම වසරේ ජාත්‍යන්තර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන වෘත්තීය පුහුණු ආයතනවල සිසුන්ගේ සහභාගීත්වයෙන් මාර්ගගත පුහුණු වැඩසටහනක් ලෙස පවත්වන ලදී. විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන් සඳහා සීදුව, වත්තේගම සහ කැටවල වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සඳහා තොරතුරු තාක්ෂණ පුහුණුව ලබාදීම සඳහා ස්වේච්ඡා කණ්ඩායම් තුනක් වෙත පවරා ඇත. ප්‍රධාන සම්බන්ධීකරණ ඒකකය වශයෙන්, ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා අංශය විසින් කොරියානු ජාතික තොරතුරු සමාජ නියෝජිතායතනයේ නිලධාරීන්, කොරියානු ස්වේච්ඡා කණ්ඩායම් සහ අදාළ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන භාර නිලධාරීන් ඇතුළු තොරතුරු තාක්ෂණ උපදේශකවරුන් සමඟ සාකච්ඡා කර 2022 ජූලි සිට අගෝස්තු දක්වා කාලය තුළ මෙම ස්වේච්ඡා වැඩසටහන සංවිධානය කරන ලදී. උපාධි අපේක්ෂකයින් 12 දෙනෙකුගෙන් සමන්විත කොරියානු තොරතුරු සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා (KIV) කණ්ඩායම් තුනක් විසින් මාර්ගගත පුහුණු වැඩසටහන පවත්වන ලදී.මෙම වැඩසටහන අවසානයේදී, එක් එක් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ සමාලෝචන වීඩියෝ සහ ප්‍රතිපෝෂණ කොරියානු ජාතික තොරතුරු සමාජ නියෝජිතායතනය වෙත ඉදිරිපත් කිරීමටත් එම කොරියානු ජාතික තොරතුරු සමාජ නියෝජිතායතනය විසින් එවන ලද සහතිකපත්‍ර පාඨමාලාවට සහභාගිවන්නන් අතර බෙදා හැරීමටත් අංශය කටයුතු කළේය.

2022 වසර සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව දක්වන ලද සහයෝගිතාවය කොරියානු ජාතික තොරතුරු සමාජ නියෝජිතායතනය විසින් අගය කරන ලදී. 2022 වසරේ කොරියානු ජාත්‍යන්තර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන ක්‍රියාත්මක කළ රටවල් 11ක් අතරින් සාර්ථක රටක් ලෙස අප රට තෝරාගෙන තිබීම විශේෂත්වයකි.

EBC-K සහ EBC-C ව්‍යාපෘති යටතේ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ සහයෝගීතා වැඩසටහන

EBC-K ව්‍යාපෘතිය

EBC-K ව්‍යාපෘති ලෙස හඳුනාගෙන ඇති කොරියානු ජනරජයේ අතිරේක අයවැය දායකත්වයෙන් අරමුදල් සපයන ව්‍යාපෘති සඳහා ආසියා- ශාන්තිකර කලාපයේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ යෙදුම් සහ සුහුරු නගර සඳහා පහසුකම් සැලසීමට ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කරන ලෙස ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය සිය සාමාජික රටවලට ආරාධනා කළේය. මෙම වැඩසටහන තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ යෙදුම් සහ සුහුරු නගර යනාදී වශයෙන් වැඩසටහන් දෙකකින් සමන්විත වේ.

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ යෙදුම් වැඩසටහනේ පරමාර්ථය වූයේ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ සාමාජික රටවල කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා හෝ සේවා හෝ කර්මාන්ත ක්ෂේත්‍රයේ නව ආර්ථික වටිනාකම් සහ ප්‍රතිලාභ ලබා දීම සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ යෙදුම් සංවර්ධනයට පහසුකම් සැලසීමයි. එමෙන්ම දැනුම/අත්දැකීම් හුවමාරු කර ගැනීම සහ සුහුරු නගර සේවාව සංවර්ධනය කිරීම සහ ව්‍යාප්තිය සඳහා රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සහයෝගීතාවයට පහසුකම් සැලසීම සුහුරු නගර වැඩසටහනේ පරමාර්ථය විය. මෙම වැඩසටහන් දෙකටම කොරියානු ජනරජයේ (EBC-K) අමතර අයවැය දායකත්වයෙන් අරමුදල් සපයනු ලබන අතර, ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ සාමාජික රටවල තෝරාගත් ව්‍යාපෘති කොරියානු විශේෂඥයින් සමඟ සහයෝගයෙන් ක්‍රියාත්මක වේ.

මේ සම්බන්ධයෙන් රාජ්‍ය විශ්වවිද්‍යාල, පර්යේෂණ ආයතන, අදාළ රාජ්‍ය ආයතන අතර තොරතුරු බෙදා හැරීමටත්, ලැබුණු පර්යේෂණ යෝජනා නියමිත කාල සීමාව තුළ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය වෙත ඉදිරිපත් කිරීමටත් එම අංශය කටයුතු යොදා ඇත. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ යෙදුම් වැඩසටහන යටතේ ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, මොරටුව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා මෘදුකාංග සේවා සමාගම් සංගමය (SLASSCOM) සහ කාර්මික තාක්ෂණ ආයතනයෙන් ව්‍යාපෘති යෝජනා හයක් ලැබිණි. තවද, වැඩසටහන සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සහ ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය විසින් ආසියා

ශාන්තිකර විදුලි සංදේශ සංගමය වෙත යෝජනා දෙකක් ඉදිරිපත් කරන ලදී.

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය විසින් ඉදිරිපත් කරන ලද "ශක්තිමත් පළාත් පාලනය සඳහා වෙබ- භූගෝලීය තොරතුරු පද්ධති පාදක කාලීන දැනුවත් තීරණ ගැනීම" පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘති යෝජනාව අතිරේක අයවැය දායකත්වය යටතේ අරමුදල් සැපයීම සඳහා ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය සහ කොරියානු රජය විසින් තෝරාගෙන ඇති බව අවධාරණය කෙරේ. සංශෝධිත යෝජනාව සහ ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම අනුව ඒකාබද්ධ පර්යේෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා සබරගමුව විශ්ව විද්‍යාලයට අරමුදල්වල මූලික වාරිකය ලබා දීම පිණිස ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ ලේකම් කාර්යාලය විසින් අවසන් අනුමැතිය ලබා දෙන ලදී.

EBC-C ව්‍යාපෘතිය

EBC-C වැඩසටහනේ පරමාර්ථය වූයේ තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සාක්ෂාත් කර ගැනීම සඳහා දරිද්‍රතාවය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යාප්ති විෂමතාවය, සෞඛ්‍ය, අධ්‍යාපනය, පිරිපහදු බලශක්තිය, යටිතල පහසුකම් සංවර්ධනය, තිරසාර නගර සහ ප්‍රජාවන් යනාදිය සම්බන්ධ සමාජ-ආර්ථික ගැටලු විසඳීම සඳහා ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ සාමාජික රටවල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යෙදුම් භාවිතය ප්‍රවර්ධනය කිරීමයි. මෙම වැඩසටහන සඳහා අරමුදල් සපයනු ලබන්නේ මහජන චීන සමුහාණ්ඩුවේ අතිරේක අයවැය දායකත්වය මගිනි.

"තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා ICT භාවිතය ප්‍රවර්ධනය කිරීම" පිළිබඳ EBC-C ව්‍යාපෘතිය සඳහා විශ්වවිද්‍යාල, පර්යේෂණ ආයතන සහ අදාළ රාජ්‍ය ආයතනවලින් පර්යේෂණ යෝජනා ලබා ගැනීමට සහ ඉදිරි ක්‍රියාමාර්ග සඳහා ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය වෙත යොමු කිරීමට අංශය කටයුතු කළේය.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, කාර්මික තාක්ෂණ ආයතනය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, කැලණිය විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා නැනෝටෙක්නොලොජි (SLINTEC) ආයතනයේ සහයෝගය ඇතිව ව්‍යාපෘති යෝජනා හයක් ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය වෙත ඉදිරිපත් කරන ලදී.


තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දිනය 2022 ගැහැණු දරුවන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය වෙත යොමුවීමේ වැදගත්කම පිළිබඳ වැඩසටහන



තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දිනය 2022 ගැහැණු දරුවන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය වෙත යොමුවීමේ වැදගත්කම පිළිබඳ වැඩසටහන විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු සහ ගණිතය (STEM) සහ තොරතුරු හා සන්නවේදන තාක්ෂණය යන ක්ෂේත්‍රවල ගැහැණු ළමයින් හා කාන්තා නියෝජනය වැඩි කිරීම අරමුණු කරගත් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ (ITU) ගෝලීය ප්‍රයත්නයකි. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ සියලුම සාමාජික රටවල් විසින් ස මෙම දිනය සමරනු ලබන්නේ විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු සහ ගණිතය (STEM) සහ තොරතුරු හා සන්නවේදන තාක්ෂණය ICT යන ක්ෂේත්‍ර පිළිබඳව අධ්‍යාපනය සහ වෘත්තීන් හැදෑරීමට ගැහැණු ළමයින්/තරුණියන් සවිබල ගැන්වීම සහ දිරිගැන්වීම පිළිබඳව දැනුවත්භාවය ඇතිකිරීමේ අපේක්ෂාවෙනි. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය විසින් සෑම වසරකම තේමාවක් හඳුන්වා දෙන අතර, ලබා දී ඇති තේමාවට අනුකූලව දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලැබේ.









"ප්‍රවේශය සහ ආරක්ෂාව" යන මෙම වසරේ තේමාවට අනුකූලව ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා 2022 දෙසැම්බර් 14 වන දින පැය දෙකක මාර්ගගත දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදී. මාර්ගගත දැනුවත් කිරීමේ වැඩසටහන මගින් ඩිජිටල් පරිසරය තුළ ගැහැණු ළමයින්ට මුහුණ දීමට සිදු විය හැකි බාධක සහ මෙම අභියෝගවලට විසඳුම් ලබා දීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. මෙම වැඩසටහන අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගිතාවයෙන් සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාව-අධ්‍යාපන අමාත්‍යාංශයේ සම්පත් දායකයින්, දුරකථන ක්‍රියාකරු සමාගම් සහ ශ්‍රී ලංකා පරිගණක හදිසි ආපදා සූදානම් සංසදය (CERT) හි සහයෝගය ඇතිව සාර්ථකව පවත්වන ලදී. "ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන 2021"ට සම්බන්ධ කුරුණෑගල, කෑගල්ල, මාතර, හම්බන්තොට සහ මොණරාගල දිස්ත්‍රික්කවල පාසල් දහයක් නියෝජනය කරමින් කාන්තා ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ගුරුවරුන් මෙම වැඩසටහනට සහභාගී විය. මෙම මාර්ගගත ඉදිරිපත් කිරීම් මත පදනම්ව, පාසල් සිසුන් අතර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දින වැඩසටහන තුලින් ගැහැණු ළමයින් අතර වැඩි අවබෝධයක් ඇති කිරීම පිණිස එම අංශය සමඟ සම්බන්ධීකරණයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මාධ්‍ය ඒකකය විසින් වීඩියෝ පටයක් සාදන ලදී.

විදුලි සංදේශ කුළුණු කාර්මික වැඩසටහන

විදුලි සංදේශ කුළුණු කාර්මික ශිල්පීන් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතිකයක් සංවර්ධනය කිරීම ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ කර්මාන්තය උදෙසා උසස් තත්ත්වයේ දේශීය තාක්ෂණික ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම පිණිස කාලෝචිත හා වැදගත් වැඩසටහනක් ලෙස සැලකේ. පනතේ දක්වා ඇති විධිවිධාන අනුව විදුලි සංදේශයේ තාක්ෂණික ශ්‍රම බලකායේ අධ්‍යාපනය සහ පුහුණුව සඳහා වන ප්‍රමිතීන් සැලකිල්ලට ගනිමින්, 2021 වසරේ දී තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC), ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරිය (NAITA) සහ දුරකථන ක්‍රියාකරු සමාගම්වල සහයෝගීත්වයෙන් ජාතික නිපුණතා ප්‍රමිතිය (NCS) සහ විදුලි සංදේශ කුළුණු කාර්මික ශිල්පීන් සඳහා විෂයමාලාව සංවර්ධනය කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.


"සංවර්ධිත ජාතික නිපුණතා ප්‍රමිතිය සහ විෂය මාලාව නිපුණතා සම්මත සංග්‍රහය I64S003"යටතේ තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් අනුමත කරන ලදී.

විදුලි සංදේශ කුළුණු කාර්මික ශිල්පීන් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය සංවර්ධනය කිරීමේ අවසන් අදියර ලෙස 2022 පළමු කාර්තුවේදී තක්සේරු සම්පත් සංවර්ධන ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) සමඟ සම්බන්ධීකරණයෙන් තක්සේරු සම්පත් සංවර්ධනය කිරීම පිණිස විදුලි සංදේශ කර්මාන්තයේ සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වෘත්තිකයන්ගෙන් සමන්විත සම්පත් මණ්ඩලයක් පත් කරන ලදී. තක්සේරු සම්පත් සකස් කිරීම සහ තක්සේරු සම්පත් සහතික කිරීම මාර්ගගත වැඩමුළු මාලාවක් ලෙස සිදු කරන ලද අතර, එහි සංවර්ධනය 2022 වසරේ දෙවන කාර්තුවේ දී සම්පූර්ණ කරන ලදී.

ඉන් අනතුරුව, අනුමත පුහුණු මධ්‍යස්ථාන වෙත වැඩසටහන හඳුන්වාදීම් සහ පුහුණු මධ්‍යස්ථානවල ජාතික වෘත්තීය සුදුසුකම් පාඨමාලාව ආරම්භ කිරීම ඇතුළුව මෙම වැඩසටහනේ ඉදිරි ගමන්මග පිළිබඳව සාකච්ඡා කිරීම උදෙසා 2022.11.25 දින තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් මාර්ගගත දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී. මාර්ගගත දැනුවත් කිරීමේ වැඩසටහනට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන

කොමිෂන් සභාව (TRCSL), තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC), ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA), දුරකථන ක්‍රියාකරු සමාගම් සහ අනෙකුත් අදාළ පුහුණු මධ්‍යස්ථානවල නිලධාරීන් සහභාගී විය.


NATIONAL COMPETENCY STANDARD &
COMPETENCY BASED TRAINING CURRICULUM
FOR
TELECOMMUNICATION TOWER TECHNICIAN
NVQ Level 4
(Competency Standard Code: I64S003)
Developed and Validated by;
National Apprentice & Industrial Training Authority
971, Sri Jayawardenepura Mawatha,
Welikada,
Rajagiriya.
Funded by;
Telecommunications Regulatory Commission of Sri Lanka
No., 276 Elvitigala Mawatha, Colombo 08
Endorsed by;
Tertiary & Vocational Education Commission
"Nipunatha Piyasa",
354/2, Elvitigala Mawatha,
Colombo 05.
State Ministry of Skills Development, Vocational Education, Research and Innovation



ජාත්‍යන්තර සංවිධාන සහ කලාපීය නියාමකයින් සමඟ සහයෝගීතාවය

ශ්‍රී ලංකාව ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU), ආසියා ශාන්තිකර විදුලි සංදේශ (APT), දකුණු ආසියානු විදුලි සංදේශ නියාමන සභාව (SATRC) සහ යටිතල පහසුකම් නියාමනය සඳහා වන දකුණු ආසියානු සම්මේලනයේ (SAFIR) දිගුකාලීන සාමාජිකයෙකි. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව යනු විදුලි සංදේශ රෙගුලාසි හා සම්බන්ධ සියලු කාරණා සම්බන්ධයෙන් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) හෝ එහි අනුබද්ධ ආයතන සමඟ සාකච්ඡා කිරීමට ඇති එකම නීත්‍යානුකූල අධිකාරියයි.

ඉහත සඳහන් කළ ජාත්‍යන්තර සංවිධානවල සාමාජිකත්වය මගින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට තාක්ෂණික සහාය, විශේෂඥ සහාය, සහයෝගීතා ව්‍යාපෘති, වැඩසටහන්, සහ විදුලි සංදේශ/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවල ධාරිතා වර්ධනය සඳහා සහයෝගිතා අවස්ථා ලබා ගැනීමට හැකි විය. ඉහත සඳහන් ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම සහ ජාත්‍යන්තර සංවිධානවලට ඔවුන්ගේ සමීක්ෂණ/ප්‍රශ්නාවලිය හරහා අවශ්‍ය තොරතුරු සැපයීම මෙන්ම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අදාළ අංශ වෙත ජාත්‍යන්තර සංවිධානවල තොරතුරු බෙදාහැරීමේ කේන්ද්‍රස්ථානය ලෙස ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සම්බන්දතා අංශය ක්‍රියා කරයි.

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) / ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT) විශේෂඥ සහාය වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය සහ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය සිය සාමාජික රටවල ඉල්ලීම් මත තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/විදුලි සංදේශයේ තාක්ෂණික හෝ විශේෂඥ සහාය ලබා දේ. මෙම විශේෂඥ සහය ක්‍රියාවලිය යටතේ බොහෝ විට විශේෂඥයින් බඳවා ගැනීම සහ යම් විෂයයක් අධ්‍යයනය කිරීම සහ උපදෙස් ලබා දීම පිණිස සීමිත කාලයක් සඳහා රටකට ගොස් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සිදු කරයි.

ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සම්බන්ධතා අංශය විසින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ විශේෂඥයින් අතර මාර්ගගත රැස්වීම් සංවිධානය කරන ලද අතර අවශ්‍ය විටෙක විශේෂඥයින්, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිලධාරීන් සහ විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් අතර සබැඳි සාකච්ඡා සම්බන්ධීකරණය කළේය. 2021 වසරේ දී "IPV6 වෙත මාරුවීමේ මාර්ග සිතියම" පිළිබඳ විශේෂඥ මෙහෙයුම යටතේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට විශේෂඥ සහාය ලැබිණි.

ඉහළ මට්ටමේ රැස්වීම් සහ සම්මන්ත්‍රණවල දී ශ්‍රී ලාංකීය නියෝජනය සම්බන්ධීකරණය කිරීම

විදුලි සංදේශ ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර නියාමන ආයතන විසින් සිය සාමාජික රටවලට ඔවුන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය අඛණ්ඩව පවත්වාගෙන යාමට සහ භෞතික හෝ මාර්ගගත සහභාගීත්වය තුලින් අදාළ වැඩසටහන් සඳහා ඔවුන්ගේ දායකත්වය ලබා දීමට දිරිමත් කරන ලදී. මෙම සන්දර්භය තුළ, මෙම අංශය විසින් අදාළ ජාත්‍යන්තර සංවිධාන (ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය - ITU, ආසියානු ශාන්තිකර විදුලි සංදේශ සංගමය - APT සහ දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමය -SATRC) සම්බන්ධීකරණය කරන ලද අතර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් සහ විධායක කාර්ය මණ්ඩලයට පහත සඳහන් ඉහළ මට්ටමේ රැස්වීම්/සම්මන්ත්‍රණ සඳහා සහභාගී වීමට අවස්ථාව සලසන ලදී.

- ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ පූර්ණ බලැති සම්මන්ත්‍රණය (PP-22), 2022 සැප්තැම්බර් 26 සිට 14 ඔක්තෝබර් දක්වා, බුකාරෙස්ට්, රුමේනියාව (මාර්ගගත).
  - පූර්ණ බලැති සමුළුව ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ (ITU) ඉහළම ප්‍රතිපත්ති සම්පාදනය කිරීමෙහි ලා ක්‍රියා කරන සමුළුව වේ. සෑම වසර හතරකට වරක් මෙම සමුළුව පවත්වනු ලබන, එය සාමාජික රටවල් අරභයා සංගමයේ අනාගත භූමිකාව තීරණය කරන ප්‍රධාන වැඩසටහන වන අතර එමඟින් ලොව පුරා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ (ICT) සංවර්ධනයට බලපාන හේතු සහ හේතු වලට බලපෑම් කිරීමට ඇති හැකියාව තීරණය කරයි. ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සම්බන්ධතා අංශය විසින් 2022 වසරේ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ පූර්ණ බලැති සමුළුවට සහභාගී වීම පිණිස ශ්‍රී ලංකා දූත පිරිස සඳහා අවශ්‍ය ලියකියවිලි විදේශ කටයුතු අමාත්‍යාංශය (UN අංශය) සමඟ සම්බන්ධීකරණයෙන් සකස් කරන ලදී. පැරිසියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ නියෝජිතයෙකු මේ සඳහා සහභාගී වූ අතර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ විධායක නිලධාරීන් කිහිප දෙනෙකු මාර්ගගතව මෙම සම්මන්ත්‍රණයට එක් විය.
- දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ (SATRC) 23 වැනි රැස්වීම, ටෙහෙරාන්, ඉරාන ජනරජය, 2022 නොවැම්බර් 14-16.
  - ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වැඩබලන අධ්‍යක්ෂ ජනරාල්වරයා පහත සැසිවාර වලට දායක විය.
  - රැස්වීමේ ආරම්භක සැසියේ ප්‍රකාශයක් සිදු කිරීම.
  - නියාමකයින්ගේ වටමේස සාකච්ඡා මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කිරීම.
  - "දකුණු ආසියාවේ ප්‍රශස්ත භාවිතයන් සහ නියාමන අත්දැකීම් බෙදාගැනීම" පිළිබඳ සැසියේ නියෝජිතයෙකු ලෙස ක්‍රියා කිරීම.
- ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ කළමනාකරණ කමිටුවේ 46 වන සැසිවාරය, 2022 දෙසැම්බර් 13-16
  - මෙම මාර්ගගත රැස්වීමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ විධායක නිලධාරීන් සහභාගී විය.

ධාරිතා ගොඩනැගීමේ සහ පුහුණු වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම

මෙම අංශය විසින් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) සහ ආසියානු ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT) ඇතුළු ජාත්‍යන්තර සංවිධාන සම්බන්ධීකරණය කරන ලද අතර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සඳහා ධාරිතා ගොඩනැගීමේ සහ පුහුණු වැඩසටහන් සංවිධානය කළේය. පශ්චාත් පුහුණු ඉදිරිපත් කිරීම් පැවැත්වීම මගින් දැනුම බෙදාගැනීමේ සැසිද පසුව සංවිධානය කර ඇත.

උසස් පුහුණු කමිටුවේ (ATC) අනුමැතිය ඇතිව 2022 වසරේ දී පහත සඳහන් වැඩසටහන් සඳහා සහභාගී වීමට අදාළ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිලධාරීන් නම් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත.

කාණ්ඩය	ITU	APT	වෙනත්	එකතුව
පුහුණු	02	09	-	11
සමුළු	01	-	-	01
වෙබ්පාදක	01	-	-	01
සම්මන්ත්‍රණ	01	01	-	02
රැස්වීම්	03	05	-	08

සංසද	-	02	01	03
වැඩමුළු	01	04	01	06
එකතුව	**09**	**21**	**02**	**32**

අරමුදල් වර්ගය අනුව වැඩසටහන්	ITU	APT	වෙනත්	එකතුව
ශිෂ්‍යත්ව වැඩසටහන්	03	13	02	18
ගාස්තු රහිත වැඩසටහන්	06	08	-	14
කොමිෂන් සභාවේ අරමුදල් මත වැඩසටහන්	-	-	-	-
කොමිෂන් සභාවේ සහභාගීවූවන්	13	27	02	42

තවද, ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය, GSMA ආයතනය සහ අන්තර්ජාල සමාජය (ISOC) සමඟ සම්බන්ධීකරණයෙන් ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ දේශීය පුහුණු වැඩසටහන් තුනක් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිලධාරීන් 38 දෙනෙකුගේ මුළු සහභාගීත්වයෙන් පහත සඳහන් මාතෘකා යටතේ සංවිධානය කරන ලදී.

- GSMA මාර්ගගත පුහුණු පාඨමාලාව "Big Data and Artificial Intelligence for Impact", 2022 මැයි 17-18
- GSMA මාර්ගගත පුහුණු පාඨමාලාව "Radio Signals and Health", 2022 ජූනි 22-23
- ISOC මාර්ගගත පුහුණු පාඨමාලාව "Internet Way of Networking", 2022 සැප්තැම්බර් 5-30

ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනය 2022

සමාජ-ආර්ථික සංවර්ධනය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතා කිරීමේ මාර්ග සහ විධි පිළිබඳව ගෝලීය වශයෙන් දැනුවත් කිරීමේ අරමුණ ඇතිව ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනය (WTISD) වාර්ෂිකව සමරයි. 1865 මැයි 17 වන දින ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) පිහිටුවන ලද පළමු ජාත්‍යන්තර ටෙලිග්‍රාෆ් සම්මුතියට අත්සන් තබා මෙම වසරට වසර 157 ක් සපිරේ.

2022 වසරේ ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනය සැමරීමේදී, "වැඩිහිටි පුද්ගලයින් සහ සෞඛ්‍ය සම්පන්න වයෝවෘද්ධභාවය සඳහා ඩිජිටල් තාක්ෂණයන්"යන මෙම වසරේ තේමාව යටතේ දායක වීමට සහ දැනුවත් කිරීම සඳහා ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය සිය සියලුම සාමාජික රටවලට ආරාධනා කළේය. මෙම වසරේ ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනයේ තේමාව මගින් සෞඛ්‍ය සම්පන්න වයස්ගත වීම සාක්ෂාත් කර ගැනීම සඳහා ඩිජිටල් තාක්ෂණයන්හි කාර්යභාරය අවධාරණය කරයි. එමගින් වයස්ගත ජනගහනයේ අනාගත අවශ්‍යතා සහ අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්වීමට සූදානම් වීමේ වැදගත්කම ආමන්ත්‍රණය කරයි.

ප්‍රතිපත්ති හා ජාත්‍යන්තර සබඳතා අංශය විසින් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ මහලේකම්, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සභාපති සහ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දින විශේෂ පණිවිඩ ලබාගෙන ඒවා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පළ කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කළේය. 2022 ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනයේ තේමාව කේන්ද්‍ර කර ගනිමින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ සහභාගීත්වයෙන් උත්සවයක් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් ශ්‍රවණාගාරයේදී සාර්ථකව පවත්වන ලදී. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා වෙබ් අඩවිය, සමාජ මාධ්‍ය සහ විද්‍යුත් මාධ්‍ය ඔස්සේ මෙම වසරේ ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනයේ තේමාව කේන්ද්‍ර කර ගනිමින් මහජනතාව දැනුවත් කිරීමට ද අවශ්‍ය පියවර ගෙන ඇත. මෙම අංශයේ සම්බන්ධීකරණය සහිතව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මාධ්‍ය ඒකකය විසින් මේ සඳහා දැනුවත් කිරීමේ වීඩියෝ පටයක් සකස් කරන ලදී.

ජාත්‍යන්තර සංවිධානවල වාර්ෂික දායකත්වය

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU), ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT), දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමය (SATRC) සහ යටිතල පහසුකම් නියාමනය පිළිබඳ දකුණු ආසියානු සම්මේලනය (SAFIR)වැනි විදුලි සංදේශ අංශයේ ජාත්‍යන්තර නියාමන ආයතනවල සාමාජිකයෙකු වශයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව නවීන තාක්ෂණයන් භාවිත කිරීම, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සාක්ෂරතාවය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට තාක්ෂණික/විශේෂඥ සහාය ලබා ගනී. ඉහත ජාත්‍යන්තර සංවිධානවල සාමාජිකයෙකු වීම තුළින් රටේ මානව සහ ආයතනික ධාරිතාව ශක්තිමත් කිරීම සහ විකාශනය වන විදුලි සංදේශ ක්ෂේත්‍රයට අනුගත වීම සඳහා පුහුණුවීම් සහ ශිෂ්‍යත්ව ලබා ගැනීමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට හැකියාව ලැබේ. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය යනු එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය සම්බන්ධ සියලු කාරණා සම්බන්ධයෙන් වගකීම දරන විශේෂිත ආයතනයකි. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය විසින් ගුවන්විදුලි වර්ණාවලියේ හවුල් ගෝලීය භාවිතය ප්‍රවර්ධනය කිරීම, චන්ද්‍රිකා කක්ෂ පැවරීමේදී ජාත්‍යන්තර සහයෝගිතාවයට පහසුකම් සැපයීම, ලෝක ව්‍යාප්ත තාක්ෂණික ප්‍රමිතීන් සංවර්ධනය කිරීම සහ සම්බන්ධීකරණය කිරීමට සහාය වන අතර සංවර්ධනය වෙමින් පවතින ලෝකයේ විදුලි සංදේශ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට ක්‍රියා කරයි. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ සාමාජිකත්වය පවත්වා ගැනීම සඳහා වාර්ෂික පදනමින් දායක මුදල් ගෙවනු ලැබේ.

ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT) යනු ආසියා ශාන්තිකර කලාපයේ විදුලි සංදේශ සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සංවර්ධනය සඳහා වන ප්‍රමුඛ අන්තර් රාජ්‍ය සංවිධානයකි. සංවර්ධනය වෙමින් පවතින රටවල් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ආසියා ශාන්තිකර කලාපයේ විදුලි සංදේශ සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවා සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 1979 ජූලි මාසයේදී ආසියා සහ ශාන්තිකර කලාපීය ආර්ථික සහ සමාජ කොමිෂන් සභාව (ESCAP) සහ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය විසින් ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය ස්ථාපනය කරන ලදී. ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය විසින් කලාපයේ විදුලි සංදේශ සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශවලට ප්‍රයෝජනවත් වන ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය, ව්‍යාපාර සහ වෙනත් අංශවල තීරණ ගන්නන් සම්බන්ධ කර ගැනීමෙන් කලාපීය සහයෝගිතාවයට පහසුකම් සපයයි. ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ සාමාජිකත්වය පවත්වා ගැනීම සඳහා වාර්ෂික පදනමින් ශ්‍රී ලංකා විදුලි සංදශෙ නියාමන කොමිෂන් සභාව විසින් දායක මුදල් ගෙවනු ලැබේ.

ආසියාව සහ ශාන්තිකර කලාපය සඳහා දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ කවුන්සිලය (SATRC) 1997 වසරේ දී ස්ථාපනය කරන ලද්දේ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය සහ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ කලාපීය කාර්යාලයේ ව්‍යාපෘතියක් වශයෙනි. දකුණු ආසියානු රටවල විදුලි සංදේශ නියාමකයින් විසින් පොදු උනන්දුවක් දක්වන විදුලි සංදේශ සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ රෙගුලාසිවලට අදාළ සියලුම ගැටළු සාකච්ඡා කිරීම සහ සම්බන්ධීකරණය කිරීම සඳහා දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමය වගකීම දරයි. මෙම ගැටළු වලට ගුවන්විදුලි සංඛ්‍යාත සම්බන්ධීකරණය, ප්‍රමිතීන්, නියාමන ප්‍රවණතා, විදුලි සංදේශ සංවර්ධනය සඳහා උපාය මාර්ග සහ විදුලි සංදේශ ආශ්‍රිත ජාත්‍යන්තර කටයුතු ඇතුළත් වේ. මෙම කවුන්සිලය විසින් දකුණු ආසියානු රටවල් අතර විදුලි සංදේශයේ විභව සහයෝගිතා ක්ෂේත්‍ර හඳුනාගෙන ප්‍රවර්ධනය කිරීම; සහ සම්මන්ත්‍රණ, පුහුණු සහ වැඩමුළු වැනි ක්‍රියාකාරකම් ඔස්සේ මෙම ක්ෂේත්‍රවල තොරතුරු හුවමාරු කර ගැනීමට පහසුකම් සපයයි. දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ සාමාජිකත්වය පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් වසර දෙකකට වරක් දායක මුදල් ගෙවනු ලැබේ.

2022 වසරේ දී ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT), ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU), සහ දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමය (SATRC) වෙත කරන ලද සාමාජික ගෙවීම් පහත වගුවේ ඇත.

ITU	APT	SATRC
ස්විස් ෆ්‍රෑන්ක් 159,000 2022 පළමු කාර්තුව	ඇමරිකන් ඩොලර් 15,420 2022 පළමු කාර්තුව	ඇමරිකන් ඩොලර් 15,000 2022 තෙවන කාර්තුව

විදුලි සංදේශ ක්ෂේත්‍රයට සම්බන්ධ නියාමකයින් අතර ධාරිතාව ගොඩනැගීම, විශේෂඥ සහාය

හෝ අත්දැකීම් බෙදාගැනීම යන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ලැබුණු සාමාජික ප්‍රතිලාභ යටිතල පහසුකම් නියාමනය සඳහා වූ දකුණු ආසියා සංසදය (SAFIR) වෙත ගෙවන ලද වාර්ෂික සාමාජික දායකත්වයට සාපේක්ෂව අවම වීම නිසා යටිතල පහසුකම් නියාමනය සඳහා වූ දකුණු ආසියා සංසදයේ (SAFIR) සාමාජිකත්වය 2022 දී අත්හිටුවීමට තීරණය විය.

විදුලි සංදේශ නියාමනය ආශ්‍රිත සමීක්ෂණ සහ අනෙකුත් ප්‍රශ්නාවලිය

- **ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ලෝක විදුලි සංදේශ / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දර්ශක ප්‍රශ්නාවලිය 2022**

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය විසින් ප්‍රශ්නාවලි දෙකක් මගින් සිය සාමාජික රටවලින් විදුලි සංදේශ/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් සහ ප්‍රවේශය පිළිබඳ වඩාත් පුළුල් සංඛ්‍යා ලේඛන වාර්ෂිකව රැස් කරයි. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය විසින් කරන ලද ඉල්ලීම මත ඉහත ප්‍රශ්නාවලිය දෙක විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම්වල සහාය ඇතිව සම්පූර්ණ කරන ලදී. මේ සම්බන්ධයෙන්, විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් වලින් ලැබුණු සංඛ්‍යාන දත්ත එකතු කර, සම්පාදනය කර, ලබා දී ඇති කාල සීමාවන් තුළ ඉදිරිපත් කර ඇත. ඇතැම් සංඛ්‍යාන දත්ත සඳහා පැහැදිලි කිරීම් අවශ්‍ය අවස්ථාවලදී ක්‍රියාකරුවන්ගෙන් ලබා ගන්නා ලදී. "ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දර්ශක කෙටි ප්‍රශ්නාවලිය 2022"2022 අප්‍රේල් මාසයේදී සම්පූර්ණ කරන ලදී. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දර්ශක 70 කින් සමන්විත "ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දර්ශක දිගු ප්‍රශ්නාවලිය 2022"වසරේ සිව්වන කාර්තුවේදී සම්පූර්ණ කරන ලදී.

ගෝලීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සංවර්ධන තත්ත්වය පිළිබඳ විශ්ලේෂණය මත ලොව පුරා රජයන්, ජාත්‍යන්තර සංවිධාන, සංවර්ධන බැංකු සහ පෞද්ගලික අංශයේ විශ්ලේෂකයින් පුළුල් ලෙස රඳා පවතින බැවින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සංවර්ධන දර්ශකය ගණනය කිරීම සඳහා ගෝලීය දත්ත රැස් කිරීම/යාවත්කාලීන කිරීම සමීක්ෂණයේ පරමාර්ථය විය. මෙලෙස සපයා ගන්නා ලද දත්ත ලෝක විදුලි සංදේශ/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දර්ශක දත්ත සමුදාය, ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ සංඛ්‍යාන ප්‍රකාශන, ලෝක බැංකු ප්‍රකාශන යනාදිය යාවත්කාලීන කිරීම පිණිස භාවිත කරන ලදී.

- **ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ නියාමන සමීක්ෂණය 2022**

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ විදුලි සංදේශ සංවර්ධන කාර්යාංශයේ වාර්ෂික ලෝක විදුලි සංදේශ/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියාමන සමීක්ෂණය ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ සාමාජික රටවලින් සෘජුවම තොරතුරු ලබාගැනීමේ මෙවලමකි. මෙම සමීක්ෂණය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රතිපත්ති සහ නියාමන ගැටළු පුළුල් පරාසයක් ආවරණය කරන අතර නවතම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රවණතා සහ පරිණාමයන් නිරීක්ෂණය කිරීමට ඉඩ සලසයි. අනෙකුත් අංශවලින් අවශ්‍ය සමීක්ෂණ දත්ත රැස් කිරීම, ඔවුන්ගේ ප්‍රතිචාර ඒකාබද්ධ කිරීම සහ 2022 මාර්තු මාසයේ දී ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ මාර්ගගත සමීක්ෂණය සම්පූර්ණ කිරීමට මෙම අංශය විසින් කටයුතු සම්පාදනය කරන ලදී. වාර්ෂික ලෝක විදුලි සංදේශ/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියාමන සමීක්ෂණ මගින් රැස් කරන ලද දත්ත ITU ICT Eye platform සහ ITU ICT Regulatory Tracker හි ඇත.

- **ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය / ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය අධ්‍යයන කණ්ඩායම් ප්‍රශ්නාවලිය සහ අනෙකුත් සමීක්ෂණ**

මෙම අංශය විසින් අනෙකුත් අංශ/දුරකථන ක්‍රියාකරු සමාගම් /අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් අදාළ දත්ත ලබා ගැනීමට අංශය අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇති අතර, එකතු කරන ලද තොරතුරු එක්රැස් කිරීමෙන් පසු පහත සමීක්ෂණ සහ ප්‍රශ්නාවලිය සම්පූර්ණ කරන ලදී.

- ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මිලගණන් පිළිබඳ ප්‍රශ්නාවලිය 2022
- ආසියානු සහ ශාන්තිකර කලාපය සඳහා ITU-T SG3 කලාපීය කණ්ඩායමේ සාමාජිකයින් සඳහා ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ප්‍රශ්නාවලිය (SG3RG-AO)
- 2023 වසරේ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ විදේශ පුහුණු පාඨමාලා වල අවශ්‍යතා පිළිබඳ සමීක්ෂණය
- 2023 වසරේ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ දේශීය පුහුණු පාඨමාලාවල අවශ්‍යතා පිළිබඳ සමීක්ෂණය
- ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය /කොරියානු ජාතික නියෝජිතායතනයේ ලෝක මිත්‍රත්ව කොරියානු තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන 2022 සඳහා සමීක්ෂණය

නීති කටයුතු

- 17 වන වගන්තිය ප්‍රකාරව පද්ධති බලපත්‍ර, වෙළඳ බලපත්‍ර, ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය, ජාල සහ විදුලි සංදේශ ක්‍රියාකරු සම්බන්ධ ගැටළු සඳහා නීති උපදෙස් ලබා දෙන ලදී.
- පාරිභෝගික පැමිණිලි, ග්‍රාහක අනන්‍යතා මොඩියුල්පත් (SIM) ලියාපදිංචිය, වෙබ් අඩවි ආශ්‍රිත ගැටළු සහ අනුකූලතාවය පිළිබඳ අනෙකුත් ව්‍යාපෘති යනාදී අනුකූලතා කාරණා සම්බන්ධයෙන් උපදෙස් සහ සහාය ලබාදේ. පාලන හා මානව සම්පත් අංශය සම්බන්ධ ගැටළු පිළිබඳව ද මෙම අංශය උපදෙස් ලබා දී ඇත.
- ජංගම දුරකථන අංකය වෙනස් නොකර ජාල අතර මාරුවීමේ හැකියාව, ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතාවය (IMEI) ලියාපදිංචි කිරීමේ පද්ධතිය සහ පාරිභෝගික පැමිණිලි නිරාකරණය කිරීමේ අභ්‍යන්තර කමිටුව ඇතුළුව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ බොහෝ වැඩසටහන් සඳහා සහභාගී වී උපදෙස් ලබා දී ඇත.
- අපරාධ විමර්ශනය කිරීමේදී නීතිය බලාත්මක කිරීමේ බලධාරීන්ට සහය වීම සඳහා 2022 වසරේ දී අපරාධ පරීක්ෂණ සඳහා අවශ්‍ය අධිකරණ නියෝග 456 ක් මෙහෙයවන ලදී.
- 2022 දී, රටේ ආර්ථික ගැටලු මධ්‍යයේ වුවද, කොමිෂන් සභාවේ පහත සඳහන් නියාමන ක්‍රියාකාරකම් සඳහා අංශය ක්‍රියාකාරීව සම්බන්ධ වූ අතර දායක විය. සමාලෝචනයේ 2022 වසරේ සමාලෝචනය ඉතා ඵලදායී එකක් විය.

විශේෂ ව්‍යාපෘති පිළිබඳ නීති සහාය

කොළඹ නෙළුම් කුලුන ව්‍යාපෘතිය

- කොළඹ නෙළුම් කුළුණ (CLT) ඉදිකිරීම් ව්‍යාපෘතිය සඳහා වූ කොන්ත්‍රාත් ගිවිසුමට අදාළ කරුණු සම්බන්ධයෙන් විශේෂ ව්‍යාපෘති අංශයට සහාය ලබා දෙන ලදී.
- කොළඹ නෙළුම් කුලුන සමාගම ස්ථාපනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණු අතර සහ කොළඹ නෙළුම් කුළුණ කළමනාකරණ සමාගම සමඟ කළමනාකරණ ගිවිසුම අවසන් කිරීම සඳහා විශේෂ ව්‍යාපෘති අංශයට සහාය වීම සඳහා ද අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබිණි.
- කොළඹ නෙළුම් කුලුන සඳහා ඉඩම් අත්පත් කර ගැනීමට පියවර ගන්නා ලද අතර, කොළඹ නෙළුම් කුලුනේ වාණිජ මෙහෙයුම් පුළුල් කිරීම සඳහා තවදුරටත් ඉඩම් අත්පත් කර ගැනීම අවශ්‍ය විය.

කොළඹ නෙළුම් කුලුන ඉදිකිරීම්, කුලුන පවරා ගැනීම, ණය ගිවිසුම සහ වාණිජකරණය සහ කළමනාකරණ සමාගම පිහිටුවීම සම්බන්ධ ප්‍රධාන කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් ලබා ගැනීමට ද කටයුතු කරන ලදී. කළමනාකරණ ගිවිසුම අත්සන් කිරීම සහ සඳහා බදු ගිවිසුම සකස් කිරීම.

තොරතුරු තාක්ෂණ උද්‍යානය හම්බන්තොට ව්‍යාපෘතිය

- බෙරුම්කරණ විනිශ්චය සභාව ඉදිරියේ බෙරුම්කරණ කටයුතු අවසන් කරන ලදී. බෙරුම්කරණ විනිශ්චය මණ්ඩලයේ තීරණය ලැබුණු අතර, ඊට අනුකූල වීමට පියවර ගන්නා ලදී.

විදුලි සංදේශ පනත සංශෝධනය කිරීම

- 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත සංශෝධනය කිරීම සඳහා සංකල්ප පත්‍රිකාවක් සකස් කිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයකු ඇතුළු බුද්ධිමතුන් සහ විශේෂඥයන්ගෙන් සමන්විත කමිටුවක් පත් කිරීමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත බලය පවරමින් අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත.
- රට තුළ පවතින තත්ත්වයන් සමඟ විදුලි සංදේශ පනත සංශෝධනය කිරීමේ වැඩ කටයුතුවල ප්‍රගතියක් ලබා ගැනීමේ අපහසුතා පැවතියද, මෙම වසරේ දී පනත සංශෝධනය කිරීමට මූලික පියවර ගන්නා ලදී. කොමිෂන් සභාව විසින් පත්

කරන ලද කමිටුව නැවත සලකා බැලීමට නියමිත අතර සුදුසු නාමයෝජනා පිළිබඳ සාකච්ඡා කිරීමෙන් අනතුරුව කමිටුව නැවත ස්ථාපිත කිරීමට නියමිතය.

ක්‍රියාකාරී අයිතමය	ප්‍රගතිය සහ කාර්ය සාධනය	
අධිකරණයේ නඩු ගොනු කිරීම සහ නීතිමය අදහස් / උපදෙස් ලබා ගැනීම	නව අධිකරණ නඩු ගණන	08
	විභාග වන නඩු	16
	නීති උපදෙස් ලබා ගැනීම	08
අධිකරණ නඩු මෙහෙයවීම	නිරීක්ෂණ	09
	උපදේශක සහ උපදේශන සම්බන්ධීකරණය කිරීම	22
	ලබා ගත් නඩු කටයුතු	06
කොමිෂන් සභාව සහ අනෙකුත් අංශ වෙත අභ්‍යන්තර නීති උපදෙස් ලබාදීම (නීති උපදෙස් 102ක් ලබා දී ඇත)	සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ	04
	බලපත්‍ර කළමනාකරණ	07
	ජාල	05
	පාලන සහ මානව සම්පත්	16
	තරඟකාරිත්ව	05
	අනුකූලතා	51
	අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය	01
	විශේෂ ව්‍යාපෘති	10
	තොරතුරු තාක්ෂණ	01
	වෙනත්	02
නීති, රෙගුලාසි සහ මාර්ගෝපදේශ කෙටුම්පත් කිරීම	අගය එකතු කළ සේවාවන් සඳහා රීති සැකසීම	
ගිවිසුම් සමාලෝචනය කිරීම	සේවා ගිවිසුම්	15
අධිකරණ නියෝග ක්‍රියාත්මක කිරීම	අපරාධ පරීක්ෂණ	456
	දුරකථන ක්‍රියාකරු සමාගම් වෙත ලිපි නිකුත් කිරීම	1873
	පොලිස් ස්ථාන සහ උසාවි වෙත ලිපි නිකුත් කිරීම	516
	වෙබ් අඩවි අවහිර කිරීම	06
පාලන සහ මානව සම්පත්	ණය	45
තොරතුරු දැනගැනීමේ අයිතිය ආශ්‍රිත ඉල්ලීම් ක්‍රියාත්මක කිරීම	තොරතුරු දැනගැනීමේ ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම	69

නඩු පැවරීම

ගෙවීම් පැහැර හරින ක්‍රියාකරුවන්ගෙන් නීත්‍යානුකූලව හිඟ මුදල් අයකර ගැනීමට නීති අංශය විසින් නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත. 2022 වසරේ සමාජ මාධ්‍ය ගැටළු සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ නව නඩු කිහිපයක් ගොනු කරන ලදී. මෙම නඩු සම්බන්ධයෙන් අධිකරණයේ පෙනී සිටීමට වගබලා ගැනීමට නීති අංශය සියලු පියවර ගන්නා ලදී.

විශේෂ ව්‍යාපෘති

කොළඹ නෙළුම් කුලුනු ව්‍යාපෘතිය

නගරය කේන්ද්‍රගතව පිහිටි විකාශන කුලුනු ලෝකයේ සියළුම සංවර්ධිත නගරවල දක්නට ලැබෙන පොදු ලක්ෂණයකි. රූපවාහිනී සහ ගුවන් විදුලි විකාශන වැඩසටහන් ඉදිරිපත් කිරීමට සහයවීම සහ විදුලි සංදේශ ජාල සඳහා කේන්ද්‍රීය මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියා කිරීම එවැනි ජාලවල ප්‍රධාන අරමුණ වේ.

එක් දිශාවක සිට,තනි ඇන්ටනාවක් භාවිතා කර, විකාශන සංඥා නිසි ලෙස හාර ගැනීම මහජනතාවට සැලසෙන ප්‍රධාන ප්‍රතිලාභයක් වන අතර, එවැනි සංවර්ධනය කිරීම මගින් විකාශන සමාගම් වලට සිය යටිතල පහසුකම් නුවමාරු කර ගැනීමට ඉඩ සැලසීමත් සමඟ ඔවුන්ගේ ප්‍රාග්ධනය සහ මෙහෙයුම් වියදම් අඩුවීම විකාශන සමාගම් වලට ලැබෙන ප්‍රතිලාභ අතර ප්‍රධාන වේ.

නගරය කේන්ද්‍රගත විකාශන කුලුන ප්‍රධාන නගරවල සංකේතාත්මක සංකේතයක් ලෙස සැලකේ. මෙමගින් විකාශන පහසුකම්වල අතිරික්ත ඉදිකිරීම් අඩුවීම නිසා නගර ක්ෂිතිජයේ දර්ශනීය බව තවදුරටත් වැඩිදියුණු කරයි.

කොළඹ නෙළුම් කුලුන කොළඹ නගරයේ කේන්ද්‍රයේ පිහිටා ඇති බැවින් ඉඩම් වටිනාකම ඇතුළු සංවර්ධන පිරිවැය සැලකිය යුතු ලෙස ඉහළ ය. සංකීර්ණයේ උපයෝගීතාව වැඩි දියුණු කිරීම, ආයෝජනය සාධාරණීකරණය කිරීම සඳහා ආදායම සහතික කිරීම සහ කුළුණු සංකීර්ණයේ ක්‍රියාකාරිත්වය පවත්වා ගැනීම සඳහා ඉහළ උසකින් යුත් නිරීක්ෂණ තට්ටුවක්, අවන්හල්, සාප්පු සවාරි සහ වාහන නැවැත්වීමේ පහසුකම් වැනි බොහෝ ආකර්ශනීය ස්ථාන එයට ඇතුළත් වේ.

කොළඹ නෙළුම් කුලුනේ ප්‍රධාන ආකර්ෂණ ස්ථාන

- කොළඹ නගරය සහ ඊට තදාසන්න ප්‍රදේශවල දර්ශන අත්විඳිය හැකි පරිදි නරඹන්නන් සඳහා ඉහල උන්නතාංශයකින් යුතු නැරඹුම් මැදිරි.
- උත්සව ශාලා දෙකක් - මංගල උත්සව, සමාජීය සහ සමුපකාර කටයුතු සඳහා.
- විශේෂ අමුත්තන් සඳහා නවාතැන් පහසුකම් සැපයීම, භෝජනශාලා මෙහෙයුම්වලට සහාය කර ගැනීම පිණිස රජයේ තානායම.
- විශාල සාප්පු සංකීර්ණ සහ ආහාර භෝජනාගාර.
- කැරකෙන අවන්හල
- ඩිජිටල් වීඩියෝ විකාශන සේවා, ශ්‍රව්‍ය විකාශන සේවා සැපයිය හැකි ඇන්ටනා කුලුනු, කොළඹ නගරය සහ තදාසන්න ප්‍රදේශ ආවරණය කරමින් ඇනලොග් විකාශන පහසුකම් ප්‍රතිස්ථාපනය කිරීම.
- වාහන නැවැත්වීමේ පහසුකම් සහිත විශාල උද්‍යානය


ව්‍යාපෘති කොන්ත්‍රාත්තුවේ සාරාංශය

සේවා දායකයා (ආයෝජක)	ශ්‍රී.ල.වි.ස.නි.කොං.සභාව
කොන්ත්‍රාත්කරු	CEIEC සහ ALIT
සම්බන්ධතා වර්ගය	සැලැස්ම සහ ඉදිකිරීම
ව්‍යාපෘති ඉංජිනේරු	මොරටුව විශ්වවිද්‍යාලයේ ව්‍යාපෘති උපදේශන ඒකකය
ගිවිසුම්ගත මිල	මුළු එකතුව ඇමරිකානු ඩොලර් මිලියන 104.3 + 9.3 එකතුව
ආරම්භ කරන ලද දිනය	2012 නොවැම්බර් 16
ගිවිසුම්ගත ව්‍යාපෘතිය ආරම්භ කිරීමේ දිනය	2017 ඔක්තෝම්බර් 31 (මුල් ඉදිකිරීම් කාලය දින 912 + ශ්‍රී.ල.වි.ස.නි.කොං. ලබා දී ඇති කාලය දීර්ඝ කිරීම)
කොන්ත්‍රාත් ව්‍යාපෘතිය අවසන් කරන දිනය	2022.02.28

2022 දෙසැම්බර් 31 වැනි දිනට ප්‍රගතිය

විස්තරය	%
ඇන්ටෙනා ආධාරකය	100%
කුලුනු පාදම පිරිසිදු කිරීම සහ පින්තාරු කිරීම	100%
කුලුනු ශීර්ෂය සවි කිරීම	100%
කුලුනු බඳ පින්තාරු කිරීම	100%
අභ්‍යන්තර අලංකරණය	100%
කුලුනු ශීර්ෂයට විදුලිය සැපයීම	100%
කුලුනු ශීර්ෂයට ගිනි ජලය සැපයීම	100%
කුලුනු ශීර්ෂයට ජලය සැපයීම සහ ජලාපවහනය	100%
කුලුනු පාදමට විදුලිය සැපයීම	100%
කුලුනු පාදමට ජලය සැපයීම සහ ජලාපවහනය	100%
බාහිර විදුලි සැපයුම	100%
කුලුනු පාදම ඉහළ	100%
කුලුනු ශීර්ෂය, පාදම සහ බඳ ආලෝකකරණය කිරීම	100%
විදුලි සෝපාන සහ විදුලි පියගැටපෙළ	100%
ගොඩනැගිලි කළමනාකරණ බුද්ධි පද්ධතිය	100%
වායු සම්කරණ සහ වා කවුළු	100%
ගිනි ආරක්ෂණ සහ අනතුරු ඇඟවීමේ පද්ධතිය	100%

සැලසුම් කරන ලද හා තථ්‍ය ප්‍රගතිය සහ ඉලක්ක සම්පූර්ණ කරන දිනය රහිතව අඛණ්ඩ ප්‍රගතිය



ව්‍යාපෘතිවල සාරාංශය

කොළඹ නෙළුම් කුලුන		
අයිතමය	ප්‍රතිඵල	කාර්ය සාධනය
කොළඹ නෙළුම් කුලුන ඉදිකිරීම	• ඉදිකිරීමේ ප්‍රතිශතය. • ව්‍යාපෘතිය භාරදීමේ වටිනාකම. • පරීක්ෂණ සහ ඉදිකිරීමේ ප්‍රතිශතය /විමර්ශනය සහ පාරදෘශ්‍ය බව සම්බන්ධීකරණය කිරීම / භාර දීම. • Exim බැංකු ණය ආපසු ගෙවීම • දෝෂ නිවැරදි කිරීම් ප්‍රතිශතය.. • ගිවිසුම්ගත ලියකියවිලි භාරදීම • පුහුණුව අවසන් කිරීමේ ප්‍රතිශතය.	• අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුවක් / ව්‍යාපෘති කමිටුවක් පත් කිරීම. • සුළු දෝෂ නිවැරදි කිරීම සහ පරීක්ෂා කිරීම. • ප්‍රධාන දෝෂ නිවැරදි කිරීම් සහ පරීක්ෂා කිරීම. • MBS, ගිනි සංඥා, ගිනි ආරක්ෂණ පද්ධතිය යනාදිය පරීක්ෂා කිරීම. • කෝවිඩ්-19 නිසා ක්‍රියාත්මක කිරීමේ බලපෑම් ඇතිබවට වාර්තාවීම. • පුහුණු ලේඛන පරීක්ෂා කිරීම සහ පුහුණුව ආරම්භ කිරීම. • ව්‍යාපෘති උපදේශන ඒකකයේ උපදේශන සේවා සඳහා දීර්ඝ කිරීම, කැබිනට් පත්‍රිකාව සමාලෝචනය වෙමින් පවතී. • ව්‍යාපෘති උපදේශන ඒකකයේ උපදේශන සේවා අඛණ්ඩව පවත්වාගෙන යාම. • වත්කම් ලේඛනය සම්පාදනය කිරීම.
කොළඹ නෙළුම් කුලුන සංකීර්ණය වාණිජකරණය කිරීම.	• භාණ්ඩාගාරය යටතේ රජයේම සමාගමක් පිහිටුවීමේ ප්‍රගතිය සහ ව්‍යාපාර ආකෘතිය අවසන් කිරීම. • කුලුනු මෙහෙයුම් කණ්ඩායම ස්ථාපනය කිරීම. • රක්ෂණ ආවරණය ලබා ගැනීම. • කළමනාකරණ සමාගම විසින් දේශීය නියෝජිතයන්/සැපයුම්කරුවන් සමඟ නඩත්තු ගිවිසුම්වලට එළැඹීම. • කොළඹ නෙළුම් කුලුනේ නිසි ක්‍රියාකාරිත්වය සඳහා වත්කම් ප්‍රසම්පාදනය කිරීම. • අලෙවිකරණ ව්‍යාපාරය/ සමාගම් ස්ථාපනය කිරීම. • විකාශන යටිතල පහසුකම් වලින් මුදල් ඉපැයීම.	• කොළඹ නෙළුම් කුලුනේ යෝජිත වාණිජකරණය සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම. • ඩිජිටල් විකාශනය සඳහා කොළඹ නෙළුම් කුලුනේ යටිතල පහසුකම් භාවිතය සඳහා ජනමාධ්‍ය සමඟ සාකච්ඡා ආරම්භ කිරීම. • භාණ්ඩාගාරය සතු සමාගමක් ස්ථාපනය කිරීම. • අවශ්‍ය රක්ෂණ ආවරණ ලබා ගන්නා ලදී. • කොළඹ නෙළුම් කුලුන කළමනාකරණ සමාගම සමඟ කළමනාකරණ ගිවිසුම අත්සන් කිරීම. • බදු ගිවිසුම ක්‍රියාත්මක වෙමින් පවතී. • වත්කම් තක්සේරුව සම්පූර්ණ කිරීම.
කොළඹ නෙළුම් කුලුන භාර ගැනීම	• අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව කොළඹ නෙළුම් කුලුන පවරා ගැනීම.	• කොළඹ නෙළුම් කුලුන කොන්දේසි සහිතව පවරා ගැනීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්නා ලදී. ඒ අනුව 2022.02.28 දින කොළඹ නෙළුම් කුලුන කොන්දේසි සහිතව පවරා ගන්නා ලදී.
කුලුනු ශීර්ෂය භාවිතා කිරීම	• කොළඹ නෙළුම් කුලුන මගින් ඩිජිටල් වීඩියෝ විකාශන සේවා ලබා ගැනීම සහ කොළඹ නෙළුම් කුලුන ශ්‍රී ලංකාවේ විකාශන මධ්‍යස්ථානය බවට පත් කිරීම. • ආරක්ෂක අමාත්‍යාංශයේ අවශ්‍යතා සඳහා පහසුකම් සැලසීම. • අගය එකතු කළ සේවාවන් සඳහා කොළඹ නෙළුම් කුලුනේ ශීර්ෂය භාවිතා කිරීම.	• කොළඹ නෙළුම් කුලුනේ සිට ඩිජිටල් වීඩියෝ විකාශන (DVB) සම්ප්‍රේෂණයට සහය වන කොළඹ නෙළුම් කුලුනේ ඇති පහසුකම් අධ්‍යයනය කිරීම සඳහා ජපන් ජාත්‍යන්තර සහයෝගීත්ව ඒජන්සිය, මාධ්‍ය අමාත්‍යාංශය, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, සහ කොළඹ නෙළුම් කුලුන පිලිබඳ ව්‍යාපෘති උපදේශන ඒකකයේ පිරිසකගෙන් සමන්විත කණ්ඩායමක් විසින් ඒකාබද්ධ සංචාරයක් සංවිධානය කිරීම. • ආරක්ෂක අවශ්‍යතා සංවිධානය කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය සමඟ සාකච්ඡා ආරම්භ කිරීම. • ජනමාධ්‍ය අමාත්‍යාංශය සමඟ අත්සන් කිරීමට අවශ්‍ය අවබෝධතා ගිවිසුමක් කෙටුම්පත් කිරීම • අභ්‍යන්තර කමිටුවක් පත් කිරීම.
නෙළුම් කුලුන අදියර 02 ව්‍යාපෘතිය	• මිශ්‍ර සංවර්ධනය සමඟ වාහන නැවැත්වීමේ පහසුකම.	• ඉඩම අත්පත් කර ගත් අතර, සංවර්ධන කටයුතු සිදු කෙරෙමින් පවතී.
Administrative Progress of the project	• වැඩබිම නිමකිරීම, පරීක්ෂා කිරීම සහ ඉදිකිරීම සඳහා ගිවිසුම් ක්‍රියාවලිය අනුගමනය කිරීම. • Exim බැංකු ණය ලබා දීම.	• කොළඹ නෙළුම් කුලුන පිළිබඳ ප්‍රගති සමාලෝචන රැස්වීම් සතිපතා පැවැත්වීම. • CECB හි අවසන් වාර්තාව සමාලෝචනය කරන ලදී. • 2022 දී Exim බැංකු ණය නැවත ගෙවීම (ප්‍රතිපත්ති සහ පොලී) සැකසීම සහ 2023 ජනවාරි 21 දින නියමිත ගෙවීම සැකසීම. නමුත් ගෙවීම රජයේ ප්‍රතිපත්තියට අනුකූලව සලකා බලනු ලැබේ.

වෙනත් සංවර්ධන ව්‍යාපෘති		
ව්‍යාපෘතිය	ප්‍රතිඵලය	කාර්ය සාධනය
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නව ගොඩනැගිල්ල ඉදිකිරීම	ව්‍යාපෘති සංරචක බෙදාහැරීමේ අගයන් සම්පූර්ණ කිරීමේ ප්‍රතිශතය.	• පරීක්ෂණ සහ ඉදිකිරීමට අමතරව භෞතික වැඩ නිම කරන ලදී. • අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ගොඩනැගිල්ල සංවර්ධනය කිරීම වෙනුවට නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම පිළිබඳව අමාත්‍ය මණ්ඩලය දැනුවත් කිරීම.
තොරතුරු තාක්ෂණ උද්‍යානය - හම්බන්තොට	කොන්ත්‍රාත්කරු සමඟ බේරුම්කරණය අවසන් කිරීම.	• බේරුම්කරණය අවසන් විය.
කදිරාන ප්‍රතිසංස්කරණය, නවීකරණය සහ අළුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය	ව්‍යාපෘති සංරචක බෙදාහැරීමේ අගයන් සම්පූර්ණ කිරීමේ ප්‍රතිශතය.	• ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් විවෘත්‍යයන් අනුමත කරන ලද අතර අනුමත විවෘත්‍යයන් සහිතව ව්‍යාපෘතිය නිම කරන ලෙස ඉංජිනේරුවරයාගෙන් ඉල්ලා සිටින ලදී.

අපගේ සේවක පැතිකඩ



අධ්‍යක්ෂ ජනරාල් සහ සභාපති කාර්යාලය



බලපත්‍ර කළමනාකරණ අංශය



විශේෂ ව්‍යාපෘති අංශය



ප්‍රතිපත්ති සහ ජාත්‍යාන්තර සබඳතා අංශය



අභ්‍යන්තර විගණන අංශය





තොරතුරු තාක්ෂණ අංශය




ජාල අංශය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL), අපි සේවකයින් 200 කට අධික සංඛ්‍යාවකින් සමන්විත දක්ෂ හා අභිප්‍රේරිත ශ්‍රම බලකායක් සේවයේ යොදවන්නෙමු. අපගේ සේවක කණ්ඩායම නියාමනය ශක්තිමත් කිරීමේ වැදගත්ම ප්‍රභවය වන අතර, ආයතනය සාර්ථකත්වය කරා ගෙන යයි. අපගේ සේවකයින් විසින් ඉටු කරනු ලබන කාර්යභාරය අවබෝධ කර ගනිමින්, අපි ඔවුන් වෙත ආකර්ශනීය ප්‍රතිලාභ යෝජනා ක්‍රම පිරිනමන්නෙමු. එමඟින් දක්ෂ සහ කැප වූ ශ්‍රම බලකායක් නිර්මාණය කරයි. වසර තුළ, අපගේ සේවකයින්ගේ කැපවීම බාධාවකින් තොරව අපගේ සේවා සැපයීමේ හැකියාව නිසැක කළ අතර විදුලි සංදේශ රෙගුලාසි පුළුල් කිරීමට උපකාරී විය.








සේවක ප්‍රතිලාභ යෝජනා ක්‍රම

දිරිදීමනා
නිල ඇඳුම් සහ ඇඳුම් මැසීම
විශ්‍රාමික පාරිතෝෂික දීමනා
තේ සහ වෙනත් කාර්ය මණ්ඩල සුභසාධනය
ලබා නොගත් නිවාඩු සඳහා දීමනා
වාර්ෂික ප්‍රසාද දීමනා
වෛද්‍ය ප්‍රතිකාර සඳහා වැයවන වියදම් ප්‍රතිපූරණය කිරීම
නිවාස ණය පොළියෙන් 2/3 ප්‍රතිපූරණය කිරීම
වාහන ණය
සේවක අර්ථසාධක අරමුදල
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල
සාමාජික මුදල් ප්‍රතිපූරණය කිරීම





අනුකූලතා හා විමර්ශන අංශය



තරහකාරිත්ව අංශය



මූල්‍ය අංශය




නීති අංශය සහ කොමිෂන් සභා ලේකම් කාර්යාලය




සංඛ්‍යාත කළමනාරකණ අංශය



පාලන සහ ආයතනික කටයුතු අංශය





ප්‍රධාන ක්ෂේත්‍ර

ආයතනික කටයුතු සහ කාර්ය මණ්ඩලය
කළමනාකරණය කිරීම
පුහුණුව
ප්‍රසම්පාදන කටයුතු
වාහන සංචිතය නඩත්තු කිරීම
ඵලදායීතාවය වැඩිදියුණු කිරීම
කාර්යාල චක්‍රලේඛ හඳුන්වාදීම
ආයතනික කටයුතු ලියකියවිලි
වාර්ෂික සමීක්ෂණ මණ්ඩලය
පුස්තකාල සේවා
මාධ්‍ය ආශ්‍රිත ක්‍රියාකාරකම්

පාලන සහ ආයතනික කටයුතු

සේවක සංඛ්‍යාව පිහිටුවීමේ කටයුතු සහ කළමනාකරණය

පුද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම, බඳවා ගැනීම, ස්ථිර කිරීම, උසස්වීම්, නිවාඩු වාර්තා, පැමිණීම්, සේවකයින්ගේ කාර්යසාධනය තක්සේරු කිරීම, විනය පරීක්ෂණ වැනි ආයතනයේ සංස්ථාපන කාර්යයන් පාලන අංශය විසින් සිදු කරනු ලබයි.

2022 වර්ෂයේ දී, සේවකයින් සඳහා කාර්ය සාධන ඇගයීම් සකස් කිරීමට සහ ස්ථිර මාණ්ඩලික නිලධාරීන් 214 දෙනෙකු සඳහා වැටුප් වර්ධක ලබාදීමට අංශය මගින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී. වසර 3 ක පරිවාස කාලය අවසන් වූ පසු සේවකයින් 30 දෙනෙකු ඔවුන්ගේ තනතුරුවල ස්ථිර කරන ලදී. මීට අමතරව, සේවක ප්‍රගති සමාලෝචන වාර්තා සකස් කිරීම, නිලධාරීන් ස්ථිර කිරීම හා උසස් කිරීම සම්බන්ධයෙන් වැටුප් පරිවර්තන සකස් කිරීම, සේවක අර්ථසාධක අරමුදලේ නිලධාරීන් ලියාපදිංචි කිරීම වැනි කටයුතු අංශය විසින් සිදු කරන ලදී. වර්ෂය තුළ මූලික විමර්ශන/පරීක්ෂණ 03ක් ද පවත්වන ලදී. අභ්‍යන්තර උසස්වීම් යෝජනා ක්‍රමය යටතේ කළමනාකරණ සහකාර 01, සංවර්ධන නිලධාරී 01 සහ සහකාර අධ්‍යක්ෂ 01 II ශ්‍රේණියේ සිට I ශ්‍රේණිය දක්වා උසස් කරන ලදී. අධ්‍යක්ෂකවරයකු (මූල්‍ය) සහ සහකාර අධ්‍යක්ෂවරයකු ද්විතීයික පදනම මත බඳවා ගෙන ඇත.

කාණ්ඩය	වෙන්කිරීම් සංඛ්‍යාව
නව පොලියෙන් 2/3 ප්‍රතිපූරණය කිරීම	248
ආපදා ණය	62
වාහන ණය	02
පාරිතෝෂික ගෙවීම්	02

මෙම වසරේ දී මෙම අංශය විසින් යෝජිත බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයේ (SOR) කාර්යයන් අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව, යෝජනාවල අනෙකුත් විධිවිධාන පිළිබඳ සාකච්ඡා සංවිධානය කරන අතරම, ඒ ඒ අංශ සඳහා යෝජිත ව්‍යුහය සහතික කිරීම සඳහා අංශ ප්‍රධානීන් සමඟ සාකච්ඡා කරන ලදී. අවසාන වාර්තාව උපදේශකයා විසින් ඉදිරිපත් කරන ලදී. මෙම ක්‍රියාකාරකම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ උපදෙස් සහ මහපෙන්වීම යටතේ සිදු කෙරේ.

රජයේ විශ්ව විද්‍යාල සහ වෘත්තීය පුහුණු ආයතනවල සිසුන් හත් දෙනෙකු මාස 06 ක පුහුණු කාලයක් සඳහා අභ්‍යාසලාභීන් ලෙස බඳවා ගන්නා ලද අතර ඔවුන්ට විදුලි සංදේශ ක්ෂේත්‍රය පිළිබඳ අත්දැකීම් ලබා ගැනීමට හැකි විය.

වසර පුරා පනවන ලද සංචරණ සීමාවන් නොතකා, අංශය විසින් සහකාර අධ්‍යක්ෂවරුන්, කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) I සහ II ශ්‍රේණි, රියදුරු I සහ II ශ්‍රේණි, කාර්යාල සහායක I සහ II ශ්‍රේණි, සහ පාරිභෝගික සම්බන්ධතා නිලධාරී කාණ්ඩ සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය සාර්ථකව පවත්වන ලදී.

සාර්ථක කාර්ය සාධනය සහ ප්‍රවේශ අවශ්‍යතා සපුරාලීම සැලකිල්ලට ගනිමින් කොන්ත්‍රාත් සේවකයින් 07 දෙනෙකුට ස්ථිර රැකියා ලබා දෙන ලදී.

පුහුණු හා සංවර්ධන

කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ දැනුම, කුසලතා සහ ධනාත්මක ආකල්ප වැඩිදියුණු කිරීමට සහ කාර්යාල පරිසරය තුළ ඒවා අදාළ කර ගැනීමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් දේශීය සහ විදේශීය පුහුණු අවස්ථා ලබා දෙන ලදී.

2022 වසරේ විදේශීය පුහුණු වැඩසටහන් (භෞතික) සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ සහභාගිත්වය

අංකය	විදේශීය වැඩසටහන	අරමුදල් මාදිලිය	කාලය		සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව
			සිට	දක්වා	
01	ප්‍රතිපත්ති, නියාමනය සහ සේවා පිළිබඳ දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ ක්‍රියාකාරී කණ්ඩායමේ රැස්වීම ඩකා, බංග්ලාදේශය	ශිෂ්‍යත්වය	2022.05.25	2022.05.26	02
02	සංඛ්‍යාත වර්ණාවලිය පිළිබඳ දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ ක්‍රියාකාරී කණ්ඩායමේ රැස්වීම, නවදිල්ලිය, ඉන්දියාව	ශිෂ්‍යත්වය	2022.06.21	2022.06.23	02
03	ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ ප්‍රතිපත්ති සහ නියාමන සංසදයේ සාමාජිකත්වය, බැංකොක්, තායිලන්තය	ශිෂ්‍යත්වය	2022.07.19	2022.07.21	01
04	PP-22 සඳහා ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ පූර්ව කණ්ඩායමේ 4 වන රැස්වීම, බැංකොක්, තායිලන්තය	ශිෂ්‍යත්වය	2022.08.01	2022.08.05	01
05	උසස් නිලතල සඳහා ප්‍රතිපත්ති සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩමුළුව, ටෝකියෝ ජපානය	ශිෂ්‍යත්වය	2022.07.26	2022.07.29	01
06	WRC-23 (APG23-4), සඳහා ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ පූර්ව කණ්ඩායමේ 4 වන රැස්වීම, බැංකොක්, තායිලන්තය	ශිෂ්‍යත්වය	2022.08.15	2022.08.20	01
07	ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (TCPIC-2022), සඳහා සූදානම් වීමේ පුහුණු පාඨමාලාව 2022 අගෝස්තු 12-13, සහ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ "WRC-23 (APG23-4) සඳහා සූදානම්වීමේ කණ්ඩායමේ 4 වන රැස්වීම, 2022 අගෝස්තු 15 - 20, බැංකොක්, තායිලන්තය	ශිෂ්‍යත්වය	2022.08.12 2022.08.15	2022.08.13 2022.08.20	01
08	ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ රැහැන් රහිත සමූහයේ (AWG-30) 30 වැනි රැස්වීම බැංකොක්, තායිලන්තය	ශිෂ්‍යත්වය	2022.09.05	2022.09.09	01
09	යහපාලනය සහ ව්‍යාපාරික හිතකාමී පරිසරය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රතිපත්තිය පිළිබඳ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ පුහුණු පාඨමාලාව (සම්මුඛ පුහුණුව), NTIPRIT (DOT), ගාසියාබාද්, ඉන්දියාව	ශිෂ්‍යත්වය	2022.09.21	2022.09.27	01
10	මෑත කාලීන ප්‍රවණතා සහ තාක්ෂණයන් පිළිබඳ දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ වැඩමුළුව (SAPVIII-WSRTT)	ශිෂ්‍යත්වය	2022.09.20	2022.09.22	02
11	ඊළඟ පරම්පරාවේ OTN සහ 5G භාවිතය පිළිබඳ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ පුහුණු පාඨමාලාව, ජබල්පූර් ඉන්දියාව	ශිෂ්‍යත්වය	2022.10.12	2022.10.18	01
12	ඉරාන ඉස්ලාමීය ජනරජයේ ටෙහෙරානයේ දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකවරුන්ගේ කවුන්සිලයේ 23 වැනි රැස්වීම	ශිෂ්‍යත්වය	2022.11.14	2022.11.16	01

13	ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ 5G සහ IoT ජාල යටිතල පහසුකම් සහ ඒවායේ කර්මාන්ත පහසුකම් පිළිබඳ සම්මුඛ පුහුණු පාඨමාලා, අදියර II, NT ඇකඩමිය, තායිලන්තය	ශිෂ්‍යත්වය	2022.11.21	2022.11.25	02
14	සැමට තොරතුරු තාක්ෂණය : ITU Accessible Asia and Pacific, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට ප්‍රවේශවීම පිළිබඳ කලාපීය වැඩමුළුව, බැංකොක්, තායිලන්තය	ශිෂ්‍යත්වය	2022.11.01	2022.11.03	01
15	පළමු රැස්වීම - ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය -D අධ්‍යයන කණ්ඩායම 2 - ජිනීවා, ස්විට්සර්ලන්තය	ශිෂ්‍යත්වය	2022.12.05	2022.12.09	01
16	එක්සත් ජාතීන්ගේ අන්තර්ජාල පාලන සමුළුව (IGF) ඉතියෝපියාව	ශිෂ්‍යත්වය	2022.11.28	2022.12.02	01
17	සුහුරු නගර භාවිතය පිළිබඳ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ කලාපීය වැඩමුළුව, පුත්‍රජය, මැලේසියාව	ශිෂ්‍යත්වය	2022.11.30	2022.12.02	01

2022 දී දේශීය පුහුණු වැඩසටහන් (භෞතික) සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ සහභාගිත්වය

අංකය	දේශීය වැඩසටහන	ආයතනය	කාලය	සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව
01	පරිගණක විද්‍යාව පිළිබඳ සහතිකය	ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය	මාස 4	01
02	කාර්යාල සන්නිවේදනය	සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල	දින 2	01
03	43 වැනි ජාතික සමුළුව-ICASL	ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය	දින 3	03
04	පද්ධති සහ ජාල පරිපාලනමය අවශ්‍යතා	දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය	දින 5	04

ප්‍රසම්පාදන කටයුතු

පාලන අංශය විසින් මෙහෙයවන ප්‍රධාන කාර්යයක් ලෙස ප්‍රසම්පාදනය සඳහන් කළ හැක. මෙම අංශය විසින් කොමිෂන් සභාවට අවශ්‍ය විවිධ වර්ගයේ භාණ්ඩ, වැඩ සහ සේවා සැපයීමේ සම්බන්ධීකරණ කටයුතු සිදු කරයි. මෙම ක්‍රියාකාරකම්වලට ලංසු ලේඛන සකස් කිරීම, දැන්වීම් ප්‍රකාශ කිරීම, තාක්ෂණික ඇගයීම් කමිටු (TECs) සහ ප්‍රසම්පාදන කමිටු (PCs) පත් කිරීම ඇතුළත් වේ. මීට අමතරව, අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා වාර්තා සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම, අදාළ පාර්ශ්ව වෙත තීරණ දැනුම් දීම, නීති අංශය සමඟ සහයෝගයෙන් සේවා ගිවිසුම් සකස් කිරීම, සේවා සපයන්නන්ගේ වැඩ කටයුතු අධීක්ෂණය කිරීම සහ නිවැරදි ක්‍රියාමාර්ග ගැනීම සඳහා මෙම අංශය සහභාගී වේ.

මෙම සියලු ප්‍රසම්පාදන ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල විධිවිධාන ප්‍රකාරව සිදු කර ඇත. මේ අනුව, සියලුම ප්‍රසම්පාදන කටයුතු සිදු කරන ලද්දේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ ප්‍රසම්පාදන කමිටුව සහ සුළු ප්‍රසම්පාදන කමිටුව විසිනි.

ජ්‍යෙෂ්ඨ ප්‍රසම්පාදන කමිටුවේ රැස්වීම් 11ක් සහ සුළු ප්‍රසම්පාදන කමිටුවේ රැස්වීම් 01ක් මෙම වසරේ දී පැවැත්විණි.

මෙම අංශය මගින් විදුලිය, ජලය, දුරකථන පහසුකම් සහ සනීපාරක්ෂක සේවාවන් කාර්යක්ෂමව සැපයීම සහතික කරන ලදී. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සියලුම අංශ වෙත ලිපි ද්‍රව්‍ය, කාර්යාල උපකරණ සහ යන්ත්‍ර සූත්‍ර නියමිත වේලාවට සැපයීම සහතික කිරීම සඳහා සෑම පියවරක්ම ගන්නා ලදී.

ආයතනයේ සුමට ක්‍රියාකාරිත්වය සඳහා විනිවිදභාවයෙන්, ලාභදායී සහ සාධාරණ ආකාරයෙන් අවශ්‍ය සේවා සහ ද්‍රව්‍ය සැපයීම සඳහා මෙම ක්‍රියාකාරකම් නියමිත වේලාවට සිදු කරන ලදී. Office 365 බලපත්‍ර අලුත් කිරීම, ලැප්ටොප් පරිගණක ප්‍රසම්පාදනය, ස්වයංක්‍රීය මානව සම්පත් පද්ධතිය, සුළු කාර්ය මණ්ඩලය සඳහා නිල ඇඳුම් සකස් කිරීම සහ සේවා සැපයීම (රක්ෂණ, ආරක්ෂාව, නඩත්තුව, පිරිසිදු කිරීම, ආපනශාලා සේවා සහ ජලය) මීට ඇතුළත් වේ.

පොදු ව්‍යාපාර චක්‍රලේඛ 04/2022 මගින් ව්‍යදම් සම්බන්ධයෙන් ඵලදායී පාලනයක් හඳුන්වා දීම සඳහා ඉහළ මට්ටමේ කළමනාකරණ කමිටුවක් (HLMC) පත් කිරීමට උපදෙස් දී ඇත. ඒ අනුව අධ්‍යක්ෂ ජනරාල් (වැඩබලන) විසින් කමිටුව පත් කරන ලද අතර, ආයතනයේ ව්‍යදම් පරිපාලනය සඳහා විවිධ තීරණ ගන්නා ලදී. ඉහත කමිටු තීරණ ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු 89 න් 43 ක් මෙවර අයවැය ප්‍රතිපාදනවලින් ඉවත් කර ඉතිරි 28 ක් අවසන් කරන ලදී.

ප්‍රසම්පාදන සැලැස්මෙන් 60.87%ක් සම්පූර්ණ කර ඇත.

වාහන සංචිතය නඩත්තු කිරීම

2022 වසරේ දී, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වාහන සංචිතය කාර් එකොළහකින්, ඩබල් කැබ් රථ දෙකකින්, ජීප් හතරකින්, වෑන් හයකින්, බස් එකකින්, ලොරි තුනකින් සහ යතුරුපැදි දෙකකින් සමන්විත විය. පරීක්ෂණ චාරිකා, කාර්ය මණ්ඩලයට නිල රාජකාරී සහ සුබසාධන කටයුතු සඳහා ප්‍රවාහන පහසුකම් යනාදිය සඳහා වාහන වෙන් කරන ලදී. වාහන 25 ක ආදායම් බලපත්‍ර නිසි පරිදි අලුත් කරන ලද අතර වාහනවල නිරන්තර සේවා සහ අලුත්වැඩියා කටයුතු ද සිදු කරන ලදී.

ක්‍රියාකාරී සැලැස්ම, ආයතනික සැලැස්ම, ප්‍රගති වාර්තා සහ වාර්ෂික වාර්තාව සකස් කිරීම

ක්‍රියාකාරී සැලැස්ම 2023

ක්‍රියාකාරී සැලැස්ම 2023 සියලුම අංශ ප්‍රධානීන්ගේ උපදෙස් ඇතිව සකස් කරන ලදී. යෝජිත ක්‍රියාකාරී සැලැස්ම මූල්‍ය අංශය වෙත යොමු කරන ලද අතර 2023 වසරේ 4 වන කාර්තුව තුළ වාර්ෂික අයවැයට ඇතුළත් කරන ලදී.

2022 දෙසැම්බර් 06 වැනි දින කොමිෂන් සභා රැස්වීමේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමට කොමිෂන් සභාවේ අනුමැතිය ලබා දී ඇති අතර, එය 2022 දෙසැම්බර් 15 වැනි දින අදාළ අමාත්‍යාංශ සහ බලධාරීන් වෙත ඉදිරිපත් කරන ලදී. මූල්‍ය මාර්ගෝපදේශ ප්‍රකාරව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් මෙම තොරතුරු නිසි කාලය තුළ ඉදිරිපත් කරන ලදී.

ආයතනික සැලැස්ම 2023-2025

ආයතනික සැලසුම් ක්‍රියාවලිය මඟින් සම්පත් ප්‍රශස්ත ලෙස භාවිත කිරීම සහතික කරන අතරම එහි අරමුණු සාක්ෂාත් කර ගැනීම සහතික කිරීම සඳහා ආයතනයට ශක්තිමත් ඉදිරි මාවතක් සකසයි.

විදුලි සංදේශ කර්මාන්තය යනු තාක්ෂණයේ ශීඝ්‍ර වෙනස්කම් සහිත ක්‍රියාකාරී අංශයකි. අපගේ ඉලක්කය සාක්ෂාත් කර ගන්නා විට පාරිභෝගිකයින් සහ කර්මාන්තය, මූල්‍ය, අභ්‍යන්තර ක්‍රියාවලිය සහ ආයතනික ධාරිතාවය පිළිබඳ අපේක්ෂාවන්ට ප්‍රතිලාභ සැලසේ. ආයතනික සැලැස්ම මගින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කළ යුතු උපාය මාර්ග ඇතුළත් කර ඇති අතර ඵලදායී නියාමන පරිසරයක් නිර්මාණය කිරීමට මගපෙන්වයි. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා ආයතනික සැලැස්ම 2023 සිට 2025 දක්වා තෙවසරක කාලයක් සඳහා යාවත්කාලීන කරන ලදී.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්යයන් ඉටු කිරීම සඳහා අංශ කිහිපයක් තිබේ. අධ්‍යක්ෂ ජනරාල් සහ සියලුම අංශවල ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සමඟ සාකච්ඡා කර මෙම වාර්තාව යාවත්කාලීන කරන ලදී. එසේම, එය කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද 2023 ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඇත. එය ක්‍රියාත්මක කිරීම සඳහා 2022 දෙසැම්බර් 06 වැනි දින කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන ඇති අතර, එය මූල්‍ය මාර්ගෝපදේශ ඉලක්ක මත අදාළ ආයතනය වෙත නිසි වේලාවට ඉදිරිපත් කරන ලදී.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව 2022

2023 අමාත්‍යාංශ අයවැය කමිටුවට ඉදිරිපත් කිරීම සඳහා අප ආයතනයේ 2022 වර්ෂය සඳහා වන ප්‍රගති වාර්තාව 2022 සැප්තැම්බර් 30 දිනට සකස් කර අධ්‍යක්ෂ ජනරාල් විසින් රේඛීය අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කර තිබුණි.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අයවැය යෝජනාව 2023

ආයතනයේ වාර්ෂික ජාතික අයවැය 2023 යෝජනා සියලුම අංශ ප්‍රධානීන්ගේ අදහස් විමසා සකස් කර නියමිත කාල සීමාව තුළ රේඩිය අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී. අධ්‍යක්ෂ/ වර්ණාවලි කළමනාකරණ මෙම අවස්ථාවට සහභාගී වූ අතර ආයතනික අයවැය යෝජනාව රේඩිය අමාත්‍යාංශය සහ මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී. තවද, රේඩිය අමාත්‍යාංශයට අදාළ පාර්ලිමේන්තු ජාතික අයවැය රැස්වීම පැවැත්වෙන දිනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ආයතනය නියෝජනය කළේය.

ක්‍රියාකාරී සැලැස්ම 2022 කාර්තුමය සමාලෝචනය සහ වාර්තා ඉදිරිපත් කිරීම

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් අදාළ වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සමාලෝචනය කිරීම සඳහා කාර්තුමය ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වයි. කෝවිඩ්-19 තත්ත්වය සහ පළමු සහ දෙවන කාර්තුව තුළ රටේ පැවති තත්ත්වය හේතුවෙන් සියලුම අංශ ප්‍රධානීන්ගේ සහභාගීත්වයෙන් MS Teams ඔස්සේ ප්‍රගති සමාලෝචන රැස්වීම් මාර්ගගතව පවත්වා රේඩිය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී. 3 වන සහ 4 වන කාර්තුව ආරම්භයේ දී, ආයතනය අයත් රේඩිය අමාත්‍යාංශය කිහිප වතාවක් වෙනස් කරන ලද අතර, අමාත්‍යාංශ අතර ආයතනික කටයුතු සම්බන්ධීකරණය කිරීම ඉතා අභියෝගාත්මක විය.

සියලුම අංශ ප්‍රධානීන්ගේ සහභාගීත්වයෙන් සෑම කාර්තුවකම කාර්තුමය ප්‍රගති සමාලෝචන රැස්වීම් අවසන් කරන ලදී. මාර්ගෝපදේශ අනුව අදාළ තොරතුරු ආයතන වෙත ඉදිරිපත් කරන ලදී. ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය පිළිබඳ තොරතුරු සෑම කාර්තුවකදීම කොමිෂන් සභාව වෙත වාර්තා කරන ලදී.

ව්‍යාපෘති ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම

රේඩිය අමාත්‍යාංශ අවශ්‍යතාවලට අනුගත වීමට වගබලා ගනිමින්, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අදාළ අංශ ප්‍රධානීන්ගේ සහය ඇතිව ආයතනයේ මාසික සහ කාර්තුමය ව්‍යාපෘති ප්‍රගතිය ලබා දෙන ලදී. මෙම ක්‍රියාකාරකම ඉටු කිරීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් MS Teams ඔස්සේ ප්‍රගතිය යාවත්කාලීන කිරීමේ පද්ධතියක් සකස් කර නියමිත කාලය තුළ තොරතුරු ඉදිරිපත් කරන ලදී.

රේඩිය අමාත්‍යාංශ රැස්වීම - ව්‍යාපෘති 2023

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ඉදිරි වර්ෂයේදී පැවැත්වීමට සැලසුම් කර ඇති ආයතනික ව්‍යාපෘති ඉදිරිපත් කළ අතර මේ සම්බන්ධයෙන් රේඩිය අමාත්‍යාංශයේ පැවති සමාලෝචන රැස්වීමට සහභාගී විය. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ඉදිරි වසර තුළ ආරම්භ කිරීමට සැලසුම් කර ඇති ව්‍යාපෘති අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉදිරිපත් කරන ලදී.

වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම

වාර්ෂික වාර්තාව යනු සාමාන්‍ය විගණනයේ නිරීක්ෂණ සමඟ ඔවුන්ගේ මෙහෙයුම් කාර්ය සාධනය සහ මූල්‍ය තත්ත්වය විස්තර කෙරෙන පොදු ව්‍යවසායන් වාර්ෂිකව පාර්ලිමේන්තුවට සැපයිය යුතු ප්‍රකාශනයකි. එය මාස 12 ක් සඳහා ආයතනයේ කාර්ය සාධනය පිළිබිඹු කරයි. වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට රජයේ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය අවශ්‍ය විය. කෝවිඩ්-19 තත්ත්වය, රට අගුලු දැමීම සහ නිවසේ සිට වැඩ කරන පරිසරය වාර්ෂික වාර්තාවල සූදානම් කිරීමේ කටයුතු නිම කිරීමට බලපෑවේය. අධ්‍යක්ෂ ජනරාල්, අංශ ප්‍රධානීන් සහ විෂය නිලධාරීන්ගේ සහාය ඇතිව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් මෙම කාර්යයන් ඉටු කරන ලදී.

1. වාර්ෂික වාර්තාව 2020

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් 2020 වාර්ෂික වාර්තාව 2021.12.06 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා රේඩිය තාක්ෂණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී. 2022.03.30 දිනැති වාර්තාව සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබිණි. තාක්ෂණ අමාත්‍යාංශය විසින් මෙම අමාත්‍ය මණ්ඩල තීරණය ගරු අග්‍රාමාත්‍යවරයා මගින් පාර්ලිමේන්තුවේ සභාගත කරන ලෙස 2022.05.04 අග්‍රාමාත්‍ය කාර්යාලයේ ලේකම් වෙත යොමු කරන ලදී. අමාත්‍යාංශය වෙනස් කිරීම හේතුවෙන්, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ආරක්ෂක අමාත්‍යාංශයේ සැලසුම් අංශය සම්බන්ධීකරණය කර, 2020 වාර්ෂික වාර්තාව අපේක්ෂිත ක්‍රියාකාරකම් සකස් කර, මාර්ගෝපදේශයට අනුකූලව 2022.08.25 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව 2022.09.22 දින වාර්ෂික වාර්තා සම්බන්ධ පාර්ලිමේන්තු කාරක සභා රැස්වීමට සහභාගී වී අදාළ තොරතුරු ලබා දුන්නේය. "වාර්ෂික වාර්තා සහ ගිණුම් පාර්ලිමේන්තුවේ සභාගත කර අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම"මැයෙන් වූ ආකෘතිය ප්‍රකාරව සකස් කරන ලද වාර්ෂික වාර්තාව 2020 සම්බන්ධ ආදර්ශ යෝජනාව ආයතනය විසින් ඉදිරිපත් කරන ලදී. මෙම වාර්තාව මහජනතාවගේ දැනගැනීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා වෙබ් අඩවියේ උඩුගත කර ඇත. මෙම කාර්යයට අදාළ සියලුම ලිපි හුවමාරුව අවසන් කර ඇත.

2. වාර්ෂික වාර්තාව 2021

මූල්‍ය ප්‍රකාශය සහිත 2021 වාර්ෂික වාර්තා කෙටුම්පත 2022.02.28 දින මාර්ගෝපදේශය ප්‍රකාරව විගණකාධිපති කාර්යාලයට සහ අනෙකුත් අදාළ ආයතන වෙත ඉදිරිපත් කරන ලදී. විගණකාධිපති වාර්තා කෙටුම්පත ලැබීමෙන් අනතුරුව එය අනුමැතිය සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද 2021 වාර්ෂික වාර්තාව රේඩිය අමාත්‍යාංශය මගින් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට ඉදිරිපත් කරන ලදී.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ 2021 වාර්ෂික වාර්තාව ආශ්‍රිත ක්‍රියාකාරකම්වල කාර්ය සාධනය.

2021 වාර්ෂික වාර්තාවේ ක්‍රියාකාරකම් ආශ්‍රිත ප්‍රගතිය	නිම කළ දිනය
වාර්ෂික වාර්තා කෙටුම්පත අදාළ ආයතන වෙත ඉදිරිපත් කිරීම	2022.02.28
විගණකාධිපතිගේ කෙටුම්පත් වාර්තාව සහ විගණකාධිපතිගේ අවසන් වාර්තාව ලැබීම	2022.07.19
වාර්ෂික වාර්තාව පිළිබඳ කොමිෂන් සභා පත්‍රිකාව ඉදිරිපත් කිරීම	2022.08.31
කොමිෂන් සභා අනුමැතිය ලබා ගැනීම	2022.08.04
2021 වාර්ෂික වාර්තාව සමඟ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා කෙටුම්පත ඉදිරිපත් කිරීම	2022.08.19
ආරක්ෂක අමාත්‍යාංශයෙන් ලබාදුන් සංශෝධන සහිතව අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව නැවත ඉදිරිපත් කිරීම.	2022.09.15
සිංහල පරිවර්තනය සහ ඇමුණුම් සම්පූර්ණ කිරීම	2022.10.12
දෙමළ පරිවර්තනය සහ ඇමුණුම් සම්පූර්ණ කිරීම	2022.10.31
සිංහල වාර්ෂික වාර්තාව අවසන් කිරීම	2022.11.03
දෙමළ වාර්ෂික වාර්තාව අවසන් කිරීම	2022.11.04
2021 වාර්ෂික වාර්තාව (සිංහල) මුද්‍රණය කිරීම	2022.11.17
ඇමුණුම් මුද්‍රණය කිරීම	2022.11.09
2021 වාර්ෂික වාර්තාව (ඉංග්‍රීසි) මුද්‍රණය කිරීම	2022.11.11
2021 වාර්ෂික වාර්තාව (දෙමළ) මුද්‍රණය කිරීම	2022.11.30
අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා වාර්ෂික වාර්තාව ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම	2022.11.30
ආරක්ෂක අමාත්‍යාංශයෙන් අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම	2022.12.06
NAO සහ PED වෙත වාර්ෂික වාර්තාවේ පිටපත් ඉදිරිපත් කිරීම	2022.12.15

ආයතනික සමාජ වගකීම් ආශ්‍රිත පූර්ව කටයුතු සම්බන්ධීකරණය කිරීම

කොමිෂන් සභා තීරණ මෙහෙයවන අතරතුර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් පූර්ව ආයතනික සමාජ වගකීම් (CSR) ක්‍රියාකාරකම්වලට සහභාගී විය. කොමිෂන් සභා තීරණය ප්‍රකාරව, අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් කෙටුම්පත් කර තාක්ෂණ අමාත්‍යාංශය (MoT) වෙත යොමු කරන ලදී. තාක්ෂණ අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අමාත්‍ය මණ්ඩල කාර්යාලයට යොමු කළේය. අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් මුදල් අමාත්‍යාංශයෙන් නිරීක්ෂණ කැඳවා ඇති අතර, නීති අංශයේ එකඟත්වය ඇතිව ඉල්ලා ඇති තොරතුරු මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.

අමාත්‍ය මණ්ඩල තීරණය වූයේ "තාක්ෂණ අමාත්‍යවරයා වශයෙන් අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් ඇතිව ත්‍රිපුද්ගල කමිටුවක් පත්කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම්වරයාට උපදෙස් දීමයි. ඒ අනුව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් සහිතව ත්‍රිපුද්ගල කමිටුවක් පත් කරන ලෙස ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ඉල්ලා සිටින ලද අතර එම අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක කිරීමේ අපේක්ෂාවෙන් පසුවේ. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අයත් වන අමාත්‍යාංශය කෙටි කාලයක් තුළ කිහිප වතාවක් වෙනස් විය. යෝජිත කමිටු පත්කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය දැනුවත් කිරීම් සිදු කර අදාළ අමාත්‍යාංශ වෙත හඳුන්වා දෙන ලදී. එබැවින් අමාත්‍යාංශ මට්ටමින් මෙම වැඩසටහනේ කටයුතු සම්බන්ධීකරණය කිරීම ප්‍රමාද විය.

ඵලදායිතාවය වැඩිදියුණු කිරීම

වර්ෂය තුළ ඵලදායිතාවය වැඩිදියුණු කිරීම යටතේ පහත සඳහන් කාර්යයන් සම්පූර්ණ කරන ලදී.

➢ **රියදුරු පරිශ්‍රයේ තත්ත්වය සහ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම**

රියදුරු පරිශ්‍රයේ තත්ත්වය සහ වැඩිදියුණු කිරීම් හඳුනා ගැනීම සඳහා රියදුරන් සමඟ සාකච්ඡාවක් සිදු කරන ලදී. 2022 සැප්තැම්බර් මාසයේදී නිර්දේශ සහ ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම සමඟ තාක්ෂණික වාර්තාවක් සකස් කරන ලදී. එය නඩත්තු අයවැය යටතේ ආරම්භ කරන ලද අතර එමගින් ආයතනයේ රියදුරු පරිශ්‍රයේ ප්‍රමිතීන් වැඩිදියුණු කිරීමට හැකි විය.

➢ **ඇතුල්වීමේ සහ පිටවීමේ අවසරපත් ලබාදීමේ ව්‍යාපෘතිය**

වාහන සඳහා ඉල්ලුම් කිරීමේ ස්වයංක්‍රිය ක්‍රමයක් හඳුන්වා දී ඇතත් රියදුරන්ට ලිඛිතව ඇතුල්වීමේ සහ පිටවීමේ අවසරපත් ලබා දී රාජකාරී කිරීමට සිදුව ඇත. ඒ නිසා ආරක්ෂක අංශය සඳහා පරිගණකයක් ලබාදීමට සාකච්ඡා කරන ලදී. එනමුත් ආරක්ෂක අංශයට CCTV දර්ශන නැරඹීමට පහසුකම් නොමැති අතර පරිගණක ප්‍රවේශය ද ලබා දිය යුතුව ඇත. මෙම කරුණු අධ්‍යයනය කර ඉදිරි වසර සඳහා ක්‍රියාත්මක කිරීමේ සැලැස්මක් සහිත වාර්තාවක් සකස් කිරීමට තීරණය විය.

➢ **ගෙවතු වගා ව්‍යාපෘතිය**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ රියදුරන් සමඟ කාර්යාල උද්‍යාන සැකසීමට සාකච්ඡා කරන ලදී. රියදුරන් අවශ්‍ය බීජ හා පැල ලබා දෙන ලදී. එය මෙම වැඩසටහන සඳහා බෑග් සහ කොම්පෝස්ට් වැනි ඇතැම් ද්‍රව්‍ය සපයන ලද අතර මෙම වැඩසටහන අවසන් කර ඇත.





➢ **පොදු ස්වයංක්‍රිය ශාඛා හුවමාරු පද්ධතිය (PABX) වැඩිදියුණු කිරීම**

කාර්යාලයීය නිලධාරීන් සහ බාහිර ප්‍රජාවට සහාය වෙමින් පිළිගැනීමේ කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී. ඇමතුම් බෙදා හැරීමේ පද්ධතිය වැඩිදියුණු කළ යුතු අතර නව පොදු ස්වයංක්‍රිය ශාඛා හුවමාරු පද්ධතිය (PABX) ස්ථාපනය කිරීම පිණිස නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් වන තෙක් බලා සිටිය යුතුය.

➢ **Microsoft Teams වැඩිදියුණු කිරීම**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් කාර්ය මණ්ඩලය සඳහා ඔවුන්ගේ කාර්ය ක්‍රමවල ඵලදායිතාව වැඩිදියුණු කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා MS Teams හරහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී. නිවසේ සිට වැඩ කරන කාලය තුළ කාර්ය මණ්ඩලයේ වැඩ කිරීමේ ධාරිතාව වැඩි කිරීමට එය උපකාරී විය. බොහෝ නිලධාරීන් ඔවුන්ගේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කුසලතා වැඩිදියුණු කර නව පරිසරයට අනුවර්තනය වී කාර්යාලීය වැඩ සංස්කෘතිය වෙනස් කළහ. මෙම ජයග්‍රහණය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්ය සාධනයට බලපෑවේය. බොහෝ අංශ මහජනතාව දැනුවත් කිරීමට සහ මහජන ගැටළු විසඳීමට සමාජ මාධ්‍ය වෙබ් අඩවි භාවිතා කළහ. අංශ විසින් සිය විෂය කටයුතුවල ප්‍රගතිය යාවත්කාලීන කරමින් වැඩ වල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා මාර්ගගත ප්‍රගති සමාලෝචන යාන්ත්‍රණයක් භාවිත කරන ලදී. තවද, වාහන ඉල්ලීම් සහ ගමන් බලපත්‍ර අවසරපත් එම විෂයයන්හි කාර්යක්ෂමතාව වැඩි දියුණු කළේය.

➢ **වෙනත් ආයතන වෙත තොරතුරු සැපයීම**

ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශන සේවා සඳහා සංවිධානය කරන ලද 2022 ඔක්තෝම්බර් මාසයේ පවත්වන ලද "Getup Startup for a Wealthy Nation Program"වැඩසටහන"යටතේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත සේවා තොරතුරු සපයන ලදී.

චක්‍රලේඛ

මෙම වසර තුළ පහත සඳහන් කාර්යයන් අවසන් කරන ලදී.

- MS Teams ඔස්සේ චක්‍රලේඛ තොරතුරු සම්පූර්ණ කිරීම සඳහා දත්ත පත්‍රිකාවක් සකස් කිරීම.
- Teams නාලිකාව ඔස්සේ තොරතුරු යාවත්කාලීන කිරීම.
- ආයතනයේ අංශ ප්‍රධානීන් අතර තොරතුරු බෙදාහැරීම සහ චක්‍රලේඛවල විස්තර සම්බන්ධයෙන් දැනුවත් කිරීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් රාජ්‍ය වියදම් කළමනාකරණය / සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම සහ කාර්යාලයේ ආරක්ෂක විධිවිධාන සම්බන්ධව වසර තුළ චක්‍රලේඛ දෙකක් නිකුත් කරන ලදී.

අංක 04/2022 දරන චක්‍රලේඛය ප්‍රකාරව ඉහළ මට්ටමේ කළමනාකරණ කමිටුවක් පත් කරන ලද අතර රැස්වීම්වලදී ගන්නා ලද තීරණ කොමිෂන් සභාවේ දැනගැනීම පිණිස දැනුම් දිය යුතු වනු ඇත. ඉහත සඳහන් චක්‍රලේඛයට අනුකූලව, ඉහළ මට්ටමේ කළමනාකරණ කමිටුව විසින් ක්‍රියාකාරී සැලැස්මේ ඉහළ ප්‍රමුඛතා අයිතම හඳුනාගෙන මුදල් අමාත්‍යාංශයේ අනුමැතියට ඉදිරිපත් කරන ලදී. මේ සම්බන්ධයෙන් රැස්වීමක් පවත්වා ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් අමාත්‍යාංශයේ අදාළ නිර්දේශ ලැබී ඇත.

අනුමත චක්‍රලේඛ-2022

චක්‍රලේඛ අංකය	චක්‍රලේඛයේ දිනය	ගන්නා ලද පියවර
05/2002	2022.03.28	ක්‍රියාත්මක කරන ලදී
07/2022	2022.04.07	ක්‍රියාත්මක කරන ලදී
08/2022	2022.04.29	ක්‍රියාත්මක කරන ලදී
09/2022	2022.05.19	ක්‍රියාත්මක කරන ලදී
10/2022	2022.05.25	ක්‍රියාත්මක කරන ලදී
13/2022	2022.06.10	ක්‍රියාත්මක කරන ලදී
16/2022 16/2022(I) 16/2022(II)	2022.06.17	
DG TRCSL	2022.06.26	
Pub/ADM/ Sec/07	2022.07.24	ක්‍රියාත්මක කරන ලදී
TRC/01/2022	2022.08.24	ක්‍රියාත්මක කරන ලදී (කාර්ය මණ්ඩලය විධිමත්ව සේවයට වාර්තා කිරීම)
TRC/02/2022	2022.09.12	ක්‍රියාත්මක කරන ලදී (විශේෂ නිවාඩු)

ආයතනික කටයුතු පිළිබඳ නිල ලිපි ලේඛන

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් වර්ෂයේ ආයතනික ක්‍රියාකාරකම්වලට අදාළව ජනාධිපති ලේකම් කාර්යාලය, අමාත්‍ය මණ්ඩල ලේකම් කාර්යාලය, භාණ්ඩාගාරය, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනෙකුත් ව්‍යවස්ථාපිත ආයතන ආශ්‍රිත කරුණු සම්බන්ධීකරණය කරන ලදී. තවද, වර්ෂය තුළදී ජාතික විගණන කාර්යාලය, රේඛීය අමාත්‍යාංශය, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (කෝප්) සහ අනෙකුත් පාර්ලිමේන්තු කමිටු වලට සහභාගී විය.

කෝප් කමිටුවේ පූර්ව කටයුතු

මෙම වසරේ කෝප් කමිටුවේ ඉල්ලීම් සම්බන්ධයෙන් පහත සඳහන් කාර්යයන් සිදු කර අදාළ තොරතුරු අදාළ ආයතන වෙත ඉදිරිපත් කරන ලදී.

ක්‍රියාකාරකම්	කාර්යයේ ප්‍රගතිය
පෙර කෝප් කමිටු ඉල්ලීමේ ප්‍රගතිය (2016)	පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුව (PED)සහ ජාතික විගණන කාර්යාලය (NAO)වෙත තොරතුරු ඉදිරිපත් කරන ලදී.
2019 සහ 2020 **වසරවල විගණන විමසුම්වල වර්තමාන ප්‍රගතිය**	අංශ ප්‍රධානීන්ගේ උපදේශනය ඇතිව සම්පූර්ණ කරන ලදී. අවසාන වාර්තාව සකස් කර අදාළ අංශ ප්‍රධානීන් වෙත යොමු කරන ලදී. 2022.08.08 දින ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන අදාළ ආයතන වෙත ඉදිරිපත් කරන ලදී.
වාර්තාව ඉදිරිපත් කිරීම	වාර්තාව 2022.09.09 දින පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත සහ 2022.09.14 දින පාර්ලිමේන්තුව

	වෙත ඉදිරිපත් කරන ලදී.
පූර්ව නිර්දේශ එකතුව	පූර්ව නිර්දේශ ඇතුළත් ලේඛනයක් සකස් කර ඇත
අභ්‍යන්තර විගණන COPE නිර්දේශ	අභ්‍යන්තර විගණන COPE නිර්දේශ සම්පූර්ණ කරන ලදී.

වාර්ෂික සමීක්ෂණ මණ්ඩලය

2021 වර්ෂය සඳහා වාර්ෂික සමීක්ෂණය 2022 ජනවාරි මාසයේදී සිදු කරන ලදී. සමීක්ෂණය සිදු කිරීම සඳහා සාමාජිකයින් පස් දෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක් පත් කරන ලදී. අබලි ද්‍රව්‍ය හඳුනාගෙන, සම්මත ක්‍රමවේදයකට අනුව එම ද්‍රව්‍ය බැහැර කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී. 2021 වසර සඳහා භාණ්ඩ වෙන්දේසිය 2022.11.10 දින ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලයේදී පැවැත්විණි. වෙන්දේසිය මගින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ලැබුණු මුළු ආදායම රු. 158,400.00 කි.

උපස්ථම්භක සහාය

රැස්වීම්, වැඩමුළු, සම්මන්ත්‍රණ, නිරීක්ෂණ චාරිකා, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යනාදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අනෙකුත් අංශවල ක්‍රියාකාරකම් සඳහා පාලන අංශය උපස්ථම්භක සහාය ලබා දෙන ලදී.

ගෙවීම් නිර්දේශ කිරීම / අනුමත කිරීම

වැටුප් වර්ධක, අතිකාල, හිඟ වැටුප්, ගමන් බිමන් සහ යැපුම් දීමනා, වින්‍යය පරීක්ෂණ ගාස්තු, වාහන අලුත්වැඩියාව, පරිහරණ භාණ්ඩ මිලදී ගැනීම, උපකරණ සහ යන්ත්‍ර සූත්‍ර, පොත්පත්, වාර සඟරා සැපයීම මෙන්ම සේවා සැපයීම (ආරක්ෂක, සනීපාරක්ෂක, ජලය, දුරකථන, විදුලිය, ආදිය) සම්බන්ධ විවිධ ගෙවීම් සඳහා අනුමැතිය ලබා දීම පාලන අංශය විසින් සිදු කරන වැදගත් ක්‍රියාකාරකමකි. මෙම අංශය විසින් ගෙවීම් වවුචර් සුපරීක්ෂාකාරීව පරීක්ෂා කර ගෙවීම්/මූල්‍ය අධිකාරී සීමාවේ ස්වභාවය අනුව නිර්දේශ හෝ අනුමැතිය ලබා දෙන අතර ප්‍රමාදයකින් තොරව ගෙවීම් සිදුකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

කාර්ය මණ්ඩලය ඇගයීමේ වැඩසටහන සහ ක්‍රීඩා උත්සවය (සුභසාධන ක්‍රියාකාරකම්)

වත්මන් වසංගත තත්ත්වය සහ 2021.08.28 දිනැති රාජ්‍ය වියදම් සමාලෝචනය පිළිබඳ අමාත්‍ය මණ්ඩල සංදේශය සැලකිල්ලට ගනිමින් වර්ෂය තුළ කාර්ය මණ්ඩල පසුබැසීමේ වැඩසටහන සහ ක්‍රීඩා උත්සවය නොපැවැත්වීමට තීරණය කර ඇත.

පුස්තකාලය

විදුලි සංදේශ කර්මාන්තයේ නියැලී සිටින්නන්ට සහ විදුලි සංදේශ ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට ඔවුන්ගේ දැනුම යාවත්කාලීන කිරීමට උපකාර කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පුස්තකාලය ස්ථාපනය කර ඇත. එහි විදුලි සංදේශ කර්මාන්තය ආශ්‍රිත පොත්පත් සහ සඟරා විශාල එකතුවක් ඇත. පරිශීලකයන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා පුස්තකාල පහසුකම් අඛණ්ඩව වැඩිදියුණු කරමින් පවතී. පුස්තකාලය මගින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට පමණක් නොව පර්යේෂකයන්, විශ්ව විද්‍යාල සිසුන්, පාසල් සිසුන් වැනි බාහිර පාර්ශ්වයන්ට ද පහසුකම් සපයයි. 2022 වසරේ දී පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

පුස්තකාලය නඩත්තු කිරීම සහ ශක්තිමත් කිරීම

- 2022 සඳහා වාරික දායකත්වය අලුත් කිරීම සහ නව සඟරා සඳහා දායක ගාස්තු ගෙවීම.
- පුවත්පත් ලිපි එකතුව (මුල් පිටපත) අනාගත පරිශීලනය සඳහා විශේෂ විෂයයන් අනුව වර්ග කිරීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ලේඛන භාවිතයෙන් ප්‍රලේඛන සේවා සහ සංඥාපන සේවා ආරම්භ කිරීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ලේඛන එකතු කර පහසු පරිශීලනය සඳහා වෙන් වෙන් වශයෙන් රැස් කිරීම.
- විධායක නිලධාරීන් අතර දිනපතා පුවත්පත් ලිපිවල මෘදු පිටපත් විද්‍යුත් තැපෑල ඔස්සේ බෙදා හැරීම සහ පාලන අංශයේ පුස්තකාල චැනලයේ (MS Teams) අදාළ තොරතුරු යාවත්කාලීන කිරීම.
- ආධුනික ගුවන් විදුලි විභාග විෂය නිර්දේශය, විභාග ප්‍රශ්න පත්‍ර, ගුවන්විදුලි සංගමය විසින් සකස් කරන ලද පුවත්පත් ලිපි, ප්‍රකාශන සහ විභාග දිනය ප්‍රකාශයට පත් කළ ගැසට් නිවේදන ඇතුළුව ආධුනික ගුවන් විදුලි විභාගයට අදාළ තොරතුරු එකතුවක් සකස් කිරීම.
- අදාළ විෂය මාතෘකා භාවිතා කරමින් විදුලි සංදේශනය ආශ්‍රිත නිබන්ධනයක් සකස් කිරීම ආරම්භ කිරීම.
- අභ්‍යන්තර ජාලය හරහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා දත්ත සමුදායට ඇතුළත් කළ යුතු අතිවිශේෂ ගැසට් සහ පනත්වල දත්ත ස්කෑන් කර ඇතුළත් කර ඇත.
- PURNA පුස්තකාල දත්ත සමුදාය නඩත්තු ගිවිසුම. PURNA පුස්තකාල දත්ත සමුදාය නඩත්තු ගිවිසුම අළුත් කිරීම.
- PURNA පුස්තකාල දත්ත සමුදාය නඩත්තු පද්ධතිය වෙබ් පාදක පුස්තකාල පද්ධතියක් බවට පරිවර්තනය කිරීම.
- පුස්තකාල පොත් බැහැරදීමේ සේවා ඉලෙක්ට්‍රොනිකව PURNA දත්ත සමුදාය භාවිතයෙන් ආරම්භ කිරීම.
- අන්තර්ජාලය සහ අභ්‍යන්තර ජාලය හරහා භාවිතා කරන්නන් සඳහා වරණීය තොරතුරු (SDI) සැපයීම සඳහා පුවත්පත් වල විශේෂිත මුල් ලිපි සඳහා දත්ත සැකසුම් ක්‍රියාවලිය සිදු කිරීම.

අනෙකුත් පුස්තකාලවල පහසුකම් ලබා ගැනීම සඳහා සාමාජිකත්වය අලුත් කිරීම

- බ්‍රිටිෂ් කවුන්සිල් සාමාජිකත්වය අලුත් කිරීම.
- මහජන ජංගම පුස්තකාල සාමාජිකත්වය ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදෙශ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට සහාය වීම.

වැදගත් තොරතුරු රැස් කිරීම සහ නාමාවලි සකස් කිරීම

පරිශීලකයින්ට පහසු පරිශීලනය සඳහා පහත සඳහන් ක්ෂේත්‍රවල නාමාවලි සකස් කර ඇත.

- පාරිභෝගික කටයුතු පිළිබඳ පුවත්පත් ලිපි එකතුව
- නෙළුම් කුලුනේ පුවත්පත් ලිපි එකතුව
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වෙළඳ දැන්වීම් නාමාවලිය
- කෙටි දුරකථන අංක නාමාවලිය.
- ෆේස්බුක් සම්බන්ධ පුවත්පත් ලිපි එකතුව.
- පනත් නාමාවලිය
- අතිවිශේෂ ගැසට් නාමාවලිය
- ඇබෑර්තු නාමාවලිය

පර්යේෂකයන්ට සහ තොරතුරු අවශ්‍ය පුද්ගලයන්ට තොරතුරු සැපයීම.

මෙම වසර තුළ, පුස්තකාල තොරතුරු ඉල්ලීම් රැසක් මාර්ගගතව, දුරකථන ඇමතුම් සහ ඊමේල් හරහා ඉටු කරන ලදී. අදාළ නිලධාරීන්ගේ සම්බන්ධතා තොරතුරු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වෙබ් අඩවිය ඔස්සේ සපයන ලද අතර පුස්තකාල තොරතුරු ලබා ගැනීම සඳහා ලැබෙන පුද්ගල ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කරන ලදී. තවද, පුස්තකාල සේවා ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා වෙබ් අඩවිය ඔස්සේ මාර්ගගත හමුවීම් ද ලබා දෙන ලදී.

මාධ්‍ය ආශ්‍රිත ක්‍රියාකාරකම්

මාධ්‍ය ඒකකය විසින් මාධ්‍ය ආවරණය ලබා දුන් අතර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සංවිධානය කරන ලද දේශීය හා ජාත්‍යන්තර වැඩසටහන් පැවැත්වීම සඳහා සහාය විය. මීට අමතරව, කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබන විදුලි සංදේශ නියාමන ක්‍රියාකාරකම් පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු ද සම්පාදනය කෙරේ.

මාධ්‍ය ඒකකය විසින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වැදගත් වැඩසටහන් සහ එම වැඩසටහන්වල විශේෂ අවස්ථා ඡායාරූපගත කරයි. මෙම වැඩසටහන් වල දී ගන්නා ලද ඡායාරූප සහ වීඩියෝ නවීන තාක්ෂණය භාවිතයෙන් සංස්කරණය කර සුරක්ෂිතව ගබඩා කර ඇත. ජාත්‍යන්තර වැඩසටහන් සංවිධායකයින්ගේ ඉල්ලීම් මත, මාධ්‍ය ඒකකය විසින් වැඩසටහන්වල ඡායාරූප, වීඩියෝ සහ නිල කණ්ඩායම් ඡායාරූප සහභාගිවන්නන් අතර බෙදා හරිනු ලැබේ.

විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම්වලට අදාළ සජීවී සහ දැනුවත් කිරීමේ වීඩියෝ ද අදාළ අංශවල සහාය ඇතිව නිර්මාණය කර නිල සමාජ මාධ්‍ය වැනල් සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කෙරේ.

මීට අමතරව, ජාතික වැඩසටහන් වලට අනුකූලව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සිදු කරන ලද විශේෂ ව්‍යාපෘති/වැඩසටහන් සම්බන්ධව සංස්කරණය කරන ලද ඡායාරූප සහ තිර රචනය කරන ලද වාර්තාමය වීඩියෝ මෙම ඒකකය විසින් සකස් කරනු ලැබේ. ඒවා ඉල්ලීම් මත විද්‍යුත් මාධ්‍ය, පුවත්පත්සහ රජයේ මාධ්‍ය ආයතන වෙත සපයයි.

- මාතර රෝහල සඳහා නව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පද්ධතියක් හඳුන්වා දෙමින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සඳහා නිර්මාණය කරන ලද වාර්තාමය චිත්‍රපටය.
- නෙළුම් කුලුන සඳහා මාධ්‍ය ආවරණය ලබා දීම.
- ස්වර වසන්තය සංගීතමය වැඩසටහන - බැනර් සැලසුම් සකස් කිරීම, වීඩියෝ පට, විශේෂ බහු මොනිටර වීඩියෝ මෙන්ම මුහුණු පොත සහ මාධ්‍ය ආවරණය ලබා දීම.
- සුබසාධක සංගමය, ක්‍රීඩා සංගමය සහ පොදු සේවක සංගමය සඳහා ලිපි ශීර්ෂය නිර්මාණය කිරීම.
- 2021 සහ 2022 වාර්ෂික වාර්තා සඳහා සංයුක්ත තැටි නිර්මාණය කිරීම.
- ලෝක විදුලි සංදේශ දිනය සඳහා වීඩියෝ පටයක්, සමාජ මාධ්‍ය පළ කිරීම් සකස් කිරීම.
- ජාතික දිනය වෙනුවෙන් බැනරයක් නිර්මාණය කිරීම.
- පුස්තකාල තොරතුරු පොත් පිංච සකස් කිරීම පිණිස ආධාර ලබා දීම.
- සමාජ මාධ්‍ය තුළ පාරිභෝගික සම්බන්ධතා ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා වීඩියෝ පට සකස් කිරීම.
- සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණය පිළිබඳ හඳුන්වාදීමේ වීඩියෝවක් සකස් කිරීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිල කාර්යයන් පිළිබඳ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සහ මාධ්‍ය ආවරණය ලබාදීම.

සම්මාන

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සංවිධානය කරන ලද වාර්ෂික වාර්තා සහ ගිණුම් සම්මාන ප්‍රදානෝත්සවයේදී 2020 වාර්ෂික වාර්තාව සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත අනු ශූරතාවය පිරිනමන ලදී.

තොරතුරු තාක්ෂණ

පද්ධති සහ ක්‍රියාවලි සංවර්ධනය

අදාළ ප්‍රතිලාභීන් වෙත ලබා දෙන ඩිජිටල්කරණ සේවාවන් වැඩිදියුණු කිරීම සඳහා තොරතුරු තාක්ෂණ අංශය විසින් පද්ධති සහ ක්‍රියාවලි වැඩිදියුණු කිරීමේ වැඩසටහන් රැසක් ආරම්භ කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, තොරතුරු තාක්ෂණ අංශය විසින් නවතම තාක්ෂණය භාවිත කර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීමේ ක්‍රියා පටිපාටිය ආරම්භ කළේය.

එමෙන්ම මෙම අංශය විසින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අංශ කිහිපයක කාර්යයන් ස්වයංක්‍රියකරණය කිරීම සඳහා සැලසුම් කර ඇත. මෙම වැඩසටහන යටතේ මානව සම්පත් කළමනාකරණ පද්ධතිය ස්ථාපනය කරන ලද අතර පරිපාලන කටයුතු විධිමත් කිරීම සඳහා මොඩියුල ගණනාවක් ක්‍රියාත්මක කරන ලදී. එසේම, ඩිජිටල් වාර්තාවල රහස්‍යභාවය සහ අඛණ්ඩතාව වැඩිදියුණු කිරීම සඳහා, ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයට ඩිජිටල් අත්සනක් හඳුන්වා දෙන ලදී.

තොරතුරු තාක්ෂණ පාලනය

2022 වසරේ දී ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (SLCERT) විසින් තොරතුරු තාක්ෂණ ආරක්ෂණ පාලන රාමුව ආරම්භ කරන ලදී. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස, තොරතුරු තාක්ෂණ අංශය විසින් ආයතනයේ අවශ්‍යතාවලට අනුගතව මාර්ගෝපදේශ කෙටුම්පත් කරමින් සිටී. ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙන් පසු, පරිගණක පද්ධති සහ සන්නිවේදන භාවිතය සමඟින් සිය දෛනික කටයුතු වැඩිදියුණු කිරීම පිණිස ප්‍රශස්ත තොරතුරු තාක්ෂණ භාවිතයන් අනුගමනය කිරීමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා කාර්ය මණ්ඩලයට හැකි වෙනු ඇත.

කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම සහ පුහුණුව ලබා දීම

තොරතුරු තාක්ෂණ අංශය විසින් තොරතුරු සන්නිවේදන තාක්ෂණය ආශ්‍රිත නවතම තාක්ෂණයන් සහ ප්‍රශස්ත සයිබර් ආරක්ෂණ භාවිතයන් පිළිබඳව දැනුවත් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සඳහා තොරතුරු තාක්ෂණ දැනුවත් කිරීමේ පුහුණු සහ සැසි රාශියක් වසර පුරා වරින් වර පවත්වනු ලැබිණි.

රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක. 04/2022 ප්‍රකාරව අයවැය ප්‍රශ්නය හේතුවෙන් 2022 දී ව්‍යාපෘති කිහිපයක් නතර කිරීමට උසස් කළමනාකාරීත්වය තීරණය කළේය.

දෛනික කටයුතු සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ආශ්‍රිත සහාය ලබා ගැනීම

කාර්ය මණ්ඩලය තොරතුරු සන්නිවේදන තාක්ෂණය ආශ්‍රිත ගැටළු වලට මුහුණ දෙන විට තොරතුරු තාක්ෂණ අංශය විසින් ඔවුන්ට උපරිම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහාය ලබා දේ.

මූල්‍ය

වාර්ෂික අයවැය / මූල්‍ය බලතල පැවරීම / මූල්‍ය ප්‍රකාශය

කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු 2023 වාර්ෂික අයවැය, 2023 මූල්‍ය බලතල පැවරීමේ ප්‍රකාශනය, 2023 වාර්ෂික මූල්‍ය ප්‍රකාශනය සම්බන්ධ වාර්තා සම්පූර්ණ කර ඉදිරිපත් කරන ලදී.

ආදායම් බදු

"රාජ්‍ය සංස්ථාවක් වන ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, ඒකාබද්ධ අරමුදලට අරමුදල් ප්‍රේෂණය කරයි. PN/IT/2020-03, 18.02.2020 (දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සංශෝධනය කරන ලද 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සඳහා යෝජිත වෙනස්කම් ක්‍රියාත්මක කිරීම) ප්‍රකාරව ඒකාබද්ධ අරමුදලට කරන ලද සුදුසුකම්ලත් ගෙවීම් සැලකිල්ලට ගනිමින් 2019.04.01 දින සිට බලපැවැත්වෙන පරිදි, ආදායම් බදු අඩු කිරීමක් ලබා ගන්නා ලදී."

	2020/21 රු. මිලියන	2021/22 රු. මිලියන
තක්සේරු කළ හැකි ආදායම	11,375	16,449
අඩුකළා: සුදුසුකම්ලත් ගෙවීම	5,000	8,500
බදු කළ හැකි ආදායම	6,375	7,949
අවසාන බදු වගකීම	1,530	1,908

විදුලි සංදේශ බදු පනත සහ මුදල් පනත යටතේ මාසික ව්‍යවස්ථාපිත එකතුව

විදුලි සංදේශ බදු පනත සහ මූල්‍ය පනත යටතේ මාසික ව්‍යවස්ථාපිත එකතු කිරීම් පහත සඳහන් පරිදි නියමිත කාල සීමාව තුළ මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරන ලදී.

- 1 වන කාර්තුව - රු. මිලියන 9,330
- 2 වන කාර්තුව - රු. මිලියන 3,753
- 3 වන කාර්තුව - රු. මිලියන 7,086
- 4 වන කාර්තුව - රු. මිලියන 7,786

(එකතුව මිලියන 27,956)

තවද, 1996 අංක 27 දරන පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ආදායමෙන් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරන ලද අරමුදල් පිළිබඳ විස්තර ඉහත වගුවේ දක්වා ඇත.

සෘජු මුදල් / වෙක්පත් තැන්පතු / මාර්ගගත අරමුදල් මාරු කිරීම් භාර ගැනීම

කොවිඩ්-19 වසංගතය හේතුවෙන්, මූල්‍ය අංශය සෘජු තැන්පතු සහ බැංකු අරමුදල් මාරු කිරීම් භාර ගැනීම ආරම්භ කර ඇති අතර ලදුපත් පරීක්ෂා කිරීම පිණිස පියවීම් සිදු කළ වහාම නාමමාත්‍ර (proforma) ඉන්වොයිස් විස්තර/ අදාළ දැන්වීම් වැනි අදාළ සියලු තොරතුරු විද්‍යුත් තැපෑලෙන් එවන ලෙස ඉල්ලා සිටින ලදී.

එහි ප්‍රතිඵලයක් වශයෙන්, රට කිහිප වරක් අගුලු දමා තිබිය දීත්, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිසි මුදල් ප්‍රවාහය සහ ආදායම් එකතු කිරීම සම්බන්ධ ක්‍රියාකාරකම් වලට බාධාවක් සිදු නොවීය.

මූල්‍ය අංශයේ කාර්ය ක්‍රියාවලිය ස්වයංක්‍රීයකරණය කිරීම

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව තොරතුරු තාක්ෂණ අංශය සමඟ සහයෝගයෙන් මූල්‍ය අංශයේ කාර්යයන්වල ගුණාත්මකභාවය සහ නිරවද්‍යතාවය ඉහළ නැංවීම සහ කාර්ය සාධනය වැඩිදියුණු කිරීම පිණිස අංශයේ ක්‍රියාකාරකම් ස්වයංක්‍රියකරණය කිරීමට පියවර ගෙන ඇත. එහි සියලුම මූලික සාකච්ඡා සහ තොරතුරු තාක්ෂණ අවශ්‍යතා සම්පූර්ණ කර ඇති අතර, ප්‍රසම්පාදන කටයුතු සිදු කෙරෙමින් පවතී.

1996 අංක 27 දරන විදුලි සංදේශ පනත යටතේ ආදායම්


1996 අංක 27 දරන විදුලි සංදේශ පනත ප්‍රකාරව කොමිෂන් සභාවේ ආදායම් ඉපැයීමට සහ එකතු කිරීමට ව්‍යවස්ථාපිත බලය පැවරී ඇත. ඒ අනුව, ගුවන් විදුලි බලපත්‍ර ගාස්තු, සෙස්

ගාස්තු, පද්ධති ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු, වෙළඳ බලපත්‍ර ගාස්තු සහ පොදු ස්විච්චිකරණ දුරකථන ජාල (PSTN) ක්‍රියාකරුවන්ගෙන් සහ ගුවන්විදුලි සංඛ්‍යාත භාවිතා කරන්නන්ගෙන් ලැබෙන වෙනත් අදාළ ගාස්තු වශයෙන් කොමිෂන් සභාව ආදායම් උපයයි/රැස් කරයි., කොමිෂන් සභාවේ ආදායම පහත දැක්වේ.

ආදායම් ප්‍රභවය	2022 (රු. '000)
පද්ධති ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු	-
සෙස් ගාස්තු	5,514,299
ගුවන් විදුලි සංඛ්‍යාත බලපත්‍ර ගාස්තු	5,430,252
සංඛ්‍යාත පූර්ව ගෙවීම් ගාස්තු	3,278,900
වෙළඳ බලපත්‍ර ගාස්තු	14,199
ආධුනික ගුවන්විදුලි බලපත්‍ර ගාස්තු	71
නැව් මධ්‍යස්ථාන බලපත්‍ර ගාස්තු	-
ගුවන්යානා බලපත්‍ර ගාස්තු	-
රැහැන් රහිත දුරකථන බෙදාහරින්නන්ගේ ගාස්තු	63,252
විභාග ගාස්තු	372
මාදිලි අනුමැති ගාස්තු	23,279
ලේබල් ගාස්තු	2,539
අයදුම්පත් සැකසුම් ගාස්තු	1,400
කෙටි සංකේත අංක ගාස්තු	39,750
අන්තර්ජාල සේවා සැපයුම්කරුවන්ගේ බලපත්‍ර ගාස්තු	2,252,509
වෙනත් ආදායම් (ස්ථාවර තැන්පතු, කාර්ය මණ්ඩල ණය යනාදියෙන් ලැබෙන පොළී ආදායම)	2,280,097
එකතුව	**18,900,918**

විදුලි සංදේශ බදු එකතු කිරීම

2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනතේ විධිවිධාන ප්‍රකාරව විදුලි සංදේශ බද්ද අය කෙරේ. 2019 නොවැම්බර් 01 වනදා වන තෙක් විදුලි සංදේශ බදු අනුපාතිකය 15%ක් විය. බදු හඳුන්වාදීමෙන් පසු 2019 දෙසැම්බර් 1 වැනිදා සිට බලපැවැත්වෙන පරිදි රජය 11.25%ක විදුලි සංදේශ බදු අනුපාතිකය පනවන ලදී. මෙය පෙර බදු අනුපාතයට වඩා 25% ක අඩුවීමකි.



විදුලි සංදේශ පනත යටතේ බදු එකතු කිරීම

ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරුවන්ගේ බදු

ඉහත ආදායමට අමතරව, 2009 අංක 13 දරන මුදල් පනත මගින් සංශෝධිත 2004 අංක 11 දරන මුදල් පනත ප්‍රකාරව, කොමිෂන් සභාව විසින් ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් වලින් ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරුගේ බද්ද අයකර ගන්නා ලදී.

එලෙස කොමිෂන් සභාව විනාඩියකට ඇමරිකන් ඩොලර් 0.06 ක් ලැබෙන දේශීය ප්‍රවේශ ගාස්තු ලෙස එකතු කර ඇති අතර, එයින් 50% ක් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරන ලද අතර ඉතිරි 50% විදුලි සංදේශ සංවර්ධන ගාස්තු ලෙස රඳවා තබා ගනී.

තවද, කොමිෂන් සභාව විසින්. පිටතට යන දේශීය ප්‍රවේශ ගාස්තු ලෙස පිටතට යන ජාත්‍යන්තර ඇමතුම්වලින් විනාඩියකට රු. 3.00. බදු මුදලක් අය කිරීම 2019 ජූලි 01 වන දින සිට අහෝසි කරන ලදී.

ජංගම කුලුනු බදු

මෙම බද්ද නව බද්දක් ලෙස 2019 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි හඳුන්වා දෙන ලද අතර එය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් කාර්තුමය වශයෙන් එකතු කර ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කෙරේ.


කෙටි පණිවුඩ සේවා බදු

මෙය තොග කෙටි පණිවුඩ සේවා වශයෙන් අයකරනු ලබන අතර එක් කෙටි පණිවුඩයකට රු 0.25 ක් වශයෙන් 2019 අප්‍රේල් 01 දින බලපවත්වන පරිදි හඳුන්වා දී ඇත.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මුළු ආදායම

කොමිෂන් සභාවේ මුළු ආදායම පහත සඳහන් ප්‍රභවයන් යටතේ එකතු කරන ලද ආදායමෙන් සමන්විත වේ.

i. 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ සංශෝධන පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත
ii. 2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනත
iii. 2009 අංක 13 මුදල් පනතින් සංශෝධිත 2004 අංක 11 දරන මුදල් පනත



ඒකාබද්ධ අරමුදල් සඳහා ප්‍රේෂණ

පහත සඳහන් පරිදි 2022 වසරේ දී රජයේ ආදායම ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් රුපියල් බිලියන 29.30 ක් රජයේ භාණ්ඩාගාරයට ප්‍රේෂණය කරන ලදී.


විස්තරය	2021 රු. බිලියන	2022 රු. බිලියන
විදුලි සංදේශ පනත/ කොමිෂන් සභා අරමුදල්	8.5	12.20
විදුලි සංදේශ බදු	11.05	12.91
විදුලි සංදේශ සංවර්ධන ගාස්තු 50%	1.81	2.40
පිටතට යැවෙන දේශීය ප්‍රවේශ ගාස්තු මත බදු	-	-
කෙටි පණිවුඩ සේවා බදු	0.40	0.23
කුලුනු බදු	1.47	1.56
එකතුව	**22.23**	**29.30**

දේපල, පිරියත සහ උපකරණ

2022 වර්ෂය තුළ පරිගණක, අනෙකුත් කාර්යාල උපකරණ, කාර්යාලීය ගෘහ භාණ්ඩ සහ තාක්ෂණික උපකරණ සඳහා දේපල, පිරියත සහ උපකරණ වශයෙන් රු. මිලියන 10.8 ක් වැය කරන ලදී.

මුදල් වෙළෙඳපොළ ගනුදෙනු

කොමිෂන් සභාව දෛනික ගනුදෙනු සඳහා මහජන බැංකුවේ මුදල් වෙළෙඳපොළ ඉතුරුම් ගිණුම පවත්වාගෙන ගිය අතර සමාලෝචිත වර්ෂය තුළ මුදල් වෙළෙඳපොළ ගනුදෙනු හරහා උපයා ගන්නා ලද පොළී ආදායම රුපියල් මිලියන 493කි.



අභ්‍යන්තර විගණනය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණක යටතේ අභ්‍යන්තර විගණන අංශය ක්‍රියාත්මක වන අතර අභ්‍යන්තර විගණකවරයා කොමිෂන් සභාව වෙත සෘජුවම වාර්තා කරයි. පරිපාලනමය වශයෙන් අභ්‍යන්තර විගණක අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වාර්තා කරයි. ඒ අනුව කොමිෂන් සභාවේ සියලුම ක්‍රියාපටිපාටි සහ නියමයන් ක්‍රියාත්මක වන බව සහතික කිරීමත්, දැනට සිදු කෙරෙන විගණන විමර්ශනවල නිගමන විගණන කමිටුව වෙත වාර්තා කිරීමත් අංශයේ වගකීම වේ. එසේම විගණන කමිටුවේ තීරණ නිසි ක්‍රියාමාර්ග ගැනීම සඳහා අංශ ප්‍රධානීන් වෙත යවනු ලැබේ. අභ්‍යන්තර විගණන කටයුතු සඳහා ප්‍රමුඛ විෂයය ක්ෂේත්‍ර ගෙන හැර දක්වමින් වාර්ෂික විගණන සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය සහ විගණන කමිටුව වෙත ඉදිරිපත් කෙරේ.

පහත සඳහන් විගණන කටයුතු අවසන් කර අදාළ වාර්තා අවශ්‍ය කටයුතු සඳහා ඉදිරිපත් කරන ලදී.

- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ලදුපත් (මුදල්, චෙක්පත් සහ මුදල් ඇණවුම්)
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ගෙවීම් (වැටුප් සහ අදාළ ගෙවීම්, ණය සහ සේවක අත්තිකාරම් හැර)
- 1996 අංක 27 දරන විදුලි සංදේශ පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 22 වගන්තිය යටතේ නිකුත් කරන ලද නව බලපත්‍ර නිකුත් කිරීම සහ බලපත්‍ර අලුත් කිරීම.
- 1996 අංක 27 දරන පනතින් සංශෝධිත 1991 අංක 25 දරන විදුලි සංදේශ පනතේ 21 වගන්තිය යටතේ වෙළඳ බලපත්‍ර නිකුත් කිරීම.
- විවිධ ආදායම්
- ජංගම කුලුනු බද්ද
- වැටුප් හා වේතන ගෙවීම
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අත්තිකාරම් ප්‍රදානය කිරීමේ සහ අත්තිකාරම් පියවීමේ ක්‍රියාවලිය
- ස්ථාවර වත්කම් ඉන්වෙන්ටරි නඩත්තු කිරීම
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රසම්පාදන කටයුතු
- බැංකු සැසඳුම් පරීක්ෂා කිරීම
- වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය – 2021/12/31
- කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණ කටයුතු කිරීම
- නව ගොඩනැගිල්ල ඉදිකිරීම පිළිබඳ විශේෂ සමාලෝචනය සම්බන්ධීකරණය කිරීම (පවතින ගොඩනැගිල්ල දිගු කිරීම)

සියලුම විගණන විමසුම් සහ පිළිතුරු සම්බන්ධයෙන් ජාතික විගණන කාර්යාලය සමඟ සම්බන්ධීකරණය කිරීම. වර්ෂය තුළ කරන ලද ඉල්ලීම් සංඛ්‍යාව පහත පරිදි වේ.

- විගණන වාර්තා - 03
- විගණන විමසුම් - 16
- තොරතුරු ඉල්ලීම - 24

විගණන කමිටු තොරතුරු

2022 වර්ෂය තුළ එක් (01) විගණන කමිටු රැස්වීමක් පවත්වන ලද අතර මෙම රැස්වීමේදී පහත කරුණු සාකච්ඡා කරන ලදී.

1. 2022 මාර්තු 14 වැනි දින පැවැත්වූ විගණන කමිටු රැස්වීම.

1.1 වාර්තා/කරුණු සාකච්ඡා කරන ලද අතර, පහත පරිදි තීරණ / ක්‍රියාමාර්ග ගන්නා ලදී:

විෂය ක්ෂේත්‍රය	ගන්නා ලද ක්‍රියාමාර්ගය/තීරණය
කොළඹ නෙළුම් කුලුන සහ විශේෂ ව්‍යාපෘති අභ්‍යන්තර විගණනය	නාක්ෂණික විගණනය සඳහා විශේෂ ව්‍යාපෘති අංශය වෙත දන්වා ඇති ලේඛන අවශ්‍යතා සපුරාලීම සඳහා රැස්වීමක් සංවිධානය කිරීම.
වාහන ණය පරීක්ෂා කිරීම	ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අදාළ හිමිකරුගේ නමින් වාහන ලියාපදිංචි කිරීමේ හැකියාව විමසමින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යැවීම සහ අවසන් කරන ලද වාහන ණය වක්‍රලේඛය ඉදිරිපත් කිරීම.
2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7)(අ) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සම්බන්ධ විගණන වාර්තාව	ප්‍රත්‍යාගණන ප්‍රතිපත්ති කෙටුම්පත නීතිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමට ජාතික විගණන කමිටු නියෝජිතයන් සහභාගි කර ගැනීම සහ තීරණ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිපියක් මඟින් දැනුම් දීම.
මෑත කාලීන විගණන වාර්තා/විගණන විමසුම් සහ නීති, රීති/රෙගුලාසි අතර පවත්නා වෙනස්කම්	1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ සංශෝධිත පනතේ විධිවිධාන සහ රාජ්‍ය බලධාරීන් විසින් නිකුත් කරන ලද නියෝග/වක්‍රලේඛවලට අනුව. අදාළ ආයතන සමඟ සංවාදයක් ආරම්භ කිරීමට පෙර. මූල්‍ය හා පරිපාලන බලතල සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් අනුගමනය කරන ලද සහ ක්‍රියාත්මක කරන ලද නීති සහ ක්‍රියා පටිපාටි අතර වෙනස්කම්/හිඩැස් හඳුනා ගැනීම
විගණකාධිපතිගෙන් ලැබුණු විමසුම් විදුලි සංදේශ කුලුනු පිළිබඳ භෞතික සත්‍යාපනය අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල හෝ පළාත් පාලන ආයතනවල සහාය ඇතිව සිදු කෙරේ.	• කාලය ඉලක්ක කර ගනිමින් සහ කුලුනු කාල සැලැස්ම සහිතව විදුලි සංදේශ කුලුනු පිළිබඳ දිප ව්‍යාප්ත භෞතික සත්‍යාපනය අඛණ්ඩව කරගෙන යාම. • අනුමත කුලුනු සංඛ්‍යාව, ලබා දී ඇති සංඛ්‍යාත බලපත්‍ර සහ අදාළ අංශ විසින් අය කරනු ලබන කුලුනු බද්ද අතර සැසඳුම් අවසන් කිරීම.
විගණකාධිපතිගෙන් ලැබුණු විමසුම නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම	කමිටු තීරණය අනුගමනය කිරීම.
විදුලි සංදේශ බද්ද ලැබීම් සහ ගෙවීම් - 2019/2020	බලපත්‍රයයේ 17 වන වගන්තියෙන් අවශ්‍ය කෙරෙන කාල රාමුව සහිතව දැනට ක්‍රියාත්මක වන පද්ධතිය අඛණ්ඩව කරගෙන යාම සහ SITA විදුලි සංදේශ පද්ධතියේ නිර්වචනය තුළට වැටෙන්නේද යන්න තහවුරු කර ගැනීම.
2019/12/31 දිනට වාර්ෂික සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ නිරීක්ෂණ සහ ප්‍රගතිය තහවුරු කිරීම	කාල ඉලක්කයක් සහිතව වාර්ෂික සමීක්ෂණ මණ්ඩලය සඳහා පරිගණක ගත පද්ධතිය ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම.
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියමන කොමිෂන් සභාවේ ප්‍රසම්පාදනය පිළිබඳ අභ්‍යන්තර විගණනය	2022 වසර සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සහ සහයෝගිතා සැලැස්ම නියමිත වේලාවට කොමිෂන් සභාව වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.
2021 වසර සඳහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ මුදල, තථ්‍ය එදිරිව අයවැයගත ආදායම පිළිබඳ වාර්තාව	2021 වසර සඳහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ මුදල පිළිබඳ සවිස්තර වාර්තාව; අධ්‍යක්ෂ මූල්‍ය ඉදිරිපත් කළ තත්‍ය එදිරිව අයවැයගත ආදායම
බැංකු සැසඳුම් පිළිබඳ අභ්‍යන්තර විගණනය	බැංකු සැසඳුම් කඩිනම් කරන ලෙස කාරක සභා සභාපතිවරයා උපදෙස් දීම.
වැටුප් ගෙවීම පිළිබඳ අභ්‍යන්තර විගණනය	මූල්‍ය රෙගුලාසිවල අවශ්‍යතාවය ප්‍රකාරව වැටුප් ලේඛණයේ අත්සන් තබන ලෙස දන්වමින් මූල්‍ය අධ්‍යක්ෂවරයා විසින් සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත අභ්‍යන්තර මැමයක් යොමු කිරීම.
2022 වසර සඳහා අභ්‍යන්තර විගණන සැලැස්ම	අභ්‍යන්තර විගණන අංශය සඳහා අතිරේක කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම.
සෙලියුලර් කුලුනු බද්ද පිළිබඳ අභ්‍යන්තර විගණනය	අනුමත කුලුනු සංඛ්‍යාව සහ අයකරනු ලබන කුලුනු බද්ද අතර සැසඳුම් අවසන් කිරීම.
ගෙවීම් (සේවකයින් සඳහා වැටුප් සහ අදාළ ණය ගෙවීම් සහ අත්තිකාරම් හැර)	අභ්‍යන්තර විගණන නිරීක්ෂණ සඳහා පිළිතුරක් ඉදිරිපත් කිරීම.

කොමිෂන් සභා ලේකම් කාර්යාලය

කොමිෂන් සභාව

කොමිෂන් සභාවේ නිල බලයෙන් සභාපතිවරයා ලෙස කටයුතු කරන අමාත්‍යාංශ ලේකම්වරයා, අධ්‍යක්ෂ ජනරාල් (ප්‍රධාන විධායක නිලධාරී) සහ නීතිය, මුදල් සහ කළමනාකරණ ක්ෂේත්‍ර නියෝජනය කරන සාමාජිකයින් තිදෙනෙකුගෙන් කොමිෂන් සභාව සමන්විත වේ.

කොමිෂන් සභාවේ රැස්වීම් කැඳවීම සහ කොමිෂන් සභාවේ තීරණ මත පදනම්ව රැස්වීම් ක්‍රියා පටිපාටි සහ පසු විපරම් ක්‍රියාමාර්ගවලට අදාළ රාජකාරි ඉටු කිරීම කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ වගකීම වේ. කොමිෂන් සභාවේ ලේකම්වරයා අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කර කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ කටයුතු සිදු කරයි.

කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ කාර්යයන්

- කොමිෂන් සභා රැස්වීම් කැඳවීම.
- කොමිෂන් සභාවේ රැස්වීම් වාර්තා සකස් කිරීම සහ අදාළ ලේඛන පවත්වාගෙන යාම.
- කොමිෂන් සභා තීරණ සහ වාර්තා සම්පාදනය කිරීම.
- කොමිෂන් සභාවේ තීරණ දැනුම් දීම සහ පසු විපරම් ක්‍රියාමාර්ග ගැනීම.
- කොමිෂන් සභාවේ මුද්‍රාව තබා ඇති උපකරණ සහ ලියකියවිලිවල ලේඛනයක් පවත්වාගෙන යාම.
- අවශ්‍ය අවස්ථාවන් වලදී කොමිෂන් සභාවේ සහ අධ්‍යක්ෂ ජනරාල්ගේ මඟපෙන්වීම ඇතිව කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබන නියාමන කටයුතු සඳහා සහාය ලබා දීම.

විදුලි සංදේශ නියාමන කටයුතුවල වැදගත්කම ඉහළ නැංවීමට සහ පාර්ශ්වකරුවන්ගේ යහපත ආරක්ෂා කිරීම උදෙසා ඵලදායි ආයතනික පාලන පටිපාටි අත්‍යවශ්‍ය වන බව විශ්වාස කරන බැවින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව පාලනයේ ඉහළම ප්‍රමිතීන් සාක්ෂාත් කර ගැනීමට සහ පවත්වා ගෙන යාමට උත්සාහ කරයි. ඒ අනුව, කොමිෂන් සභාව කාර්යයේ ගුණාත්මකභාවය, ඵලදායී පාලනය, විනිවිදභාවය සහ වගවීම අවධාරණය කරන යහපත් පාලන මූලධර්ම අනුගමනය කර ඇත. මීට අමතරව, මෙමඟින් සදාචාරාත්මක සංස්කෘතියක් සහිතව පටිපාටි අඛණ්ඩව වැඩිදියුණු කිරීමට කැපවී සිටී. 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා, කොමිෂන් සභාව අපගේ පාලන පටිපාටිවල සියලුම විධිවිධානවලට අනුකූලව කටයුතු කරයි. එමෙන්ම සියලුම අංශ විසින් ප්‍රකාශ කරන ලද නිර්දේශිත ප්‍රමිතීන් කිහිපයක් ද අනුමත කර ගන්නා ලදී.

කොමිෂන් සභා කමිටු

කොමිෂන් සභාවේ සාමාජිකයින් විගණන කමිටුව, නීති කමිටුව සහ අනෙකුත් විශේෂිත නියාමන කමිටු නියෝජනය කරයි. තවද, ප්‍රධාන විධායක නිලධාරී (අධ්‍යක්ෂ ජනරාල්) කොමිෂන් සභාවේ සාමාජිකයෙකු වන අතර, ඔහු ආයතනයේ බොහෝ කමිටුවල සභාපතිවරයා වශයෙන් ප්‍රධාන භූමිකාවක් ඉටු කරයි.

වාර්තා කිරීම, පාලනය සහ කළමනාකරණය

ආයතනයේ ඵලදායී ක්‍රියාකාරිත්වය සඳහා කොමිෂන් සභා පත්‍රිකා කාලෝචිත ලෙස බෙදා හරිනු ලැබේ. එම පත්‍රිකා පිළිබඳ තීරණ කොමිෂන් සභාවේ එකඟතාව සහ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය මත ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ අංශ වෙත ඉදිරිපත් කරන ලදී. තවද, තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ප්‍රාදේශීය වාර්තාකරණ ආකෘතියකින් පසු විපරම් කරනු ලබන අතර, මෙම වාර්තා කොමිෂන් සභාවේ මීළඟ රැස්වීමට ඉදිරිපත් කරනු ලැබේ.

වගකීම්

කොමිෂන් සභාවේ රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයින් තිදෙනෙකු විය යුතු අතර, ඔවුන්ගෙන් එක් අයෙකු කොමිෂන් සභාවේ සභාපතිවරයා විය යුතුය. සභාපතිවරයා සහභාගී නොවන සෑම කොමිෂන් සභා රැස්වීමකම සභාපති වශයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා මුලසුන දැරිය යුතුය. කොමිෂන් සභා රැස්වීමකට පැමිණ සිටින සාමාජිකයින්ගේ බහුතර ඡන්ද ගණන එම රැස්වීමේදී ගනු ලබන තීරණ තීරණය කරයි.

කාර්යසාධනය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නියාමන සහ මෙහෙයුම් කටයුතු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා කොමිෂන් සභාව සෑම මසකම රැස්වේ. වරින් වර අමාත්‍යාංශ වෙනස්වීම් හේතුවෙන් කොමිෂන් සභාවේ ඇතැම් තනතුරු වසර තුළ කිහිප වතාවක් වෙනස් විය. නියාමන, පරිපාලන, මූල්‍ය, විගණන සහ විශේෂ ව්‍යාපෘති කටයුතු සම්බන්ධයෙන් අවශ්‍ය තීරණ ගැනීම සඳහා කොමිෂන් සභා රැස්වීම් 11ක් පවත්වා ඇත.

කොමිෂන් සභාවේ තීරණ පිළිබඳ කෙටුම්පත් සහ අවසන් අනුමැතිය සකස් කර කොමිෂන් සභාවේ සහ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ එකඟතාවය ඇතිව ක්‍රියාත්මක කිරීම පිණිස අදාළ අංශ වෙත ඉදිරිපත් කරන ලදී. කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම සඳහා මෙම තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සෑම අංශයකින්ම ලබා ගනී.

අංශ ප්‍රධානීන් විසින් කරන ලද ඉල්ලීම් මත පෙර කොමිෂන් පත්‍රිකා සහ ඒවායේ තීරණ කොමිෂන් සභා ලේකම් කාර්යාලය විසින් සපයනු ලැබේ.

ඇතැම් රැස්වීම් භෞතිකව පැවැත්වීමේ දුෂ්කරතා මධ්‍යයේ වුවද, ලේකම් කාර්යාලය තොරතුරු තාක්ෂණ අංශය සම්බන්ධීකරණය කර ගනිමින් රැස්වීම් පවත්වා මාර්ගගතව කොමිෂන් සභා පත්‍රිකා සාමාජිකයින් අතර බෙදා හැරීමට කටයුතු කළේය. තවද, ලේකම් කාර්යාලය විසින් කොමිෂන් සභාවේ තීරණ වාර්තා කර ඇත, වාර්තා ගොනු කර ඇත, සහ අනාගත භාවිතය සඳහා වාර්තා සංරක්ෂණය කිරීම සහ සුරක්ෂිත කිරීම සඳහා අදාළ සියලුම ලේඛන නඩත්තු කර ඇත. තවද, ලේකම් කාර්යාලය විසින් අනාගත භාවිතය සඳහා වාර්තා සංරක්ෂණය කිරීම සහ සුරක්ෂිත කිරීම සඳහා කොමිෂන් සභාවේ තීරණ වාර්තා කර, වාර්තා ගොනු කර, අදාළ සියලුම ලේඛන නඩත්තු කර ඇත.

2022 වසරේ දී විවිධ විෂය ක්ෂේත්‍ර සඳහා ඉදිරිපත් කරන ලද කොමිෂන් සභා පත්‍රිකා සංඛ්‍යාව පහත වගුවේ දැක්වේ.

විෂය	අංශය	කොමිෂන් සභා පත්‍රිකා සංඛ්‍යාව
නියාමන	සංඛ්‍යාත වර්ණාවලි, ජාල, බලපත්‍ර කළමනාකරණ, ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා, තරහකාරිත්ව, අනුකූලතා සහ විමර්ශන, නීති	81
පාලන	පාලන සහ ආයතනික කටයුතු, තොරතුරු තාක්ෂණ	116
මූල්‍යය	මූල්‍යය	16
විගණන	අභ්‍යන්තර විගණනය	06
ව්‍යාපෘති	විශේෂ ව්‍යාපෘති, තරහකාරිත්ව	16
කොමිෂන් සභා තීරණ වල පසු විපරම් ක්‍රියාමාර්ග	කොමිෂන් සභා ලේකම් කාර්යාලය	04
එකතුව		**239**

නියාමන කමිටුව / ප්‍රගති සමාලෝචනය යාවත්කාලීන කිරීම්

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නිශ්චිත නියාමන ගැටලු මතුවන විට ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කර අවශ්‍ය තීරණ ගැනීම සඳහා නියාමන කමිටුව ස්ථාපනය කර ඇත. විදුලි සංදේශ නියාමන ක්‍රියාකාරකම්වල සුමට ක්‍රියාකාරිත්වය සඳහා නියාමන ගැටළු අවම කිරීම, විසඳීම සහ අවදානම් අවම කිරීම සඳහා මෙම කමිටුව සහාය වේ.

නියාමන කමිටුවේ සභාපතිත්වය අධ්‍යක්ෂ ජනරාල් විසින් දරන අතර සංඛ්‍යාත වර්ණාවලි, ජාල, ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා, නීති, තරහකාරිත්ව, බලපත්‍ර කළමනාකරණ, අනුකූලතා සහ විමර්ශන සහ මූල්‍ය අංශවල ප්‍රධානීන් විසින් මෙම කමිටුව නියෝජනය කරනු ලැබේ. තරහකාරිත්ව අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (අයකුම) කමිටුවේ ලේකම්වරයා වේ.

විදුලි සංදේශ නියාමනය ආශ්‍රිත කරුණු කමිටුවේ කැඳවුම්කරු වෙත ඉදිරිපත් කර නියාමන කමිටුවට ඉදිරිපත් කෙරේ. එවිට කමිටුව අදාළ අංශවලට අවශ්‍ය මඟ පෙන්වීම් ලබා දෙයි. අවශ්‍ය නම් අදාළ කරුණු සම්බන්ධයෙන් කොමිෂන් සභා තීරණ ගනු ලැබේ.

2022 වසරේදී නියාමන කමිටු රැස්වීම් නොපැවැත්වුණි. කෙසේ වෙතත්, බොහෝ නියාමන කරුණු අංශ ප්‍රධානීන්ගේ රැස්වීම් වලදී සාකච්ඡා කරන ලද අතර, ගැටළු විසඳීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

අධ්‍යක්ෂ ජනරාල් විසින් සෑම කාර්තුවකම සියලුම අංශ ප්‍රධානීන්ගේ සහභාගීත්වයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වයි. මෙම වසර තුළදී, බොහෝ දුෂ්කරතා යටතේ, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සියළුම අංශ ප්‍රධානීන්ගේ සහයෝගය ඇතිව සිය කාර්යයන් සිදු කරන ලදී. ඇතැම් ක්‍රියාකාරකම් ආරම්භ කිරීම සහ ක්‍රියාත්මක කිරීම ඉතා අභියෝගාත්මක වූ අතර, අංශ ප්‍රධානීන් නිතිපතා අංශ රැස්වීම් පවත්වමින් සිය අංශ මඟින් සිදු කරන ලද කාර්යයන් අධීක්ෂණය කරන ලදී. තවද, වර්ෂයේ නියමිත ඉලක්ක සපුරා ගැනීමේ අවදානම අවම කිරීම සඳහා කැපවූ ශ්‍රම බලකායේ සහාය ඇතිව ක්‍රියාකාරී වැඩසටහන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරන ලදී. වසර පුරා ප්‍රගති සමාලෝචන රැස්වීම් 03ක් මාර්ගගතව සහ භෞතිකව පවත්වන ලදී.

2 වන කාර්තුවේ ප්‍රගති සමාලෝචන රැස්වීම - 2022.07.01

අංශය	ගත් තීරණ සහ ක්‍රියාමාර්ග
බලපත්‍ර කළමනාකරණ	• “අක්‍රීය සහ සක්‍රීය යටිතල පහසුකම් බෙදාගැනීමේ මාර්ගෝපදේශය සකස් කිරීම”සඳහා විශේෂඥ සහාය අවශ්‍ය බව තාක්ෂණ අමාත්‍යාංශයට දැනුම් දීම.
ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා	• භාණ්ඩාගාරයේ උපදෙස් අනුව විදුලි සංදේශ ආශ්‍රිත පර්යේෂණ අධ්‍යයනයන් මෙන්ම දේශීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා සේවකයන්ගේ වැඩසටහන් අඛණ්ඩව පවත්වාගෙන යාම.
සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණය	• “රසායනාගාරයක් ස්ථාපනය කිරීමේ “අවශ්‍යතාවය අධ්‍යක්ෂ ජනරාල් සමඟ වෙනම රැස්වීමකදී සාකච්ඡා කිරීම. • සංඛ්‍යාත වර්ණාවලි කරුණු සාකච්ඡා කිරීමට කමිටුවක් පත් කිරීම. • ව්‍යාපෘතිය සඳහා විදේශ සහය අපේක්ෂා කරමින් ISMMS සංකල්ප පත්‍රිකාව අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කිරීම. • ඉදිරි වසර පහ සඳහා සංඛ්‍යාත වර්ණාවලි මාර්ග සිතියමේ ක්‍රියාකාරකම් සහ 5G සඳහා සංඛ්‍යාත වර්ණාවලි පැවරුම් ක්‍රියාත්මක කිරීම.
තොරතුරු තාක්ෂණය	• ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ තොරතුරු තාක්ෂණය ආශ්‍රිත ක්‍රියාකාරකම් තාක්ෂණ අමාත්‍යාංශය හරහා සිදු කිරීම සහ මෘදුකාංග ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් තොරතුරු තාක්ෂණ සහය ලබා දීමට අධ්‍යක්ෂ ජනරාල් එකඟ වීම මෙන්ම තාක්ෂණ අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමට ඉල්ලා සිටීම.
තරහකාරිත්ව	• රටේ වත්මන් තත්ත්වය සහ ඉදිරි ගමන හේතුවෙන් ගමට සන්නිවේදනය සහ ජාතික පාසල් ෆයිබර් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් යථාර්ථවාදීව සලකා බැලීම සඳහා දුරකථන ක්‍රියාකරු සමාගම්වල රැස්වීමට සහභාගි වන ලෙස ඉල්ලා සිටීම.
නීති කටයුතු	• නීතිපති දෙපාර්තමේන්තුව මඟින් බලපත්‍ර මාර්ගෝපදේශ ක්‍රියාවලිය කඩිනම් කිරීම. • පනත සංශෝධනය කිරීමේ ක්‍රියාවලිය පසුවිපරම් කිරීම.
විශේෂ ව්‍යාපෘති	• අධ්‍යක්ෂ ජනරාල් විසින් කොළඹ නෙළුම් කුලුනේ විදුලි සෝපාන විමර්ශනය කිරීමේ කටයුතු වෙනුවෙන් තාක්ෂණ අමාත්‍යාංශය සම්බන්ධීකරණය කිරීම මෙන්ම, ක්‍රියාවලියේ ප්‍රසම්පාදන කටයුතු කඩිනම් කළ යුතු වීම. • පාලන අංශයේ සහය ඇතිව විදුලි උත්පාදන යන්ත්‍ර ධාරිතාව පරීක්ෂා කිරීම සහ විදුලි ධාරිතාවය පරීක්ෂා කිරීමේ ක්‍රියාවලීන් පසු විපරම් කිරීම.
මූල්‍යය	• ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් වසරක් සඳහා කරන ලද විදේශ මුදල් බැඳියාවන් සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කිරීම.
අභ්‍යන්තර විගණනය	• කොමිෂන් සභාව දැනුවත් කර විගණන කමිටු රැස්වීම් පැවැත්වීම සහ විගණන කමිටු සභාපතිවරයා සමඟ කරුණු සාකච්ඡා කිරීම. • සැලසුම්ගත අභ්‍යන්තර විගණන වැඩසටහන් හඳුන්වාදීමට ඉල්ලා සිටීම.
පාලන, ආයතනික කටයුතු සහ මානව සම්පත්	• ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නව ගොඩනැගිල්ලේ අභ්‍යන්තර ප්‍රසම්පාදනයේ ඉදිරි මාවත සහ කදිරාන ප්‍රශ්නය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා සමඟ සාකච්ඡා කිරීමට රැස්වීමක් සැලසුම් කිරීම.

3 වැනි කාර්තුවේ ප්‍රගති සමාලෝචන රැස්වීම - 2022.09.30	
අංශය	ගත් තීරණ සහ ක්‍රියාමාර්ග
බලපත්‍ර කළමනාකරණ	• ඉදිරි වසර තුළ ජාත්‍යන්තර ප්‍රවීණයන්ගේ දැනුම අපේක්ෂා කරමින් "නිෂ්ක්‍රීය සහ සක්‍රීය යටිතල පහසුකම් බෙදාගැනීමේ මාර්ගෝපදේශය සකස් කිරීම"නැවත සලකා බැලීම.
තරහකාරිත්ව	• මූල්‍ය ප්‍රකාශන පිළිබඳ දුරකථන ක්‍රියාකරු සමාගම්වල විශ්ලේෂණ වාර්තා කොමිෂන් සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කිරීම. • ගමට සන්නිවේදනය ව්‍යාපෘතියේ ප්‍රගතිය දැක්වීම පිණිස පැහැදිලි ක්‍රමයක් සකස් කිරීම. • ජාත්‍යන්තර ප්‍රවීණයන්ගේ සහාය ඇතිව මීළඟ වසරේ දී "සම්මත අයක්‍රම ආශ්‍රිත තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දර්ශක ගණනය කිරීම සහ විදුලි සංදේශ අයක්‍රම පිළිබඳ ජාත්‍යන්තර මිණුම් අධ්‍යයනයන් පැවැත්වීම"නැවත සලකා බැලීම.
අනුකූලතා සහ විමර්ශන	• "ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතාවය - IMEI සක්‍රීය උපාංග රටට ආනයනය කිරීම විධිමත් කිරීම"අඛණ්ඩව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ අදහස් ලබා ගැනීම.
විශේෂ ව්‍යාපෘති	• කොළඹ නෙළුම් කුලුනේ පිරිවැය සහ අයිතම පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් මූල්‍ය අංශය වෙත ඉදිරිපත් කිරීම.
මූල්‍ය	• කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට පෙර 2023 අයවැය කෙටුම්පත සම්බන්ධයෙන් ඉහළ මට්ටමේ කළමනාකරණ කමිටුව සමඟ සාකච්ඡා කිරීම. • ස්වයංක්‍රීය මූල්‍ය පද්ධතිය ඉදිරි වර්ෂයේදී ක්‍රියාත්මක කිරීම නැවත සලකා බැලීම සහ තොරතුරු තාක්ෂණ අංශයේ සහාය ඇතිව අනෙකුත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු වල භාවිතා වන එවැනි පද්ධති අධ්‍යයනය කිරීම.
පාලන, ආයතනික කටයුතු සහ මානව සම්පත්	• 04/2022 චක්‍රලේඛය ප්‍රකාරව කරන ලද ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා ඉල්ලීම් සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය/රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් පසු විපරම් කිරීම. • තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මෘදුකාංග/දෘඩාංග මිලදී ගැනීම් සම්බන්ධ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ ටෙන්ඩර් ලේඛන ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත අනුගත කිරීමේ හැකියාව නිශ්චය කිරීම. • ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල සහ සනීපාරක්ෂක පහසුකම් නිසි ලෙස නඩත්තු කිරීම සහතික කිරීමට අවශ්‍ය පියවර ගැනීම. • ජ්‍යෙෂ්ඨ ප්‍රසම්පාදන කමිටුවේ ලකුණු ක්‍රම සුළු ප්‍රසම්පාදන කමිටුව විසින් හැකි අවස්ථාවන්හී දී භාවිත කිරීමට යෝජනා කරන ලදී.

4 වැනි කාර්තුවේ ප්‍රගති සමාලෝචන රැස්වීම - 2022.12.30	
අංශය	ගත් තීරණ සහ ක්‍රියාමාර්ග
බලපත්‍ර	• අධ්‍යක්ෂ/ බලපත්‍ර කළමනාකරණගේ උපදේශකත්වය ඇතිව අංශයේ ඉතිරි සහ අනාගත වැඩ කටයුතු අඛණ්ඩව සිදු කිරීමට අලුතින් පත් කරන ලද අධ්‍යක්ෂ/බලපත්‍ර කළමනාකරණට උපදෙස් දෙන ලදී. • නිර්නායකවල 17 වන වගන්තිය සංශෝධනය කිරීම පිළිබඳ කොමිෂන් සභා තීරණ සහ දුරකථන අංකය වෙනස් නොවී ජාල අතර මාරුවීමේ බලපත්‍රය නිකුත් කිරීම පසුවිපරම් කිරීම.
සංඛ්‍යාත වර්ණාවලි	• "අනුකලිත සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ සහ පිරික්සුම් පද්ධති"ව්‍යාපෘතියට සහය විය නොහැකි බව ලෝක බැංකුව දන්වා ඇත. එබැවින්, මෙම අයිතමය 2023 ක්‍රියාකාරී සැලැස්මෙන් ඉවත් කිරීමට තීරණය කරන ලදී. • ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ උපදේශක විසින් ඉදිරිපත් කරන ලද සංඛ්‍යාත වර්ණාවලි මාර්ග සිතියම නැවත සලකා බැලීම සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වාර්තා කිරීම. • ඉදිරි වසර තුළ 5G සඳහා සංඛ්‍යාත වර්ණාවලිය පැවරීමේ කටයුතු කඩිනම් කිරීම. • කාර්ය මණ්ඩල කටයුතු සාකච්ඡා කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල් සහ පාලන අංශය සමඟ රැස්වීමක් සංවිධානය කිරීම. • 2023 අංශ ක්‍රියාකාරී සැලැස්ම සඳහා සංශෝධන අවශ්‍ය නම් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.
ජාල	• ලබන වසරේ දී දුරකථන අංකය වෙනස් නොවී ජාල අතර මාරුවීමේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව සිදු කිරීම.
අනුකූලතා	• නීතිපතිවරයාගේ ප්‍රශ්නාවලියට පිළිතුරක් සකස් කිරීම සහ "ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතා - IMEI සක්‍රීය උපාංග මෙරටට ආනයනය කිරීම විධිමත් කිරීම"පිළිබඳ ඉදිරි ක්‍රියාමාර්ග සාකච්ඡා කිරීම.
තරහකාරිත්ව	• නව සැලැස්මට අනුව ගමට සන්නිවේදනය ව්‍යාපෘතිය අඛණ්ඩව කරගෙන යාම. • තන්තුකරණ ව්‍යාපෘති කටයුතු පිළිබඳ පසු විපරම් කිරීම.
විශේෂ ව්‍යාපෘති	• ප්‍රධාන කාර්යාලයේ නව ගොඩනැගිල්ලේ අමාත්‍ය මණ්ඩල තීරණ පසුවිපරම් කිරීම සහ කදිරාන ගොඩනැගිල්ලේ ප්‍රමාණාත්මක බිල්පත් - BOQ සම්පූර්ණ කිරීම.
නීති	• නව පනත සංශෝධනය කිරීම සම්බන්ධයෙන් කමිටු පත්කිරීම් පසු විපරම් කිරීම.
ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා	• ඉතිරි පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සහ ස්වේච්ඡා වැඩසටහන ලබන වසරේ සම්පූර්ණ කිරීම.
තොරතුරු තාක්ෂණය	• දැනට පවතින ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් පාලන අංශය සමඟ සම්බන්ධීකරණය සිදු කිරීම. • තෝරාගත් පාර්ශවය සමඟ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වෙබ් අඩවිය ප්‍රතිනිර්මාණය කිරීම සම්පූර්ණ කිරීම. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සහ අනෙකුත් නියාමන ආයතනවල වෙබ් අඩවි ආකෘති අධ්‍යයනය කිරීම.
මූල්‍ය	• 2022 මූල්‍ය ප්‍රකාශනය නියමිත කාලය තුළ ඉදිරිපත් කළ යුතුය.
අභ්‍යන්තර විගණනය	• පනතේ 22 වගන්තිය යටතේ නිකුත් කර ඇති බලපත්‍රය පිළිබඳ විගණනය පසු විපරම් කිරීම.
පාලන	• තොරතුරු තාක්ෂණ අංශයේ සහය ඇතිව වාර්තා තබා ගැනීමට තොරතුරු තාක්ෂණ උපකරණ දත්ත ගබඩාවක් සකස් කිරීම (භිමිකාරත්වය, පැවරීම්, වගකීම්, අලුත්වැඩියාව සඳහා යැවීම යනාදිය.) • තොරතුරු තාක්ෂණ උපකරණ ප්‍රසම්පාදනය සඳහා සම්මත ටෙන්ඩර් ලේඛනයක් සකස් කිරීම. • ප්‍රධාන ගොඩනැගිල්ලේ ප්‍රධාන නඩත්තු අවශ්‍යතා සඳහා උපදේශන සේවාවෙන් ප්‍රමාණාත්මක බිල්පතක් (BOQ) ලබා ගැනීම සහ අවශ්‍ය නම් භාණ්ඩාගාරයේ අනුමැතිය ඉල්ලා සිටීම.

අවදානම් සාධක කළමනාකරණය

දැඩි ආර්ථික බාධාවන් සහ කොවිඩ්-19 බලපෑම හේතුවෙන් විදුලි සංදේශ කර්මාන්තයේ නියාමන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව බොහෝ දුෂ්කරතාවන්ට මුහුණ දෙන ලදී. තවද, වසංගතය හේතුවෙන් ඇති වූ සීමා කිරීම්, ඉන්ධන හිඟය හේතුවෙන් ප්‍රවාහන ගැටළු සහ රජය විසින් පනවා ඇති සීමා කිරීම් තාක්ෂණික පරීක්ෂණ සිදු කිරීම, සංඛ්‍යාත වර්ණාවලියේ ගැටළු විසඳීම, පාරිභෝගික කටයුතු ආශ්‍රිත කරුණු මෙහෙයවීම, විශේෂ ව්‍යාපෘති මූලපිරීම්, යටිතල පහසුකම් නඩත්තු කිරීම වැනි නියාමන ක්‍රියාකාරකම් මෙන්ම ආංශික සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම යනාදී නියාමන ක්‍රියාකාරකම්වල ප්‍රගතියට බලපාන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පවතින හිඟ සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම සහතික කරන අතරම, මහජනතාවට නියාමන සේවා සැපයීමේදී තිරණාත්මක කාර්යභාරයක් ඉටු කිරීමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට සිදු විය.

ආර්ථික පරිහානියක සන්දර්භය තුළ, නියාමන ආයතනය, දුරකථන ක්‍රියාකරු සමාගම් සහ පාරිභෝගිකයින් ආශ්‍රිත අවදානම් හඳුනාගෙන ඇත. පසුව, අපගේ සංවිධානයට සහ පාර්ශවකරුවන්ට ඇති වන අහිතකර බලපෑම් අවම කිරීම සඳහා විය හැකි අවදානම් සාධක අධීක්ෂණය සහ කළමනාකරණය කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. මෙම කාර්යය සඳහා, අදාළ අවදානම් ප්‍රවේශයන්, ප්‍රතිචාර දැක්වීම් සහ වෙගවත් විචල්‍යයන් නිරීක්ෂණය කිරීම පිළිබඳව ආයතනය තවදුරටත් අවධානය යොමු කර ඇත. තවද, කොමිෂන් සභාවේ සුමට ක්‍රියාකාරීත්වය සහ වියදම් කළමනාකරණය කිරීම සඳහා පනවා ඇති රජයේ චක්‍රලේඛ සහ මාර්ගෝපදේශවලට අනුකූලව වැඩිදුරටත් සුදුසු අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග ගන්නා ලදී.

අවදානම් සාධක		අවදානම් මට්ටම	අවදානම් අවම කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග
මූල්‍ය අවදානම	➢ මූල්‍ය වෙලඳපොලවල අස්ථාවරත්වය හේතුවෙන් මූල්‍ය මෙහෙයුම් පිරිවැයේ අවිනිශ්චිතතාවයන්. ➢ ආදායම් එකතු කිරීම, අඩු කිරීම, ගෙවීම් ප්‍රමාදය අවම කිරීම, විනිමය අනුපාත අවප්‍රමාණය වීම සහ පාර්ශවකරුවන්ගේ මුදල් ප්‍රවාහය කෙරෙහි බලපෑම්. ➢ අනිවාර්ය ණය ආපසු ගෙවීම සහ දායකත්ව ගෙවීම් වලදී විනිමය අනුපාත අවප්‍රමාණය වීම මගින් ඇති වන දුෂ්කරතා සහ ප්‍රමාදයන් වල බලපෑම්. ➢ අයවැයෙන් මුදල් වෙන්කර තිබුණද අපේක්ෂිත ප්‍රාග්ධන වියදම් තුලින් ඇතිවන ගැටලු. ➢ අතුරු ප්‍රතිපත්තිය ප්‍රකාරව රජය විසින් ණය ආපසු ගෙවීම අත්හිටුවන ලදී.	අධි	➢ ගෙවීම් සහන ප්‍රදාන කාලසීමාවන් සඳහා පහසුකම් සැලසීම්. ➢ මුදල් මගින් ගෙවීම් සීමා කිරීම සහ කාඩ්පත් ගෙවීම් ප්‍රවර්ධනය කිරීම. ➢ වෙළඳපත් නිකුත් කිරීම වෙනුවට සෘජු අරමුදල් හුවමාරු ක්‍රමය භාවිතා කිරීම. ➢ විදේශීය සංවිධාන ගෙවීම් ප්‍රමාදය වැළැක්වීම සඳහා බැංකු සමඟ පූර්ව සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම සහ අදාළ දෙපාර්තමේන්තු සමඟ සාකච්ඡා කිරීම. ➢ සීමිත සේවකයින් සංඛ්‍යාවක් භාවිතා කරමින් සාමාන්‍ය මූල්‍ය පසුබිම් තොරතුරු නිරීක්ෂණය කිරීම සහ යාවත්කාලීන කිරීම අඛණ්ඩව සිදු කිරීම. ➢ වෙබ් අඩවිය, දුරකථන සේවා සහ අත්පත්‍රිකා මගින් පාරිභෝගික ගෙවීම් සේවා තොරතුරු යාවත්කාලීන කිරීම සහ පාරිභෝගික සේවා සැපයීම අඛණ්ඩව සිදු කිරීම. ➢ ජංගම, ස්ථාවර සම්බන්ධතා, බ්‍රෝඩ්බෑන්ඩ්, අමතර සේවා සහ Pay-TV සේවා සඳහා ඉහළ අයක්‍රම සංශෝධනයකට අනුමැතිය ලබා දීම. ➢ අපේක්ෂිත වියදම් කළමනාකරණය කිරීම සඳහා අතුරු අයවැය අනුමත කිරීම. ➢ ණය ආපසු ගෙවීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මහා භාණ්ඩාගාරයේ උපදෙස් අනුව කටයුතු කරනු ඇත.
මෙහෙයුම් අවදානම	➢ අභ්‍යන්තර විගණන සමාලෝචන වල සේවා තත්ත්වය/ කරුණු සමඟ අනුකූල වීම. ➢ ඉන්ධන අර්බුදය හේතුවෙන් ඇති වූ ප්‍රවාහන ගැටලු හේතුවෙන් සේවයට වාර්තා කිරීමේ දී නිලධාරීන්ට ගැටලු මතුවීම. ➢ විදුලිය විසන්ධි වීමකදී සේවාදායක මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාම සහතික කිරීම. ➢ විදුලි සංදේශ කර්මාන්තය ආශ්‍රිත පාර්ශවකරුවන්ගේ සහ පාරිභෝගිකයින්ගේ ගැටළු වලට ප්‍රතිචාර දැක්වීම. ➢ යටිතල පහසුකම් සංවර්ධනය, විශේෂ ව්‍යාපෘති ක්‍රියාකාරකම් සහ පාරිභෝගික කටයුතු කෙරෙහි බලපෑම් ඇතිවීම. ➢ අත්‍යාවශ්‍ය පුරප්පාඩු සහ නියාමන කාර්යයන් සඳහා සේවකයන් බඳවා ගැනීමේදී චක්‍රලේඛ මගින් බාධා කිරීම. ➢ උපයෝගිතා සේවාවල සහ උපකරණවල පිරිවැය ඉහළ යාම.	අධි	➢ සේවා තත්ත්ව කාරණා සහ අභ්‍යන්තර විගණනය සමාලෝචනය කිරීමට දුරකථන ක්‍රියාකරු සමාගම් වලට පහසුකම් සැලසීම සඳහා අදාළ මූලාරම්භයන් සහ තත්ත්වයන් කළමනාකරණය කිරීමට සැලසුම් කිරීම සහ ක්‍රියා කිරීම. ➢ කිසිදු බාධාවකින් තොරව මහජන සේවා සැපයීම පිණිස නිවසේ සිට වැඩ කිරීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කරන ලදී. ➢ අධි ධාරිතා බල ආරක්ෂකයන් ස්ථාපනය කර විදුලි උත්පාදනය සඳහා ඉන්ධන කෝටාව ලබා ගැනීම. ➢ අවශ්‍ය උපදෙස් සහ පසු විපරම් ක්‍රියාමාර්ග ගැනීම. ➢ අවශ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම්වල අඛණ්ඩ ක්‍රියාකාරීත්වය සඳහා අවශ්‍ය සහය සැලසීම්. ➢ සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම සහ ක්ෂේත්‍ර පරීක්ෂණ පැවැත්වීම. ➢ MS Teams යෙදුම හරහා සේවකයින් නිවසේ සිට කරන වැඩ සම්බන්ධ වාර්තා සටහන් නිරීක්ෂණය කිරීමට සහ ඔවුන්ගේ කාර්ය සාධනය ඇගයීමට අංශ ප්‍රධානීන්ට බලය ලබා දීම. ➢ සියලුම බාහිර රැස්වීම්, සාකච්ඡා සහ පුහුණු වැඩසටහන් මාර්ගගතව පැවැත්වීම. ➢ බඳවා ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳව අවශ්‍ය සාධාරණීකරණයන් සහිතව මුදල් අමාත්‍යාංශයට දැනුම් දීම. ➢ චක්‍රලේඛ මාර්ගෝපදේශ අනුව සුදුසු තීරණ ගැනීම සඳහා ඉහළ මට්ටමේ කළමනාකරණ කමිටුවක් පිහිටුවීම. ➢ මෙහෙයුම් පිරිවැය අවම කිරීම සහ විභව ඉතුරුම් පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීම, ද්‍රව්‍ය සහ උපකරණ භාවිතය අඩු කිරීම, නැවත භාවිත කිරීම සහ ප්‍රතිචක්‍රීයකරණය කිරීම සඳහා සූර්ය බලශක්ති උත්පාදනය හඳුන්වා දීමට සැලසුම් කර ඇත. ➢ ප්‍රාදේශීය මට්ටම හරහා මෙහෙයුම් පිරිවැය කළමනාකරණයට සහාය වීම. ➢ ඉන්ධන ආරක්ෂණ පියවර ක්‍රියාත්මක කර ඇති අතර කාර්යාල වාහන භාවිතය පාලනය කර ඇත.
නියාමන අවදානම	➢ විදුලි සංදේශ පනත සංශෝධනය කිරීම ➢ විදුලි සංදේශ සේවා තත්ත්වය සාක්ෂාත් කිරීම. ➢ විගණන කමිටුවේ ක්‍රියාකාරීත්වය. ➢ කෙටි කාලයක් ඇතුළත ජ්‍යෙෂ්ඨ පුහුණු නියාමන නිලධාරීන් විශ්‍රාම යාම.	අධි	➢ පනත සංශෝධනය කිරීම සඳහා කොමිෂන් සභාව විසින් පත් කරන ලද කමිටුව නැවත සලකා බැලීම. ➢ පාර්ශවකරුවන්ගේ උපදේශනය සමඟ විදුලි සංදේශ නියාමනය ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය සහ ගැලපීම් අධීක්ෂණය කිරීම. ➢ සේවා ගුණාත්මකභාවය අඛණ්ඩව අධීක්ෂණය කිරීම. ➢ විගණන කමිටු මෙහෙයුම් සඳහා සාමාජිකයින් පත් කිරීමට අදාළ බලධාරීන්ට දැනුම් දීම.

	➢ කොමිෂන් සභා සාමාජිකයින් පත්කිරීම ප්‍රමාද වීම. ➢ බදුකරණ රෙගුලාසි සහ අර්ථ නිරූපණයන්හි වෙනස්කම් ඇතිවීම. ➢ නිතරහකාරී විරෝධී භාවිතයන් නිර්මාණය කිරීම සහ වෙළඳපොලේ ප්‍රමුඛ සමාගම් පැවැත්වීම. ➢ ඇතැම් විදුලි සංදේශ ව්‍යාපාර ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ පරිපාලන අනුමැතිය හරහා බලපත්‍ර නිකුත් කිරීම ප්‍රමාද කිරීම. ➢ වසර තුළ පස් වතාවක් රේඛීය අමාත්‍යාංශය නිතර වෙනස් කිරීම හේතුවෙන් පරිපාලන හා මෙහෙයුම් ප්‍රමාදයන් බලපෑවේය. ➢ ආනයන සීමා කිරීම් හේතුවෙන් වෙළෙඳ බලපත්‍ර වෙළඳපොළට බලපෑම් ඇතිවීම සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් වෙළඳපොළෙන් පිටවීම. ➢ තාක්ෂණයන් සහ සේවා කේන්ද්‍රගතවීම මත නව නියාමන අභියෝග නිර්මාණය වීම.		➢ නීති මගින් නිතරහකාරී ක්‍රියාකාරකම් අවම කිරීම සහ සාධාරණ නියාමන පරිසරයක් නිර්මාණය කිරීම. ➢ අමාත්‍යාංශවල සිදුවන වෙනස්කම් වලක්වා ගැනීමට සිදුවන ප්‍රමාදයන් නඩත්තු කිරීමට සහ ඒවා ජය ගැනීමට අදාළ බලධාරීන් සමග අවශ්‍ය පියවර ගැනීම. ➢ විදුලි සංදේශ සේවා සංවර්ධනය සඳහා ගම්‍යතාවයක් සැපයීම සඳහා නව බලපත්‍ර රාමුවක් අවශ්‍ය වන අතර ඊට අදාළ පියවර ගන්නා ලදී. ➢ නියමිත වේලාවට බලපත්‍ර ලබා දීම, අවශ්‍ය නිසි ක්‍රියාමාර්ග ගැනීම සහ ආනයන සීමා කිරීම් වල බලපෑම පිළිබඳව අදාළ බලධාරීන් දැනුවත් කිරීම.
මානව අවදානම	➢ ආයතනයට පාරිභෝගිකයන්ගේ පැමිණීම අඩු වීම. ➢ පාරිභෝගික පැමිණිලි කළමනාකරණය කිරීම, පැමිණිලි නිරාකරණය කිරීම සහ පැමිණිලි පිළිබඳව දැනුවත් කිරීම සම්බන්ධයෙන් බාධාකාරී පරිසරයක් නිර්මාණය කිරීම. ➢ සේවකයින්ගේ සහ සේවා ස්ථානයේ සෞඛ්‍ය සහ ආරක්ෂාව සහතික කිරීම. ➢ පුහුණු අවස්ථා සඳහා අභියෝගාත්මක පරිසරයක් නිර්මාණයවීම.	අධි	➢ පාරිභෝගික සේවා සඳහා කාල සීමාවන් මාර්ගගතව වෙන් කර ගැනීමට පාරිභෝගිකයින්ට අවස්ථාව ලබා දීම. ➢ සමාජ මාධ්‍ය, ගුවන්විදුලි සහ රූපවාහිනී නාලිකා පිළිබඳව පාරිභෝගිකයන් දැනුවත් කිරීම. ➢ පෞද්ගලික ස්වයංක්‍රීය ශාඛා හුවමාරු පද්ධතිය (PABX) හරහා නිලධාරීන් ඔවුන්ගේ ජංගම දුරකථනවලට සම්බන්ධ කිරීම. ➢ සෞඛ්‍ය මාර්ගෝපදේශ බලාත්මක කිරීම සහ අවශ්‍ය උපදෙස් ලබා දෙමින් සුභසාධනය ප්‍රවර්ධනය කිරීම. ➢ මාර්ගගත ක්‍රම මගින් පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ ප්‍රවර්ධනය කිරීම. ➢ විශේෂ අවශ්‍යතා සහිත වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල සිසුන් සඳහා ජාත්‍යන්තර සංවිධානවල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සංවර්ධනය පිළිබඳ මාර්ගගත පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම. ➢ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සමඟ පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් ආරම්භ කිරීම. ➢ ජාත්‍යන්තර සංවිධාන විසින් අභ්‍යන්තර කාර්ය මණ්ඩලය සඳහා අත්‍යවශ්‍ය ඩිජිටල් වෙබ් පාදක වැඩසටහන් සංවිධානය කිරීම. ➢ වෘත්තීය පුහුණු සිසුන් සඳහා කුලුනු තාක්ෂණ විෂය මාලාව සහ ජාතික නිපුණතා ප්‍රමිතිය වැඩි දියුණු කිරීම. ➢ රත්නපුර සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල ග්‍රාමීය ප්‍රදේශවල කුලුනු ඉදි කිරීම. ➢ කාර්යාල පරිශ්‍රයේ සහ නිවසේ එළවලු වගා කිරීම කාර්ය මණ්ඩලය අතර හඳුන්වා දීම.
තාක්ෂණික අවදානම	➢ වසංගත කාලය තුළ දී, මාර්ගගත සේවා, මාර්ගගත අධ්‍යාපනය, නිවසේ සිට වැඩ කිරීම දිරිගැන්වීම වැනි පහසුකම් සඳහා ඇති ඉල්ලුමේ එකවර වැඩි වීමක් දක්නට ලැබීම සහ සහන යෝජනා ක්‍රම සැපයීමට දිරිගැන්වීම. ➢ වසංගත හැසිරීම් සහ අනෙකුත් විදුලි සංදේශ තාක්ෂණ පහසුකම් සංවර්ධනය පිළිබඳ නියාමන සැලසුම් වලට අනුකූලව විදුලි සංදේශ සේවාවල ගුණාත්මකභාවය සහ අධීක්ෂණය සමාලෝචනය කිරීම. ➢ රටතුළ සිදුවන ශීඝ්‍ර විදුලි කප්පාදුව හේතුවෙන් විදුලි සංදේශ සේවා අඩාල වීම. ➢ බලශක්ති අර්බුදය සහ අමුද්‍රව්‍ය හිඟය හේතුවෙන් ව්‍යාපෘති මුලපිරීම් යටතේ කුලුනු ඉදිකිරීම් සඳහා බලපෑම් ඇතිවීම. ➢ බලපත්‍ර ක්‍රියාකරුවන්ගේ කර්මාන්ත ආයෝජන අඩු වීම.	අධි	➢ පාර්ශ්වකරුවන් විසින් අදාළ විදුලි සංදේශ සේවා පහසුකම් සැපයීම සඳහා කොමිෂන් සභාවේ අයකුම යෝජනා නිර්දේශ කඩිනම් කිරීමට අවශ්‍ය පියවර ගැනීම. ➢ පාරිභෝගිකයින්ට ගුණාත්මක සේවා අවශ්‍යතා සැපයීම පිළිබඳව පසු විපරම් කිරීම. ➢ පාරිභෝගික ගැටළු සම්බන්ධයෙන් පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කිරීම. ➢ පාර්ශවකරුවන්ගේ සහාය ඇතිව "ගමට සන්නිවේදනය"ව්‍යාපෘතියට අදාළ නියාමන උපදෙස් ලබාගෙන ක්‍රියාත්මක කිරීම. ➢ මාර්ගගත ක්‍රම මගින් විදුලි සංදේශ ආශ්‍රිත බාහිර ආයතනික වැඩසටහන් පැවැත්වීම. ➢ ජාත්‍යන්තර විදුලි සංදේශ සංවිධාන සමඟ මාර්ගගතව රැස්වීම්, උපදේශනයන් සහ ක්‍රියාකාරකම් පැවැත්වීම. ➢ බාධාවකින් තොරව විදුලි සංදේශ සේවා සැපයීම පිණිස ශක්‍යතා විසඳුම් සෙවීම සඳහා දුරකථන ක්‍රියාකරුවන් සහ අනෙකුත් බලධාරීන් සමඟ සාකච්ඡා කිරීම. ➢ ප්‍රගතිය සමාලෝචනය කිරීමෙන් අමාත්‍යාංශවලට සහ අදාළ බලධාරීන්ට අවශ්‍ය යාවත්කාලීන කිරීම් ලබා දීම.

මූල්‍ය ප්‍රකාශනය
2022 වර්ෂය සඳහා

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
2022 දෙසැම්බර් 31 දිනට
(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)

	සටහන්	31.12.2022 දිනට	31.12.2021 දිනට
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත හා උපකරණ	**4**	240,632,259	290,190,395
දේපල, පිරියත හා උපකරණ - කොළඹ නෙළුම් කුලුන	**4.1**	23,613,421,995	11,805,535,127
අස්පෘශ්‍ය වත්කම්	**4.2**	6,841,125	172,502
කෙරිගෙන යන වැඩ	**5**	970,347,921	22,634,607,858
ආයෝජන	**6**	11,563,722,603	8,776,051,081
මුළු ජංගම නොවන වත්කම්		**36,394,965,903**	**43,506,556,963**
ජංගම වත්කම්			
ලැබිය යුතු ගිණුම්	**7**	3,104,691,601	2,350,218,958
පූර්වගෙවුම් සහ අත්තිකාරම්	**8**	77,629,209	1,277,958,601
ණය සහ අනෙකුළුහ් ලැබීම්	**9**	1,305,304,693	266,701,487
මුදල් සහ මුදල් සමානුපාත	**10**	2,691,954,967	5,228,410,528
මුළු ජංගම වත්කම්		**7,179,580,469**	**9,123,289,575**
මුළු වත්කම්		**43,574,546,372**	**52,629,846,537**
සම කොටස් සහ වගකීම්			
සම කොටස්			
රජයේ දායක මුදල්	**11**	526,214,744	526,214,744
සමුච්චිත අතිරික්තය		31,137,553,343	31,496,927,534
ප්‍රත්‍යාගණන අතිරික්තය		37,380,000	37,380,000
මුළු සම කොටස්		**31,701,148,087**	**32,060,522,278**
ජංගම නොවන වගකීම්			
ව්‍යාපෘති ණය - එක්සිම් බැංකුව (නෙළුම් කුලුන)		5,105,962,811	3,043,136,756
රඳවා ගැනීම්	**12**	17,448,766	63,601,567
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	**13**	38,665,062	25,088,960
නාගරික සංවර්ධන අධිකාරිය		0	9,450,000,000
මුළු ජංගම නොවන වගකීම්		**5,162,076,639**	**12,581,827,283**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
2022 දෙසැම්බර් 31 දිනට
(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)

	සටහන්	2022.12.31 දිනට	2021.12.31 දිනට
ජංගම වගකීම්			
ගෙවිය යුතු ගිණුම්	**14**	51,419,723	163,502,233
අත්තිකාරම්, තැන්පතු සහ වෙනත් ගෙවීම්	**15**	1,109,071,697	4,296,813,373
භාණ්ඩාගාරය සඳහා ගෙවිය යුතු මුදල්	**16**	1,763,592,926	1,410,725,771
නෙළුම් කුලුනේ ප්‍රමාද හානි වගකීම්		3,787,237,300	2,116,455,600
මුළු ජංගම වගකීම්		**6,711,321,646**	**7,987,496,976**
මුළු වගකීම්		**11,873,398,285**	**20,569,324,259**
මුළු සම කොටස් සහ වගකීම්		**43,574,546,372**	**52,629,846,537**

මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් සමස්ථ මූල්‍ය ප්‍රකාශනයේ කොටසකි. කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශනය මඟින් 2022 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය තුළ සිදු කරන ලද කාර්යයන් පිළිබඳව සත්‍ය හා සාධාරණ සමාලෝචනයක් කර ඇති බවත් කාලපරිච්ඡේදය සඳහා අතිරික්ත එතැන් සිට අවසන් වන බවත් සහතික කරමි.

.....
ඒ. උතයරාජන්
අධ්‍යක්ෂ - මූල්‍ය

මෙම මූල්‍ය ප්‍රකාශය පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීමේ වගකීම කොමිෂන් සභාව සතුවේ. කොමිෂන් සභාව වෙනුවෙන් අනුමත කර අත්සන් කරන ලදී.

.....	.....	.....
මහාචාර්ය එන්.ඩී. ගුණවර්ධන	**ආර්.ජී.ඒ.ඒ.කේ. රණතුංග**	**අසංක බිමල් රාජසිංහ**
සභාපති	**අධ්‍යක්ෂ ජනරාල්**	**කොමිෂන් සභා සාමාජික**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
ලාභ හෝ අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා
(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)

	සටහන්	2022.12.31 දිනට	2021.12.31 දිනට
ආදායම			
ආදායම	17	38,414,628,131	33,700,521,871
මුළු මෙහෙයුම් ආදායම		**38,414,628,131**	**33,700,521,871**
අඩු කළා: නියාමන වියදම්	18	(209,596,429)	(50,060,177)
මුළු ශුද්ධ මෙහෙයුම් ආදායම		**38,205,031,702**	**33,650,461,694**
අඩු කළා: වෙනත් වියදම්			
පරිපාලන හා ස්ථාපිත කිරීම	19	1,822,878,544	660,795,995
මූල්‍ය සහ වෙනත් වියදම්	20	119,961,363	39,143,093
විදේශ විනිමය ගනුදෙනු (ලාභය)/අලාභය		4,565,034,424	658,340,611
(වැඩි)/අඩු ප්‍රතිපාදන		0	(4,094,920)
මුළු වියදම		**6,507,874,331**	**1,354,184,780**
අඛණ්ඩ මෙහෙයුම් තුළින් වර්ෂය සඳහා ලාභය ආදායම් බදු ගෙවීමට පෙර		**31,697,157,371**	**32,296,276,914**
අඩු කළා: ආදායම් බදු - වර්ෂය සඳහා ගාස්තු		0	(1,748,639,905)
පසුගිය වර්ෂය වැඩි වෙන්කිරීම් ගැළපීම		(159,117,368)	(2,743,489,107)
අඛණ්ඩ මෙහෙයුම් තුළින් වර්ෂය සඳහා ලාභය ආදායම් බදු ගෙවීමට පසු		**31,538,040,003**	**27,804,147,902**
වෙනත් විස්තීර්ණ ආදායම			
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් මත ලාභය/(අලාභය)		4,796,706	5,051,557
වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීර්ණ ආදායම		**4,796,706**	**5,051,557**
බදු ගෙවීමෙන් පසු වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම		**31,542,836,709**	**27,809,199,459**
අඩු කළා: ඒකාබද්ධ අරමුදලට දායකත්වය	21-1	(29,308,503,882)	(22,227,469,125)
ඒකාබද්ධ අරමුදලට දායක කිරීමෙන් පසුව වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම		**2,234,332,827**	**5,581,730,334**
එකතු කරන්න:			
ඉදිරියට ගෙනා මුළු විස්තීරණ ආදායම		**29,903,220,516**	**26,915,197,200**
අඩු කළා: ඒකාබද්ධ අරමුදලට දායකත්වය	21-2	(1,000,000,000)	(1,000,000,000)
		28,903,220,516	**25,915,197,200**
ඉදිරියට ගෙන ගිය මුළු විස්තීර්ණ ආදායම		**31,137,553,343**	**31,496,927,534**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
මුදල් ප්‍රවාහ ප්‍රකාශය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා
(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)

	සටහන්	2022.12.31 දිනට	2021.12.31 දිනට
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් උත්පාදනය වූ මුදල් ප්‍රවාහ			
මෙහෙයුම් තුළින් උත්පාදනය වූ මුදල්	22	32,732,275,082	30,451,955,976
බදු ගෙවීම්		(2,517,398,705)	(1,334,763,912)
ගෙවන ලද අධිභාර බදු		(1,593,707,018)	0
විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම්		(1,720,250)	(3,542,453)
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් උත්පාදිත ශුද්ධ මුදල් ප්‍රවාහය		**28,619,449,110**	**29,113,649,611**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය			
දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම		(35,567,482)	(92,895,960)
කෙරිගෙන යන වැඩ යටතේ ඇති ව්‍යාපෘති		(46,431,042)	(360,234,457)
ස්ථාවර තැන්පතුවල ශුද්ධ ආයෝජනය හා භාණ්ඩාගාර බැඳුම්කර		(2,787,671,522)	(7,276,051,081)
ස්ථාවර තැන්පතු වලින් ලැබෙන පොළී ආදායම		1,341,809,605	156,091,883
ස්ථාවර තැන්පතුවල ආයෝජන - පාරිතෝෂික බැඳීම්		(910,000)	(8,110,000)
ස්ථාවර තැන්පතු වලින් ලැබෙන පොළී ආදායම් - පාරිතෝෂික බැඳීම්		13,057,820	4,200,207
දේපල, පිරියත් සහ උපකරණ අළෙවි කිරීම්		4,650,111	712,200
කුපන් පොලි ආදායම		410,000,000	222,972,603
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යෙදවූ ශුද්ධ මුදල		**(1,101,062,510)**	**(7,353,314,605)**
මූල්‍ය ක්‍රියාකාරකම් මඟින් උත්පාදනය වූ මුදල් ප්‍රවාහ			
අත්තිකාරම් ගෙවීම ලියාපදිංචි කිරීම	23	157,081,430	6,955,098
කොටස් වෙළඳපොල ගණුදෙනු වලින් පොළී අදායම		493,775,933	462,748,634
ඒකාබද්ධ අරමුදල සඳහා ප්‍රේෂණ		(30,308,503,882)	(23,227,469,125)
ව්‍යාපෘති ණය - එක්සිම් බැංකුව (නෙලුම් කුලුන)		(452,549,828)	(1,766,524,679)
රඳවා ගැනීම්		(46,152,801)	852,541
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා යෙදවූ ශුද්ධ මුදල්		**(30,156,349,149)**	**(24,523,437,530)**
මුදල් හා මුදල් සමානුපාත වල ශුද්ධ (අඩුවීම්)/වැඩිවීම		**(2,637,962,550)**	**(2,763,102,523)**
මුදල් හා මුදල් සමානුපාතවල වෙනස්වීම්			
2022 ජනවාරි 01 දිනට		5,228,410,528	7,985,067,767
(අඩුවීම්)/වැඩිවීම්		(2,637,962,550)	(2,763,102,524)
මුදල් හා මුදල් සමානුපාතවල විනිමය අනුපාතය (අලාභය)/ලාභය		101,506,989	6,445,286
2022 දෙසැම්බර් 31 දිනට	**10**	**2,691,954,967**	**5,228,410,528**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
සමානුපාතවල වෙනස්කම් ප්‍රකාශය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)

	රාජ්‍යදායකවීම්	ප්‍රත්‍යාගණන අතිරික්තය	සමුච්චිත අතිරික්තය / (හිඟය)	මුළු සමානුපාත
2021 ජනවාරි 01 දිනට ශේෂය	526,214,744	37,380,000	26,915,197,200	**27,478,791,944**
අඩු කළා: ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම්	-	-	(1,000,000,000)	**(1,000,000,000)**
	526,214,744	**37,380,000**	**25,915,197,200**	**26,478,791,944**
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම	-	-	5,581,730,334	**5,581,730,334**
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**526,214,744**	**37,380,000**	**31,496,927,534**	**32,060,522,278**
2022 ජනවාරි 01 දිනට ශේෂය	526,214,744	37,380,000	31,496,927,534	**32,060,522,278**
2020 වර්ෂය සඳහා අධිභාර බදු	0	0	(1,593,707,018)	**(1,593,707,018)**
	526,214,744	**37,380,000**	**29,903,220,516**	**30,466,815,260**
අඩු කළා: ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම්	-	-	(1,000,000,000)	**(1,000,000,000)**
	526,214,744	**37,380,000**	**28,903,220,516**	**29,466,815,260**
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම	-	-	2,234,332,827	**2,234,332,827**
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**526,214,744**	**37,380,000**	**31,137,553,343**	**31,701,148,087**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - **2022.12.31**
(මෙම සටහන්වල සියළුම වටිනාකම් වෙනත් ආකාරයකින් සඳහන් නොවන්නේනම් මිස ශ්‍රී ලංකා රුපියල් වලින් දැක්වේ)

1. පොදු තොරතුරු

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත ප්‍රකාරව විදුලි සංදේශ ක්ෂේත්‍රය නියාමනය කිරීම සඳහා ස්ථාපනය කරන ලද ස්වාධීන ආයතනයකි.

කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්යාලය අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08 පිහිටා තිබේ.

උක්ත පනතේ සඳහන් පරිදි කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යයන් පහත සඳහන් වේ:

කොමිෂන් සභාව විසින් පනත යටතේ තමා සතු බලතල ජාතික යහපත ප්‍රවර්ධනය කිරීම සඳහා තමා වඩාත්ම යෝග්‍ය යයි තමා සලකන ආකාරයට සහ විශේෂයෙන්,

(අ) ශ්‍රී ලංකාවේ ජාතික හා අන්තර්ජාතික විදුලි සංදේශ සේවාවක් සැපයීම සඳහා සියලුම සාධාරණ ඉල්ලීම් ඉටු කළ හැකි වන පරිදි විශ්වාසය තැබිය හැකි සහ කාර්යක්ෂම සේවාවක්, (එවැනි සේවාවක් සැපයීම ප්‍රායෝගික නොවන අවස්ථාවල හැර) හදිසි සේවා, පොදු දුරකථන කුටි සේවා, නාමාවලි තොරතුරු සේවා, සමුද්‍රීය සේවා, ග්‍රාමීය සේවා සහ වෙනත් ප්‍රදේශවල ජාතික යහපත පිණිස අවශ්‍ය යයි සළකනු ලබන සේවා ඇතුළුව, සපයනු ලබන බවට වගබලා ගැනීම.

(ආ) (අ) ඡේදයේ ව්‍යාප්තියට හානියක් නොමැතිව, සෑම ක්‍රියාකරුවකුගේම බලපත්‍රයේ සඳහන් කර ඇති සේවාවන් සපයනු ලැබීම නිසැක කිරීම සඳහා, එකී සෑම ක්‍රියාකරුවෙකුටම අවශ්‍ය තාක්ෂණික, මූල්‍ය සහ කළමනාකරණ සම්පත් ඇති බවට සහ ඔහු විසින් ඒවා යොදා ගනු ලබන බවට වග බලා ගැනීම.

(ඇ) අය කරනු ලබන ගාස්තු සහ සපයනු ලබන විදුලි සංදේශ සේවාවන් සහ විදුලි සංදේශ උපකරණ වල තත්වය හා විවිධත්වය සම්බන්ධයෙන් පාරිභෝගිකයන්ගේ, ගැනුම්කරුවන්ගේ සහ වෙනත් පාර්ශ්වයන් කරන්නන්ගේ සම්බන්ධතාවයන් හා පොදුවේ මහජන යහපත ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

(ඈ) විදුලි සංදේශ සේවා හා සම්බන්ධ වාණිජ කටයුතු වල නිරත තැනැත්තන් අතර ඵලදායී තරහකාරිත්වයක් පවත්වා ගෙන යාම සහ ප්‍රවර්ධනය කිරීම සහ ඒ තැනැත්තන්ගේ කාර්යක්ෂමතාවය සහ පිරිමැසුම්දායක බව ප්‍රවර්ධනය කිරීම.

(ඉ) අභ්‍යන්තර සහ ජාත්‍යන්තර විදුලි සංදේශ පහසුකම් පිළිබඳ සීඝ්‍ර සහ අඛණ්ඩ සංවර්ධනයක් ප්‍රවර්ධනය කිරීම.

(ඊ) අත්‍යාවශ්‍ය ප්‍රමාදයන් හෝ බාධාවන් හෝ අවහිරවලින් තොර විශ්වාසදායක සහ කාර්යක්ෂම සේවාවක් සැපයීම තම වගකීම් ඉටු කිරීමට ක්‍රියාකරුවන්ට හැකිකම ඇති බවට නිසැක කිරීම.

(උ) විදුලි සංදේශ සහ ඒ හා සම්බන්ධ ක්ෂේත්‍ර ගැන නව තාක්ෂණික ක්‍රම පිළිබඳ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සහ ඒ නව තාක්ෂණික ක්‍රම වැඩිදියුණු කිරීම සහ ඒ ක්‍රම භාවිතා කිරීම.

(ඌ) ශ්‍රී ලංකාවෙන් පිටත සිය ව්‍යාපාරික ස්ථාන ඇති, විදුලි සංදේශ සේවා බහුල වශයෙන් පාවිච්චි කරන්නන් ශ්‍රී ලංකාව ඇතුළත ව්‍යාපාරික ස්ථාන පිහිටු වීම පිණිස දිරිගැන්වීම.

(එ) ජාත්‍යන්තර සංක්‍රාන්ති සේවා සඳහා ශ්‍රී ලංකාව යොදා ගැනීම ප්‍රවර්ධනය කිරීම.

2. අනුකූලතා ප්‍රකාශනය - පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (“SLFRS”සහ “LKAS”) සහ 1995 අංක 19 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත සහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයීය ගිණුම්කරණ ප්‍රමිති (SLPSAS’s) අවශ්‍යතා අනුව කොමිෂන් සභාව සිය මූල්‍ය ප්‍රකාශන සකස් කරයි.

3. විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදා ගන්නා ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දැක්වේ. මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනත් ආකාරයකින් සඳහන් නොවන්නේනම් මිස ඉදිරිපත් කළ වර්ෂය සඳහා නිත්‍ය වශයෙන් අදාල වී ඇත.

3.1 පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (“SLFRS”සහ “LKAS”) අනුකූලව පිළියෙල කර ඇති මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ පිළියෙල කර ඇත. මෙම ගිණුම්වලට බලපාන උද්ධමනකාරී සාධකයන් සඳහා ගැලපීම් කර නැත.

3.1.1 විදේශ විනිමය පරිවර්තනය කිරීම

ගණුදෙනු සිදුවූ අවස්ථාවේ පැවති විදේශ විනිමය අනුපාතය සියළු විදේශ මුදලින් වූ ගණුදෙනු සඳහා යොදාගෙන ඇත. ශේෂ පත්‍ර දිනට පවතින විනිමය අනුපාතිකය අනුව විදේශ මුදලින් ඇති වත්කම් සහ වගකීම් පරිවර්තනය කරයි. ප්‍රතිඵල ලෙස ඇතිවන ලාභය හෝ අලාභය ආදායම් වියදම් ගිණුමේ දක්වා ඇත.

3.2 වත්කම් සහ ඒවායේ තක්සේරු පදනම

3.2.1 දේපල, පිරියත සහ උපකරණ

(අ) හඳුනාගැනීමේ මිනුම

සියලුම දේපළ, පිරියත සහ උපකරණ සමුච්චිත ක්ෂය පිරිවැය හෝ හානිකරන අලාභය මත සටහන් කරනු ලැබේ. දේපළ, පිරියත සහ උපකරණ පිළිබඳ පිරිවැය එහි ගැනුම් මිල සහ පරිහරණය කිරීමට අපේක්ෂිත වත්කම්වල සේවා තත්ත්වය මත සෘජු ආරෝපිත පිරිවැයෙන් සමන්විත වේ.

කොමිෂන් සභාව වෙත අයිතමය හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ ගෙනයාමට හෝ ගලා ඒම සඳහා ස්ථීර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීම, දීර්ඝ කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා දරන ලද පසුකාලීන පිරිවැය ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ. ප්‍රතිස්ථාපනය කරන ලද කොටස් රැගෙන යන ප්‍රමාණය හඳුනා නොගනී. අනෙකුත් සියලුම අළුත්වැඩියා කිරීම් සහ නඩත්තු කිරීම් ඔවුන් දරනු ලබන මූල්‍ය කාල සීමාව තුළ විස්තීරණ ආදායමට අය කෙරේ.

විගණන කමිටුවේ උපදෙස් පරිදි, පසුගිය වසරේ විගණකාධිපති දෙපාර්තමේන්තුවේ එකගතාවය ලබා ගැනීම පිණිස ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රත්‍යාගණන ප්‍රතිපත්ති කෙටුම්පත සඳහා විගණකාධිපතිගේ මතය ලැබෙන තුරු, මූල්‍ය අංශය විසින් එම ක්‍රියාවලිය ආරම්භ කරන ලද අතර එම ප්‍රත්‍යාගණන ක්‍රියාවලිය සම්බන්ධ කටයුතු තක්සේරු දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණය කර සකස් කරන මෙන් පාලන අංශයෙන් ඉල්ලා සිටින ලදී.

(ආ) ක්ෂය වීම්

ඉඩම් ක්ෂය කිරීමට නොහැකිය. සෙසු වත්කම් ක්ෂයකිරීමේදී ලාභය හෝ අලාභය දේපළ, පිරියත සහ උපකරණ අයිතමවල එක් එක් කොටස්වල ඵලදායී ජීවිත කාලය පුරා ක්ෂය කිරීමේ සරල රේඛීය ක්‍රමය මත හඳුනාගනු ලැබේ. අත්පත් කර ගන්නා වර්ෂයේදී ක්ෂය කිරීම වත්කම පරිහරණයට ගන්නා ලද මාසයේ සිට සමානුපාතික පදනම මත ගණනය කරනු ලබන අතර අදාල වත්කම ඉවත් කරන මාසයේදී ක්ෂය කිරීම සිදු නොකරයි.

(ඇ) දේපළ, පිරියත සහ උපකරණවල ඇස්තමේන්තු කළ ඵලදායී ජීවිත කාලය

නෙලුම් කුලුණු ගොඩනැගිලි සහ ව්‍යුහය	වසර 50 වැඩි
ගොඩනැගිලි	වසර 20 වැඩි
විදුලි සංදේශ කුලුනු	වසර 10 වැඩි
ලී බඩු සහ සවි කිරීම්	වසර 10 වැඩි
කාර්යාල උපකරණ	වසර 10 වැඩි
ගිනි ආරක්ෂණ පද්ධතිය	වසර 10 වැඩි
මුළුතැන්ගෙයි උපකරණ	වසර 10 වැඩි
වායුසමීකරණ යන්ත්‍ර	වසර 10 වැඩි
විදුලි උත්පාදන යන්ත්‍ර	වසර 10 වැඩි
විදුලි සෝපාන යන්ත්‍ර	වසර 10 වැඩි
කාර්යාල දුරකථන	වසර 10 වැඩි
තාක්ෂණික උපකරණ	වසර 10 වැඩි
මෝටර් රථ	වසර 08 වැඩි
පරිගණක	වසර 04 වැඩි
වෙබ් සර්වර්	වසර 04 වැඩි
කාය වර්ධන උපකරණ	වසර 04 වැඩි
මාධ්‍ය ඒකකයේ උපකරණ	වසර 04 වැඩි

(ඈ) අස්පෘශ්‍ය වත්කම්

අත්පත් කරගත් පරිගණක මෘදුකාංග බලපත්‍ර ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ නිශ්චිත මෘදුකාංගයක් අත්පත් කර ගැනීමට සහ ඒවා භාවිතා කිරීමට ගෙන ඒමට දරන පිරිවැය මත ය. එම වියදම් වසරක කාලයක් තුළ පියවනු ලැබේ.

(ඉ) කෙරිගෙන යන ප්‍රාග්ධන වැඩ

කෙරිගෙන යන ප්‍රාග්ධන වැඩවල පිරිවැය සඳහන් වේ. මෙය ප්‍රාග්ධනය අපේක්ෂාවෙන් ගොඩනැගිලි ඉදිකිරීම සහ පද්ධති සංවර්ධනයෙහිලා සෘජුවම වැය කරන ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් වේ.

(ඊ) ශේෂපත්‍රයෙහි වත්කම් හෝ වගකීම් ඉවත් කිරීම

දේපල, පිරියත සහ උපකරණ අයිතමයක ප්‍රකාශ කරන වටිනාකම එහි පරිහරණය මත තවදුරටත් හඳුනාගනු නොලැබේ. දේපල, පිරියත සහ උපකරණවල ප්‍රකාශ කරන වටිනාකම සමඟ පරිහරණය කිරීමේ ලාභ ප්‍රයෝජන සැසඳීමෙන් දේපල, පිරියත සහ පාඩුව නිරණය වන අතර "වෙනත් ආදායම්"ලාභය හෝ පාඩුව තුලින් ශුද්ධ ලාභය හඳුනා ගනු ලැබේ.

3.2.2 ආයෝජන

කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද තාවකාලික අරමුදල් කළමනාකරණ මාර්ගෝපදේශයට අනුකූලව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සියලුම ආයෝජන කටයුතු සිදු කරනු ලැබේ.

ගමට සන්නිවේදනය නම් ජාතික ව්‍යාපෘතිය සඳහා වෙන් කර ඇති රු. 7,400,000 ස්ථාවර තැන්පතු මුදලින් ආයෝජන ශේෂය දැක්වේ. එමෙන්ම රජයේ භාණ්ඩාගාරයේ හදිසි අරමුදල් අවශ්‍යතාවයක් හේතුවෙන් රජයේ භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනයක් කිරීමට සිදුවී තිබිණි. ඒ අනුව, භාණ්ඩාගාර ලේකම් විසින් යෝජනා කරන ලද පරිදි, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් භාණ්ඩාගාර බැඳුම්කරය සමග තැන්පතුවක් වශයෙන් කල් පිරෙන විට මුදල් බවට පත් වනු ලබන රුපියල් මිලියන 4000ක අරමුදල ප්‍රේෂණය කරන ලදී. එම අරමුදල ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරන සෙසු ජාතික ව්‍යාපෘති සඳහා මූලිකව වෙන් කර යොදවන ලදී.

මෙම බැඳුම්කරය වට්ටමක් සහිතව නිකුත් කර ඇති අතර එම නිසා එම බැඳුම්කරයේ පියවීමේ වටිනාකම රු. 4,276,051,080 ක් වන අතර එහි මුහුණත වටිනාකම රු.4,000,000,000. ඉතිරි වට්ටම් මුදල රු. 163,722,603 ආයෝජනයට එකතු කර ඇති අතර එය කල් පිරෙන තෙක් බැඳුම්කර ජීවන චක්‍රය පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ. සමාලෝචිත කාල සීමාව වෙනුවෙන් වට්ටම් ක්‍රමක්ෂය කිරීම සඳහා අදාළ වන රු. 112,328,477 වටිනාකම මූල්‍ය පිරිවැය ලෙස වර්ගීකරණය කර ඇත.

ඉහත ස්ථාවර තැන්පතුවලින් ලැබෙන පොලී ආදායම සහ භාණ්ඩාගාර බැඳුම්කරයෙන් ලබාගත් ආයෝජනය කරන ලද අරමුදල් මත ලැබෙන පොලී ආදායම අංක 17 අ (1) විවිධ ආදායම් සටහන් යටතේ සටහන් කර ඇත.

3.2.3 ලැබිය යුතු ගිණුම්

ලැබිය යුතු ගිණුම් හඳුනාගෙන පවත්වාගෙන යනු ලබන්නේ එක්රැස් කර ගත නොහැකි සියළුම වටිනාකම් සඳහා වන සියළුම දීමනා අඩුකිරීමෙන් පසුව මුල් බිල්පත් වටිනාකම් මතය. සම්පූර්ණ වටිනාකම රැස්කිරීම තවදුරටත් අපේක්ෂා කල නොහැකි විට අඩමාන ලැබීම් පිළිබඳ ඇස්තමේන්තු පිළියෙල කරනු ලැබේ.

3.2.4 මුදල් සහ මුදල් සමානුපාත

මුදල් සහ මුදල් සමානුපාත අතැති මුදල් සහ බැංකු තැන්පතු වලින් සමන්විත වේ.

3.3 වගකීම් සහ වෙන් කිරීම්

ශේෂපත්‍ර දිනට පවතින සියලුම ප්‍රමාණාත්මක වගකීම් මූල්‍ය ප්‍රකාශනයේ ඇතුලත් කර ඇති අතර ශේෂපත්‍ර දිනට පවතින නමුත් වටිනාකම නිවැරදිවම අගය කළ නොහැකි වගකීම් සඳහා ප්‍රමාණවත් වෙන් කිරීමක් සිදු කොට ඇත.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සඳහන් දින සිට වසරක් ඇතුලත ඉල්ලුම් මත ගෙවිය යුතු බැඳීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් වශයෙන් සැලකේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දින සිට වසරකට පසු ගෙවිය යුතු වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල ජංගම නොවන වගකීම් වශයෙන් සැලකේ.

3.3.1 ප්‍රාග්ධන බැඳියාවන් සහ අසම්භාව්‍ය බැරකම්

මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ දිනට ඇති ප්‍රාග්ධන වියදම් බැඳියාවන් සහ අසම්භාව්‍ය බැරකම් ගිණුම් සඳහා සටහන් ලෙස අංක 3.7 යටතේ හෙළිදරව් කර ඇත.

3.3.2 කාර්ය මණ්ඩල ප්‍රතිලාභ

(අ) විශ්‍රාම ගැනීමේ පාරිතෝෂික වෙන් කිරීම

වර්ෂය තුල විශ්‍රාම ගැනීමේ පාරිතෝෂික වෙන් කිරීම පහත දැක්වේ.

	2022 (රු.)	2021 (රු.)
මූල්‍යය වර්ෂය ආරම්භයේදී ශේෂය	**99,939,358**	**94,824,253**
ජංගම සේවා පිරිවැය	3,771,394	3,788,794
පොළී පිරිවැය	7,422,674	5,720,115
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වෙනත් ආදායම් ලෙස අයකිරීම්	**111,133,426**	**9,508,909**
තථ්‍ය අලාභ / (ලාභ)	(4,796,706)	(5,051,557)
ගෙවන ලද ප්‍රතිලාභ	(1,720,250)	(3,542,453)
එකතු කළා: පාරිතෝෂික බැඳීම් ආවරණය කිරීමට ආයෝජන මත උපයාගත් පොලිය	13,057,820	4,200,207
මූල්‍යය වර්ෂය අවසානයේදී ශේෂය	**117,674,290**	**99,939,358**

1983 අංක 12 දරන පාරිතෝෂික පනත ප්‍රකාරව සුදුසුකම් සපුරන ලද සියලුම සේවකයින් සඳහා අවශ්‍ය පරිදි විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්ම කොමිෂන් සභාව විසින් සම්මත කර ඇත. විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්ම මගින් අරමුදල් සපයනු ලැබේ.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මගින් සේවකයෙකු විශ්‍රාම ගැනීම මත ලබාගන්නා ප්‍රතිලාභවල වටිනාකම විස්තර කෙරේ. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිළිබඳ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල හඳුනාගත් වගකීම් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති - LKAS 19: සේවක ප්‍රතිලාභවල නියම කර ඇති පරිදි පුරෝකථනය කළ ඒකක බැර ක්‍රමය භාවිතා කරමින් කොමිෂන් සභාව විසින් වාර්ෂිකව ගණනය කරනු ලැබේ.

පසුගිය වර්ෂයේ අධි හෝ ඌන වෙන් කිරීම් නිසා සිදුවන වෙනස්කම් මගින් පැන නගින ලාභය හෝ අලාභය එය සිදුවන කාලපරිච්ඡේදයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සඳහා අය කිරීම හෝ බැර කිරීම කරනු ලැබේ. විස්තීර්ණ ආදායම් ප්‍රකාශනවල වර්ෂය සඳහා පාරිතෝෂික අය කිරීම ක්ෂණිකව හඳුනාගනු ලැබේ. කොමිෂන් සභාව විසින් පාරිතෝෂික බැඳීම් සඳහා සමාන වටිනාකම් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරනු ලැබේ.

පහත සඳහන් ප්‍රධාන තථ්‍ය උපකල්පනයන් සැලකිල්ලට ගෙන කොමිෂන් සභාව විසින් පාරිතෝෂික වෙන් කිරීම් සිදු කරනු ලැබේ.

වට්ටම් අනුපාතිකය	-	වාර්ෂිකව සියයට 10.25%
වැටුප් වර්ධක අනුපාතය	-	1% - 6.7% දක්වා
විශ්‍රාම ගැනීමේ වයස	-	අවුරුදු 60

(ආ) නිශ්චිත දායකත්ව සැලසුම්

නිශ්චිත සහභාගී සැලසුමක් සඳහා සහභාගිත්වය පිළිබඳ බැඳීම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ සිදු කරන ලද වියදමක් වශයෙන් හඳුනාගනු ලැබේ.

(ඇ) සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල (ETF)

කොමිෂන් සභාවේ සියළුම සේවකයන් සේවක අර්ථසාධක අරමුදලේ හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ සාමාජිකයන් වේ.

කොමිෂන් සභාව සේවකයින්ගේ මූලික වැටුපෙන් 15%ක් සහ 3%ක් සේවක අර්ථසාධක අරමුදලට (EPF) සහ සේවක භාරකාර අරමුදලට (ETF) පිළිවෙළින් දායක වන අතර සේවකයා සේවක අර්ථසාධක අරමුදල සඳහා 10%කින් දායක වේ.

3.4 ආදායම හඳුනා ගැනීම

3.4.1 සටහන් 3.4.1.2 හා 3.4.1.4 හි ආදායම් අයිතමය හැර, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 ප්‍රකාරව ආදායම හඳුනාගෙන ඇත

3.4.1.1 සංඛ්‍යාත බලපත්‍ර ගාස්තු

1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ සංශෝධන පනතින් සංශෝධනය කරන ලද 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 22 වන වගන්තිය ප්‍රකාරව, සංඛ්‍යාත බලපත්‍ර ගාස්තු යනු යම් කිසි ගුවන් විදුලි සංඛ්‍යාතයක් හෝ ගුවන් විදුලි සංඛ්‍යාත විමෝචන උපකරණයක් පරිහරණය කිරීම සඳහා සංඛ්‍යාත පරිහරණය කරන්නකු විසින් ගෙවිය යුතු බලපත්‍ර ගාස්තුවකි. එබැවින්, 2019 වර්ෂයේ සිට, නැව් මධ්‍යස්ථාන ගාස්තු සහ ගුවන් යානා බලපත්‍ර ගාස්තු ගුවන් විදුලි සංඛ්‍යාත බලපත්‍ර ගාස්තු යටතේ වර්ගීකරණය කර ඇත.

වර්ෂය තුළ එකතු කරන ලද කිසියම් සංඛ්‍යාත බලපත්‍ර ගාස්තුවක බලපත්‍ර කාලය ලබන වසර දක්වා ක්‍රියාත්මක වන්නේ නම්, ඊළඟ වසර සඳහා අදාළ සමානුපාතික මුදල අත්තිකාරම් ආදායම ලෙස හඳුනාගෙන අත්තිකාරම්, තැන්පතු සහ ගෙවිය යුතු වෙනත් ශීර්ෂ යටතේ වර්ගීකරණය කෙරේ.

3.4.1.2 ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු

1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17 වන වගන්තිය ප්‍රකාරව විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් වලට නව බලපත්‍ර නිකුත් කිරීමේදී හෝ පවතින බලපත්‍ර වසර 10ක් හෝ අවුරුදු 05ක් සඳහා අලුත් කිරීමේදී මුදල් පදනම මත ක්‍රියාකරු බලපත්‍ර අලුත් කිරීමේදී මුදල් පදනම මත හඳුනාගනු ලැබේ.

3.4.1.3 වෙළඳ බලපත්‍ර ගාස්තු/රැහැන් රහිත දුරකථන බෙදාහරින්නන්ගේ ගාස්තු/කෙටි සංකේත අංක ගාස්තු/බලපත්‍ර සකස් කිරීමේ ගාස්තු

1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 21 වන වගන්තිය ප්‍රකාරව කිසියම් තැනැත්තෙකුට බලපත්‍ර නිකුත් කිරීමේදී වෙළෙඳ බලපත්‍ර ගාස්තු මුදල් පදනම මත හඳුනාගනු ලැබේ.

3.4.1.4 සෙස් ගාස්තු

1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ සංශෝධන පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 22 (ඇ) කොන්දේසි ප්‍රකාරව සෙස් ගාස්තු හඳුනාගනු ලැබේ.

3.4.2 විදුලි සංදේශ බදු

2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනත යටතේ විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම්වලින් ලැබෙන විදුලි සංදේශ බදු ආදායමක් වශයෙන් හඳුනාගෙන ඇති අතර පසුව රජයේ ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කර ඇත.

විදුලි සංදේශ සේවා මත විදුලි සංදේශ බදු අනුපාතය 2018.11. 05 දින සිට බලපැවැත්වෙන පරිදි සියයට 25 සිට සියයට 11.25 දක්වා අඩු කරන ලද අතර 2019.11.27 දින පවත්වන ලද අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කරන ලද පරිදි 2001 අංක 21 දරන විදුලි

සංදේශ බදු පනතේ සංශෝධනයක් සහිතව 2019.12.01 දින සිට බලපවත්වන පරිදි එය නැවත සියයට සියයට 15 සිට සියයට 11.25 දක්වා අඩු කරන ලදී.

ලංකා කේබල් සැටලයිට් නෙට්වර්ක් (පෞද්ගලික) සමාගම, ආස්ක් කේබල් විෂන් (පෞද්ගලික) සමාගම, සුප්‍රීම්සැට් (පෞද්ගලික) සමාගම, ලංකා බ්‍රෝඩ්බෑන්ඩ් නෙට්වර්ක්(පෞද්ගලික) සමාගම සහ සිටි කේබල් ලින්ක්ස් (පෞද්ලගික) සමාගම විසින් නොගෙවන ලද විදුලි සංදේශ බදු හා සෙස් ගාස්තු අය කර ගැනීමේ ක්‍රියාවලියක් ආරම්භ කර ඇත.

2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව ලංකා කේබල් සැටලයිට් නෙට්වර්ක් (පෞද්ගලික) සමාගම සහ ලංකා බ්‍රෝඩ්බෑන්ඩ් නෙට්වර්ක් (පෞද්ගලික) සමාගම විසින් විදුලි සංදේශ බදු ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් නීතීමය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

3.4.3 විදුලි සංදේශ සංවර්ධන ගාස්තු

2004 අංක 11 දරන මුදල් පනතේ iii කොටස යටතේ බාහිර ප්‍රවේශ ක්‍රියාකරුවන්ගෙන් ලැබෙන විදුලි සංදේශ සංවර්ධන ගාස්තු ආදායමක් වශයෙන් හඳුනා ගන්නා ලදී. මෙම ආදායමෙන් සියයට 50 ප්‍රතිශතයක් ගෙවිය යුතු නියමිත දිනයට හෝ එදිනට පෙර රජයේ ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරනු ලැබේ.

3.4.4 ජාත්‍යන්තර පිටතට යැවෙන ඇමතුම් බදු

2004 අංක 11 දරන මුදල් පනතේ iii කොටස සහ 2011 දෙසැම්බර් 29 වන දිනැති අංක 1738/15 අතිවිශේෂ ගැසට් නිවේදනයේ ප්‍රසිද්ධ කර ඇති රීති යටතේ බාහිර ප්‍රවේශ දුරකථන ක්‍රියාකාර සමාගම්වලින් ලැබෙන ජාත්‍යන්තර පිටතට යැවෙන ඇමතුම් බදු ආදායමක් වශයෙන් හඳුනාගෙන ඇති අතර ගෙවිය යුතු නියමිත දිනයට හෝ එදිනට පෙර රජයේ ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරන ලදී.

2004 අංක 11 දරන මුදල් පනත යටතේ 2019 මැයි 14 දින අතිවිශේෂ ගැසට් අංක. 2123/19 මගින් ප්‍රසිද්ධ කරන ලද 2019 අයවැය තීරණය ප්‍රකාරව 2019.06.01 දින සිට බලපවත්වන පරිදි පිටතට යැවෙන දේශීය ප්‍රවේශ ගාස්තු (OLAC) අවලංගු කරන ලදී.

3.4.5 කෙටි පණිවුඩ සේවා (SMS) ප්‍රමාණය මත බදු

2018 අංක 35 දරන මුදල් පනතේ xiii කොටස යටතේ 2019.01.01 දින සිට බලපවත්වන පරිදි කෙටි පණිවුඩ සේවා (SMS) ප්‍රමාණය මත බදු පනවන ලද අතර අතිවිශේෂ ගැසට් අංක 2104/1 හි රීති ප්‍රසිද්ධ කරන ලදී.

3.4.6 ජංගම දුරකථන කුලුනු බදු

2018 අංක 35 දරන මුදල් පනතේ xii කොටස යටතේ 2019.01.01 දින සිට බලපවත්වන පරිදි ජංගම දුරකථන කුලුනු බදු පනවන ලද අතර අංක 2104/16 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ රීති ප්‍රසිද්ධ කරන ලදී.

3.4.7 මාදිලි අනුමැති ගාස්තු

2020 ඔක්තෝම්බර් 09 දිනැති අංක 2196/51 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය යටතේ ගුවන්විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE) මාදිලි අනුමැති රීති 2020 ලෙස හඳුන්වා දෙන ලද මෙම මාදිලි අනුමැති ගාස්තු නව ආදායම් මූලාශ්‍රයකි. ශ්‍රී ලංකාව තුළ ආනයනය කිරීමට, අලෙවි කිරීමට, නිෂ්පාදනය කිරීමට හෝ භාවිතා කිරීමට අදහස් කෙරෙන සියලුම මාදිලියේ ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ සම්බන්ධයෙන් අදාළ වන සියලුම ගාස්තු මෙමගින් ප්‍රකාශ වේ.

මාදිලි අනුමැති පද්ධතිය ක්‍රියාත්මක කිරීම සහ පරිපාලනය කිරීම ඇතුළුව මාදිලි අනුමත කිරීමේ අයදුම්පත් තක්සේරු කිරීම සහ වෙළඳපල ආවේක්ෂණ කටයුතු සඳහා කොමිෂන් සභාව විසින් දරනු ලබන පරිපාලන වියදම් ආවරණය කිරීම මාදිලි අනුමැති ගාස්තුව මගින් අදහස් කෙරේ. මෙම රීතිවල උපග්‍රන්ථය ඈ හි දක්වා ඇති පරිදි, එක් එක් ගුවන් විදුලි හා විදුලි සංදේශ පර්යන්ත උපකරණය සඳහා මාදිලි අනුමැති ගාස්තුව අය කෙරේ. කොමිෂන් සභාව විසින් අවශ්‍ය පරිදි කලින් කල මාදිලි අනුමැති ගාස්තු සමාලෝචනය කළ හැක.

3.4.8 අනෙකුත් ආදායම

අනෙකුත් ආදායම කෙටිකාලීන ස්ථාවර තැන්පතු සහ කොටස් වෙළඳපල තැන්පතු ගිණුම, භාණ්ඩාගාර බැදුම්කර, කොකාවිල් බදු කුලී, මඩුකන්ද බදු කුලී යනාදියෙහි ආයෝජනය කරන ලද අරමුදල් මත ලැබෙන පොලී ආදායමෙන් සමන්විත වන අතර කල්පිරීමේ දිනයේ දී ලාභ හෝ අලාභ එකතු වන බැවින් පොලී ආදායම් හඳුනා ගැනේ.

3.5 වියදම්

වැයවූ පිරිවැය සහ ආදායමේ නිශ්චිත අයිතමයක් උපයා ගැනීම අතර වන සෘජු සම්බන්ධතාවයක පදනම මත විස්තීර්ණ අදායම් ප්‍රකාශය තුළ වියදම් හඳුනාගැනේ. කොමිෂන් සභාව පවත්වාගෙන යාමේදී සහ කාර්යක්ෂම තත්වයෙන් ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීමේදී දරණ ලද සියලු වියදම් වසර සඳහා වන අතිරික්ත ආදායමෙන් අය කරගෙන ඇත.

3.5.1 ආදායම් බදු

2009.04.01 දින සිට බලපවත්වන පරිදි සංශෝධනය කරන ලද 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත යටතේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ලබා දී ඇති බදු වලින් නිදහස් කිරීම 2018/04/01 දින සිට බලපැවැත්වෙන 2017 අංක 24 දරන නව දේශීය ආදායම් පනත බලාත්මක කිරීමත් සමඟ අහෝසි කරන ලදී.

ගරු කථානායකතුමා විසින් සහතික කරන ලද 2021 මැයි 13 වැනි දිනැති 2021 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත ප්‍රකාරව , ඕනෑම රාජ්‍ය සංස්ථාවක් විසින් ඒකාබද්ධ අරමුදලට කරන ලද ගෙවීම් සුදුසුකම්ලත් ගෙවීමක් ලෙස සලකනු ලබන අතර,

2019.04.01 දින සිට බලපැවැත්වෙන පරිදි (ප්‍රධාන පනතේ පස්වන උපලේඛනය සංශෝධනය කිරීම) එම සංස්ථාවේ ආදායම් බද්ද ගණනය කිරීමේදී අඩු කළ හැකිය.

තවද, පෙර 2021 මූල්‍ය වර්ෂයේ දී ආදායම් බදු ගෙවිය යුතු ගිණුමේ රු. 159,117,368 මුදලක් වෙන් කර ඇති අතර,එය වසර තුළ ආදායම් බදු වියදම්වල ගළපා ඇත. එත්මන් වර්ෂය සඳහා වැඩිපුර ගෙවන ලද ආදායම් බදු ප්‍රමාණය රු. 1,077,992,225 කි.

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරන ලද පරිදි ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ බදු කාලය ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා වේ. ඒ අනුව, 2022 වසරේ බදු වගකීම පහත දැක්වේ.

	2022 (රු.)
බදුකරණයට පෙර ගිණුම් ලාභය	**30,135,029,649**
එකතු කළා: බදු අයකළ හැකි ආදායම / (අලාභය) තීරණය කිරීමේදී අනුමත කළ නොහැකි වියදම්වල බදු බලපෑම	649,437,866
අඩුකළා: බදු අයකළ හැකි ආදායම තීරණය කිරීමේදී අනුමත කළ හැකි වියදම්වල බදු බලපෑම	(24,292,433,563)
ආදායම් බදු සඳහා අය කළ හැකි ගැළපුම් කළ ගිණුම් ලාභය / (අලාභය)	**6,492,033,951**
පොලී ආදායම	2,253,614,890
තක්සේරු කළ හැකි ආදායම	**8,745,648,842**
අඩුකළා: සුදුසුකම් ලබන ගෙවීම	(13,200,000,000)
මුළු බදු අය කළ හැකි ආදායම	**(4,454,351,158)**
වර්ෂය සඳහා බදු අනුපාතය	30%
වර්ෂය සඳහා බදු බලපෑම	-
ගෙවන ලද ස්වයං - තක්සේරු බදු වාරික **2022 අගෝස්තු මාසයේදී ගෙවන ලද ආදායම් බදු ගාස්තු (2 වන කාර්තුව)** **ගෙවිය යුතු/ලැබිය යුතු බදු මුදල**	 1,077,992,225 **(1,077,992,225)**

3.5.2 අධිභාර බද්ද

2022 අංක 14 දරන අධිභාර බදු පනත 2022 අප්‍රේල් 8 වන දින පනවන ලද අතර, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට ද වලංගු වේ. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව 2020/2021 තක්සේරු වර්ෂය සඳහා සාමූහික බදු අය කළ හැකි ආදායම ලෙස ගණනය කරන ලද මුදල රුපියල් මිලියන 2,000 ඉක්මවයි. බදු අය කළ හැකි ආදායමෙන් සියයට 25 ක අනුපාතයකින් වගකීම ගණනය කෙරේ.

2022 අංක 14 දරන අධිභාර බද්ද පනතේ 6 වන වගන්තිය ප්‍රකාරව, "මේ පනත යටතේ අයකරනු ලබන බද්ද, 2020 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වූ තක්සේරු වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශයේ වූ වියදමක් ලෙස සලකනු ලැබිය යුතුය."මෙම ප්‍රතිපාදනය වෙනත් ඕනෑම ලිඛිත නීතියක් අභිබවා යනු ඇත.

අධිභාර බදු වගකීම් මත , 2022 මුදල් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ මුළු අධිභාර බදු වගකීම රු. 1,593,707,017.00 වශයෙන් හඳුනා ගැනේ.

3.6 ව්‍යාපෘති

3.6.1 කොළඹ නෙළුම් කුලුන

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (ශ්‍රී.ල.වි.ස.නි.කොා. සභාව) විසින් 2010 ඔක්තෝම්බර් 27 සහ 2011 දෙසැම්බර් 14 දිනැති පිළිවෙලින් යොමු අංක 10/2473/401/301 සහ 11/2262/501/026 දරන අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව "කොළඹ නෙළුම් කුලුන"නමින් මීටර් 350 ක් උසැති බහු කාර්යය රූපවාහිනී සහ විදුලි සංදේශ කුලුන ඉදි කිරීම ආරම්භ කර ඇත. එමෙන්ම අමාත්‍ය මණ්ඩලය විසින් මෙම ව්‍යාපෘතියේ ඉදි කිරීමට කටයුතු China National Electronics Importers & Exports Corporation (CEIEC) හා Aerospace Long March International Trade Co. Ltd. (ALIT) සමාගම්වලට ප්‍රදානය කරන ලදී.

මෙම ඉදිකිරීමේ පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 104.3 වශයෙන් මූලිකව ඇස්තමේන්තු කරන ලද අතර, ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම් ඇපකරුවකු වශයෙන් සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) සහ EXIM බැංකුව විසින් අත්සන් තබන ලද අංක BLA-201207 දරන ගැනුම්කරුවන්ගේ ණය ගිවිසුම යටතේ - Export-Import Bank of China (EXIM) බැංකුව විසින් වසර 14 ක ණයක් මගින් ඇමරිකානු ඩොලර් මිලියන 67,259,754 ක මුදලක් සපයන ලදී. මූලික කොන්ත්‍රාත් ව්‍යාපෘති වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 37.040246 හි ඉතිරිය ශ්‍රී ලංකා විදුලි සංදේශ

නියාමන කොමිෂන් සභාව විසින් දරන ලදී. අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහ 2019/09/25 දිනැති අංක 2K19.264.07(3) දරන කොමිෂන් සභා තීරණය අනුව, ඇමරිකානු ඩොලර් මිලියන 9,355,935.81 ක වෙනස මූලික කොන්ත්‍රාත් වටිනාකමට එකතු කරන ලද අතර 2019/08/03 දිනැති අංක 2k19.262.04 දරන කොමිෂන් සභා තීරණය සහ මොරටුව විශ්ව විද්‍යාලයේ ව්‍යාපෘති උපදේශන ඒකකයේ -PCU (ව්‍යාපෘති ඉන්ජිනේරු) නිර්දේශ ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ඇමරිකානු ඩොලර් 7,525,499.82 ක මුදල ගෙවන ලදී.

2021.12.31 වන විට ව්‍යාපෘතියේ සම්පූර්ණ කරන ලද ප්‍රතිශතය දළ වශයෙන් 99% කි. අතුරු ගෙවීම් සහතිකපත් 20 ,21 සහ 22 ට පටහැනිව ඇමරිකානු ඩොලර් 10,430,000 ක සමුච්චිත ප්‍රමාද හානි අය කර ගන්නා ලදී. නමුත් ගිවිසුම්ගත බැඳීම් මෙතෙක් අවසන් කර නොමැති අතර , 2022.12.31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ ජංගම වගකීමක් වශයෙන් අඩු කරන ලද ප්‍රමාද හානිවලට සමාන ප්‍රමාණයකට ප්‍රතිපාදන සලසා ඇත. ම නමුත් සාකච්ඡා සහ හාරදීමේ ක්‍රියාවලිය අවසන් කර නොතිබූ බැවින්, 2021..12. 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ ජංගම වගකීමක් වශයෙන් අඩු කරන ලද ප්‍රමාද හානිවලට සමාන මුදලක් සඳහා ප්‍රතිපාදන සලසා ඇත. මෙම ප්‍රතිපාදනය සාමාන්‍යයෙන් පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට සහ ස්ථායී සංකල්පයට අනුකූලව සිදු කර ඇත. කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු ඉතිරි මුදල සහ සමුච්චිත ප්‍රමාද හානි කොන්ත්‍රාත්කරු විසින් ගිවිසුම්ගත බැඳීම් ඉටු කරන තෙක් රඳවා තබා ගැනීමට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී. කොන්ත්‍රාත්කරු ඊට එකඟ විය.

මොරටුව විශ්ව විද්‍යාලයේ ව්‍යාපෘති උපදේශන ඒකකයේ (PCU) නිර්දේශය සහ අනුමැතිය මත සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුවේ (CANC) අනුමැතිය මත, HSBC බැංකුවෙන් අවලංගු කළ නොහැකි, ඉල්ලුම් මත රඳවා ගැනීමේ බැංකු ඇපකරයට සමානව කොන්ත්‍රාත්තුවේ කොන්දේසි ප්‍රකාරව රඳවා ගැනීම නිකුත් කරන ලදී. 2021.02.28 දින බැංකු ඇපකරය කල් ඉකුත් වූ අතර, CEIEC ට එරෙහිව ඇමරිකා එක්සත් ජනපදය පනවන ලද සම්බාධක හේතුවෙන්, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට නීතිපතිවරයාගේ මතය සහ එකඟතාවය අනුව ත්‍රෛපාර්ශ්වික කොන්ත්‍රාත්තුවේ අනෙක් පාර්ශවය වන ALIT වෙතින් නව ඇපකරයක් ලබා ගැනීමේ ක්‍රියාවලිය අවසන් කිරීමට නොහැකි විය.

එක්සිම් (EXIM) බැංකු ණය ඇඩො 67,259,754 මුදල අවසන් කළ අතර ඉතිරි කොන්ත්‍රාත් මුදල වන ඇඩො 21,395,247 ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අරමුදල් වලින් ගෙවීම සඳහා 2018.01.11 දිනැති යොමු අංක. 17/3004/701/059 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 23 ප්‍රකාරව, කොළඹ නෙළුම් කුලුන ව්‍යාපෘතිය ඉදිකිරීම පිණිස ලබා ගන්නා ලද එක්සිම් බැංකු ණය මුදල සියයට සියයක වෙන්කළ ණය මුදලක් වන බැවින්, 2022.02.28 දිනට මුළු ණය මුදල් පිරිවැය සහ අදාල වියදම් රු. 21,825,096,346 මුදල සම්පූර්ණයෙන්ම ප්‍රාග්ධනීකරණය කෙරෙනු ඇත.

කොළඹ නෙළුම් කුලුන ව්‍යාපෘතියේ ඉදිකිරීම් හාරගැනීමේ සහතිකය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් 2022 පෙබරවාරි 28 වැනි දින නිකුත් කරන ලදී.

2022 මාර්තු 01 වැනි දින කොළඹ නෙළුම් කුලුනේ ව්‍යාපාරික කටයුතු ආරම්භ කිරීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) සහ පූර්ණ රජය සතු සමාගමක් වන සීමාසහිත කොළඹ නෙළුම් කුලුන කළමනාකාරිත්ව (පුද්ගලික) සමාගම (Colombo Lotus Tower Management Company (Private) Limited)විසින් කළමනාකරණ ගිවිසුමට එළැඹ ඇත.

2021 වර්ෂයේ දී නෙළුම් කුලුන රක්ෂණ වාරික වියදම රු. 28,121,409 ක මුදල ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් දරන ලද අතර එය කොළඹ නෙළුම් කුලුන මුදල් ඉපැයීම් ලැබිය යුතු ගිණුමේ ඇතුළත් කර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සතු දේපළක් නිසා වියදමක් ලෙස හඳුනාගෙන ඇත.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය 23 ට අනුව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් පොළී ගෙවීම වියදමක් වශයෙන් හඳුනාගැනීමෙන් අනතුරුව 2022/02/28 දින සිට අපේක්ෂිත භාවිතය දක්වා (දිනය භාර ගැනීම) රුපියල් 2,793,631,137 ක්වූ ණය වාරිකය ගෙවීමේ ආරම්භයේ සිට ණය පොළී පිරිවැය ප්‍රාග්ධනීකරණය කර තිබිණි.

2023.01.19 දිනැති විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ලිපිය මගින් ශ්‍රී ලංකාවේ විදේශ රාජ්‍ය ණය සඳහා සේවා සැපයීම සම්බන්ධ අතුරු ප්‍රතිපත්ති පිළිබඳ ලිපියේ උපදෙස් පරිදි, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් කොළඹ නෙළුම් කුලුන ණය ආපසු ගෙවීම නැවත දැනුම් දෙන තුරු අත්හිටුවන ලදී.

3.6.2. ඉඩම - නෙළුම් කුලුන

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙනුවෙන් කොළඹ දිස්ත්‍රික් ප්‍රසිද්ධ නොතාරිස් නිලූෆර් ජෙහාන් මහතා විසින් සහතික කරන ලද 2022 ජනවාරි 10 දිනැති අංක 2004 දරන ස්ථාන මාරු ඔප්පුව ක්‍රියාත්මක කර ඇති අතර රුපියල් මිලියන දෙදහස් දෙසිය පනහක (රු. 2,250,000,000/=) මුදල් වටිනාකමින් යුතු අක්කර 4 රූඩ් 3 පර්චස් 24.47 ඉඩම් ප්‍රමාණය සඳහා බලපත්‍රලාභී මිනින්දෝරු පී.එම් . සුනිල් මහතා විසින් සාදන ලද 2015 නොවැම්බර් 5 දිනැති අංක 3115 දිනැති පිඹුරේ දැක්වෙන කැබලි අක්ෂර බී, සී, ඩී, ඊ, ඕ සහ එස් ලෙස සලකුණු කර ඇති ඉඩමේ හිමිකම පවරා දී ඇත. කෙසේ වෙතත්, එම පිඹුරු අංක 3115 හි දැක්වෙන කැබලි අක්ෂර එස් ලෙස සලකුණු කර ඇති ඉඩම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත පැවරීමට නාගරික සංවර්ධන අධිකාරිය තවමත් කටයුතු කර නොමැත.

රජයේ ඉඩම් ආඥාපනතේ 6(1) වගන්තියට අනුව, මිනින්දෝරු දෙපාර්තමේන්තු මූලික සැලැස්ම අංක 9401 හි දැක්වෙන හෙක්ටයාර් 1.1372 ක ප්‍රමාණයකින් යුත් ඉඩමේ කැබලි අංක 1 ලෙස සලකුණු කර ඇති කොටස, අංක 4/10/66549 දරන නිදහස් ප්‍රදානය මත ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ප්‍රදානය කර ඇත.

කොළඹ නෙළුම් කුලුන සඳහා අක්කර 10.7049 ක භූමි ප්‍රමාණයක් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ලබා දී ඇත.

3.6.3 තොරතුරු තාක්ෂණ උද්‍යානය, හම්බන්තොට සූරියවැව

2012.06.14 දිනැති අංක 12/0836/501/019 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව පදනම් කරගෙන අමාත්‍ය මණ්ඩලය විසින් 2012 ජූලි 04 දින පවත්වන ලද අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළැඹි තීරණය ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් විදුලි සංදේශ මාධ්‍ය මධ්‍යස්ථාන ව්‍යාපෘතිය (හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යාන ව්‍යාපෘතිය) ස්ථාපනය කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී.

ව්‍යාපෘති ඉන්ජිනේරු වශයෙන් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLRDC) පත් කරන ලද අතර අනුමත ටෙන්ඩර් පටිපාටිය මත, ඉදිකිරීමේ පිරිවැය රුපියල් 2,493,870,318 සහිතව සීමාසහිත තුඩාවේ සහ සහෝදරයෝ (පෞද්ගලික) සමාගම වෙත ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලදී.

සැලසුම් කර ඇති පරිදි, 2015 ජූනි වන විට ගොඩනැගිල්ලේ තෙවන මහල දක්වා පාදමේ සිට උඩ කොටසේ ගොඩනැගිලි ව්‍යුහය සම්පූර්ණ කරන ලදී. නමුත් මෙම ප්‍රදේශයේ වෙනත් සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කළ ආකාරයට ආරම්භවී නැති බව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, ආයෝජන මණ්ඩලය හා ජනාධිපති ලේකම් කාර්යාලය නිරීක්ෂණය කර ඇති අතර මෙම ව්‍යාපෘතිය ප්‍රතිව්‍යුහගතකරණය කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරන ලදී.

ව්‍යාපෘතියේ වැඩ නිම කරන ලද ප්‍රතිශතය 33% ක් වන අතර, එම වැඩබිමේ ඇති ද්‍රව්‍ය ඇතුළුව මුළු වැඩ කටයුතුවල වටිනාකම රුපියල් මිලියන 423.9 කි.2018 .12. 31 දින වනවිට රඳවා තබා ගැනීම සහ අත්තිකාරම් යෙදවීම් අයකර ගැනීම පිළිවෙලින් රුපියල් මිලියන 46 ක් සහ රුපියල් මිලියන 157 ක් විය.

මෙම ව්‍යාපෘතියේ ඉන්ජිනේරු උපදේශක වශයෙන් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLRDC) ව්‍යාපෘතිය ප්‍රතිව්‍යුහගතකරණය කිරීමේ කටයුතු වල නිරත වන අතර, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ සීමාසහිත තුඩාවේ සහ සහෝදරයෝ (පෞද්ගලික) සමාගම අතර එලැඹුණු කොන්ත්‍රාත්තුව 2016 අගෝස්තු 10 දින අවසන් විය. එබැවින් ව්‍යාපෘති ඉන්ජිනේරු වන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ නිර්දේශය ප්‍රකාරව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට සීමාසහිත තුඩාවේ සහ සහෝදරයෝ (පෞද්ගලික) සමාගම සමග වූ කොන්ත්‍රාත්තුව අවසන් කර තිබිණි.

මෙම ව්‍යාපෘතිය සඳහා දරන ලද මුළු පිරිවැය රුපියල් මිලියන 715 ක් (ආපසු අය කර ගැනීමට ඇති රුපියල් මිලියන 157 අත්තිකාරම් මුදල ඇතුලත්ව) වන අතර සීමාසහිත තුඩාවේ සහ සහෝදරයෝ (පෞද්ගලික) සමාගම නැමැති කොන්ත්‍රාත්කරු, කොන්ත්‍රාත්තුව අවසන් කිරීම පිළිබඳ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ තීරණයට එරෙහිව ආරාවුල් බේරුම්කාර මණ්ඩලය වෙත යොමු කර ඇත.

ආරවුල් බේරුම්කාර මණ්ඩලයේ (DAB) තීරණය සලකා බැලීමෙන් පසු, රු. මිලියන 157 අත්තිකාරම් යෙදවුම් මුදල සඳහා සමහර පිරිවැය මුලිකාංග සහ රඳවා ගැනීමේ මුදල වූ රුපියල් මිලියන 46 හිලව් කිරීමට එකඟ විය. ව්‍යාපෘති ඉන්ජිනේරු - ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් ලබාදුන් උපදෙස් අනුව ඉතිරි මුදල රු. මිලියන 50 ක මුදල බැංකු ඇපකරයක් මගින් ආවරණය කරන ලද අතර මෙම කරුණ යොමු සටහන් අංක.3.7 (ඇ) අනුව බේරුම්කාර විනිශ්චය සභාව වෙත යොමු කරන ලදී.

බේරුම්කරණ කටයුතු 2021 නොවැම්බර් 24 වන දින අවසන් කරන ලදී, දෙපාර්ශවයම තම ලිඛිත ඉදිරිපත් කිරීම් ගොනු කළහ. තවදුරටත් බේරුම්කරණ විනිශ්චය සභාව විසින් නියම කරන ලද පරිදි, ඒකාබද්ධ යෝජනාවක් මගින්

පැමිණිලිකරු (සීමාසහිත තුඩාවේ පුද්ගලික සමාගම) වෙත රුපියල් 411,223,338.90 ක සමස්ථ මුදල 2022 නොවැම්බර් 30 වන දින සිට එම මුදල පැමිණිලිකරු වෙත ගෙවන දින දක්වා වූ නීතිමය පොළී මුදල සහිතව ගෙවන ලෙස වගඋත්තරකරු (TRCSL) වෙත නියම කරමින් බේරුම්කාර විනිශ්චය සභාව විසින් 2022 නොවැම්බර් 30 වන දින ‘ අවසාන තීන්දුව ’ ලබා දෙන ලදී.

එම අවසන් තීන්දුව ලැබීමෙන් අනතුරුව, ඊට අනුකූලව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ගෙවිය යුතු ගෙවීම සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් ඉල්ලා සිටින ලදී. බේරුම්කරණ පනත ප්‍රකාරව එය අභියෝගයට ලක් කිරීමට කිසිදු පදනමක් නොමැති බවත්, ප්‍රදානය කරන දිනයට අනුකූල වීම සඳහා මූල්‍යමය යෝජනා අමුණා ඇති බවත් උපදෙස් දෙන ලදී.

නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් සහ තීන්දුව මගින් නියම කර ඇති කාලරාමුව සහ මූල්‍යමය යෝජනා සැලකිල්ලට ගනිමින්, නීත්‍යානුකූලව පොළී මුදල කපා හැරීමේ ඇති හැකියාව විමසා බැලීම පිණිස පැමිණිලිකරුගේ නීතීඥවරයා වෙත ලිවීමට (අගතියෙන් තොරව) වහාම පියවර ගන්නා ලදී.

ඔවුන්ගේ ප්‍රතිචාරය මත බේරුම්කරණ විනිශ්චය සභාව විසින් ලබා දුන් ‘අවසාන තීන්දුවට’ අනුකූලව සම්පූර්ණ සහ අවසාන පියවීමක් ලෙස සීමාසහිත තුඩාවේ සහෝදරයෝ (පෞද්ගලික) වෙත රුපියල් 340,955,976.75 (SSCL + VAT ඇතුළුව) මුදලක් ගෙවන ලදී.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) වෙනුවෙන් කොළඹ නොතාරිස් ඩී. සුනන්ද රණසිංහ මහතා විසින් සහතික කරන ලද 2014 සැප්තැම්බර් 3 දිනැති අංක 92 දරන ප්‍රදාන ඔප්පුව ක්‍රියාත්මක කර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) විසින් ලියාපදිංචි බලපත්‍රලාභී මිනින්දෝරු සහ තලමිතිකකරු ජී.ජී.එල්. පත්මසිරි මහතා විසින් සාදන ලද 2013 මැයි 4 දිනැති අංක 65/2013 පිඹුරුපත්වල දැක්වෙන කැබලි අක්ෂර J ලෙස සලකුණු කර ඇති ඉඩමේ හිමිකම පවරා ඇත.

රජයේ තක්සේරුකරු විසින් ඉඩමේ වටිනාකම තක්සේරු කරන විට සූරියවැව ඉඩම් පිරිවැය ප්‍රාග්ධනීකරණය කළ යුතුය.

3.7 අවිනිශ්චිත වියදම්

(අ) DC/DMR/6188/2010

Gewaan Engineering සමාගමේ හිමිකරු වන ගාමිණි රාජපක්ෂ මහතා, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වගඋත්තරකරුවකු කරමින්, අංක 6188/2010 දරන නඩුව දිසා අධිකරණයේ ගොනු කර ඇත.

2007 ජූලි 19 දින පැමිණිලිකරු හා වගඋත්තරකරු අතර එළැඹී ගිවිසුම උල්ලංඝනය කිරීම මත ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් ඒ සඳහා වූ හානිය අයකර ගැනීම පිණිස පැමිණිලිකරු මෙම නඩුව ගොනු කර ඇති අතර අපේක්ෂිත සහන යටතේ පැමිණිලිකරු හානිය වෙනුවෙන් අපේක්ෂා කරන මුදල රු. මිලියන 1.5 කි.

2019.04.30 දින පැමිණිල්ලට පක්ෂව තීන්දුව ලබා දෙන ලදී. තීන්දුවට අනුව රු. 71,443.31 සහ නීතිමය පිරිවැය පැමිණිලිකරුට ප්‍රදානය කරන ලදී.

(ආ) HC Civil No. 137/2011

නිත්‍යානුකූල මැදිහත්වීම ඇතිව නඩු තීන්දුවේ දිනය දක්වා රුපියල් බිලියන 47,345,112,000 සම්පූර්ණ මුදල පියවන තෙක් නඩු තීන්දුවේ මුදල රැස්කර ගැනීමේ නඩු තීන්දුව/නියෝගය සඳහා සීමාසහිත ELECTROTEKS සමාගම විසින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට එරෙහිව අංක HC (Civil) 137/11 දරන නඩුව පවරා ඇත. සංඛ්‍යාත බලපත්‍ර ගාස්තුව රු. 172,500,000 සහ රු. 2,300,000 නොපියවීම මත වගඋත්තරකරු විසින් ප්‍රතිස්ථාපනය කිරීමේ ගාස්තුවක් අයකර ඇත. මෙම නඩුව වැඩිදුර විභාග වෙමින් පවතී.

(ඇ) DC/DMR/3277/17

සම්පූර්ණ යාපන අර්ධද්වීපයම සහ යාබද දූපත් සියල්ලම ආවරණය කරන ලද සම්ප්‍රේෂණ මධ්‍යස්ථානයට සිදු වූ හානිය සහ සේවා බිඳ වැටීම මගින් සිදුවූ හානිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් අය කරගැනීමට පැමිණිලිකරු විසින් නඩුවක් ගොනු කර ඇති අතර පැමිණිලිකරු හානි වශයෙන් අපේක්ෂා කරනු ලබන මුදල රු. 14,800,000,000 කි. මෙම නඩුව වැඩිදුර විභාගය සඳහා නවමත් පවතී.

4. දේපල, පිරියත සහ උපකරණ

පිරිවැය	2022.01.01 දිනට ශේෂය	2022 වර්ෂය සඳහා එකතු කිරීම්	2022 වර්ෂය සඳහා ඉවත්කිරීම්/ මාරුකිරීම්	2022.12.31 දිනට ශේෂය
ඉඩම්	148,863,771	0	0	148,863,771
බද්දට ගත් ඉඩම්	345,502	0	0	345,502
ගොඩනැගිලි	150,381,065	0	0	150,381,065
කොකාවිල් කුලුන	314,933,479	0	0	314,933,479
වවුනියා කුලුන	29,900,741	0	0	29,900,741
වාහන	168,717,224	0	(4,516,311)	164,200,913
වායු සමීකරණ	18,179,145	0	(36,000)	18,143,145
විදුලි සෝපාන	4,683,848	0	0	4,683,848
විදුලි උත්පාදක යන්ත්‍ර	2,665,428	0	0	2,665,428
පරිගණක	115,177,200	5,230,844	0	120,408,044
වෙබ් සර්වර්	34,095,551	0	0	34,095,551
වෙනත් කාර්යාල උපකරණ	47,805,480	1,205,566	(90,300)	48,920,746
ජංගම දුරකථන	1,517,309	0	0	1,517,309
කාර්යාල ගෘහ භාණ්ඩ	26,417,049	1,229,377	(7,500)	27,638,925
තාක්ෂණික උපකරණ	73,705,569	1,672,000	0	75,377,569
FMMS ව්‍යාපෘති ආවේක්ෂණ වාහන	61,712,127	0	0	61,712,127
FMMS ව්‍යාපෘති උපකරණ	408,303,544	0	0	408,303,544
කායවර්ධන උපකරණ	5,629,707	0	0	5,629,707
මාධ්‍ය ඒකක උපකරණ	12,865,066	750,000	0	13,615,066
	1,625,898,803	**10,087,787**	**(4,650,111)**	**1,631,336,478**

ක්ෂය කිරීම්	2022.01.01 දිනට ශේෂය	2022 වර්ෂය සඳහා එකතු කිරීම්	2022 වර්ෂය සඳහා ඉවත්කිරීම්/ මාරුකිරීම්	2022.12.31 දිනට ශේෂය
ගොඩනැගිලි	134,998,463	2,005,099	0	137,003,562
කොකාවිල් කුලුන	312,966,720	1,859,865	0	314,826,584
වවුනියා කුලුන	29,900,741	0	0	29,900,741
වාහන	164,382,509	2,718,506	(4,516,311)	162,584,704
වායු සමීකරණ	14,616,177	883,410	(36,000)	15,463,587
විදුලි සෝපාන	4,683,848	0	0	4,683,848
විදුලි උත්පාදක යන්ත්‍ර	2,665,428	0	0	2,665,428
පරිගණක	106,168,979	6,963,904	0	113,132,883
වෙබ් සර්වර්	23,382,117	10,713,433	0	34,095,550
වෙනත් කාර්යාල උපකරණ	33,674,101	2,488,175	(90,300)	36,071,976
ජංගම දුරකථන	1,036,753	87,342	0	1,124,095
කාර්යාල ගෘහ භාණ්ඩ	20,736,835	1,572,332	(7,500)	22,301,667
තාක්ෂණික උපකරණ	50,997,971	5,925,385	0	56,923,356
FMMS ව්‍යාපෘති ආවේක්ෂණ වාහන	47,992,546	13,719,581	0	61,712,127
FMMS ව්‍යාපෘති උපකරණ	369,114,731	10,448,442	0	379,563,173
කායවර්ධන උපකරණ	5,629,707	0	0	5,629,707
මාධ්‍ය ඒකක උපකරණ	12,760,781	260,449	0	13,021,230
	1,335,708,408	**59,645,923**	**(4,650,111)**	**1,390,704,219**
ශුද්ධ පොත් අගය	**290,190,395**			**240,632,259**

සටහන්:

ඉඩම සඳහා අගය වන රු. 148,235,572 තුළ මීගමුව කදිරාන පිහිටා ඇති රු. 45,000,000 වටිනා ඉඩම්වල, වටිනාකම් ද ඇතුලත්ය. එම ඉඩමේ විශාලත්වය අක්කර 112 රූඩ් 02 පර්චස් 10.5කි. ඉඩමේ විශාලත්වයෙන් ආසන්න වශයෙන් සියයට 69 ප්‍රමාණයක් කටාන ප්‍රාදේශීය ලේකම් විසින් අත්පත් කරගෙන ඇත. මෙම අත්පත් කර ගැනීමෙන් වූ බලපෑම ගිණුම් වලට ගෙන නැත.

තක්සේරු දෙපාර්තුමේන්තුව 2019.04.02 දිනැති අංක GM/LM/5549 දරණ ලිපිය ප්‍රකාරව ඉහත ඉඩම් කොටසෙන් රු. 359,375,000 වටිනාකමින් යුතු අක්කර 35 රූඩ් 02 පර්චස් 30 ශ්‍රී.ල.වි.ස.නි.කොං. සභාව සතුව වර්තමානයේ පවතී බව තක්සේරු කර ඇතත්, ශ්‍රී.ල.වි.ස.නි.කොං.සභාවේ සමස්ථ වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති 16 අවශ්‍යතාවය සපුරා ඇති බවට මෙතෙක් සෑහීමකට පත් නොවන බැවින් එය 2020.12.31 දිනට මූල්‍ය ප්‍රකාශනයේ සඳහන් නොවේ.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රත්‍යාගණන ප්‍රතිපත්ති කෙටුම්පත සඳහා අදාළ අනුමැතිය ලැබුණ විට සියලුම ඉඩම් සහ ගොඩනැගිලි වල වටිනාකම ගණනය කරනු ලබන අතර එහි ප්‍රත්‍යාගනනය කරන ලද වටිනාකම් වාර්තා කරනු ලැබේ. (යොමුව සටහන 3.2.1 (අ)).

4.1 දේපල, පිරියත සහ උපකරණ - කොළඹ නෙලුම් කුලුන

පිරිවැය	2022.01.01 දිනට ශේෂය	2022 වර්ෂය සඳහා එකතු කිරීම්	2022 වර්ෂය සඳහා ඉවත්කිරීම්/ මාරුකිරීම්	2022.12.31 දිනට ශේෂය
ඉඩම්	11,805,535,127	(9,450,000,000)	0	2,355,535,127
ගොඩනැගිලි සහ ව්‍යුහයන්	0	18,773,228,257	0	18,773,228,257
වායු සමීකරණ	0	636,947,459	0	636,947,459
විදුලි සෝපාන	0	613,103,592	0	613,103,592
විදුලි උත්පාදක යන්ත්‍ර	0	540,207,042	0	540,207,042
ගිනි ආරක්ෂණ පද්ධතිය	0	362,321,270	0	362,321,270
වෙනත් උපකරණ	0	568,170,384	0	568,170,384
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	0	94,721,217	0	94,721,217
මුළු තැන්ගෙයි උපකරණ	0	236,397,126	0	236,397,126
	11,805,535,127	**12,375,096,346**	**0**	**24,180,631,473**

ක්ෂය වීම්	2022.01.01 දිනට ශේෂය	2022 වර්ෂය සඳහා එකතු කිරීම්	2022 වර්ෂය සඳහා ඉවත්කිරීම්/ මාරුකිරීම්	2022.12.31 දිනට ශේෂය
ගොඩනැගිලි සහ ව්‍යුහයන්	0	312,887,138	0	312,887,138
වායු සමීකරණ	0	53,078,955	0	53,078,955
විදුලි සෝපාන	0	51,091,966	0	51,091,966
විදුලි උත්පාදක යන්ත්‍ර	0	45,017,254	0	45,017,254
ගිනි ආරක්ෂණ පද්ධතිය	0	30,193,439	0	30,193,439
වෙනත් උපකරණ	0	47,347,532	0	47,347,532
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	0	7,893,435	0	7,893,435
මුළු තැන්ගෙයි උපකරණ	0	19,699,760	0	19,699,760
	0	**567,209,478**	**0**	**567,209,478**
ශුද්ධ පොත් අගය	**11,805,535,127**			**23,613,421,995**

4.2 අස්පෘශ්‍ය වත්කම්

පිරිවැය	2022.01.01 දිනට ශේෂය	2022 වර්ෂය සඳහා		2022.12.31 දිනට ශේෂය
		එකතු කිරීම්	ඉවත්කිරීම්/ මාරුකිරීම්	
පරිගණක මෘදුකාංග	21,890,086	25,479,695	0	47,369,781
	21,890,086	**25,479,695**	**0**	**47,369,781**

ක්ෂය වීම්	2022.01.01 දිනට ශේෂය	2022 වර්ෂය සඳහා		2022.12.31 දිනට ශේෂය
		එකතු කිරීම්	ඉවත්කිරීම්/ මාරුකිරීම්	
පරිගණක මෘදුකාංග	21,717,585	18,811,071	**0**	40,528,656
	21,717,585	**18,811,071**	**0**	**40,528,656**
ශුද්ධ පොත් අගය	**172,502**			**6,841,125**

5. කෙරිගෙන යන වැඩ

	2022.01.01 දිනට ශේෂය	2022 වර්ෂය සඳහා		2022.12.31 දිනට ශේෂය
		එකතු කිරීම්	(මාරු කිරීම්)	
ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල	10,057,910	0	0	10,057,910
නෙළුම් කුලුන ඉදිකිරීම	21,632,988,290	0	(21,632,988,290)	0.00
තොරතුරු තාක්ෂණ උද්‍යානය - හම්බන්තොට	684,015,309	27,593,460	0	711,608,769
ශ්‍රී.ල.වි.ස.නි.කොං. සභාවේ ප්‍රධාන කාර්යාලයේ නව ගොඩනැගිල්ල ඉදි කිරීම	164,867,953	0	(14,580,018)	150,287,934
කදිරානා ඉදිකිරීම	78,305,776	18,837,582	0	97,143,358
කෙරිගෙන යන වැඩ	64,372,620	0	(63,122,670)	1,249,950
	22,634,607,858	**46,431,042**	**(21,710,690,978)**	**970,347,921**

		2022.12.31 දිනට	2021.12.31 දිනට
6. ආයෝජන			
ස්ථාවර තැන්පතු		7,400,000,000	4,500,000,000
ආයෝජන - භාණ්ඩාගාර තැන්පතු		4,000,000,000	4,276,051,081
ආයෝජන - වට්ටම් - භාණ්ඩාගාර බැඳුම්කර		163,722,603	0
		11,563,722,603	**8,776,051,081**
7. ලැබිය යුතු ගිණුම්			
ලැබිය යුතු සෙස් ගාස්තු		558,909,906	495,260,644
ලැබිය යුතු විදුලි සංදේශ සංවර්ධන ගාස්තු		820,178,261	560,654,086
ලැබිය යුතු විදුලි සංදේශ බදු		932,029,436	746,238,923
අයකර ගත යුතු කොකාවිල් කුලුන		108,996,583	93,612,539
කුලුනෙන් ලැබිය යුතු බදු		391,279,178	366,541,667
ලැබිය යුතු කෙටි පණිවුඩ සේවා බදු		27,967,039	16,617,138
අයකර ගත යුතු නීති කාර්ය මණ්ඩල ණය		1,226,011	2,254,729
ලැබිය යුතු කොකාවිල් බදුකුලී		2,133,717	1,131,014
මඩුකන්ද බදු කුලී පාලන ගිණුම්		2,526,093	0
ලැබිය යුතු ගුවන් ටිකට්පත්		162,500	0
ස්ථාවර තැන්පතු වලින් ලැබිය යුතු පොලි		241,310,274	49,935,616
ලැබිය යුතු කූපන් පොලි		17,972,603	17,972,603
වෙළඳ ණයගැති	**07 අ**	(0)	0
		3,104,691,601	**2,350,218,958**
07 අ. වෙළඳ ණයගැති			
ගුවන් විදුලි සංඛ්‍යාත ගාස්තු		373,166,107	373,259,080
ආධුනික ගුවන් විදුලි බලපත්‍ර ගාස්තු		32,790	32,790
		373,198,897	**373,291,870**
අඩු කළා - බොල්ණය සඳහා වෙන් කිරීම **		(373,198,897)	(373,291,870)
		(0)	**0**

සටහන: (1)	***ණය ගැනියන්***		***ප්‍රතිපාදන***
** *බොල් ණය ගැනියන් සඳහා වෙන්කිරීම*			
වසර 02 ට වඩා වැඩි	373,401,311	**100%**	373,700,914
වසර 01 ට වඩා වැඩි වසර 02 ට වඩා අඩු	0	**10%**	10,757
මාස 06 ට වැඩි සහ වසර 01 ට වඩා අඩු	0	**0%**	0
මාස 02 ට වඩා වැඩි සහ මාස 6 ට වඩා අඩු	0	**0%**	0
මාස 01 ට වඩා වැඩි සහ මාස 2 ට වඩා අඩු	0	**0%**	0
මාස 01 ට වඩා අඩු	0	**0%**	0
	373,401,311		**373,711,670**

සටහන: (2)
ඉහත ආකාරයේ පිළිවෙලින් වසරකට වඩා වැඩි බොල් සහ අඩමාන ණය ගැනියන් සඳහා 100% සහ 10% වෙන් කිරීම් ලබාදීමෙන් පසු සාධාරණ අගයකින් යුතුව බොල් ණය ගැනියන් ප්‍රකාශ කෙරේ.

		2022.12.31 දිනට	2021.12.31 දිනට
8. පූර්ව ගෙවීම් සහ අත්තිකාරම්			
විශේෂ අත්තිකාරම්		575	575
උත්සව අත්තිකාරම්		184,000	148,000
ගැනුම් අත්තිකාරම්		505,355	116,640
පූර්ව ගෙවීම්		59,489,157	1,103,161,835
අත්තිකාරම් ගෙවීම් ලියාපදිංචි කිරීම (තොරතුරු තාක්ෂණ උද්‍යානය)		0	157,081,430
අත්තිකාරම් ලියාපදිංචි කිරීම් (ප්‍රධාන කාර්යාලය - නව)		11,927,619	11,927,619
අත්තිකාරම් ලියාපදිංචි කිරීම් (කදිරාන)		5,522,503	5,522,503
		77,629,209	**1,277,958,601**
9. ණය සහ වෙනත් ලැබීම්			
ආපදා ණය		48,985,602	33,157,355
මෝටර් රථ ණය		139,847,799	166,422,167
දේපල ණය		350,500	913,213
මෝටර් බයිසිකල් ණය		489,407	895,082
අයකර ගතයුතු වැටුප් අඩුකිරීම්		2,305,065	4,059,713
වෙනත් ලැබීම්		2,200,000	2,030,000
ලං.වි.බ ආරක්ෂක ඇප තැන්පතු ගිණුම (තොරතුරු තාක්ෂණ උද්‍යානය)		125,000	125,000
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් (රඳවා ගැනීමේ බදු)		14,244	14,244
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් (ආදායම් බදු වැඩියෙන් වෙන්කිරීම)		1,077,992,225	0
නෙළුම් කුලුන විදුලි ආරක්ෂණ තැන්පතු		3,125,000	3,125,000
කොළඹ නෙළුම් කුලුන මඟින් ලැබිය යුතු මුදල් ඉපයීම්		29,869,852	55,959,715
		1,305,304,693	**266,701,487**
10. මුදල් සහ මුදල් සමානුපාත			
බැංකු මුදල්	**10 අ**	90,003,226	(777,760,280)
අතැති මුදල්	**10 ආ**	55,000	50,000
මහජන බැංකුව - නාරාහේන්පිට ශාඛාව, අංක 119-2-001-2-3693169		2,601,896,741	6,006,120,808
ඉතුරුම් ගිණුම			
		2,691,954,967	**5,228,410,528**
10 අ. බැංකු මුදල්			
මහජන බැංකුව - නාරාහෙන්පිට ශාඛාව (තැන්පතු ගිණුම)			
ගිණුම් අංකය 119402113960300 (RFC USD 0032)		229,453,190	123,344,130
මහජන බැංකුව - නාරාහේන්පිට ශාඛාව ජංගම ගිණුම් අංකය			
119-1-001-4-3693169		(234,834,591)	(933,237,468)
මහජන බැංකුව - නාරාහේන්පිට ශාඛාව (ජාත්‍යන්තර විදුලි සංදේශ			
ක්‍රියාකරු බදු) ජංගම ගිණුම් අංකය 119-1-001-3-3693264		1,649,514	255,611
ලංකා බැංකුව - නාරාහේන්පිට ශාඛාව - ජංගම ගිණුම් අංකය 2323167		93,735,113	31,877,446
		90,003,226	**(777,760,280)**
10 ආ. අතැති මුදල්			
සුළු මුදල් - ප්‍රධාන කාර්යාලය		10,000	10,000
සුළු මුදල් - පාලන හා මානව සම්පත් අංශය		5,000	10,000
සුළු මුදල් - අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය		15,000	15,000
සුළු මුදල් - අනුකූලතා		5,000	5,000
සුළු මුදල් - පරිපාලන නිලධාරී / පාලන		20,000	10,000
		55,000	**50,000**
11. රජයේ දායකත්වීම්			
ලෝක බැංකු ණය ගිවිසුම		298,572,434	298,572,434
එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන		19,533,906	19,533,906
භාණ්ඩාගාරය විසින් දායක කරන ලද ප්‍රග්ධනය		208,108,404	208,108,404
		526,214,744	**526,214,744**

	2022.12.31 දිනට	2021.12.31 දිනට
12. රඳවාගැනීම්		
රඳවාගැනීම් - තොරතුරු තාක්ෂණ උද්‍යානය	0	46,152,801
රඳවාගැනීම් - ප්‍රධාන කාර්යාලයීය නව ගොඩනැගිල්ල	10,454,652	10,454,652
රඳවාගැනීම් - කදිරාන	6,994,114	6,994,114
	17,448,766	**63,601,567**
13. විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්		
පාරිතෝෂික සඳහා වෙන්කිරීම්	117,674,290	99,939,358
ස්ථාවර තැන්පතු (පාරිතෝෂික)	(72,420,000)	(71,510,000)
ප්‍රතිලාභ සඳහා ස්ථාවර තැන්පතු මත ලැබිය යුතු පොළි	(6,589,228)	(3,340,399)
ශුද්ධ ප්‍රතිලාභ වගකීම්	**38,665,062**	**25,088,960**
14. ලැබිය යුතු ගිණුම්		
උපචිත වියදම්		
දුරකථන - කාර්යාලය	453,377	1,944,820
වැටුප් පාලන	290,580	2,013,889
ගෙවිය යුතු වැටුප්	323,541	151,634
විදුලිය	1,494,629	3,873,434
ජලය	42,451	989
සනීපාරක්ෂක සේවා	2,392,916	517,507
ආරක්ෂක සේවා	3,370,315	3,118,000
අතිකාල	951,229	1,079,436
සේවා අර්ථසාධක අරමුදල	3,669,230	4,128,576
සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල	440,307	495,428
අන්තර්ජාල	556,152	306,803
වෛද්‍ය රක්ෂණ හිමිකම්	250,995	250,995
කාර්ය මණ්ඩල සහසාධනය	1,127,025	486,965
පුවත්පත් සහ නිවේදන	233,150	19,790
විගණන ගාස්තු	1,500,000	1,500,000
ප්‍රසාද දීමනා	11,871,021	46,762,733
රඳවා ගැනීම් - පොදු	275,188	481,102
වැටුප් අඩුකිරීම්	132,524	135,366
අළුත්වැඩියා හා නඩත්තු	4,687,129	5,345,040
ගෙවිය යුතු මුද්දර ගාස්තු	939,391	1,164,892
ගෙවිය යුතු උපයන විට ගෙවීමේ බදු	56,537	56,537
ගෙවිය යුතු අත්තිකාරම් පුද්ගල ආදායම් බදු	0	70,332
ගෙවිය යුතු විවිධ ගැනුම් සහ සැපයුම්	1,103,555	80,624,105
කාර්ය මණ්ඩල ණය වැඩියෙන් අයකර ගැනීම	12,657	12,657
ගෙවිය යුතු ඉන්ධන	0	86,539
ගෙවිය යුතු මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය	474,950	605,490
විවිධ ගෙවීම්	12,838,569	4,635,204
නඩු ගොනු කිරීම සහ නඩු වලට පෙනී සිටීම	40,000	0
විලම්බිත ආදායම	1,878,060	3,619,726
විවිධ ණයගැති	14,244	14,244
	51,419,723	**163,502,233**

		2022.12.31 දිනට	2021.12.31 දිනට
15. අත්තිකාරම්, තැන්පතු සහ වෙනත් ගෙවිය යුතු දෑ			
අත්තිකාරම් ලෙස ලැබුණු ආදායම්		965,359,434	1,378,278,009
ටෙන්ඩර් සඳහා ආපසු ගෙවිය යුතු තැන්පතු		1,563,167	1,530,167
ආපසු ගෙවිය යුතු තැන්පතු - සේවක		0	2,086,843
මෙගාහර්ට්ස් 1800 පරාසය සඳහා ලබුණු අත්තිකාරම්		57,500,000	57,500,000
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ එලදායී ආපදා කළමනාකරණ සමුළුව		34,210	34,210
සංඛ්‍යාත බලපත්‍ර ගාස්තු වැඩියෙන් අයකර ගැනීම		2,172,737	2,178,047
C.T.O විදුලි සංදේශ මධ්‍යස්ථාන ව්‍යාපෘතිය		924,492	924,492
අගය එකතු කිරීමේ බදු පාලන ගිණුම්		68,374,399	122,081,985
ආදායම් බදු සඳහා වෙන්කිරීම්		0	1,121,171,744
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් (සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද)		12,336,809	0
ඉදිකිරීමේ ණයගැතියන්		751,650	751,650
අනපේක්ෂිත වෙළඳ කටයුතු - ආපසු ගෙවීම්		54,800	0
ව්‍යාපෘති ණය - එක්සිම් බැංකුව (නෙළුම් කුලුන)		0	1,610,276,227
		1,109,071,697	**4,296,813,373**
16. භාණ්ඩාගාරයට ගෙවිය යුතු දෑ			
භාණ්ඩාගාරයට ගෙවිය යුතු විදුලි සංදේශ සංවර්ධන අරමුදල 50%		410,389,129	280,327,042
භාණ්ඩාගාරයට ගෙවිය යුතු විදුලි සංදේශ බදු		933,957,580	747,238,925
භාණ්ඩාගාරයට ගෙවිය යුතු කෙටි පණිවිඩ බදු		27,967,039	16,618,138
භාණ්ඩාගාරයට ගෙවිය යුතු සෙලියුලර් කුලුනු බදු		391,279,178	366,541,667
		1,763,592,926	**1,410,725,771**
17. ආදායම්			
ආදායම් - බලපත්‍ර ගාස්තු	**17 අ**	18,900,917,956	17,162,602,169
විදුලි සංදේශ බදු		12,906,756,507	11,050,897,082
විදුලි සංදේශ සංවර්ධන ගාස්තු	**17 ආ**	4,810,412,572	3,620,901,150
ජංගම කෙටි පණිවිඩ සේවා බදු		231,424,383	399,954,804
සෙලියුලර් කුලුනු බදු		1,565,116,713	1,466,166,667
		38,414,628,131	**33,700,521,871**
17 අ. ආදායම් - බලපත්‍ර ගාස්තු			
සෙස් ගාස්තු		5,514,298,727	5,164,189,283
ගුවන් විදුලි සංඛ්‍යාත ගාස්තු		5,430,252,390	7,374,467,719
සංඛ්‍යාත පෙරගෙවුම් ගාස්තුව		3,278,900,000	3,324,250,000
වෙළඳ බලපත්‍ර ගාස්තු		14,198,890	14,226,250
ආධුනික ගුවන් විදුලි බලපත්‍ර ගාස්තු		71,192	99,742
රැහැන් රහිත දුරකථන බෙදාහැරීමේ ගාස්තු		63,251,578	193,969,767
විභාග ගාස්තු		371,722	388,000
මාදිලි අනුමැති ගාස්තු		23,278,625	38,969,792
ලේබල් ගාස්තු		2,538,870	0
අයදුම්පත්‍ර සැකසීමේ ගාස්තු		1,400,000	1,000,000
කෙටි සංකේත අංක ගාස්තු		39,749,950	45,749,925
අන්තර්ජාල සේවා සැපයුම්කරුවන්ගේ බලපත්‍ර ගාස්තු		2,252,509,051	133,472,904
අතිරික්ත ආදායම් - 17 අ (1)		2,280,096,961	871,818,786
		18,900,917,956	**17,162,602,168**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2022.12.31
(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)

	2022.12.31 දිනට	2021.12.31 දිනට
17 අ (1) අනෙකුත් ආදායම්		
කාර්ය මණ්ඩල ණය වලින් ලද පොලී ආදායම්	8,029,353	8,791,182
ස්ථාවර තැන්පතු මත ආදායම්	1,341,809,605	156,091,883
කොටස් වෙළඳපල ගනුදෙනු මත පොලී ආදායම්	493,775,933	462,748,634
කොකාවිල් බදු කුලී	6,837,009	6,837,009
මඩුකන්ද බදු කුලී	3,289,082	12,302,966
වෙනත් ආදායම් - විවිධ	11,612,897	1,144,658
ස්ථාවර වත්කම් ඉවත් කිරීම	4,650,111	712,200
කූපන් පොලී ආදායම	410,000,000	222,972,603
බොල් ණය අයකර ගැනීම	92,973	217,652
	2,280,096,961	**871,818,786**
17 ආ. විදුලි සංදේශ සංවර්ධන ගාස්තු (TDC)		
විදුලි සංදේශ සංවර්ධන ගාස්තු ආදායම	4,810,412,572	3,620,901,150
	4,810,412,572	**3,620,901,150**
18. නියාමන වියදම්		
ITU වාර්ෂික සාමාජික මුදල	35,530,903	34,885,822
APT වාර්ෂික සාමාජික මුදල	10,301,239	3,093,488
වාර්ෂික පුස්තකාල සාමාජික මුදල	43,333	10,000
නියාමන කටයුතු සඳහා සහභාගී වීම	264,565	424,598
පර්යේෂණ අධ්‍යයන පැවැත්වීම	0	340,000
නඩු ගොනුකිරීම සහ නඩු වලට පෙනීසිටීම	9,676,960	7,925,500
නෙළුම් කුළුණ ණය පොලී	151,370,648	0
නියාමන කටයුතු සඳහා ප්‍රවාහන හා යැපීම් දීමනා	1,018,774	680,630
ගමට සන්නිවේදනය ව්‍යාපෘතිය	1,514,716	187,645
දේශීය පුහුණු වැඩසටහන - ITU/APT	0	30,290
විවිධ නියාමන වියදම්	0	399,900
“e-nable”ව්‍යාපෘතිය	12,000	0
සංඛ්‍යාත බලපත්‍ර PYT	0	78,680
ශිෂ්‍යයන් දැනුවත් කිරීමේ වැඩසටහන	(137,250)	1,910,625
විදුලි සංදේශ කුලුනු තාක්ෂ ශිල්පීන් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් වැඩිදියුණු කිරීම	0	93,000
විවිධ නියාමන වියදම්	540	0
	209,596,429	**50,060,177**

	2022.12.31 දිනට	2021.12.31 දිනට
19. පරිපාලන හා ආයතන වියදම්		
වැටුප්	185,086,168	192,623,856
සේ.අ.අ. (15% දායකත්වය)	26,783,794	28,069,943
සේ.හා.අ. (3% දායකත්වය)	5,356,759	5,613,989
ප්‍රවාහන දීමනා	23,076,749	22,757,539
ගෙවල් කුලී දීමනාව	18,204,701	18,141,377
වෙනත් දීමනා	19,846,231	6,195,851
කාර්ය සාධනය දිරිදීමනා	45,643,145	45,322,829
විශේෂ දීමනා	351,779	346,379
ප්‍රසාද දීමනා	60,807,814	63,636,073
අතිකාල	8,686,594	6,608,273
සභාපතිගේ චේතනය	1,099,007	1,200,000
පාවිච්චි නොකළ විවේක නිවාඩු	11,591,735	14,725,551
විශ්‍රාම වැටුප් සඳහා කොමිෂන් සභාවේ දායකත්වය	1,511,025	1,227,080
සන්නිවේදන දීමනාව	2,955,638	2,780,242
නිල ඇඳුම්	258,317	770,887
කාර්ය මණ්ඩල සුභසාධනය	9,331,470	2,757,928
කාර්ය මණ්ඩලය වෘත්තීය සාමාජික මුදල් දායකත්වය	642,815	765,562
දේශීය පුහුණු	295,500	934,600
කොමිෂන් සභා සාමාජිකයින්ගේ දීමනාව	370,000	305,000
විගණන කමිටු දීමනා	37,500	237,500
2/3 නිවාස ණය පොලිය ප්‍රතිපූරණය කිරීම	4,287,104	4,777,946
පාරිතෝෂික	3,771,394	3,788,794
විදුලිය	10,921,935	9,823,692
ජලය	520,120	426,805
සනීපාරක්ෂක සේවා	6,086,388	6,370,380
ආරක්ෂක සේවා	17,070,285	19,425,746
වරිපනම් හා බදු	467,555	903,149
පුස්තකාල පොත්	14,764	205,815
මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය	14,212,217	5,774,496
ඉන්ධන	5,374,280	2,496,459
තැපෑල්	1,113,640	698,614
දුරකථන, ෆැක්ස් සහ පි.ඒ.බී.එක්ස්	5,954,452	5,882,215
රක්ෂණය (දේපල හා වෛද්‍ය)	90,812,430	49,269,041
අන්තර්ජාල ගාස්තු	648,095	433,785
අධිභාර බදු	0	0
සමාජ ආරක්ෂණ දායකත්ව බදු	61,166,205	0
පුවත්පත් හා නිවේදන	2,757,115	3,635,144
උපදේශන ගාස්තු	214,420	150,000
වැඩමුළු හා සම්මන්ත්‍රන	1,146,884	348,100
වෘත්තීය දීමනා	6,411,283	5,736,924

		2022.12.31 දිනට	2021.12.31 දිනට
විගණන ගාස්තු		1,383,000	884,000
නීති වියදම් / විනය පරීක්ෂණ/ මූලික විමර්ශන		772,776	205,700
ක්ෂයවීම		626,855,401	49,281,427
ණය හිලව් කිරීම		18,811,071	261,725
විවිධ පාලන වියදම්		1,117,285	421,062
විවිධ මිලදී ගැනීම් හා සැපයීම්		0	1,586,368
විවිධ මෙහෙයුම් පිරිවැය		4,753,746	1,208,096
කාර්යාල උපකරණ නඩත්තුව		3,993,668	3,726,398
වාහන නඩත්තුව		4,961,238	3,861,115
ගොඩනැගිලි සහ වියුහ නඩත්තුව		4,735,337	114,648
තාක්ෂණික උපකරණ නඩත්තුව		(12,061)	7,536,736
මෘදුකාංග නඩත්තුව සහ සංවර්ධනය		65,062,042	46,792,827
කුලුනු නඩත්තුව		0	67,085
විදුලි ජනක යන්ත්‍ර අලුත්වැඩියාව සහ නඩත්තුව		197,555	243,425
අලුත්වැඩියාව හා නඩත්තුව - විවිධ		0	358,851
අලුත්වැඩියාව හා නඩත්තුව - තොරතුරු තාක්ෂණ - සූරියවැව		0	31,327
විදුලි සෝපාන නඩත්තුව		682,108	169,633
බද්දට ගත් අන්තර්ජාල සම්බන්ධතා කුලී		5,314,026	5,456,374
බද්දට ගත් පරිශ්‍ර සඳහා කුලී		0	396,000
විදුලි උපකරණ		225,004	0
බෙරුම්කරණ ප්‍රදානයන් සඳහා වියදම්		426,897,598	0
ක්‍රීඩා කටයුතු සංවර්ධනය		78,300	0
විවිධ ගැනුම් සහ සැපයුම්		2,158,384	0
පිරික්සුම් මධ්‍යස්ථාන නඩත්තුව		4,760	3,025,634
		1,822,878,544	**660,795,995**

20. මූල්‍ය හා අනෙකුත් වියදම්

බැංකු ගාස්තු		210,211	186,059
පාරිතෝෂික මුදල් වෙන්කිරීම මත පොලිය		7,422,674	5,720,115
භාණ්ඩාගාර බැදුම්කර වට්ටම් ක්ෂයවීම්		112,328,478	33,236,919
		119,961,363	**39,143,093**

21. ඒකාබද්ධ අරමුදලට දායකවීම

	21-1		
2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විදුලි සංදේශ පනත යටතේ දායකත්වය		12,200,000,000	7,500,000,000
2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විදුලි සංදේශ පනත යටතේ දායකත්වය			
ගෙවන ලද විදුලි සංදේශ බදු		12,906,756,501	11,050,897,079
50% විදුලි සංදේශ සංවර්ධන ගාස්තු		2,405,206,286	1,810,450,575
භාණ්ඩාගාරයට ගෙවන ලද කෙටි පණිවුඩ සේවා බදු		231,424,383	399,954,804
භාණ්ඩාගාරයට ගෙවන ලද ජංගම කුලුනු බදු		1,565,116,713	1,466,166,667
		29,308,503,882	**22,227,469,125**

විදුලි සංදේශ පනත යටතේ දායකත්වය

	21-2		
2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායමෙන්		**1,000,000,000**	**1,000,000,000**

		2022.12.31 දිනට	2021.12.31 දිනට
22. මෙහෙයුම් තුළින් උත්පාදන වූ මුදල්			
බදුවලට පෙර ශුද්ධ ලාභය		**31,697,157,371**	**32,296,276,914**
ගැලපුම් සඳහා			
දේපල, පිරියත හා උපකරන ක්ෂයවීම		626,855,401	49,281,427
අස්පෘශ්‍ය වත්කම් ණය හිලවිකිරීම		18,811,071	261,725
බොල් ණය අයකර ගැනීම		92,973	(217,652)
විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම		3,771,394	9,508,909
ස්ථාවර තැන්පතු වලින් පොළි		(1,341,809,605)	(156,091,883)
කොටස් වෙළඳපොල ගනුදෙනු වලින් පොලී ආදායම		(493,775,933)	(462,748,634)
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් මත පොලි පිරිවැය		7,422,674	(222,972,603)
විදේශ මුදල් ගනුදෙනු මත ලාභ/අලාභ		4,305,538,299	658,348,362
ස්ථාවර වත්කම් ඉවත් කිරීම මත ලාභය		(4,650,111)	(712,200)
කාරක ප්‍රාග්ධනය වෙනස්වීම්			
ලැබිය යුතු ගිණුම්	**22-1**	(751,853,575)	(103,801,695)
පූර්ව ගෙවීම් සහ අත්තිකාරම්	**22-2**	1,043,247,963	(1,066,554,455)
ණය සහ වෙනත්ලැබීම්	**22-3**	(1,038,603,206)	(28,551,286)
පාරිතෝෂික ප්‍රතිලාභ සඳහා ස්ථවර තැන්පතු මත ලැබිය යුතු පොලි		(3,248,829)	7,830,128
ගෙවිය යුතු ගිණුම්	**22-4**	(112,082,510)	29,752,344
අත්තිකාරම්, තැන්පතු හා වෙනත් ගෙවිය යුතු දෑ		(1,577,465,449)	(582,480,679)
භාණ්ඩාගාරයට ගෙවිය යුතු		352,867,155	24,827,256
මෙහෙයුම් තුළින් උත්පාදනය වන මුදල්		**32,732,275,082**	**30,451,955,976**

22-1. ලැබිය යුතු ගිණුම්			
ලැබිය යුතු සෙස් ගාස්තු		558,909,906	495,260,644
ලැබිය යුතු විදුලි සංදේශ සංවර්ධන ගාස්තු		820,178,261	560,654,086
ලැබිය යුතු විදුලි සංදේශ බදු		932,029,436	746,238,923
අයවිය යුතු කොකාවිල් කුලුන		108,996,583	93,612,539
ලැබිය යුතු කුළුණු බදු		391,279,178	366,541,667
ලැබිය යුතු කෙටි පණිවිඩ සේවා බදු		27,967,039	16,617,138
හිඟ කාර්ය මණ්ඩල ණය අයවීම		1,226,011	2,254,729
ලැබිය යුතු කොකාවිල් බදු කුලී		2,133,717	1,131,014
ලැබිය යුතු කූපන් පොලි		17,972,603	17,972,603
ස්ථාවර තැන්පතු මත ලැබිය යුතු පොලී		241,310,274	49,935,616
ලැබිය යුතු ගුවන් ටිකට්පත්		162,500	0
ගුවන් විදුලි සංඛ්‍යාත ගාස්තු		373,166,107	373,259,080
ආධුනික ගුවන් විදුලි බලපත්‍ර ගාස්තු		32,790	32,790
		3,475,364,404	**2,723,510,829**
		(751,853,575)	

22-2. පූර්ව ගෙවීම් සහ අත්තිකාරම්			
විශේෂ අත්තිකාරම්		575	575
උත්සව අත්තිකාරම්		184,000	148,000
ගැනුම් අත්තිකාරම්		505,355	116,640
පූර්ව ගෙවීම්		59,489,157	1,103,161,835
		60,179,087	**1,103,427,050**
		1,043,247,963	

	2022.12.31 දිනට	2021.12.31 දිනට
22-3. ණය සහ වෙනත් ලැබීම්		
ආපදා ණය	48,985,602	33,157,355
මෝටර් රථ ණය	139,847,799	166,422,167
දේපල ණය	350,500	913,213
මෝටර් බයිසිකල් ණය	489,407	895,082
ලැබිය යුතු වැටුප් අඩු කිරීම්	2,305,065	4,059,713
අනෙකුත් ලැබීම්	2,200,000	2,030,000
ලංකා විදුලිබල මණ්ඩලයේ ආරක්ෂක ඇප තැන්පතු ගිණුම (තොරතුරු තාක්ෂණ උද්‍යානය)	125,000	125,000
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් (රඳවාගැනීමේ බදු)	14,244	14,244
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් (ආදායම් බදු වැඩියෙන් වෙන් කිරීම)	1,077,992,225	0
නෙළුම් කුලුන විදුලි ආරක්ෂණ තැන්පතු	3,125,000	3,125,000
ලැබිය යුතු කොළඹ නෙලුම් කුලුන ණය	29,869,852	55,959,715
	1,305,304,693	**266,701,486**
	(1,038,603,206)	
22-4. ගෙවිය යුතු ගිණුම්		
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ප්‍රකාරව	51,419,723	163,502,233
	51,419,723	**163,502,233**
	(112,082,510)	
23. අත්තිකාරම් ගෙවීම් ලියාපදිංචි කිරීම		
අත්තිකාරම් ගෙවීම ලියාපදිංචි කිරීම (තොරතුරු තාක්ෂණ උද්‍යානය)	0	157,081,430
අත්තිකාරම් ගෙවීම ලියාපදිංචි කිරීම (නව ප්‍රධාන කාර්යාලය)	11,927,619	11,927,619
අත්තිකාරම් ගෙවීම ලියාපදිංචි කිරීම (කදිරාන)	5,522,503	5,522,503
	17,450,122	**174,531,552**
	157,081,430	

වසර 10ක මූල්‍ය ප්‍රගතිය

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් මිලියන වලින්)

	2022	2021	2020	2019	2018	2017	2016	2015	2014	2013
මූල්‍ය තත්ත්ව										
මුළු ජංගම නොවන වත්කම්	36,394.9	43,506.6	35,826.9	34,215.3	30,334.9	34,324.5	25,330.0	45,915.1	19,341.0	26,661.2
මුළු ජංගම වත්කම්	7,179.6	9,123.3	12,724.0	9,295.8	8,306.0	12,120.3	18,746.0	7,022.0	17,586.8	6,016.9
මුළු වත්කම්	43,574.5	52,629.8	48,550.9	43,511.1	38,640.9	46,444.8	44,076.0	52,937.0	36,927.9	32,678.1
මුළු සම කොටස්	31,701.1	32,060.5	27,478.8	20,327.8	11,132.4	17,309.2	20,041.4	29,242.9	26,143.2	21,635.9
මුළු ජංගම නොවන වගකීම්	5,162.1	12,581.8	13,850.1	15,294.3	16,947.1	18,451.7	16,966.6	15,856.3	5,239.1	4,427.6
මුළු ජංගම වගකීම්	6,711.3	7,987.5	7,222.0	7,889.0	10,561.4	10,683.9	7,068.0	7,837.9	5,545.6	6,614.6
මුළු වගකීම්	11,873.3	20,569.3	21,072.1	23,183.3	27,508.5	29,135.6	24,034.6	23,694.2	10,784.7	11,042.2
මුළු සම කොටස් සහ වගකීම්	43,574.5	52,629.8	48,550.9	43,511.1	38,640.9	46,444.8	44,076.0	52,937.0	36,927.9	32,678.1
ලාභ හෝ අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම්										
ආදායම	38,414.6	33,700.5	29,000.9	38,575.2	48,032.9	54,368.0	56,024.0	48,235.1	47,579.8	48,750.7
නියාමන වියදම්	209.6	50.1	54.8	78.9	82.2	66.9	164.2	97.8	1,014.9	870.6
වෙනත් වියදම්	6,507.9	1,354.2	918.0	612.8	2,244.1	724.7	518.0	543.9	298.8	512.9
ලාභය ආදායම් බදු ගෙවීමට පෙර	31,697.2	32,296.3	28,028.1	37,883.5	45,706.6	53,576.5	55,341.7	47,593.4	46,266.1	47,367.3
ආදායම් බදු	159.1	4,492.1	702.9	0.0	2,349.2	536.4	727.8	842.1	403.7	429.4
ලාභය ආදායම් බදු ගෙවීමට පසු	31,538.0	27,804.1	27,325.1	37,883.5	43,357.3	53,040.0	54,614.0	46,751.3	45,862.4	46,937.9
වෙනත් විස්තීර්ණ ආදායම	4.8	5.1	(2.5)	(7.1)	(5.1)	0.8	1.5	0.5	10.9	7.7
ඒකාබද්ධ අරමුදලට දායකත්වය	29,308.5	22,227.5	18,817.6	27,681.0	34,529.0	40,773.1	48,816.9	43,652.1	41,328.1	34,509.3
මුළු විස්තිරණ ආදායම	2,234.3	5,581.7	8,505.0	10,195.4	8,823.2	12,267.8	5,798.6	3,099.7	4,523.5	12,420.9
මුදල් ප්‍රවාහ										
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් උත්පාදිත ශුද්ධ මුදල් ප්‍රවාහය	28,619.4	29,113.6	27,415.0	33,498.7	44,722.8	54,790.7	51,101.7	46,054.0	46,042.9	47,205.1
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යෙදවූ ශුද්ධ මුදල	(1,101.1)	(7,353.3)	(1,476.3)	(3,946.8)	3,584.7	(7,398.2)	22,462.9	(8,339.2)	(33,280.8)	(48,295.6)
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා යෙදවූ ශුද්ධ මුදල්	(30,156.3)	(24,523.4)	(21,583.8)	(29,573.4)	(50,301.2)	(53,749.8)	(62,420.8)	(42,485.2)	259.7	0.0
මුදල් හා මුදල් සමානුපාතවල වෙනස්වීම්	(2,637.9)	(2,763.1)	4,354.9	(21.5)	(1,993.6)	(6,357.2)	11,143.8	(4,770.3)	13,021,8	(1,090.5)

විගණකාධිපතිගේ වාර්තාව

මගේ අංකය எனது இல. My No. CAM/E/TRC/01/2022/51 මබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2023 අගෝස්තු 29 දින

සභාපති

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනසහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින්2022දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) නාගරික සංවර්ධන අධිකාරිය සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අතර ඇති කරගෙන තිබූ අවබෝධතා ගිවිසුම අනුව අක්කර 7 රූඩ් 2 පර්චස් 8.41 ක භූමිය රු.මිලියන 11,700 කට අගය කර මූලික ගෙවීම ලෙස රු. මිලියන 1500 ක් හා රු. මිලියන 300 බැගින් වසර 34 ක කාල සීමාවකට අඛණ්ඩව කොටස් වශයෙන් ගෙවීමට එකඟ වී 2021 දෙසැම්බර් 31 දින වනවිට රු. මිලියන 2,250 ක් ගෙවා තිබුණි. ඒ අනුව අවබෝධතා ගිවිසුම අනුව රු. මිලියන 9,450 ක මුදල නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. 2021 ඔක්තෝබර් 05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/21/1734/331/009 අනුව කොමිෂන් සභාව විසින් ගෙවා ඇති රු. මිලියන 2250 ක මුදලකට උක්ත අවබෝධතා ගිවිසුමේ දැක්වෙන නාගරික සංවර්ධන අධිකාරියට අයත්ව තිබුණු භූමි ප්‍රමාණයෙන් අක්කර 4 රූඩ් 3 පර්චස් 24.47 ක ඉඩම් ප්‍රමාණයක් පමණක් විකුණුම් ඔප්පුවකින් කොමිෂන් සභාව වෙත පවරා තිබුණු අතර ඉතිරි අක්කර 2 රූඩ් 02 පර්චස් 22.08 ක ඉඩම් ප්‍රමාණය දීමනා පත්‍රයක් මගින් කොමිෂන් සභාව වෙත පවරා දී තිබුණි. 2022 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මඟින් කොමිෂන් සභාව විසින් ඉහත සඳහන් ගෙවිය යුතු මුදල හා එම වටිනාකමට සමාන ප්‍රමාණයක් අදාළ වත්කමේ වටිනාකම්න් ඉවත් කර තිබුණි. එසේ වුවද නෙලුම් කුලුණ ස්ථාපිත කර ඇති භූමිය මේ වන විටත් භාවිතා කරන බැවින් එලෙස ගෙවිය යුතු වගකීම සහ ඉඩමේ ගිණුම්ගත කර තිබූ වටිනාකම්න් කොටසක් ඉවත් කිරීම හේතුවෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ප්‍රකාරව ඉඩමේ සාධාරණ වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළ නිරූපනය කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 20 හි 23 ඡේදය ප්‍රකාරව මූල්‍ය නොවන රජයේ ප්‍රදානයක් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවද සමාලෝචිත වර්ෂය තුළ කොළඹ නෙලුම් කුලුන පිහිටි ඉඩම ප්‍රදානයක් ලෙස කොමිෂන් සභාව වෙත ලැබී තිබුණද එහි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත 07 ප්‍රකාරව නත්‍ය වශයෙන් ලැබුණු පොළී හා ලාභාංශ පමණක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගැලපිය යුතු වුවද සමාලෝචිත වර්ෂය තුළදී ලැබුණු පොලී හා ලාභාංශ රු. 1,150,434,945 ක් සහ ලැබිය යුතු පොලිය වන රු. 241,310,274 ක් ඇතුළු මුළු පොලී හා ලාභාංශ වටිනාකම වූ රු. 1,341,809,603 ක් මුදල් ගලා ඒම් ලෙස දක්වා එම වෙනස (ලැබිය යුතු පොළිය රු. 241,310,274) කාරක ප්‍රාග්ධන ගැලපීම් තුළින් ගලපා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 07 අනුව මුදලින් ගෙවූ ණය පමණක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගැලපිය යුතු වුවද වර්ෂය තුළ එක්සිම් බැංකු ණය ගෙවීම රු. 1,833,493,891 ක් වුවද රු. 452,549,828 ක්ණය ගෙවීම් ලෙස දක්වා තිබුණි. ඒ අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් ගලා යාම් රු. 1,380,944,063 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයේදී අලුත්වැඩියා / නඩත්තු වියදමක් ලෙස ගිණුම්ගත කළ රු. 625,000 ක ස්ථාවර වත්කම් මිලදී ගැනීමේ වියදමක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ලාභයට ගලපනවා වෙනුවට සමාලෝචිත වර්ෂයේ මුදල් ගලා යාමක් ලෙස ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළ මුදලින් සිදුකරන ලද ආයෝජන රු. 2,900,000,000 ක් වුවත් රු. 112,328,477 ක් වූ ජ'නල් සටහන් මගින් භාණ්ඩාගාර බැඳුම්කරවල නාමික අගයට වඩා වැඩියෙන් ගෙවූ වටිනාකමින් සමාලෝචිත වර්ෂයට අදාළව ආදායම් ප්‍රකාශයෙන් කපා හල අගය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ලාභයට ගලපනවා වෙනුවට වර්ෂය තුළ මුදලින් සිදු කරන ලද ආයෝජනවලින් එම වටිනාකම අඩුකර රු. 2,787,671,522 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි. ඒ අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් ගලා යාම්රු. 112,328,477 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු අගය ශූන්‍ය වූරු. 1,075,740,531 ක වත්කම් තවදුරටත් ප්‍රයෝජනයට ගත්නා බැවින් එම දේපළ පිරියත හා උපකරණවල වටිනාකම් නැවත අගය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඌ) බෙරුම්කරණ වියදම් වූ රු. 296,483,458 ක් ගෙවීමේදී ඊට අදාළ රු. 44,472,518 ක එකතු කළ අගය මත බදු එම ගිණුමට සටහන් නොකර මුළු වියදම් වූ රු. 340,955,976 ක මුදල බෙරුම්කරණ වියදම් ගිණුමට හර කිරීම හේතුවෙන් වර්ෂයේ ලාභය රු. 44,472,518 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) කොළඹ නෙලුම් කුලුනේ 2022 නොවැම්බර් 01 දින සිට 2022 නොවැම්බර් 30 දින දක්වා මසක කාලයට අදාළ රක්ෂණාවරණය වෙනුවෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත ගෙවූ රු. 2,454,017 ක වියදම සමාලෝචිත වර්ෂයේ වියදම් ගිණුමට හර කළ යුතු වුවද රු. 409,002 ක් පමණක් හරකර ඉදිරියට කළ ගෙවීම් ගිණුමට රු. 2.045.014 ක් හරකර තිබුණි. මේ හේතුවෙන් රු. 2.045.014 කින් සමාලෝචිත වර්ෂයේ ලාභය වැඩියෙන් හා වියදම් අඩුවෙන් දක්වා තිබුණු අතර ජංගම වත්කම් වැඩියෙන් දැක්වුණි.

(ඒ) කාර්යය මණ්ඩලය වෙනුවෙන් ජීවිත රක්ෂණාවරණය සඳහා 2022 ඔක්තෝබර් 01 දින සිට 2023 සැප්තැම්බර් 30 දින දක්වා වූ කාල පරිච්ඡේදයට අදාළ රු. 2,975,382 ක මුදල 2022 වර්ෂයේ උපචිත වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි. එයින් 2023 වර්ෂයේ මාස 09 කට අදාළ රු. 2,231,536 ක වියදම උපචිත වියදම් ලෙස වැඩියෙන් ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ලාභය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඔ) සේවා ගිවිසුම් කඩ කිරීම් හේතුවෙන් නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු. 1,878,060 ක ඇප බැඳුම්කර වටිනාකම ලැබිය යුතු වැටුප් අවකරණ ගිණුමේ වත්කමක් ලෙස දක්වා විලම්බිත ආදායම් ලෙස දක්වනවා වෙනුවට උපචිත වියදම් යටතේ දක්වා තිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයේ මිලදිගැනීම් හා වියදම් සඳහා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ පවතින එකතුව රු. 1,282,800 ක්, කෙරිගෙන යන වැඩ හා වියදම් ලෙස උපචිත වියදම් ගිණුමක ගිණුම්ගත කිරීම නිසා වියදම් හා ජංගම වගකීම් වැඩියෙන් දක්වා තිබුණි.

(ක) 2022 ජූනි 07 දින අංක PV/733/730 දරන ගෙවීම් වවුචරයෙන් වාහන අලුත්වැඩියාව වෙනුවෙන් දරා ඇති රු. 576,381 ක් තුළ ඇතුළත් රු. 42,696 ක එකතු කළ අගය මත බදු පාලන ගිණුමට හර නොකර වෙනත් ආදායම් ගිණුමට හර කර තිබීම නිසා වගකීම් සහ ආදායම් අඩුවෙන් දක්වා තිබුණි.

(ග) 2022 දෙසැම්බර් 30 දිනැති අංක PV/1710/1698 දරන ගෙවීම් වවුචරයෙන් හම්බන්තොට තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය සඳහා ලබාගත් විශේෂඥ සේවය සඳහා ගෙවන ලද රු. 2,606,452 තුළ ඇතුළත් රු. 339,972 ක එකතු කළ අගය මත බදු මුදල එකතු කළ අගය මත බදු ගිණුමට හදුනා නොගෙන වියදම් ගිණුමට ගෙන තිබීම නිසා වියදම සහ එකතු කළ අගය මත බදු වගකීම වැඩියෙන් පෙන්වා තිබුණි.

(ච) අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව ක්‍රියාත්මක වන ගමට සන්නිවේදනය ව්‍යාපෘතියට අදාළව විභාගයක් පැවත්වීම වෙනුවෙන් ආයතනයකට ගෙවූ රු. 487,500 ක් අදාළ ව්‍යාපෘති ගිණුමට ගිණුම්ගත නොකර විවිධ මෙහෙයුම් පිරිවැය ගිණුමට දක්වා තිබුණි.

(ජ) සමාලෝචිත වර්ෂයට අදාළ රු. 3,815,600 ක සෙස් බදු ආදායම 2023 අප්‍රේල් 26 දින ලැබී තිබුණද එය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. එම තත්ත්වය හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු. 3,815,600 ක් අඩුවෙන්ද ලැබිය යුතු ආදායම (වත්කම්) රු. 3,815,600 ක් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ට) 2022 මාර්තු 29 දිනැති වවුචර් අංක 476 මගින් කදිරාන සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථානයේ ගොඩනැගිලි නවීකරණය කිරීම වෙනුවෙන් රු.20,344,564 ක් කොන්ත්‍රාත්කරු වන පුද්ගලික සමාගමක් වෙත ගෙවා තිබුණු අතර එම වවුචරයට අනුව කොන්ත්‍රාත්කරුට කොන්ත්‍රාත්තුව ආරම්භයේ ගෙවූ අත්තිකාරම් මුදල සම්පූර්ණයෙන්ම අය කරගෙන තිබුණද 2022 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් - (කදිරාන) ගිණුමේ රු.5,522,503 ක ශේෂයක් තවදුරටත් පැවතුණි.

(ඩ) වටිනාකම රු.45,000,000 ක් වූ අක්කර 112 රූඩ් 01 පර්චස් 10.5 ක කදිරාන සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථානය පිහිටි ඉඩම් ප්‍රදේශයේ ආසන්න වශයෙන් සියයට 69 ක බිම් කොටසක් කටාන ප්‍රාදේශීය සභාව අත්පත් කරගෙන තිබුණද එම ඉඩමේ අයිතිය පිළිබඳ ගැටලු නිරාකරණය කරගෙන ඊට අදාළ ගැලපීම් සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනවල සිදු කර නොතිබුණි.

(ණ) හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යානයේ විදුලි සංදේශ මාධ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීමට අදාළ ඉඩම 2022 දෙසැම්බර් 31 දින වන විටක් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ත) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන සටහන් අංක 3.5.1 හි දැක්වෙන ආදායම් බදු ගණනය කිරීමේ උප ලේඛනයේ සමාලෝචිත වර්ෂයේ බදු පෙර ලාභය රු.31,697,157,371 ක් වුවද රු.30,135,029,649 ක් පදනම් කරගෙන ආදායම් බදු ගණනය කිරීමේදී ලාභයෙන් අඩු කිරීමට ඉඩදිය හැකි වියදම් යටතේ පාරිතෝෂික ගෙවීම් රු.1,720,250 ක් ගෙවා තිබුණද රු.1,055,330 ක් පමණක් අඩු කර තිබීම හා විනිමය අනුපාත වෙනස්වීම් මත ඇතිවන භුවමාරු අලාභය පෙර වර්ෂයේ ආදායම් බදු ගණනය කිරීමේදී සලකා බලා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී රු.4,565,034,424 ක් වූ විනිමය අනුපාත වෙනස්වීම් මත ඇති වූ භුවමාරු අලාභය ගැලපීම් කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ බදු වියදම් නිවැරදිව ගිණුම්ගත කර ඇති බව නිරීක්ෂණය නොවීය.

(ද) 2022 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයගැතියන්ගෙන් රු.373,198,897 ක මුදලක් අයවිය යුතුව පැවතුණි. ඒ පිළිබඳව 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මුළු ණය ශේෂය වර්ෂ 02 කට වැඩි කාලයක සිට පැවත එන ණයගැතියන් වශයෙන් වර්ගීකරණය කර තිබුණද එය සාවද්‍ය බවත් එම ණය ශේෂය තුළ වර්ෂ 20 කට වැඩි කාලයක සිට පැවත එන ණය ශේෂයක්ද ඇතුළත් වී තිබුණි.

(ත) මුළු ණයගැති ශේෂයෙන් සියයට 46 කට වැඩි ප්‍රමාණයක් පුද්ගලික සමාගමක් නමින් අයවිය යුතුව තිබුණු අතර එම මුදල රු.174,800,000 ක් විය. 2007 වර්ෂයේ රු.172,500,000 ක්ද 1993 වර්ෂයේ රු.2,300,000 ක්ද ලෙස පැන නැගී තිබුණු මෙම හිඟ ණය ශේෂ සනාථ කර නොතිබුණු අතර අය කරගැනීමට ඵලදායී ක්‍රියාමාර්ගයක්ද ගෙන නොතිබුණි.

(ප) මුළු ණයගැති ශේෂයෙන් සියයට 40 කට වැඩි ප්‍රමාණයක් ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව නමින් අයවිය යුතුව තිබුණු අතර එම මුදල රු. 145,254,449 ක් විය. එම ණය ශේෂය 1976 වර්ෂයේ සිට ආරම්භ වී තිබුණි. මෙම හිඟ ණය ශේෂ සනාථ කර නොතිබුණු අතර අය කරගැනීම සඳහා ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(බ) ණයගැති ශේෂය තුළ වැඩියෙන් අයකර ගන්නා ලද සෘණ ණය ශේෂ 544 ක එකතුවක් වූ රු.2,171,741 ක් 2022 දෙසැම්බර් 31 දින දක්වා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. එම ණය ශේෂ තුළ රු. 100 ට අඩු ණයගැතියන් සංඛ්‍යාව 415 ක් විය. මෙම ණය ශේෂ ගැලපීම සඳහා කොමිෂන් සභාව විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ම) කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ණය ශේෂයන් රු.344,832,696 ක වටිනාකමැති ණය ශේෂ 104 ක් සනාථ කරගැනීම සඳහා ලිපි යවා තිබුණු නමුත් ශේෂ 03 ක තහවුරු කිරීම් ලිපි පමණක් ලැබී තිබුණි. කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.12,604,641 ක වටිනාකමැති ණය ශේෂ 1,057 ක් තහවුරු කිරීමට ලිපිනය නොමැති වීම හේතුව ලෙස දක්වමින් ශේෂ සනාථ කිරීමේ ලිපි යවා නොතිබුණි.

(ය) පුද්ගලික ආයතනයකින් 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලයට අදාළව ලැබිය යුතු විදුලි සංදේශ බදු ආදායම වූ රු. 6,358,657 ක් අයකර ගැනීමට නඩු පවරා තිබුණද 2022 දෙසැම්බර් 31 දින දක්වා අය කරගෙන නොතිබුණි.

(ර) ආයතනයකින් 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලයට අදාළව ලද සෙස් බදු ආදායම්වලට අදාළ එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු මුදල වූ රු.3,411,488 ක් අයකර ගැනීමට නඩු පවරා තිබුණද එම මුදල අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. එසේම පුද්ගලික සමාගමකින් 2011 හා 2012 වර්ෂයන්ට අදාළව අයවිය යුතු සෙස් බදු ආදායම වූ රු.254,135 ක් අයකර ගැනීමට ඵලදායී ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ල) කොමිෂන් සභාව විසින් ලෝන්ග්ඩන් පෙදෙස ගොඩනැගිල්ල බද්දට ගැනීමේදී ගොඩනැගිල්ලේ හිමිකරු සමඟ එළඹී ගිවිසුමේ h වගන්තිය ප්‍රකාරව අදාළ බදු කාල සීමාව තුළ ගිවිසුම අවසන් කළ නොහැකි බවත් අදාළ කාල සීමාව අවසන් වීමට කලින් බදු ගිවිසුම අවසන් කරන්නේ නම් ඉතිරි කාලසීමාව සඳහාද බදු කුලිය ගෙවිය

යුතු බව දක්වා තිබුණි. ගිවිසුම් කාලය ඉක්මවීමට පෙර කොමිෂන් සභාව විසින් නැවත ගොඩනැගිල්ල ආපසු භාරදී නිබීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල එම ගොඩනැගිල්ලට අදාළ තැන්පතු මුදල ලෙස රු. 1,350,000 ක මුදල ලැබිය යුතු මුදලක් ලෙස දක්වා තිබුණද එය ලැබිය යුතු මුදලක් නොවන බවත් කොමිෂන් සභාව විසින් ගොඩනැගිල්ලේ නිමිකරු වෙත රු.960,250 ක මුදලක් ගෙවිය යුතු බවත් නිරීක්ෂණය විය.

(ව) 2022 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශනවල වෙළඳ ණයගැති ශේෂය රු.373,198,897 ක් වූ අතර එම ණයගැතියන් සම්බන්ධව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ උපලේඛනය අනුව වෙළඳ ණයගැතියන් සංඛ්‍යාව 1,887 ක් වූ අතර එහි එකතුකම රු.371,075,408 ක් විය. ඒ අනුව වෙනස රු.2,123,490 ක් විය.

(ස) පෙර වර්ෂයේ කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව ගමට සන්නිවේදන ව්‍යාපෘතියට එම වර්ෂයේ දරා ඇති වියදම රු.187,645 ක් විය. එම වියදම් හඳුනාගැනීම සඳහා විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කොමිෂන් සභාවේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් කොමිෂන් සභාවේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ.

කොමිෂන් සභාවේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම් සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තවදුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම.

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහ හැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ

සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කොමිෂන් සභාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2. අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කොමිෂන් සභාව සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ)	1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනතේ 20 (2) (ඇ), 21 (2) (ආ) සහ 22 (2) (අ)	යම් ගාස්තුවක් ගෙවනු ලැබූ විට පමණක් සේවා සැපයිය යුතු වුවත් 2018 වර්ෂයට පෙර මුදල් ලැබීමට පෙර සේවා සැපයීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දින වන විට රු. 373,198,897 ක මුදලක් අයවිය යුතුව පැවතුණි.
(ආ)	2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 21(1)(ආ), 26(1) වගන්ති සහ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 වගන්තිය	සමාලෝචිත වර්ෂයට අදාළ එකතු කළ අගය මත බදු පාලන ගිණුමට අනුව ගෙවූ බදු වටිනාකම රු. 1,785,458,237 ක් විය. කෙසේ වුවත් රු. 40,952,958 ක මුදලක් තවදුරටත් ගෙවිය යුතුව පැවතුණි.
(ඇ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය**	
	i. II වැනි පරිච්ඡේදයේ 13.3 ඡේදය	වැඩ බැලීමේ පත්කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් වන අතර එම තනතුරු සඳහා පූර්ණකාලීන නිලධාරියෙකුගේ සේවය අවශ්‍ය නොවේ නම් කොමිෂන් සභාවේ නිලධාරීන් අතර රාජකාරි බෙදා දිය යුතු වේ. එහෙත් කොමිෂන් සභාව විසින් තනතුරු 07 ක් සඳහා දීර්ඝ කාලීනව වැඩ බැලීමේ පත්කිරීම් සිදු කර තිබුණු අතර එහි කාල පරාසය අවුරුදු 02 සිට අවුරුදු 15 ක් දක්වා විහිදී තිබුණි. නිලධාරීන් 07 දෙනෙකුට වැඩ බැලීම වෙනුවෙන් 2016 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වැඩ බැලීමේ දීමනා ලෙස රු.19,647,854 ක් ගෙවා තිබුණි. 2022 වර්ෂය තුළ පමණක් රු.7,075,398 ක් ගෙවා තිබුණි.
(ඇ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**	
	i.මු.රෙ. 104	2010 සැප්තැම්බර් 02 දින සිට 2015 සැප්තැම්බර් 08 දින දක්වා විදේශ රැකියාවකට යාමට වැටුප් රහිත නිවාඩු ලබාගෙන තිබුණු නිලධාරියෙකු 2015 සැප්තැම්බර් 09 දින සිට සේවයට

	වාර්තා කර නොතිබුණි. එදින සිට 2022 පෙබරවාරි 09 දින දක්වා වර්ෂ 07 කට ආසන්න කාලයක් ගතවී තිබියදී රු. 1,878,060 ක ඇප බැඳුම්කර වටිනාකම් ආපසු ගෙවන මෙන් ඔහු වෙත කොමිෂන් සභාව විසින් ලිපියකින් හෝ දන්වා නොතිබුණි. ඒ හේතුවෙන් අයවිය යුතු රු. 1,878,060 ක මුදල 2022 දෙසැම්බර් 31 දින දක්වා අය කරගෙන නොතිබුණි.
ii.මුදල් රෙගුලාසි 138	ගෙවීම් සඳහා වෙනත් වවුචරයක් පසු අවස්ථාවක සහතික කිරීම වළක්වාලීම සඳහා බලය ලත් නිලධාරියෙකු කටයුතු කළ යුතු වුවද නාමමාත්‍ර ඉන්වොයිස් පත්‍ර 03 ක් පදනම් කරගෙන ගෙවීම් වවුචර් 03 කට රු. 1,075,000 ක් හා ඉන්වොයිස්වල ඡායා පිටපත් පදනම් කරගෙන ගෙවීම් වවුචර් 17 කට රු. 8,616,726 ක් ගෙවා තිබුණි.
iii. මු.රෙ. 261(3)	මහජන බැංකු ශේෂ සනාථ කිරීමේ ලිපියට අනුව රු. 436,243,821 ක ශේෂයක් තිබුණද මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු. 234,834,591 ක ඍණ ශේෂයක් විය. එම බැංකු ගිණුමට අදාළව ඉදිරිපත් කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව හඳුනා නොගත් ලැබීම් රු. 260,619,617 ක් විය. උක්ත බැංකු ගිණුමේ ආරම්භක ශේෂය රු. 933,237,468 ක ඍණ ශේෂයක්ව පැවතියදී චෙක්පත් මගින් ගනුදෙනු කිරීමේ අසාමාන්‍ය තත්ත්වය විගණනයට ප්‍රශ්නගත විය.
iv.2020 අගෝස්තු 28 දිනැති 01/2020 මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයේ මුදල් රෙගුලාසි 371(2)(ආ)	කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂයේ රු. 100.000 සීමාව ඉක්මවා අවස්ථා 13 කදී එකතුව වටිනාකම් රු. 3,222,168 ක් මිලදී ගැනීම් අත්තිකාරම් ලෙස ලබාදී තිබුණි.
v. මුදල් රෙගුලාසි අංක 1645 (ආ)	එක් එක් වාහනයේ රියදුරු ලවා 268 වැනි පොදු ආකෘති පත්‍රයේ දෛනික ධාවන සටහනක් තබා ගැනීමට සලස්වා පරිපාලන නිලධාරීන් ලවා නිතිපතා පරීක්ෂා කරවීම් කළ යුතු අතර කොමිෂන් සභාවේ වාහන 25 න් 08 ක 2022 වර්ෂයේ කිසිදු මාසයක ධාවන සටහන් ඉදිරිපත් කර නොතිබුණි. වාහන 13 ක සමාලෝචිත වර්ෂයේ මාස කීපයක ධාවන සටහන් ඉදිරිපත් කර නොතිබුණි.

vi. මුදල් රෙගුලාසි අංක 1646	වාහන භාර නිලධාරීන් විසින් වාර්තාව ඉදිරිපත් කරනු ලබන මාසයට පසු ඊළඟ මාසයේ 15 වැනි දින ගතවන්නට ප්‍රථමයෙන් 268(අ) වැනි පොදු ආකෘති පත්‍රයේ ලියන ලද ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපත විගණකාධිපති වෙත එවිය යුතු වුවත් 2022 වර්ෂයේ කොමිෂන් සභාවට අයත් වාහනවල ගමන් පිළිබඳ මාසික සාරංශයේ මුල් පිටපත විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.
(ඉ) PED අංක 05/2022 දරන චක්‍රලේඛය3.9 වගන්තිය	විදේශගත වූ නිලධාරියෙකු විසින් මෙරට බැංකු පද්ධතිය හරහා තමාගේ නමින් ආරම්භ කරන ලද අනේවාසික විදේශ මුදල් ගිණුමකට (NRFC) නිලධාරියාගේ සේවා තත්ත්වය මත මාසිකව ඇමරිකන් ඩොලර් 500 ක්, ඇමරිකන් ඩොලර් 300 ක් එවිය යුතු අතර එම ගිණුම පිළිබඳ විස්තර විදේශගත වූ නිලධාරියා සේවය කළ ආයතනයට ලබාදිය යුතුය. එම චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව අනේවාසික විදේශ මුදල් ගිණුමට මුදල් ප්‍රේෂණය කිරීම පිළිබඳ තොරතුරු නිලධාරියා විසින් සේවය කළ ආයතනයට දැන්විය යුතුය. කොමිෂන් සභාවේ සේවය කරමින් සිට සමාලෝචිත වර්ෂයේ විදේශගත වූ නිලධාරීන් 04 දෙනා වෙනුවෙන් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර කොමිෂන් සභාව විසින් ඒ පිළිබඳව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර කොමිෂන් සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) **කොළඹ නෙලුම් කුලුන ව්‍යාපෘතිය**

---

i. මෙම ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව සඳහා අරමුදල් සපයා ගැනීමට 2012 සැප්තැම්බර් 17 දින කොමිෂන් සභාව, චීන එක්සිම් බැංකුව සමඟ ඵළඹී ණය ගිවිසුමට අනුව කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 85 ක් එනම් ඇ.ඩො. මිලියන 88.655 පමණක් ලබා දීමට එකඟ වී තිබුණ අතර 2016 අගෝස්තු 18 දින වන විට ණය මුදල ලබාගෙන අවසන් කළ යුතුව තිබුණි. කොන්ත්‍රාත්තුවට අදාළ කාලසටහනට අනුව ඉදිකිරීම නිම නොකිරීම හේතුවෙන් සම්පූර්ණ ණය මුදල නියමිත පරිදි ලබාගැනීමට නොහැකි වී තිබුණු අතර අදාළ කාලය තුළදී ඇ.ඩො. මිලියන 67.260 ක් එනම් ණය මුදලින් සියයට 76 ක් පමණක් ලැබී තිබුණි.

ii. කොළඹ නෙලුම් කුලුන ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් ගිවිසුමේ 18.4 වගන්තිය ප්‍රකාරව වලංගු කාර්යය සාධන බැඳුම්කරයක්, රඳවා ගැනීමේ සහතිකයක් හා වෘත්තීය වන්දි රක්ෂණාවරණයක් ඉදිරිපත් කිරීමට චයිනා නැෂනල් ඉලෙක්ට්‍රොනික්ස් ඉම්පෝර්ට් ඇන්ඩ් එක්ස්පෝර්ට් කෝපරේෂන් සමාගම අපොහොසත් වී තිබුණු අතර 2022 ජනවාරි 31 දිනැති අංක 22/0132/331/001 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව එම බැඳීම් ඉටුකරන තෙක් ද්‍රවශීලතා හානි ලෙස අඩුකර ඇති ඇ.ඩො. මිලියන 10.43 ක මුදල රඳවාගැනීම සිදුකර තිබුණි.

iii. ව්‍යාපෘතියේ ආදායමෙන් ණය වාරික ගෙවීමට සැලසුම් කර තිබුණද 2022 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 12,762 ක ණය වාරික හා පොලී කොමිෂන් සභාවේ මුදලින් ගෙවා තිබුණි.

iv. කොළඹ නෙලුම් කුලුන මුළුතැන්ගෙයි උපකරණ භෞතික පරීක්ෂාවේදී පිරිවැය ඇ.ඩො. 15,747 ක් වූ අයිස් කැට සාදන යන්ත්‍රය (S/N G01423B) ක්‍රියාත්මක කළ නොහැකි මට්ටමේ පැවතුණු අතර ඇ.ඩො. 100,744 ක් පිරිවැය වූ අයිතම 32 ක ඌනතාවයක් විය.

v. 2010 ඔක්තෝබර් 13 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව රූපවාහිනී, විදුලි සංදේශ හා ගුවන් විකාශන සේවා කටයුතු සඳහා කුලුන යොදා ගැනීම මූලික අරමුණ වී තිබුණු අතර ගුවන් විදුලි, රූපවාහිනී හා විදුලි සංදේශ කටයුතු 2022 දෙසැම්බර් 31 දින දක්වාම ක්‍රියාත්මක කර නොතිබුණි.

vi. 2022 පෙබරවාරි 24 දිනැති අංක 2k22.286.06(1) දරන කොමිෂන් සභා තීරණය ප්‍රකාරව සියලු උපකරණ හා පද්ධතිවල නඩත්තු කටයුතු සඳහා ගිවිසුම්වලට ඵළඹීම කොළඹ නෙලුම් කුලුන කළමනාකරණ පුද්ගලික සමාගම සතු වගකීමක් බව සඳහන් වී තිබුණු අතර 2022 පෙබරවාරි 28 දින සිට 2022 මැයි 28 දින දක්වා මාස 03 ක කාලයක් සඳහා කොමිෂන් සභාව විසින් නඩත්තු කටයුතු කොන්ත්‍රාත් සමාගම වූ

සී.ඊ.අයි.ඊ.සී සමාගම වෙතින් ඉටු කරගෙන තිබුණද 2023 මාර්තු 02 දින වන විටත් නඩත්තු කටයුතු වෙනුවෙන් ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

vii. කොළඹ නෙලුම් කුලුන කොම්ෂන් සභාව වෙත පවරා ගැනීමට කොම්ෂන් සභාව වෙනුවෙන් මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය පත්කර තිබූ අතර 2019 ජනවාරි 10 දින එකතු කළ අගය මත බදු රහිත වටිනාකම වූ රු. 22,500,000 කට සති 12 කින් පවරා ගැනීමේ කාර්යය නිම කිරීමට ගිවිසුම් අත්සන් කර තිබුණු අතර එකතු කළ අගය මත බදු සහිතව රු. 25,481,250 ක් ගෙවා තිබුණද කොන්ත්‍රාත්තුව ප්‍රමාදවීම හේතු කොටගෙන නෙලුම් කුලුන භාර ගැනීමට අදාළ උපදේශන සේවා ගිවිසුමට අමතරව පසුදාතම් කර 2019 අගෝස්තු 01 දින සිට 2020 අගෝස්තු 31 දින දක්වා කාල පරිච්ඡේදයට අතිරේකයක් අත්සන් කිරීමෙන් පසු එකතු කළ අගය මත බදු සහිත වටිනාකම වූ රු.9,234,000 ක් 2021 අගෝස්තු 06 දින මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යංශය වෙත ගෙවීම් කර තිබුණි.

viii. කොළඹ නෙලුම් කුලුන ව්‍යාපෘතිය සඳහා 2022 දෙසැම්බර් 31 දිනට ගෙවූ උපදේශන ගාස්තුව රු.මිලියන 336.4 ක් වූ අතර ගිවිසුම්ගත වටිනාකම ඉක්මවා ගෙවූ මුදල රු. මිලියන 137.7 ක් විය.

ix. කොළඹ නෙලුම් කුලුන වාණිජකරණය කිරීමේ කටයුතු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් උපදේශක වෙත 2020 පෙබරවාරි මාසයේ සිට 2022 පෙබරවාරි මාසය දක්වා වැටුප් හා දීමනා ලෙස රු. 5,227,613 ක් ගෙවා තිබුණද 2020 මැයි හා 2020 ජුනි මාස 02 සඳහා පමණක් මාසික වාර්තා ලබාදී තිබුණි. තත්කාර්ය පදනම මත බඳවා ගත් උපදේශක සහායකයින් 05 කගේ මාසික වාර්තා හා පැමිණීමේ හා පිටවීමේ මාසික වාර්තා සලකා බැලීමකින් තොරව වැටුප් හා දීමනා රු.26,403,419 ක් ගෙවා තිබුණි.

(ආ) ගමට සන්නිවේදන ජාතික ව්‍යාපෘතිය

"ගමට සන්නිවේදනය" ජාතික ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති සම්බන්ධීකරණ තනතුරු 04 ක් සහ ව්‍යාපෘති සහායක තනතුරු 15 ක් බඳවාගැනීම සඳහා 2021 නොවැම්බර් 05 දින දැන්වීම් පලකර තිබුණු අතර යටෝක්ත තනතුරු සඳහා පිළිවෙලින් අයදුම්පත් 204 ක්ද, 271 ක්ද වශයෙන් අයදුම්පත් 475 ක් ලැබී තිබුණු අතර රු. 975,000 ක් වැයකර තෝරා ගැනීමේ විභාගය 2022 ජුනි 22 දින පවත්වා තිබුණි. යටෝක්ත තනතුරු සඳහා පිළිවෙලින් ලකුණු 40 ට වැඩි ලකුණු ලබාගත් සංඛ්‍යාව 66 ක්, 74 ක් සිටියද විභාගයෙන් සමත් වූ අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා 2023 ජුනි 30 දින දක්වා බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද ගමට සන්නිවේදන ව්‍යාපෘතියට දරන ව්යදම් සහ වත්කම් වෙනම හඳුනාගත හැකිවන පරිදි ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) **හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යානයේ විදුලි සංදේශ මාධ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීම**

i. මෙම ඉදිකිරීම සඳහා කොමිෂන් සභාව සහ කොන්ත්‍රාත්කරු සමඟ 2014 ජූලි 28 දින එළඹුණු ගිවිසුම කොමිෂන් සභාව විසින් ආයෝජන මණ්ඩලයේ හා ජනාධිපති ලේකම් කාර්යාලයේ උපදෙස් මත 2016 අගෝස්තු 10 දින අවසන් කර තිබීම හේතුවෙන් එම තීරණයට එරෙහිව කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ පැමිණිල්ලට අනුව කොන්ත්‍රාත්කරුට වන්දි ඇතුලුව මුළු බෙරුම්කරණ වියදම ලෙසරු.426,897,598 ක මුදලක්කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

ii. කොන්ත්‍රාත්තුව නිම කරන දිනට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 33 ක් වූ අතර 2022 දෙසැම්බර් 31 දින වන විට දරන ලද රු.711,608,769 ක් නිශ්කාර්ය වියදමක් වී තිබුණු අතර එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ නොනිමි වැඩ යටතේ දක්වා තිබුණි.

(ඈ) **කදිරාන සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථානයේ ගොඩනැගිලි නවීකරණය හා ප්‍රතිසංස්කරණය කිරීම**

i. මෙම කාර්යය සඳහා එකතු කළ අගය මත බදු රහිත වටිනාකම රු.139,882,281 කට පෞද්ගලික ආයතනයක් වෙත 2019 ජනවාරි 31 දින ප්‍රදානය කර තිබුණු අතර ප්‍රමාණ බිල්පතේ ඇතුළත් නොවූ විවිලතාවයන් හා අමතර වැඩ සඳහා රු.24,360,085 ක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි.

ii. උක්ත කොන්ත්‍රාත්තුව නිම කිරීමේ දිනය 2019 නොවැම්බර් 11 දින වුවද 2023 ජුනි 30 දින වන විටත් කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කර නොතිබුණු අතර කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමක්ද සිදුකර නොතිබුණි.

(ඉ) **කොමිෂන් සභාවේ ප්‍රධාන ගොඩනැගිලි දිගුවක් ඉදිකිරීම.**

කොන්ත්‍රාත් වටිනාකම රු. 209,093,034 ක් වූ ඉදිකිරීමේ ව්‍යාපෘතියට කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2020 පෙබරවාරි 15 දින අවසන් කළ යුතු වුවද 2023 ජුනි 30 දින වන විටක් ඉදිකිරීම් අවසන් කර නොතිබුණි. තවද 2021 දෙසැම්බර් 31 දිනෙන් පසු කිසිදු භෞතික ප්‍රගතියක් අත් කරගෙන නොතිබුණි.උපදේශන සේවා සැපයීම වෙනුවෙන් 2019 ජුනි 10 දින මොරටුව විශ්ව විද්‍යාලය සමඟ ගිවිසුමකට එළඹ තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දින වන විට උපදේශක සේවා ගාස්තු ලෙස මුළු උපදේශන සේවා ගාස්තුවලින් සියයට 70 ක් හෙවත්රු. 7,318,256 ක් මොරටුව විශ්ව විද්‍යාලය වෙත ගෙවා තිබුණි.

(ඊ) කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ල නවීකරණය කිරීමේ කොන්ත්‍රාත්තුවේ ප්‍රමාණ පත්‍ර ඇස්තමේන්තු සකස් කිරීමේ කාර්යයන් සඳහා උපදේශක ගාස්තුව ලෙස 2015 ජනවාරි 25 දින මොරටුව විශ්ව විද්‍යාලයට රු. 10,057,910 ක් ගෙවා තිබුණු අතර එම වියදම කෙරීගෙන යන වැඩ ගිණුමේ ගිණුම්ගත කර තිබුණද 2022 ජුනි 30 දින දක්වා ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු සිදුකර නොතිබුණි.

(උ) **කොමිෂන් සභාවේ වාහනවලට අත්තිකාරම් මගින් ඉන්ධන සැපයීම**

i. රටේ ඉන්ධන අර්බුදය පැවති කාල වකවානුවක කොමිෂන් සභාවේ වාහනවලට ඉන්ධන සපයා ගැනීම සඳහා සහකාර අධ්‍යක්ෂ (පාලන) වෙත රු. 200,000, රු. 300,000 වැනි විශාල වටිනාකම්වලින් අත්තිකාරම් ලබාදී තිබුණි. සමාලෝචිත වර්ෂයේ වාහන 27 කට අත්තිකාරම් වලින් රු. 388,965 ක ඉන්ධන ලබාගෙන තිබුණු බවට බිල්පත් ඉදිරිපත් කළද එම ඉන්ධන වාහනවලට සපයා නොතිබුණි. වාහන 07 ක සැපයූ ඉන්ධන ප්‍රමාණයද බිල්පත්වල දක්වා නොතිබුණි.

ii. සහකාර අධ්‍යක්ෂ (පාලන) 2022 අගෝස්තු 25 දින අංක ZA – 5123 දරන වාහනයට ඉන්ධන ලබාගැනීම සඳහා රු. 21,500 ක ඉන්ධන අත්තිකාරමක් ලබාගෙන තිබුණු අතර එය පියවීමේදී ඩීසල් ලීටර් 50 ක් මිලදී ගත් බවට බිල්පත් ඉදිරිපත් කර තිබුණද වාහනයට සපයා ඇති ඉන්ධන ප්‍රමාණය ඩීසල් ලීටර් 20 ක් විය.

iii. වාහන 92 කට අත්තිකාරම් වලින් රු. 1,335,693 ක ඉන්ධන ලබාගෙන තිබුණද එම වාහනවල ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් මිලදී ගත් ඉන්ධන අදාළ වාහනවලට යෙදවූවාද යන්න විගණනයට තහවුරු කරගත නොහැකි විය. අවස්ථා 13 ක වාහනවලට සැපයූ ඉන්ධන ප්‍රමාණයද බිල්පත්වල දක්වා නොතිබුණි.

(ඌ) **ජාල අංශය සඳහා තාක්ෂණික උපකරණ සැපයීම, සවිකිරීම සහ ක්‍රියාත්මක වන බව තහවුරු කිරීම සඳහා වූ ප්‍රසම්පාදනය.**

i. ජාතික තරහකාරී ක්‍රමය යටතේ ඇස්තමේන්තුගත වටිනාකම රු. 6,450,000 ක්වූ තාක්ෂණික උපකරණ වර්ග 03 ක් මිලදී ගැනීම සඳහා ලංසු කැඳවා තිබුණද රු. 1,047,000 කට එක් තාක්ෂණික උපකරණයක් වූ ක්ලැම් ඔන් අර්ත් ටෙස්ටර් 03 ක් පමණක් පුද්ගලික සමාගමකින් මිලදී ගෙන තිබුණි. අනෙක් තාක්ෂණික උපකරණවල අවශ්‍යතාවය නොතිබුණේද යන්නත් එම උපකරණ නොතිබීමෙන් අදාළ කාර්යය ඉටු කිරීමේ ඵලදායීතාව පිළිබඳවත් විගණනයට ප්‍රශ්නගත විය.

ii. ටවර් හයිට් මෙෂරින්ග් ලේසර් මීටර් 03 ක් සඳහා එක් ආයතනයක් පමණක් ලංසු ඉදිරිපත් කර තිබුණු අතර එය අනුකූල නොවන බැවින් නැවත ලංසු කැඳවීමටත් රේඩියේෂන් මීටර් ඇන්ටනා 02 ක් සඳහා ලංසු එක් ආයතනයක් පමණක් ඉදිරිපත් කර තිබුණු බැවින් ඒ සඳහා ඉන්දියාවේ ප්‍රාදේශීය නියෝජිත ආයතනය සමඟ සෘජුවම මිලදී ගැනීමට, සන්නිවේදන කටයුතු කරගෙන යාමට සහ වෙනත් දේශීය නියෝජිතයන් සිටීද යන්න සොයා බැලීමට තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රසම්පාදන කමිටුවට උපදෙස් දී තිබුණද ප්‍රසම්පාදන කමිටුව එසේ කටයුතු කර නොතිබුණි. ලංසු ලේඛන ප්‍රකාරව ගිවිසුම් අත්සන් කළ 2022 අප්‍රේල් 02 දින සිට සති 04 ක් ඇතුළත අදාළ උපකරණ බෙදාහැරීම හා සවිකිරීම සිදුකළ යුතු වුවද කොමිෂන් සභාව වෙත අදාළ උපකරණ 2022 අගෝස්තු 30 දින ලැබී තිබුණි.

(එ) අයි.බී.එම්සර්වර් 11 ක් සඳහා වාර්ෂික නඩත්තු ගිවිසුම්වලට එළඹීමේ ප්‍රසම්පාදනය.

i. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 5.4.8 (ආ) දරන වගන්තිය ප්‍රකාරව කාර්ය සාධන සුරක්ෂණය 2022 අප්‍රේල් 27 දින සිට 2022 ජුනි 27 දින දක්වා වලංගු විය යුතු වුවත් තෝරාගත් ආයතනය විසින් ඉදිරිපත් කර ඇති කාර්ය සාධන සුරක්ෂණය 2022 මැයි 27 දින දක්වා පමණක් වලංගු වන බව නිරීක්ෂණය විය.

ii. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 8.9 දරන වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීමේදී ප්‍රතිග්‍රහණ ලිපිය නිකුත් කිරීමත් සමගම විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කිරීම සිදු කළ යුතු වුවත් 2022 අප්‍රේල් 07 දින ප්‍රතිග්‍රහණ ලිපිය නිකුත් කර තිබුණු නමුත් 2022 ජුනි 21 දින කොන්ත්‍රාත් ගිවිසුම ලියා අත්සන් කර තිබුණි.

(ඒ) කොමිෂන් සභා කීරණ අනුව කොළඹ නෙලුම් කුලුන වාණිජකරණය කිරීමේ කටයුතු සඳහා කොන්ත්‍රාත් කාර්ය මණ්ඩල දීමනා හා දුරකථන ගාස්තු ලෙස ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ පිළිවෙලින් රු. 27,763,292 ක් හා රු. 2,106,560 ක වියදමක් දරා තිබුණද කොළඹ නෙලුම් කුලුන කළමනාකරණ පුද්ගලික සමාගමෙන් එම මුදල 2023 ජුනි 30 දින දක්වා අය කරගෙන නොතිබුණි.

(ඕ) හන්තාන සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථානය පිහිටි පර්වස් 6.21 ක ඉඩමේ අයිතිය පවරාගැනීම සඳහා 1999 හා 2010 වර්ෂවලදී එහි තක්සේරු වටිනාකම හා වෙනත් වියදම් සඳහා රු. 345,502 ක් ජාතික නිවාස සංවර්ධන අධිකාරියට ගෙවා තිබුණද එහි අයිතිය සමාලෝචිත වර්ෂයේදීද පවරාගෙන නොතිබුණි. තවද ප්‍රධාන කාර්යාලය හා කොකාවිල් බහුකාර්යය මධ්‍යස්ථාන පිහිටි ඉඩම්වල හිමිකම් ඔප්පු / බදු ගිවිසුම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද ලබාගෙන නොතිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) අයවැය ලේඛන පාලනය

i. සමාලෝචිත වර්ෂය තුළ වියදම් අයිතම 10 ක අයවැයගත වියදම ඉක්මවා රු. 515,459,337 ක් වැයකර තිබුණු අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 13 සිට සියයට 313 දක්වා පරාසයක් තුළ පැවතුණු බව නිරීක්ෂණය විය.

ii. සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයට ඇතුළත් කර නොතිබුණු නියාමන වියදම් යටතේ ඇති වියදම් අයිතම 03 ක්සඳහා රු. 152,389,962ක වියදමක්ද හා ආයතන සහ පරිපාලන වියදම් යටතේ ඇති වියදම් 11ක් සඳහා රු. 514,696,496ක වියදමක්ද සමාලෝචිත වර්ෂය තුළ දරා තිබුණි.

(ආ) වාහන අපහරණය

i. අපහරණ ඇගයීම් කමිටුව විසින් 2020 ජූලි 22 දිනැති තක්සේරු වාර්තා වර්ෂයකට වඩා වැඩි කාලයක් ගතවී ඇති බවත්, වර්තමානයේ වාහන ආනයනය තහනම් කර ඇති බැවින් වාහන මිල ගණන් ඉහළ අගයක්ගන්නා බවත් ඒ හේතුවෙන් නව තක්සේරු වටිනාකම් ලබා ගැනීමට කටයුතු කරන ලෙස අපහරණ ඇගයීම් කමිටුවවිසින් දන්වා තිබියදී කොමිෂන් සභාව විසින් 2020 වර්ෂයේ තක්සේරු වාර්තා පදනම් කරගෙනසමාලෝචිත වර්ෂය තුළ වාහන 04 ක් රු. 4,877,616 කට විකුණා තිබුණි.

ii. අංක 227 – 8280 දරන වාහනය සඳහා තක්සේරු වටිනාකමට සමාන හෝ වැඩි අගයක් සහිත ලංසු ඉදිරිපත් නොවීම හේතුවෙන් නැවත ලංසු කැඳවීමට අපහරණ ඇගයීම කමිටුව නිර්දේශ කර තිබුණද එම නිර්දේශ ක්‍රියාත්මක නොකර ලංසු ඉදිරිපත් කිරීමේදී රු. 310,900 ක වැඩිම ලංසුව ඉදිරිපත් කළ ලංසුකරු තක්සේරු වටිනාකම වූ රු. 520,000 කට වාහනයමිලදී ගැනීමට කැමැත්ත දැක්වීම හේතුව ලෙස දක්වමින් එම ලංසුකරුට තක්සේරු වටිනාකමට වාහනය විකුණා තිබුණි.

iii. අංක 227 – 8426 දරන වාහනය සඳහා දෙවන වැඩිම මිල ඉදිරිපත් කළ ලංසුකරු තක්සේරු වටිනාකම් වූ රු. 520,000 ට අඩුවෙන් ලංසුව ඉදිරිපත් කළද ඔහුගේ ඉල්ලීම පරිදි තක්සේරු වටිනාකමට මෙම වාහනය විකුණා තිබුණි.

iv. කොමිෂන් සභාව විසින් ලංසු ලේඛනවල එකතු කළ අගය මත බදු අයකර ගැනීම පිළිබඳව දක්වා නොතිබීම හේතුවෙන් අංක 227 – 8430 දරන වාහනය රු. 1,200,000 කට මිලදී ගත් ලංසුකරු එකතු කළ අගය මත බදු ගෙවීම ප්‍රතික්ෂේප කර තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායමෙන් රු. 88,889 ක් එකතු කළ

අගය මත බදු ගෙවීමට සිදුවී තිබුණු අතර ලංසු ලේඛන නිසි පරිදි සකස් නොකළ නිලධාරීන් හඳුනාගෙන කොමිෂන් සභාවට වූ අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

v. 2015 ජූලි 10 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2015 අංක 10 ප්‍රකාරව වාහන අපහරණය කිරීමේදී සියලුම ආදායම් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවද කොමිෂන් සභාව විසින් වාහන විකිණීමෙන් ලැබුණු රු. 4,877,616 ක මුදල බැර කර නොතිබුණි.

(ඇ) 2022 දෙසැම්බර් 31 දිනට සේවක පාරිතෝෂික වශයෙන් වෙන් කළ රු. 117,674,290 ක මුදලින් රු. 72,420,000 ක මුදලක් ආයෝජනය කර තිබුණද ඉතිරි රු. 45,254,290 ක මුදල ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) **මිලදීගැනීම් අත්තිකාරම්**

2022 දෙසැම්බර් 31 දිනට රු. 505,355 ක නොපියවූ මිලදීගැනීම් අත්තිකාරම් ශේෂයක් විය. හිටපු සභාපතිවරයෙකු විසින් 2002 වර්ෂයේ සිට 2003 වර්ෂය දක්වා අවස්ථා 04 කදී රු. 116,000 ක අත්තිකාරම් ගෙන තිබුණු අතර එම අත්තිකාරම් ලබා ගත්තේ කුමන කාර්යයක් සඳහාද යන්න විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. 2022 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 10 ත් 11 ත් අතර කාලයක් ගතවී තිබියදී ඒවා පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) **මානව සම්පත් කළමනාකරණය**

i. කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 288 ක්වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 214 ක් විය. ඒ අනුව මුළු පුරප්පාඩු සංඛ්‍යාව 77 ක් විය. මෙහි ඇතුළත් අතිරේක/නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ තනතුරු සඳහා පුරප්පාඩු 32 ක් සම්පූර්ණ කිරීමට හෝ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට හෝ කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි. එසේම නිත්‍ය සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු පිරවීමට කටයුතු නොකර ද්විතීයන හා කොන්ත්‍රාත්පදනම් මත පිළිවෙලින් නිලධාරීන් 08 දෙනෙකු හා 02 දෙනෙකු 2022 දෙසැම්බර් 31 දින වන විට බඳවාගෙන තිබුණි.

ii. කොමිෂන් සභාව වෙනුවෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් කාර්යාල කාර්යය සහායක තනතුරු23 දෙනෙකු පමණක් අනුමත කර තිබියදීත් කොමිෂන් සභාව විසින් කාර්යය සහායකයින් 26 දෙනෙකු බඳවාගෙන තිබුණි.

iii. කොමිෂන් සභාව විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත නොවූ තනතුරක් වූ සහකාර ගණකාධිකාරී තනතුර සඳහා ස්ථිර පදනම මත සහකාර ගණකාධිකාරීවරයෙකු පත්කර නිබුණු අතර සමාලෝචිත වර්ෂය සඳහා වැටුප් හා දීමනා ලෙස රු. 1,130,575 ක් ගෙවා තිබුණි.

iv. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව කොමිෂන් සභාව විසින් අධ්‍යක්ෂ සහ ජ්‍යෙෂ්ඨ විදුලි සංදේශ නිලධාරී තනතුරුවල අනුමත සේවක සංඛ්‍යාව 03 කින් වර්ධනය කරගෙන තිබුණි.

v. තෘතියික, ද්විතියික හා ප්‍රාථමික සේවා ගණයේ තනතුරු 08 ක් සඳහා පුරප්පාඩු 09 ක් වර්ෂ 02 සිට වර්ෂ 13 ක් වන කාල පරාසයක් තුළ පුරප්පාඩුව පැවතුණි.

vi. රාජ්‍යායතනයකට රු. 2,992.332 ක මුදලක් ගෙවා බඳවාගැනීම් පරිපාටිය, සංවිධාන ව්‍යුහය, අනුමත සේවක සංඛ්‍යාව, කාර්යසාධන ඇගයීම් පද්ධතිය සහ වැටුප් ව්‍යුහය ඇතුලු කාර්යය පරිපාටිය සකස් කරගෙන තිබුණද එය කොමිෂන් සභා අනුමැතියට ඉදිරිපත් කර නොතිබුණි.

vii. 2022 වර්ෂයේ කළමනාකරණ සහකාර II(තාක්ෂණික නොවන) තනතුරට බඳවා ගත් නිලධාරීන් 04 ක සහ කාර්යාල කාර්යය සහායකගේ විභාග සහතික අදාළ ආයතනවලින් පරීක්ෂා කර නොතිබුණි.

viii. 2016 ජූලි 01 දින සිට කළමනාකරණ සහකාර II තාක්ෂණිකනොවන තනතුරට ද්විතියන පදනම මත බඳවාගත් කළමනාකරණ සහකාරවරිය 2021 ජූලි 01 දින ස්ථිර කර තිබුණද නිලධාරිනිය වෙත බඳවාගැනීමේ පරිපාටියේ සඳහන් සුදුසුකම් තිබේද යන්න අදාළ ආයතනවලින් පරීක්ෂා කර නොතිබුණි.

ix. සමාලෝචිත වර්ෂය තුළ ද්විතියන පදනම මත බඳවාගත් නිලධාරීන් 08 ක් වෙනුවෙන් සියයට 25 ක විශ්‍රාම වැටුප් දායක මුදල වශයෙන් රු. 1,490,625 ක් ගෙවා තිබුණි. එය කොමිෂන් සභාවට අමතර වැය බරක් වූ අතර එම නිලධාරීන් බඳවා ගැනීමේදී බඳවා ගැනීමේ පරිපාටිය අනුව එක් එක් තනතුරට අදාළ සුදුසුකම් බඳවා ගත් නිලධාරීන්ට තිබේද යන්න අදාළ ආයතනවලින් පරීක්ෂා කර නොතිබුණි.

x. කොමිෂන් සභාවේ පරිපාලන හා මානව සම්පත් අංශයේ ඉහළ කළමනාකරණ මට්ටමේ නිලධාරීන් තිදෙනාම ද්විතියන පදනම මත බඳවා ගත් නිලධාරීන් වූ අතර එම නිලධාරීන් විටින් විට සේවයෙන් ඉවත් වීමෙන් පරිපාලන හා මානව සම්පත් අංශයේ කටයුතු අඩපන වී තිබුණි. එම අංශයට වර්ෂ ගණනාවක සිට ඉහළ කළමනාකරණ මට්ටමේ තනතුරු සඳහා ස්ථිර පදනමින් නිලධාරීන් බඳවාගෙන නොතිබුණි.

xi. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාරවරියක් ද්විතියික පදනම මත කොමිෂන් සභාවේ සේවයට බඳවා ගැනීමේදී එම දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ අංක රජ/ආ03/02/02/005 දරන 2021 නොවැම්බර් 23 දිනැති ලිපියේ 03 ඡේදය අනුව මෙම නිලධාරිනිය ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අංශයේ රාජකාරී කළ කාලසීමාව තුළ වාහන අලුත්වැඩියා සහ වාහන ලිපිගොනු පවත්වාගෙන යාමේදී සිදු කර ඇතැයි පැවසෙන අක්‍රමිකතා සහ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නියෝග නොතකා ක්‍රියා කිරීම සම්බන්ධව විමර්ශනයක් පවතින බව දන්වා තිබියදී කොමිෂන් සභාවේ වගකිව යුතු නිලධාරීන් ඒ පිළිබඳව කිසිදු අවධානයක් යොමු නොකර අක්‍රමිකතාවලට සම්බන්ධ නිලධාරිනියක් බඳවාගෙන තිබුණි.

xii. 2002 සැප්තැම්බර් 02 දින කොන්ත්‍රාත් පදනමට කාර්යාල සහායක තනතුරට පත්කර තිබුණු නිලධාරියෙකු 2009 දෙසැම්බර් 02 දින සිට ලිපිකරු තනතුරට උසස් කර තිබුණි. බඳවාගැනීමෙන් වර්ෂ 05 කට පසු ඔහු විසින් ඉදිරිපත් කර ඇති ප්‍රතිඵල සටහන ව්‍යාජ ප්‍රතිඵල සටහනක් බව තහවුරු කර තිබුණි. 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනත යටතේද ආයතන හා දණ්ඩ නීති සංග්‍රහය අනුව ව්‍යාජ ප්‍රතිඵල සටහනක් සකස් කිරීම හා ඉදිරිපත් කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් බවත් ඒ අනුව ඔහුට එරෙහිව විනයානුකූල සහ නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගෙන ඔහු වෙත දන්වා යවන ලෙසත් සභාපති වෙත දන්වා තිබුණි.

විභාග දෙපාර්තමේන්තුවේ ලිපිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් 2002 සැප්තැම්බර් 02 දින සිට 2012 අගෝස්තු 06 දින දක්වා ගෙවූ වැටුප් හා දීමනා සහ ගෙවූ අමතර ප්‍රතිලාභ කිසිවක් අය කරගැනීමට කටයුතු නොකර 2012 සැප්තැම්බර් 06 දින රු. 59,640 ක පාරිතෝෂික මුදල්ද ගෙවා 2013 පෙබරවාරි 05 දින සේවයෙන් පහ කර තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
276, ඇල්විටිගල මාවත, කොළඹ 08, ශ්‍රී ලංකාව
දුරකථනය: +94 11 268 9345 / 1900 | ෆැක්ස්: +94 11 268 9341

www.trc.gov.lk twitter.com/TRCSL facebook.com/trcsl